# පුරාණ ඉන්දියාවේ කාසි

**මහජන පුස්තකාලය**

# පුරාණ ඉන්දියාවේ කාසි

පී. එල්. ප්‍රේමතිලක

ගුණසේන

# පෙරවදන

පුරාණ ඉන්දියාවේ ඉතිහාසය අවබොධ කොට ගැනීමෙහි ලා එ රට පුරාණ කාසි පිළිබඳ අධ්‍යයනයෙන් සැලසී ඇති සේවය ඉමහත්. ඇත්ත වශයෙන් පංජාබය හා ඊට යාබද රටවල් පාලනය කළ ග්‍රීකයන් වැනි ඇතැම් පාලකයන් හඳුනා ගත හැකි වී තිබෙන්නේ ඔවුන්ගේ කාසිවලින් පමණි. බලවත් පරිශ්‍රමයක් දරා ඉමහත් සැලකිල්ලෙන් කළ යුතු අධ්‍යයනයක් වන නාණක විද්‍යාව පිළිබඳව විශෙෂ දැනුමක් ලබා ඇත්තේ ස්වල්ප දෙනෙකු පමණි. සාමාන්‍ය වශයෙන් බලන කල, අවශෙෂ ඉන්දියානු පුරාවස්තු ගැන මෙන් ම, ඉන්දියානු කාසි පිළිබඳව ද පුරෝගාමීහු වූවෝ යුරෝපීය විද්වත්හු ය. එසේ වුව ද, පසුගිය දශකයන් කිහිපය තුළ වැඩි වැඩියෙන් ඉන්දියානු විද්වතුන් මෙම අධ්‍යයන ක්ෂෙත්‍රයට පිවිස නොනස්නා සේවයක් කොට ඇත. බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ සහ ඉන්දියානු කෞතුකාගාර කිහිපයක තැන්පත් කොට ඇති කාසි පිළිබඳ සවිස්තර ලේඛන ඇතුළත් ඉන්දියානු කාසි පිළිබඳ ප්‍රමාණ ග්‍රන්ථ රාශියක් ඉංග්‍රිසි භාෂාවෙන් පළ වී ඇතත්, මා දන්නා තරමින් මෙම විෂයය ගැන සංක්ෂෙපයෙන් වුව ද, ලියා ඇති සිංහල පොතක් නොමැත. එහෙයින් මේ පිළිබඳව සිංහලෙන් පොතක් සැපයීමට ආචාර්ය ප්‍රේමතිලක ගෙන ඇති උත්සාහය ප්‍රශංසාර්හය.

ආචාර්ය ප්‍රේමතිලකගේ අත් පිටපත මම පරීක්ෂා කර බැලීමි. විශ්ව විද්‍යාලයයේ ශිෂ්‍යයන්හට මෙම විෂය ඉගැන්වීමෙහි ආචාර්ය ප්‍රේමතිලක හට මහා පළපුරුද්දක් ඇති හෙයින්, විශ්ව විද්‍යාලයීය පරීක්ෂණයන් සඳහා ඉන්දියානු පුරාවිද්‍යාව හා ඉතිහාසය හදරන ශිෂ්‍යයන්ට මෙම පොත ඉතා ප්‍රයෝජනවත් විය යුතුය. මෙම ප්‍රකාශනය සියලු අතින් ම සාර්ථක වේවා යි උදක් පතමි.

සෙනරත් පරණවිතාන

14 A පිටර්ස් පෙදෙස,
නුගේගොඩ.

විමර්ශන අංශය

# පටුන


පරිච්ඡේදය — පිට

පොත ගැන ... vii

පෙරවදන ... ix

1. ආරම්භය: බඩු හුවමාරුව – වටිනාකම් ඒකක – මුදල් භාවිතය – කාසි – සම්මත බර – සම්මත සටහන් – ''ඉන්ගොට්'' හා ''බෙන්ට් – බාර්'' කාසි – බර මිමි – ''පුරාණ'' හෙවත් හස් යෙදු කාසි – කාල නිර්ණය – නිෂ්පාදන ක්‍රම – ලෝහ වර්ග. ... ... ... 1–7

2. ''පුරාණ'' කාසි: හැඳින්වීම – නිෂ්පාදන ක්‍රමය – අභිමුඛය හා ප්‍රතිමුඛය – ව්‍යාප්තිය හා විකාශය – නිකුත් කළ අය – බර ප්‍රමාණ හා ප්‍රභේද – හස් සලකුණු. ... ... ... 8–12

3. ඉන්දු – ග්‍රීක කාසි: හැඳින්වීම – ඉන්දු – ග්‍රීක පෙළපත් – කාසි සැලැස්ම – කාසි පාඨ – අභිමුඛය – රජ රූ දැක්වීම – ප්‍රතිමුඛය – දේවතා රූප – අක්ෂර සංයුක්ත යෙදීම. ... ... ... 13–17

4. ශක – පහ්ලව කාසි: ශක හා පහ්ලව ආක්‍රමණ – මොආස් හා වොනොනීස් – පළමුවන අසීස් – අසිලිසිස් – දෙවන අසීස් – පහ්ලව පාලනය – ගොණ්ඩෝපාරීස් – ශක – කුෂාණ සබඳතා – ශක කාසි – අශ්වාරෝහක රජ රුව – දේවතා රූප – ඉන්දු – ග්‍රීක බලපෑම – කාසි පාඨ – වොනොනීස් පෙළපතේ පාලකයන්ගේ කාසි – පහ්ලව කාසි – රාජ ශීර්ෂය යෙදීම – දේවතා රූප – කාසි පාඨ. ... 18–22

5. කුෂාණ කාසි: හැඳින්වීම – යුඒ – චි වරු – කැඩ්ෆිසීස් පරපුර – හර්මියස් හා කුජුල කැඩ්ෆිසීස් – කුෂාණ බලය තහවුරු වීම – ඉන්දීය ආභාසය – මුල් කුෂාණ කාසි – රන් කාසි – රෝම බලපෑම – කාසිවල වටිනාකම් – අභිමුඛය – රජ රුව යෙදීම – ප්‍රතිමුඛය – දේවතා රූප – කාසි පාඨ – සංකේත. ... ... ... ... ... 23–26

6. ක්ෂත්‍රප කාසි: හැඳින්වීම – ''ක්ෂත්‍රප'' නාමය හා නිලය – ක්ෂත්‍රප ඉතිහාසය – මථුරා ක්ෂත්‍රපවරු – බටහිර ක්ෂත්‍රපවරු – ක්ෂහරාත පෙළපත – රිදී කාසි – චෂ්ටන පෙළපත – රුද්‍රදමන් හා අනන්තරාගාමිකයෝ – දෙවැනි රුද්‍රසිංහ හා අනන්තරාගාමිකයෝ – ගුප්ත ආක්‍රමණය – ක්ෂත්‍රප කාසි – රාජුවුලගේ කාසි – ෂොඩාස හා අනන්තරාගාමිකයන්ගේ කාසි – භූමකගේ කාසි – නහපානගේ කාසි – චෂ්ටන වංශිකයන්ගේ කාසි – චෂ්ටනගේ කාසි – කාසි පාඨ – ජීවදමන්ගේ කාසි – වර්ෂය දැක්වීම – ඊශ්වරදත්තගේ කාසි – ලෝහ වර්ග – කාසි ප්‍රභේද. ... ... ... 27–38

7. ගෝත්‍රික කාසි: දේශපාලන ඉතිහාසය – යෞධෙය – මාලව කාසි – ආර්ජුනායන කාසි – ඒවායේ ප්‍රභේද – උජ්ජයිනී කාසි – ඒරාන් කාසි – ඖදුම්බර කාසි – ඒවායේ ප්‍රභේද – පාඨ – කෞශාම්බි කාසි – ඒවායේ රූප සටහන් – කාල නිර්ණය – තක්ෂශිලා කාසි ප්‍රභේද – පාඨ – රූප සටහන් – කාල නිර්ණය – පඤ්චාල කාසි – ඒවා නිකුත් කළ අය – මාලව කාසි – ආර්ජුනායන යෞධෙය සම්බන්ධතා – කාසි ප්‍රභෙද – කාසි පාඨ – යෞධෙය කාසි – කාසි ප්‍රභේද – කුෂාණ බලපෑම – ප්‍රධාන කාසි වර්ග. ... ... ... ... ... 39–47

8. ආන්ධ්‍ර කාසි: හැඳින්වීම – ලෝහ වර්ග – කාසි නාම – සංකේත සටහන් – පර්වත සංකේතය – යුග්ම සංකේත – ප්‍රාදේශික ප්‍රභේද, – රජ රුව දැක්වීම – කාසි පාඨ – පාලක නාම යෙදීම. ... ... 48–51

9. ත්‍රෛකූටක හා බොධි කාසි: ත්‍රෛකූටක දේශපාලන ඉතිහාසය – කාසි – බටහිර ක්ෂත්‍රප බලපෑම – රජවරු – ධරසේනගේ කාසි – ඒවායේ ප්‍රභේද – ව්‍යාඝ්‍රසේන ගේ කාසි – බොධි කාසි – මූලාශ්‍ර – කාල නිර්ණය – කාසිවලින් දත හැකි පාලකවරු. ... ... ... 54–25

10. ගුප්ත කාසි: හැඳින්වීම – දේශපාලන ඉතිහාසය – පරපුරෙහි ආරම්භය – පළමුවැනි චන්ද්‍රගුප්ත – සමුද්‍ර ගුප්ත – දෙවැනි චන්ද්‍රගුප්ත – කුමාරගුප්ත – ස්කන්දගුප්ත – අවනතිය – ගුප්ත කාසි – බලපෑම් – ලෝහ වර්ග – රන් කාසි – පළමුවැනි චන්ද්‍රගුප්තගේ කාසි – රාජ-රාජනී වර්ගය – මතභේද – සමුද්‍ර ගුප්තගේ කාසි වර්ග – දණ්ඩධර වර්ගය – ධනුර්ධර වර්ගය – පරශු වර්ගය – ව්‍යාඝ්‍රපරාක්‍රම වර්ගය – වීණා වාදක වර්ගය – අශ්වමෙධ වර්ගය – ''කාච'' කාසි – දෙවැනි චන්ද්‍රගුප්තගේ කාසි වර්ග – දණ්ඩධර වර්ගය – ධනුර්ධර වර්ගය – සිංහවික්‍රම වර්ගය – ඡත්‍ර වර්ගය – අශ්වාරෝහක වර්ගය – සයන වර්ගය – චක්‍රවික්‍රම වර්ගය – රාජ-රාජිනී වර්ගය – දෙවැනි චන්ද්‍රගුප්තගේ රිදී කාසි – දෙවැනි චන්ද්‍රගුප්තගේ තඹ කාසි – ඡත්‍ර වර්ගය – රාජරූප වර්ගය – ධනුර්ධර වර්ගය — රාජශීර්ෂ වර්ගය – අනුකොටස් – චක්‍ර වර්ගය – ඝට වර්ගය – රාමගුප්ත ගේ කාසි – පළමුවන කුමාරගුප්තගේ රන් කාසි – නව කාසි වර්ග – ධනුර්ධර වර්ගය – ස්වාධීන ලක්ෂණ – අශ්වාරෝහක වර්ගය – අනුකොටස් – ඛඩ්ගධර වර්ගය – සිංහවික්‍රම වර්ගය – අනුකොටස් – ව්‍යාඝ්‍රපරාක්‍රම වර්ගය – හස්ත්‍යාරොහක වර්ගය – හස්ත්‍යාරොහක - සිංහහන්තා වර්ගය – බවගාත්‍රාතා වර්ගය – අශ්වමෙධ වර්ගය – කාර්තිකෙය වර්ගය – ඡත්‍ර වර්ගය – අප්‍රතිඝ වර්ගය – වීණාවාදක වර්ගය – රාජ-රාජිනී වර්ගය – ගරුඩ වර්ගය – පළමුවන කුමාරගුප්තගේ රිදී කාසි – බටහිර ඉන්දීය ප්‍රදේශවල රිදී කාසි – වර්ගී කරණය – මධ්‍ය දේශයේ රිදී කාසි – රිදී ආලේප කරන ලද තඹ කාසි – තඹ කාසි – ඡත්‍ර වර්ගය – ධනුර්ධර වර්ගය – රාජ-ලක්ෂ්මී (රාජිනී ?) වර්ගය – මතභේද – ඡත්‍ර වර්ගය – අශ්වාරොහක වර්ගය – ස්කන්දගුප්තගේ රිදී කාසි – බටහිර ඉන්දීය ප්‍රදේශවල කාසි – වෘෂභ වර්ගය – පූජාසන වර්ගය – මධ්‍ය දේශයේ කාසි – ස්කන්දගුප්ත අනන්තරාගමිකයන්ගේ කාසි – බුඩගුප්ත – ඝටොත්කචගුප්තගේ කාසි – නරසිංහගුප්තගේ කාසි – දෙවැනි කුමාරගුප්තගේ කාසි – බුඩගුප්ත ගේ කාසි – විෂ්ණුගුප්තගේ කාසි – වෛන්‍යගුප්තගේ කාසි – ප්‍රකාශාදිත්‍ය කාසි – ගුප්ත කාසිවල යෙදෙන සංකේත හරිකාන්තගේ කාසි – ජය ගුප්තගේ කාසි – වීරසේකරගේ කාසි – සමාචරදේවගේ කාසි – ශශාංකගේ කාසි – ජයනාග ප්‍රකාණ්ඩයශස්ගේ කාසි – ගුප්ත ආභාසය ලත් කාසි – හිමරාජගේ කාසි – හරිගුප්තගේ කාසි. 55–94

ගැටපද විවරණය ... ... ... ... ... 95–97

ග්‍රන්ථ ලෙඛනය ... ... ... ... ... 98

චිත්‍ර නාමාවලිය ... ... ... ... ... 100–104

සූචිය ... ... ... ... ... 105–109



1 2 3 4 5 6 7
8 9 10 11 12 13 14
15 16 17 18 19 20 21
22 23 24 25 26 27 28
29 30 31 32 33 34 35
36 37 38 39 40 41 42
43 44 45 46 47 48 49
50 51 52 53 54 55 56
57 58 59 60 61 62 63
64 65 66 67 68 69 70
71 72 73 74 75 76 77




1
2
3
4
5
6
7
8
9
10


1
2
3
4
5
6


1
2
3
4
5
6
7
8


1
2
3
4
5
6
7
8
9
10
11
12

වැලිගම
මහජන පුස්තකාලය.

# 1 ආරම්භය

ප්‍රාථමික මිනිසා ක්‍රමයෙන් ශිෂ්ට වත් ම, සිය දෛනික අවශ්‍යතා පිරිමසා ගැනීම සඳහා උනුන් අතර ගනුදෙනු කිරීමේ පුරුද්ද ඇති වන්නට විය. සියලු ජන කොට්ඨාසයන් අතර ම වාගේ මුල් ම අවස්ථාවේ දී මේ සඳහා භාවිත වූයේ බඩු හුවමාරු කර ගැනීමේ සිරිතයි. වර්තමානයේ වුව ද, ශිෂ්ටාචාරය අතින් ප්‍රාථමික අවදියක ජීවත් වන වැද්දන්, පිග්මිවරුන් ආදී ම්ලේච්ඡ මිනිස් කොට්ඨාසයන් අතර මේ ක්‍රමය ම ගනුදෙනු සඳහා යෙදෙන බව පෙනෙයි.

මුල් යුගවල දී බඩු හුවමාරු කිරීම ආරම්භ වූයේ ගොත්‍රයන් අතර ය. තැනින් තැන ඇවිදිමින් ජීවත්වූ මිනිසුන් යම් යම් ස්ථානවල නියත වාසයන් ඇති කර ගැනීමෙන් පසු මේ අවශ්‍යතාව තවත් වැඩි විය. සමාජය දියුණු වත් ම මේ පුරුද්ද පුළුල් විය. ඉන්දියාවේ වුසුවන් අතර ද ප්‍රාථමික සමාජයෙහි ආදියෙහි සිට ම බඩු ගනුදෙනු කිරීම පැවැති බව පෙනේ, හරප්පාවෙන් පාද ගන්නාලද එක්තරා ගොඩනැගිල්ලක නටබුන් ගැන සිය අදහස් පළ කරන ජෝන් මාර්ෂල් එහි සැලැස්ම ක්‍රීට දූපතේ ඇති ගබඩා කාමර සහිත මාලිග ගොඩනැගිලිවල සැලැස්මට සමාන බවත්, ලෝහමය කාසි භාවිතය ආරම්භ වීමට පෙර බඩු හුවමාරු කිරීමේ ක්‍රමය පවතිද්දී, නොයෙකුත් භාණ්ඩ එක් රැස් කොට තැබීම පිණිස මෙවැනි ගබඩා කාමර අවශ්‍ය වූ බවත්, පෙන්වා දී ඇත. වෛදික යුගයේ දී ද, ත්‍යාග වශයෙන් හා ගනුදෙනු වශයෙන් විවිධ භාණ්ඩ හුවමාරු කර ගැනීමේ සිරිත ප්‍රචලිත ව පැවැති බව පෙනේ. කාසි භාවිතය ආරම්භ වූවායින් පසුව ද, කාසින් සමඟ ම බඩු හුවමාරු කර ගැනීම පැවැති බව ජාතක කථා ආදි පැරණි සාහිත්‍යමය මූලාශ්‍රයන්ගෙන් පැහැදිලි වේ. ගෞතම හා වශිෂ්ඨ නීති ග්‍රන්ථයන්හි කාසි පරිහරණය අකැප හෙයින්, භික්ෂූන් සඳහා මේ ක්‍රමය අනුදැන තිබුණු බව කියැවේ. කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයෙහි දැක්වෙන පරිදි, කොෂ්ටාගාරාධිපති විසින් භාණ්ඩ පරිහරණය හෙවත් බඩු හුවමාරු කිරීම පාලනය කරන ලදි. වර්තමානයෙහි භාවිත වන "භාණ්ඩාගාරය" යන පදයෙන් ද ආදියෙහි හුවමාරු කර ගැනීම සඳහා භාණ්ඩ තැන්පත් කළ ස්ථානයට අර්ථාන්විත ව දෙන ලද නාමයක අදහස ලැබෙන බව පෙනේ. කාසි භාවිතය අතිශයින් ප්‍රචලිත ව ඇති මේ යුගයේ පවා ඉන්දියාවේ ඇතැම් ප්‍රදේශයන්හි මුදල් වෙනුවට ධාන්‍ය ආදි දේ හුවමාරු කර ගැනීමෙන් ගනුදෙනු කරන්නෝ වෙති.

කෙසේවුව ද, බඩු හුවමාරු කර ගැනීම පවත්නා සමයේ දී වුව ද, යම් යම් ගනුදෙනුවල දී එක්තරා වටිනාකම් ඒකකයක් (standard of value) භාවිත කිරීමේ පුරුද්දක් වූ බව පෙනේ. මේ අනුව වනචාරී යුගයේ දී මිනිසා ආයුධ හා සම් වර්ග ද, සංචාරී (nomadic) යුගයේ දී ගව, එළු, බැටලු, අශ්ව ආදී සතුන් ද, කෘෂක (agricultural) යුගයේ දී ධාන්‍ය, ගෘහ හා ලෝහ වර්ග ද වටිනාකම් ඒකකයන් ලෙස සිය බඩු හුවමාරු කිරීමේ දී භාවිත කළේ ය. මෙසේ ගනුදෙනු කිරීමේ දී දෙපක්ෂයට තමන්ට වුවමනා කරන දෙය කෙතෙක් අගී ද යන්නත්, තමන්ට දිය හැකි දෙය කවර වටිනාකමකින් යුක්ත ද යන්නත් පහසුවෙන් සලකා ගත හැකි විය.

ඍග් වේදය ප්‍රධාන කොට ඇති වෛදික සාහිත්‍යයේ ද, පශ්චාත් කාලීන බ්‍රාහ්මණ ග්‍රන්ථයන්හි ද, මෙසේ බඩු හුවමාරු කර ගැනීමේ පහසුව සඳහා යොද ගන්නා ලද වටිනාකම් ඒකකයන් පිළිබඳ කරුණු දක්නට ලැබෙයි. ඉන්දියාවේ භාවිත වුණු මෙම ඒකකයන් අතර ගවයා ප්‍රධාන විය. මේ අතර වටිනාකමෙන් අඩු ඒකකයන් වශයෙන් සිප්පි කටු, පබළු, පිහි ආදියත්, ලෝහ වර්ග ගැන දැන ගැනීමෙන් පසු ව, යකඩ හා තඹ පොලුත් ඒ සඳහා භාවිත විය. වෛදික ආර්යයන් අතර උසස් ම පානය සකසා ගැනීම සඳහා යොද ගත් අමු ද්‍රව්‍යය වූ සෝම පැළෑටිය, ඉන්ද්‍ර වැනි

දෙවි වරුන්ගේ රූප ආදිය අගය කරන ලද්දේ ගවයා ඒකකයක් ලෙස සැලකීමෙනි. ඓතරෙය බ්‍රාහ්මණයෙහි තැනෙක ගවයා උසස් ම ධන සම්පත වශයෙන් හැඳින්වෙයි. කෙසේ වුව ද, පශ්චාත්-වේද යුගයේ දී ගවයා විනිමය මාධ්‍යයක් (source of wealth) වශයෙන් සලකන ලද නමුදු, ප්‍රචලිත මාධ්‍යය වූයේ රත්රන් වැනි ලෝහ වර්ග බව නිගමනය කිරීමට සාක්ෂ්‍ය ඇත.

මේ අයුරින් රන්, රිදී වැනි අගනා ලෝහ වර්ග ගනුදෙනු සඳහා භාවිතයට පත් වීමෙන් ''මුදල්'' භාවිතය තවත් පියවරක් ඉදිරියට ගමන් ගත් බව පෙනේ. ඍග්වේද යුගයේ දී ගනුදෙනු ගැන වාර්තා කෙරෙන තැන්හි ''නිෂ්ක'' යන පදය නිතර භාවිත කර තිබෙනු දක්නට ලැබීම කාසි ව්‍යවහාරයේ ආරම්භය පිළිබඳ ව තතු සොයන අයකුට ඉතා වැදගත් කරුණකි. ''නිෂ්ක'' යන පදයෙන් මුල දී රනින් කරන ලද ග්‍රීවාභරණයක් හඳුන්වනු ලැබිණි. පසුව එය වටිනාකම් ඒකකයක් ලෙස ද, රන් කාසියක් ලෙස ද, ගණන් ගත් බව යි පෙනෙන්නේ. ඍග් වේදයෙහි සඳහන් වන එක් කියමනක් මෙහි ලා වැදගත් වේ. ගායකයෙක් එහි දී නිෂ්ක සියයක් හා අශ්වයන් සියයක් ලැබීම ගැන ප්‍රීතිය පළ කරයි. ඔහුට නිෂ්කයන් ආභරණ වශයෙන් වැදගත් නොවී ය. නිෂ්කය මුල දී විනිමය මාධ්‍යයක් වූ පසු ද, ග්‍රීවාභරණයේ ආකෘතිය ම ගත් බවක් ද සිතන්නට ඉඩ තිබේ. ග්‍රීකයන් විසින් ගවයාට සමාන වටිනාකමෙන් යුත් කාසි සාද එ පමණකින් සෑහීමට පත් නොවී, ගව හිස දක්වන සලකුණක් ද එහි ඔබ්බවන ලදි. එමෙන් ම ඒ කාසි හඳුන්වන ලද්දේ ''වෘෂභ'' (oxen) නමිනි. මේ ආකාරයෙන් ම, වෛදික සාහිත්‍යයේ නිතර සඳහන් වන නිෂ්කය ද නියම බරකින්, නියම ප්‍රමාණයකින් හා නියත ආකෘතියකින් යුක්ත වූ කාසි ඒකකයක් බවට පත් වන්නට ඇතැයි සිතන්නට ඉඩ ඇත. මෙසේ සම්මත ඒකකයක් (ගවයකු, ආභරණයක් වැනි වස්තුවක්) වෙනුවට එහි වටිනාකමට සරිලන ලෝහ ප්‍රමාණයක් ගනුදෙනු කිරීමේ මාධ්‍යයක් වශයෙන් යොදා ගැනීමේ සිරිත කාසි ව්‍යවහාරය ඇති වන්නට පෙර, මුදල් පිළිබඳ අදහස විකාශනයට පත් වීමේ දී ඉතා වැදගත් කොට සැලකිය යුතු අවස්ථාවක් හා සන්ධි ස්ථානයක් ලෙස හැඳින්වීම නිවැරදි ය. මෙසේ ගනුදෙනු සඳහා වටිනාකම් ඒකකයක් ලෙස නියමිත ආකෘතියක්, බරක් හා ප්‍රමාණයක් ඇති වටිනා ලෝහ වර්ග භාවිතය මෙන් ම, ඉන්දියාවේ මුදල් වෙනුවට රන්සුණු භාවිතය ද පැවතිණි. ක්‍රි. පූ. හයවන හා හතරවන ශත වර්ෂයන් අතර කාලය තුළ ඉන්දියාවේ ප්‍රදේශයක් ඇකිමිනියානු අධිරාජ්‍යයේ කොටසක් ව පවතිද්දී, වාර්ෂික ව බදු වශයෙන් රන්සුණු තලෙන්තු (talents) (-තලෙන්තුවක් බරින් රාත්තල් 84 ක් පමණ විය.) 360 ක් ගෙවන ලද බව හෙරොඩෝටස් නම් ග්‍රීක ලේඛකයා සඳහන් කොට තිබේ. පැරණි ඉන්දියාවේ මුදල් වශයෙන් බර ප්‍රමාණයෙන් මනින ලද රන්සුණු භාවිත වූ බවක් මින් පෙනේ. මෙසේ රන් හා රිදී ද අනෙක් ලෝහ වර්ග ද ප්‍රමාණය අනුව නියම කරන ලද අගය සඳහා ගනුදෙනුවල දී ව්‍යවහාර කිරීමේ සිරිත කල් යාමේ දී තවත් වෙනස් ව විකාශනයට පත් වීමෙන් විශාල ලෝහ ප්‍රමාණයන් හා ලෝහ දඬු වෙනුවට කුඩා ලෝහ කැබැලි භාවිත කිරීමේ ක්‍රමයක් බවට පෙරළිණි.

මේ සඳහා වැඩි වශයෙන් භාවිත වූයේ නියමිත ප්‍රමාණයෙන් මැන ගත් රත්රන් බව පෙනේ. මීට නිදසුනක් ලෙස පැරණි සංස්කෘත ලේඛකයන් ''සුවර්ණ'' යන්නෙන් හඳුන්වන ලද්දේ, මනාව වැඩුණු එළ දෙනකගේ අගය බර ප්‍රමාණය අනුව සලකා, ඒ වටිනාකමට සමාන වූ රත්රන් ප්‍රමාණය වූ බව දක්වන්නට පුළුවන. වේද සාහිත්‍යයෙහි සඳහන් කෙරෙන ''හිරණ්‍ය-පිණ්ඩ'' මෙසේ කිසියම් වටිනාකමක් අනුව සම්මුතියෙන් ගනුදෙනු සඳහා ව්‍යවහාරයට ගන්නා ලද රත්රන් කැටි වන්නට පුළුවන. පසු අවස්ථාවක ලෝහ කැබැලි යම් යම් ප්‍රමාණ හා බර අනුව සම්මත කර තනා ගෙන ඒවාට ද මුල දී බර ප්‍රමාණයන් හැඳින්වීම සඳහා යොද ගත් නාමයෝ ම භාවිත කැරුණහ. මේ අනුව, පුරාතන ඉන්දියාවේ නිෂ්ක, සුවර්ණ, ශතමාන, මාෂක, කාර්ෂාපණ හා කෘෂ්ණල යනුවෙන් ප්‍රධාන බර මිම් ඒකක හයක් භාවිත විය. මේවා අතර පැරණි ම ඒකකය ලෙස සලකනු ලබන්නේ නිෂ්කය යි. එය රනින් කළ ''කාසියක'' (මුදල් ඒකකයක)නම ද විය. මනු හා යාඥවල්ක්‍ය සඳහන් කරන පරිදි, නිෂ්කයක සාමාන්‍ය බර රති 320 ක් පමණ (වර්තමාන මිම්වලින් දක්වතොත් ග්‍රෙන් 560 ක් පමණ) වෙයි. රිදී ශතමානය ද මීට සමාන බර ප්‍රමාණයකින් යුක්ත විය. ශතපථ බ්‍රාහ්මණයෙහි රන් ශතමාන ගැන ද සඳහන් වෙයි. මුල දී පිළිගෙන තුබුණු බර ප්‍රමාණයනට වඩා කුඩා ඒකකයන් පසු කලෙක මේ සඳහා පිළිගනු ලැබිණි. මේ හේතුවෙන් ග්‍රෙන් 5·6 ක් බර වූ මාන වෙනුවට අනතුරු අවදියක දී ග්‍රෙන් 1·8 ක් බර වූ කෘෂ්ණල භාවිතය වඩා ප්‍රචලිත විය.

කල් යාමේ දී වටිනාකමට සරිලන ලෝහ ප්‍රමාණයන් ගනුදෙනු සඳහා යොද ගැනීමේ මූලික සිරිත වඩාත් විධිමත් කර ගැන්ම සඳහා, නියමිත බර ප්‍රමාණයෙන් යුත් ලෝහ කැබැල්ලෙක එය සම්මතයෙන් යොද ගන්නා ලද මාධ්‍යයක් බව දක්වීමට කිසියම් සම්මත සටහනක් යොද ගැනීමේ චාරිත්‍රය ආරම්භ විය. ඉන්දියාවේ මේ ආකාරයට නිපදවා ගන්නා ලද මුල් ම කාසි ලෙස සැලැකිය හැක්කේ රිදී ''ඉන්ගොට්'' (ingot - අච්චුවක වත් කළ ලෝහ කැටි) කාසි හා ඊට වඩා තරමක් බරින් වැඩි රිදී ''බෙන්ට්-බාර්'' (bent – bar) කාසිත් ය. ''ඉන්ගොට්'' කාසිවල වෘත්තාකාර කුඩා තිත් තුනක් ද, ''බෙන්ට්-බාර්'' කාසිවල එක පැත්තක මුද්‍රා භාවිත-යෙන් ඔබ්බන ලද සලකුණු කිහිපයක් ද යෙදී තිබෙනු දක්නට ලැබෙයි (චිත්‍ර I, 1-3; III, 1-2). මෙම රිදී ''බෙන්ට්-බාර්'' කාසි ශතපථ බ්‍රාහ්මණයේ හා අනා පැරණි සංස්කෘත ග්‍රන්ථයන්හි සඳහන් වන ''ශතමාන'' නම් කාසි වර්ගය දැයි ඇතැම් නාණක ශාස්ත්‍රඥයෝ සැක කරත්. ඒ කෙසේ වුව ද, පුරා විද්‍යා සාධක අනුව දැනට හමු වී තිබෙන ඉන්දීය කාසි අතර පැරණි ම ඒවා ලෙස ගිණිය හැක්කේ මේ ''බෙන්ට්-බාර්'' හා ''ඉන්ගොට්'' කාසි ය. මේවා ක්‍රි. පූ. 600 පමණ ඈත සමයකට අයත් වෙතැයි සී. ජේ. බ්‍රවුන් කල්පනා කරයි. මේ කාසි ලැබී ඇති සංඛ්‍යාව ද, ඒවා ලැබී ඇති ස්ථාන ගණන ද ඉතා අල්ප ය. එයින් මේවා දිගු කලක් තිස්සේ සුලභ වශයෙන් ව්‍යවහාරයට පත් වෙමින් පුළුල් ප්‍රදේශයක ව්‍යාප්තියට පත් ව නොතිබුණු බව නිගමනය කරන්නට ඉඩ ඇත.

හැම රටක ම වාගේ භාවිතයට පත් වූ බර ප්‍රමාණයන් සකස් කරගන්නා ලද්දේ ඒ ඒ රටවල සුලභව ලැබෙන බීජ වර්ග වැනි ස්වාභාවික වස්තූන් ආශ්‍රය කොට ගෙනයි. ඉන්දීය කාසිවලද බර මිනුම් සඳහා යොද ගන්නා ලද්දේ රාක්තික (රති), බාර්ලි, මාෂ, ගුඤ්ජා, කාර්ෂා වැනි බීජ වර්ග ආශ්‍රයෙන් සකස් කර ගන්නා ලද බර මිනුම් ක්‍රමයකි. කෘෂ්ණලයත් ගුඤ්ජාවත් එක සමාන බරින් යුක්ත විය. සුවර්ණ, මාෂ හා කර්ෂාපණ රති භාවිතයෙන් මනින ලද්දේ ය. (සුවර්ණ 1 = රති 80, රිදී මාෂ 1 = රති 2, රන් මාෂ 1 = රති 5, තඹ කර්ෂාපණ 1 = රති 80 යනාදි වශයෙනි). ඒ ඒ කාසි වර්ග පිළිබඳ ව විස්තර සහිතව හදරන විට, මෙම මිනුම් ක්‍රම කාසි නිෂ්පාදනයේ දී කෙතරම් දුරට උපයෝගී විණි දැයි වැඩි දුරටත් සලකා බලන්නට අවස්ථාව ලැබෙනු ඇත.

ඉහත සඳහන් කරන ලද පැරණි ම ඉන්දීය ''කාසි'' යනුවෙන් හඳුන්වා දිය හැකි රිදී ''ඉන්ගොට්'' කාසි හා ''බෙන්ට්-බාර්'' කාසි සමග ම එකට හමු වී ඇති, ඒවාට වඩා සුලභ නවත් කාසි වර්ගයක් වේ. ඒවා නම් ''පුරාණ'' හෙවත් ''ධරණ'' ය. මේවා අපරදිග නාණකවිද්‍යාඥයන් විසින් ''හස් යෙදූ කාසි'' (punch-marked coins) යන නාමයෙන් හඳුන්වනු ලැබේ. ඉන්දියාවේ කාසි ව්‍යවහාරයේ මීළඟ අවස්ථාව වූයේ මේ හස් යෙදූ කාසි භාවිතය බව කිව හැක. මෙම වර්ගත්‍රයට ම අයත් වූ කාසි සමකාලීනව එකට භාවිත කරනු ලැබූ සමයක් වූ බව ඒවා සොයා ගන්නා ලද අයුරින් පෙනී යයි. ජෝන් මාර්ෂල් විසින් තක්ෂශිලාවේ භීර් ගොඩැල්ලේ කරන ලද පුරාවිද්‍යා කැණීම්වලදී රිදී ''බෙන්ට්-බාර්'' කාසි සමඟ විවිධ ප්‍රමාණවලට අයත් හස් යෙදූ කාසි රැසක් එකට හමු වී තිබීම මේ අදහස තහවුරු කරන සාධකයකි. මෙම කාසි ලැබී ඇත්තේ භීර් ගොඩැල්ලේ ප්‍රාග්-මෞර්ය යුගයට අයත් ස්තරවලින් හෙයින්, එම සොයා ගැනීම මේ කාසි වර්ගවල කාල නිර්ණයේ දී ද, ප්‍රයෝජන වෙයි. ''ඉන්ගොට්'' හා ''බෙන්ට් -බාර්'' කාසි හැරුණු විට, ඉන්දීය කාසි වර්ග අතුරෙන් පැරණි ම කාසි විශේෂය ලෙස සැලැකිය යුත්තේ හස් යෙදූ කාසි ය.

හස් යෙදූ කාසි නිපදවා ගන්නා ලද්දේ තළා සකස් කර ගන්නා ලද රිදී තහඩු අහල් භාග-යක් පමණ පළල තීරුවලට කපා, ඊළඟට එම තීරු යළි කුඩා කැබැලිවලට කපාගෙන, පසුව, නියම බර ප්‍රමාණයට වැඩි නම්, ඒ ප්‍රමාණය අයින්වලින් කපා හැර, අවසානයේ මෙසේ සකස් කරගත් තහඩු කැබැලි මත අවශ්‍ය සංකේතයන් වෙන වෙන ම යෙදීමෙනි.

''ඉන්ගොට්'', ''බෙන්ට්-බාර්'' හා හස් යෙදූ කාසි භාවිතය කෙසේ කවරද ඇරැඹිණිද යන්න ගැන විශාරදයන් අතර විවිධ මත පවතියි. තක්ෂශිලාවේ පුරාවිද්‍යා කැණීම්වලින් ලැබී තිබෙන සාක්ෂි අනුව, මහා ඇලෙක්සැන්ඩර් රජුගේ ඉන්දියා ආක්‍රමණයට බොහෝ කලකට පෙර පටන් මේ කාසි තක්ෂශිලා ප්‍රදේශයේ භාවිතයෙහි පැවැති බව නිගමනය කළ හැකි යැයි

ජේ. ඇන්. බැනර්ජි පවසයි. මේ කැණීම්වල දී හස් යෙදූ කාසි විශාල තොගයක් සමඟ එකට තිබී ක්‍රි. පූ. 245 පමණ සමයට අයත් ඩයොඩෝටස් නම් බැක්ට්‍රියානු පාලකයාගේ කාසියක් ද හමුවීම නිසා, ක්‍රි. පූ. 3 වන ශතවර්ෂය කාලයේ දී මේ ප්‍රදේශයේ හස් යෙදූ කාසි භාවිතයේ පැවැති බව පැහැදිලිය. ක්‍රි. පූ. සිවුවැනි සිය වසෙහි ඉන්දියාව ආක්‍රමණය කළ මහා ඇලෙක්සැන්ඩර් රජුට තක්ෂශිලාවේ ස්වදේශීය පාලකයා වූ ඔම්ෆිස් (ආම්භි) රජු විසින් මුද්‍රා යෙදූ රිදී තලෙන්තු අසූවක් තෑගි කරන ලද බව ලතින් ලේඛකයකු වූ ක්වින්ටස් කර්ටියස් වාර්තා කර ඇත. මේ, ඒ සමය වන විට මෙම ප්‍රදේශයෙහි රිදී කාසි ව්‍යවහාරයෙහි පැවැති බවට හොඳ සාධකයකි.

ඉන්දීය කාසි ගැන පර්යේෂණ පැවැත්වූවන් අතර පුරෝගාමියකු වූ එච්. එච්. විල්සන් දැක්වූ අදහස් අනුව, ඉන්දියාවේ කාසි භාවිතය ප්‍රචලිත වූයේ ග්‍රීකයන්ගේ ආගමනයෙන් පසුව ය. ඉන් පෙර ඉන්දියාවේ මුදල් වශයෙන් යොදා ගන්නා ලද්දේ සටහන්වලින් තොර රන් හා රිදී කැටි බව ඔහුගේ විශ්වාසය විය. ප්‍රථම වරට බ්‍රාහ්මී අක්ෂර සාර්ථකව හඳුනා ගැනීමේ ගෞරවය හිමි කර ගත් ජේම්ස් ප්‍රින්සෙප් ද මුල දී විල්සන්ගේ ඉහත කී මතය පිළිගත් නමුදු, පසුව ඔහු ග්‍රීකාගමනයට පෙර ද ඉන්දියාවේ ස්වදේශීය රන් හා රිදී කාසි ක්‍රමයක් පැවැති බව පිළිගනිමින් තම මුල් මතය වෙනස් කර ගත්තේ ය. මෙසේ හස් යෙදූ කාසි ඉන්දියාවේ ග්‍රීකයන්ගේ පැමිණීමට පෙර සිට ම භාවිත වූ නමුදු, නියම වශයෙන් මුද්‍රිත කාසි (die-struck coins) තැනීමේ ක්‍රමය එ රටට ගෙනෙන ලද්දේ ග්‍රීකයන් විසිනැයි ඔහු අදහස් කළේය. ජෝන් ඇලන් කියන්නේ ඉන්දියාවේ මුල් ම කාසිවලට බලපෑම් ලැබුණේ ග්‍රීක කාසිවලින් නොව ඇකිමීනිය අධිරාජ්‍යයේ ''සිග්ලොයි (sigloi) කාසිවලින් බවයි. මෙම ''සිග්ලෝයි'' කාසි ක්‍රි. පූ. 5 වැනි සිය වසේ අවසාන භාගයේ දී හෝ හතර වැන්නේ මුල් භාගයේ දී හෝ භාවිත වූ කාසි විශේෂයක් විය. මෙසේ මුල් ඉන්දීය කාසිවලට ඇකිමීනියානු අධිරාජ්‍යයේ කාසි නිෂ්පාදන ශිල්ප ක්‍රමයේ බලපෑම හා ''සිග්ලෝයි'' කාසිවල ආදර්ශය ලැබුණ ද, හස් යෙදූ කාසිවල දක්නට ලැබෙන ස්වරූපය සම්පූර්ණයෙන් ම ඉන්දීය වූවකැයි ජෝන් ඇලන් තව දුරටත් ප්‍රකාශ කරයි.

ක්‍රි. පූ. හයවැනි සියවසේ දී ඉන්දියාව හා බටහිර ආසියාතික ප්‍රදේශ අතර මුහුදු මඟින් වෙළෙඳ සම්බන්ධතා ආරම්භ වූවාට පසු, බැබිලෝනියානු මූලාදර්ශ අනුගමනයෙන් ඉන්දියාවේ ප්‍රථම වරට හස් යෙදූ කාසි නිපදවන ලද බවට ජේ. කෙනඩි අදහසක් ඉදිරිපත් කරයි. මීට බෙහෙවින් සමාන මතයක් දක්වන වින්සන්ට් ඒ. ස්මිත් පවසන්නේ ක්‍රි. පූ. හත්වන සියවසේ පමණ විදේශයන් හා මුහුදු මඟින් වෙළෙඳ සබඳතා ඇරැඹුණු පසු, අක්ෂර ශිල්පයත් සමඟ ම ලෝහ කාසි භාවිතයත් ඉන්දියයන් විසින් පටන් ගන්නා ලද බවයි. මෙසේ පැවැසුව ද, ස්මිත් කල්කටාවේ ඉන්දීය කෞතුකාගාරය සතු පැරැණි ඉන්දීය කාසි වර්ග කොට ඒවායේ විස්තර සංග්‍රහය සැකැසීමේ දී රිදී ''බෙන්ට්-බාර්'' කාසි ක්‍රි. පූ. 500-600 සමයට වඩා පැරණි නො වෙතැයි සඳහන් කර තිබේ. පැරැණි ම ඉන්දීය කාසි ගැන එඩ්වර්ඩ් තොමස්, ඊ. ජේ. රැප්සන් යන විශාරදයන් දරන අදහස නම්, ඒවා විදේශීය ආභාසයෙන් තොරව, ස්වාධීනව ඉන්දියාවේ ම ප්‍රභවය ලැබ විකාශනයට පත් වූ බවයි. පැරැණිතම ඉන්දීය කාසි ගැන මෙබඳු ම අදහස් ඇතිව සිටි ඇලෙක්සැන්ඩර් කනින්හැම් ඒවා බුඩ කාලීනව, එනම් ක්‍රි. පූ. හය වැනි සියවස පමණ සමයෙහි, භාවිත වූවාට සැක නැතැයි පවසයි. කාසි භාවිතයේ ප්‍රාරම්භක අවස්ථාවකට අයත් වන මේවා ඔහුගේ අදහසේ හැටියට ක්‍රි. පූ. 1000 පමණ ඈත සමයකට අයත් වේ. කාසි පිළිබඳව සාහිත්‍යගත හා පුරාවිද්‍යාත්මක සාධකයන් ගැන සමාලෝචනයක යෙදෙන ඩී. ආර්. භාණ්ඩර්කර්, වෛදික යුගයේ දී මෙම කාසි මුදල් ගනුදෙනු සඳහා භාවිත කරන ලද බව නිගමනය කරයි. වෛදික යුගයේ කාල නිර්ණය අනුව ඉන්දීය කාසි පිළිබඳ ඉතිහාසයේ මුල් අවදිය ක්‍රි. පූ. තෙවන සහශ්‍රයේ මැද භාගය තෙක් දිවෙතැයි ඔහු අනුමාන වශයෙන් පවසයි. ඉහත දක්වන ලද විවිධ විශාරදයන්ගේ මත තුලනාත්මක විග්‍රහයකට භාජන කළ ඒ. ඇස්. අල්ටේකාර් ඉන්දීය හස් යෙදූ කාසිවල පූර්වතම සීමාව ලෙස ගිණිය හැකි වන්නේ ක්‍රි. පූ. 800 පමණ කාලය යැයි පෙන්වා දී ඇත. ඇලෙක්සැන්ඩර් රජු ඉන්දියාව ආක්‍රමණය කළ සමයේ දී මෙම වර්ගයේ කාසි තක්ෂශිලා ප්‍රදේශයේ හා ඒ අවට භාවිතයෙහි පැවැති බව ද, මෞර්‍ය අධිරාජ්‍ය යුගයේ දී ඔවුන්ගේ අධිරාජ්‍යයට අයත් ප්‍රදේශයන් පුරා ඒවා පැතිර ගිය බව ද, පිළිගත හැකිය. මුල් ම ඉන්දීය කාසි නිෂ්පාදන ක්‍රමය ලිඩියානු, පර්සියානු හා ග්‍රීක යන ජාතීන්ගේ පැරැණි ම කාසි නිෂ්පාදන ක්‍රමයන් හා සසඳා බලන විට, පොදු ලක්ෂණ කිසිත් දක්නට නොලැබීමෙන්, ඉන්දීය කාසි

ක්‍රමයේ සම්භවය විදේශීය බලපෑම්වලින් තොරව ඉන්දියාවේ ම සිදුවූවක් බව පෙනී යතැයි පවසන ජේ. ඇන්. බැනර්ජිගේ මතය වඩාත් ම පිළිගත හැකි අදහස ලෙස පෙනී යේ. හස් යෙදූ කාසිවල ලක්ෂණ මොනවා ද යන්න වඩාත් විස්තර සහිතව සලකා බැලීමේ දී මේ අදහස තව දුරටත් පැහැදිලි වනු ඇත.

මෙසේ මුදල් වශයෙන් භාණ්ඩ හුවමාරුව හා භාණ්ඩ වෙනුවට ලෝහ වගී භාවිත කිරීම යන ආරම්භක අවස්ථාවලින් පසු මුල් ම කාසි ක්‍රමය ඇරැඹුණු අයුරු ඉහත දැක්විණි. කල් ගත වීමේ දී සමාජයේ අවශ්‍යතා පිරිමසා ලන්නට අවශ්‍ය මුදල් හා කාසි ප්‍රමාණය ක්‍රමයෙන් අධික වන්නට විය. මේ නිසා කාසි වඩා බහුල වශයෙන් නිපැදවීම අවශ්‍ය විය. එහෙයින් මුලින් විස්තර කළ ක්‍රමයට අතිරේකව කාසි නිපැදවීම සඳහා අච්චුවක් භාවිත කිරීමේ ක්‍රමය ද ආරම්භ විය. මෙසේ අච්චු මඟින් ලෝහ භාණ්ඩ නිපදවන ශිල්පය ඉන්දියයන් අතර ඉන්දු-නිම්න ශිෂ්ටාචාර අවදියේ පටන් ම දියුණු ව තිබුණු හෙයින්, කාසි නිෂ්පාදනය සඳහා ද මෙම පහසු ක්‍රමය සකසා යොද ගැන්ම එතරම් දුෂ්කර නොවී ය. අච්චුවක වත්කොට නිපදවා ගැනීමෙන් පසු, එම කාසිවල විවිධ සලකුණු සාමාන්‍ය පරිදි හස් මඟින් යොදන ලදී. කෙසේ වුව ද, ක්‍රමයෙන් කාසියක එක එක සටහන වෙන වෙන ම යෙදීම පිණිස කිහිප වරකට හස් කිහිපයක් භාවිත කිරීමට වඩා හස් සලකුණු සියල්ල එක් වර තැබිය හැකි වන සේ එක ම මුද්‍රාවක් සකස් කරගෙන එය කාසි නිපදවීම සඳහා උපයෝගී කර ගැනීම වඩාත් පහසු කාර්‍යයක් බව පෙනී ගියේය. මේ අනුව නාණක ශිල්පීහු තමන්ට කාසියක යොදන්නට අවශ්‍ය වූ සටහන් සියල්ල එක ම මුද්‍රාවකින් ඔබ්බවන්නට පටන් ගත්හ. මේ හැරුණු විට, අච්චුවක රූප සටහන්වලින් තොර කාසිය වත්කොට සකසා ගෙන, ඒ මත හස් යොදනවාට වඩා අච්චුවෙහි ම තමන්ට අවශ්‍ය සටහන් ද යොද ගනිතොත් පහසුවෙන් කාසි නිපැදවිය හැකි යැයි පෙනී ගියාට පසු, මෙම නව ක්‍රමය යොදන්නට පටන් ගන්නා ලදි. මෙසේ උණු කළ ලෝහ වත් කිරීමෙන් කාසි නිපදවා ගැනීමට භාවිත කරන ලදැයි සැලකෙන මැටියෙන් තැනූ අච්චු කිහිපයක් මථුරා ආදි ස්ථානවලින් සොයාගෙන තිබේ (චිත්‍රය III 10). මේවා නව ක්‍රමයට කාසි නිපැදවීමේ දී නාණක ශිල්පීන් විසින් භාවිත කරන ලද බව සිතිය හැකි වුව ද, ඒ පිළිබඳ ව ද විශාරදයන් අතර මත භේද වෙයි. සමහරුන්ගේ අදහස නම් මේ මුද්‍රාවන් හස් යෙදූ කාසි සමග ව්‍යවහාරයට පත් කළ හැකි වන අයුරු හොර කාසි නිපදවා ගැනීම සඳහා යොද ගන්නා ලද ඒවා බවයි.

අලුත් ක්‍රමයට අනුව මුද්‍රාවකින් කාසිවල තමන්ට අවශ්‍ය සලකුණු සටහන් සියල්ල එක වර යොද කාසි නිපදවීම විකාශනයට පත් වූයේ අවස්ථා කිහිපයකිනි. මුල් අවදියේ දී, එක ම මුද්‍රාවක් මඟින් මෙසේ සටහන් යොදන කල කාසියෙහි ක්ෂේත්‍රයෙන් තුනෙන් දෙකක පමණ කොටසක පමණි, මුද්‍රාව හරි හැටි අවශ්‍ය පරිදි යෙදුණේ. එරාන් ප්‍රදේශයෙන් හමුවී ඇති සමහර කාසි මීට නිදසුන් ලෙස දැක්විය හැක. මුල් ම අවස්ථාවේදී මෙසේ මුද්‍රණය කරන ලද්දේ කාසියෙහි එක් පැත්තක් පමණි. මින් අනතුරුව, කිනිරයක කපන ලද මුද්‍රාවක් කාසි නිපදවීම සඳහා යොද ගැනිණි. මීළඟ අවදියක දී අභිමුඛයේ සම්පූර්ණ වශයෙන් ද, ප්‍රතිමුඛයේ කොටසක ද, මුද්‍රාව වැදෙන පරිදි කාසි නිපදවන්නට ශිල්පීන්ට පුළුවන් විය. හොඳ පළපුරුද්දක් ඇති වූවායින් අනතුරුව, මෙම ශිල්පීන්ට අභිමුඛය (obverse) සහ ප්‍රතිමුඛය (reverse) මුළුමනින් ම වැසී යන පරිදි, මුද්‍රාවන් දෙකක් යොද ගැනීමෙන් කාසි නිෂ්පාදනය කරන්නට හැකි කම ලැබිණි. ''පුරාණ'' කාසිවල යොද ගනු ලැබුයේ පැරැණි ම, එනම් කිහිප වරක දී වෙන් වෙන් වශයෙන් හස් කිහිපයක් මුද්‍රණය කිරීමේ ක්‍රමයයි. මෙම කාසි ගණයට ම වැටෙන ඇතැම් කාසියක අච්චු මඟින් කාසි නිපදවීමේ ක්‍රමය ද, කුඩා මුද්‍රාවක් භාවිතයෙන් කාසියේ කොටසක් පමණක් අසුවන සේ හස් මුද්‍රණය කිරීමේ ක්‍රමය ද, භාවිත වී තිබෙනු පෙනෙතත්, ඒ විරල වශයෙනි. ඉහත විස්තර කරන ලද වඩා දියුණු ක්‍රම තමන්ගේ කර්මාන්තයෙහි දී භාවිත කිරීමට ඉන්දිය ශිල්පීන් ඉගෙන ගන්නට ඇත්තේ විදේශිකයන්ගෙන් විය හැක. පසුව විස්තර කරනු ලැබෙන තක්ෂශිලා, පඤ්චාල, කෞශාම්බි, මථුරා ආදි ගෝත්‍රික කාසි ද, ආන්ධ්‍ර පාලකයන්ගේ කාසි ද, පසු කලෙක, හස් යෙදූ කාසිවල සටහන් හා සංකේත ම භාවිත කෙරෙමින්, එකම මුද්‍රාවක් මඟින් නව ක්‍රමයට එක් වරම මුද්‍රණය කිරීමෙන් නිපදවා ගන්නා ලද කාසි බව පෙනේ.

පැරණි ඉන්දීය කාසි අනෙක් රටවල මෙන් ම රන්, රිදී, තඹ හා වෙනත් මිශ්‍ර ලෝහ වර්ග වලින් නිපදවා ඇත. මේවා අතර ඉතා බහුල වශයෙන් දක්නට ලැබෙන්නේ තඹයෙන් සාදන ලද කාසි ය. නොයෙකුත් කලා ශිල්පයන් සඳහා ඉන්දුනිම්න ශිෂ්ටාචාරය සමයේ පටන් ම ඉන්දියානුවන් අතරේ තඹ භාවිත විය. කාසි භාවිතය ආරම්භ වුණු පසු කාසි නිෂ්පාදනය සඳහා ද මෙම ලෝහය බහුල වශයෙන් යොද ගන්නා ලදී. මේ ලෝහයෙන් කළ කාසි කෙතරම් විශාල වශයෙන් භාවිත කරන ලදුයේ ද යත්, මුල දී තඹ කාසි විශේෂයකට යොද ගන්නා ලද ''කාර්ෂාපණ'' යන නාමය පසු කලෙක ''කාසි'' යන පදයට පර්‍යාය පදයක් මෙන්, රන්, රිදී, තඹ ආදී ඕනෑම ලෝහයකින් කළ කාසියක් හඳුන්වන්නට යොදනු ලැබිණැයි ජේ. ඇන්. බැනර්ජි අදහස් කරයි.

මේ තත්ත්වය කෙසේ වෙතත්, හස් යෙදූ කාසි අතර සුලභව දක්නට ලැබෙන්නේ තඹ කාසි නොව රිදී කාසි ය. නාණක විශෙෂඥයන් මීට හේතු දක්වීමේ දී පෙන්වා දෙන්නේ ලෝහයක් වශයෙන් තඹ රිදී තරම් කල් නො පවත්නා බැවින් තඹයෙන් කරන ලද හස් යෙදූ කාසි විශාල සංඛ්‍යාවක් විනාශයට පත් ව ඇති බවයි. රිදී භාවිතය සුලභ වීමෙන් පසුව වුව ද, ඇතැම් ප්‍රදේශවල තඹ කාසි නිකුත් කිරීම වඩා ජනප්‍රියව පැවැති බව පෙනේ.

ඉන්දියාවේ ලෝහ වර්ග අතර රිදී ලැබී ඇත්තේ දුර්ලභ වශයෙනි. එරට ස්වාභාවික ඛනිජ සම්පත් අතර වඩා සුලභ වූයේ රත්රන් ය. මේ නිසා පැරණි වෙළඳෙ සම්බන්ධතාවල දී ඉන්දියාවෙන් බැහැරට රත්රන් ගෙන යාමත්, පිටතින් එරටට රිදී ගෙන ඒමත්, බහුලව කරන ලද බවට සාක්ෂි හමු වේ. ඉන්දියාවේ බරිගාසා (Barygaza), මුසිරිස්, (Muziris), නෙල්කින්ඩා (Nelcynda) වැනි ස්ථානවලට පිටතින් රිදී ආනයනය කරන ලද බව ''පෙරිප්ලස්'' ග්‍රන්ථය සඳහන් කරයි. පර්සියානු අධිරාජ්‍යය මඟින් නිකුත් කරන ලද ''සිග්ලොයි'' රිදී කාසි ද මුල් අවධියේ උතුරු ඉන්දියාවේ ප්‍රචලිතව තිබිණි.

''පුරාණ'' හෙවත් හස් යෙදූ කාසි රිදී හා තඹ යන ලෝහ ද්වයෙන් නිමවා ඇත. මේ කාසිවල ම ක්‍රමික විකාශයකින් ප්‍රභවයට පත් වී යැයි සැලැකිය හැකි අනන්තරාගමික ගොත්‍රික කාසි වර්ග ද මේ ලෝහ වර්ග දෙකින් ම නිමවන ලද ඒවා විය. මේ ගෝත්‍රික පිරිස් අතර අවන්ති, අයොධ්‍යා, එරාන්, කෞශාම්බි, මාලව, සිබි, ආර්ජුනායන, අශ්වක වැනියවුන් ස්වකීය කාසි නිපදවීම සඳහා තඹ පමණක් භාවිත කළ අතර වෘෂ්ණි, වීමක ආදිහු රිදී කාසි පමණක් නිකුත් කළහ. තක්ෂශිලා, මාගධ, ඖදුම්බර, කුණින්ද, යෞධෙය ආදීහු තඹ කාසි මෙන් ම රිදී කාසි ද නිකුත් කළහ. මොවුන් ප්‍රථමයෙන් තඹ කාසි පමණක් නිකුත් කළ බව ද, රිදී කාසි තැනීම ඉන් අනතුරුව ආරම්භ කළ බව ද, ඒ කාසි පරීක්ෂා කිරීමෙ දී පෙනී යතැයි නාණක විශාරදයෝ පවසති.

ඉන්දියාවේ රත්රන් භාවිතය ප්‍රාග් - පාෂාණ යුගය දක්වා ඇතට දිවෙයි.එසේ ම ඒ රටේ වටිනා ලෝහ අතර ඉතා සුලභ වශයෙන් ලබා ගත හැකි වූයේ ද රත්රන් බව ඉහත සඳහන් විණි. කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රයෙහි ජාම්බුනද, සාතකුම්භ, වෛනව, හාටක, ශෘංගශුක්තිජ ආදී වශයෙන් රත්තරන් පිළිබඳ ප්‍රභේද කිහිපයක් ගැන සඳහන් වෙයි. ඇකිමීනියානු අධිරාජ්‍යයේ කොටසක් ව පැවැති ඉන්දීය ප්‍රදේශ වාර්ෂික බදු වශයෙන් රන් සුණු තලෙන්තු 360 බැගින් ගෙවූ බව සඳහන් කරන හෙරොඩොටස් ගේ වාර්තාව ගැන ඉහත සඳහන් කරන ලදී. ඉන්දියාවේ නදී නිම්නවලින් ලබා ගත හැකි වූ රන් සුණු පිරිසිදු කිරීමක් අවශ්‍ය නුවූ හෙයින්, ප්‍රකෘති තත්ත්වයෙන් ම විකුණන ලද බව මෙගස්තිනස් සඳහන් කොට තිබේ. මේ රන් සුණු ඉන්දු නදිය ආදී ගංගාවන්ගේ ජලය සමඟ කඳුකර ප්‍රදේශවලින් සේදී ආ රත්රන් විය. රන් සුණු උණු කොට දඬු බවට හරවාගෙන, අනතුරුව කිසියම් බර ප්‍රමාණයක් අනුව කැබැලිවලට කපා සම්මත සලකුණක් තබා ගනුදෙනු මාධ්‍යයක් වශයෙන් ද භාවිත කරන ලදි. මේ අනුව, මේවා රිදී ''ඉන්ගොට්''-වලට සමාන වන්නට ඇත. ශතපථ බ්‍රාහ්මණයෙහි සඳහන් කෙරෙන ''ශතමාන'' නම් කාසි වර්ගය මෙවැනි ක්‍රමයකින් නිපදවා ගන්නා ලද්දේ යැයි සමහරු සලකත්. ශතමානවල හැඩය වටකුරු විය. ''නිෂ්ක'' නම් වූ ආභරණ විශෙෂය පසු කලෙක ගනුදෙනු මාධ්‍යයක් බවට පත් වූ අයුරු ඉහත විස්තර කරන ලදි. මේවා ගනුදෙනු සඳහා මාධ්‍යයක් වශයෙන් භාවිත වූ නමුත් ''නිෂ්ක'' හා ''ශතමාන'' වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම කාසි විශේෂයක් වී යැයි

පවසන්නට නුපුළුවන. රනින් කළ පැරැණි ම කාසි යැයි හැඳින්විය හැකි කාසි කිහිපයක් ලැබී ඇත්තේ තක්ශිලාවෙනි. මේවායේ යෙදෙන සලකුණ කනිංහැම් ''තක්ෂිලා සංකේතය'' යන නමින් හඳුන්වයි. රන් වටිනාකමින් අධික වූ නිසා මුල දී එම ලෝහය කාසි නිපදවීම සඳහා භාවිත නො කරන ලදැයි සිතන්නට ද ඉඩ තිබේ.

ඉන්දියාවේ මුලින් ම රන් කාසි සුලභ ලෙස භාවිතයට පත් කරන ලද්දේ ක්‍රිස්තු වර්‍ෂාරම්භයේ දී පමණ කුෂාණ පාලකයන් විසිනි. මේ සමයේ රෝමයේ සිට තොග වශයෙන් රන් කාසි ඉන්දියාවට ආනයනය කරන ලදැයි ''පෙරිප්ලස්'' ග්‍රන්ථයේ වාර්තාවෙයි. කුෂාණ රජවරුන් මෙම රෝම රන්කාසි අනුගමනය කරමින් ඉන්දියාවේ ද ප්‍රථම වරට රන්කාසි ක්‍රමයක් ආරම්භ කළ බවයි පෙනෙන්නේ. කුෂාණ පාලකයන් විසින් නිකුත් කරන ලද මෙම රන්කාසි අනුගමනය කරමින් ගුප්ත අධිරාජ්‍යයේ පාලකයෝ ක්‍රි. ව. සිවුවැනි හා පස්වැනි ශතක අතරේ දී තමන්ගේ ම රන් කාසි ක්‍රමයක් ඇති කළහ. මොවුන් විසින් සෑහෙන තරම් දීර්ඝ කාලයක් තිස්සේ ඉතා උසස් තත්ත්වයක් දරූ රන් කාසි විශාල සංඛ්‍යාවක් ව්‍යවහාරයට පත් කරන ලදි. අනතුරුව, මධ්‍ය කාලීන යුගයේ දී ගුප්ත කාසි අනුගමනයෙන් හා අනුකරණයෙන් ඉන්දීය පාලකයන් විසින් රන් කාසි නිකුත් කිරීම දිගින් දිගට පවත්වා ගෙන යන ලද නමුත්, ඒවා කලාත්මක වශයෙන් ගුප්තයන්ගේ රන් කාසි තරම් උසස් නොවී ය.

වටිනාකමින් අඩු ලෝහ අතර නිකල් සහ ඊයම් ද පැරැණි ඉන්දියානු කාසි නිපදවීම සඳහා යොදා ගන්නා ලද්දේය. යුතිඩීමෝස්, ඇගතොක්ලීස්, පැන්ටැලියන් වැනි ඉන්දු-බැක්ට්‍රියානු පාලකයන් විසින් නිකල් කාසි නිකුත් කරන ලද අතර, ඊයම් කාසි සුලභව නිකුත් කරන ලද්දේ ආන්ධ්‍ර වංශික පාලකයන් විසිනි. ඊයම් කාසි ප්‍රථම වරට ඉන්දියාවට හඳුන්වා දෙන ලද්දේ ක්‍රි.පූ. 140 දී පමණ වයඹදිග ඉන්දීය ප්‍රදේශ පාලනය කළ පළමුවැනි ස්ට්‍රේටෝ හා ඔහුගේ මුණුබුරු දෙවැනි ස්ට්‍රේටෝ විසිනි.

පිරිසිදු ලෝහ වර්ග මෙන් ම, ලෝහ වර්ග කිහිපයක් සංයෝග කර සකසා ගන්නා ලද මිශ්‍රණයන් ද කාසි නිපැදවීම සඳහා ඉන්දීය පාලකයන් විසින් භාවිත කරන ලදි. රිදී හා තඹ මිශ්‍ර කිරීමෙන් සාදා ගන්නා ලද ''බිලන්'' (billon) ලෝහය ද, තඹ, සින්ක්, ඊයම් හා ටින් මිශ්‍රණයක් වූ ''පොටින්'' (potin) ද, තඹ හා සින්ක් මිශ්‍ර කිරීමෙන් තනා ගනු ලැබෙන පිත්තල ද, මෙම මිශ්‍ර ලෝහ වර්ග අතර කාසි සඳහා භාවිත කරන ලද්දේ වේ. ''බිලන්'' හා ''පොටින්'' ලෝහයන්ගෙන් නිපැදවූ කාසි ආන්ධ්‍ර කාසි අතර ද, පිත්තල කාසි අයෝධ්‍යා, කෞශාම්බි, අවන්ති වැනි ස්ථානවලින් ද සොයා ගත හැකි වී ඇත. රඤ්ජුවුල හා ෂොඩාස යන මථුරා ක්ෂත්‍රපයන් විසින් ලෝකඩයෙන් කළ කාසි නිකුත් කොට ඇති බව පෙනේ.

## 2. ''පුරාණ'' කාසි

ක්‍රිස්තු පූර්ව අවදියේ ඉන්දියාවේ කාසි භාවිතය දැක්වෙන පුරාවිද්‍යාත්මක සාක්ෂි ලෙස ගිණිය හැකි පැරණි ඉන්දීය කැටයම් කිහිපයෙක් වේ. දැනට කල්කටාවේ ඉන්දියානු කෞතුකාගාරයේ ඇති වේදිසාවේ (වර්තමාන බේස්නගර්) තිබී හමු වූ ක්‍රි. පූ. තුන්වන ශතකයට අයත් වන කෘතියකැයි සැලැකෙන ''කල්පද්‍රැම'' වැම් හිසෙහි අෂ්ට-නිධි නිරූපණය කිරීමේ දී දක්වා ඇති කාසි ද, භාරුත්හි ජේතවන පූජාව පිළිබිඹු කරන කැටයමෙහි දක්නට ලැබෙන කාසි ද, මේවාට නිදසුන් ලෙස පෙන්විය හැක. මින් භාරුත්හි කැටයම අයත් වන්නේ ක්‍රි. පූ. දෙවැනි ශතවර්ෂය පමණටය. මේ කැටයම්වලින් දැක්වෙන්නේ පැරණි ඉන්දීය ග්‍රන්ථවල ''පුරාණ'' ''ධරණ'' හා ''කහාපණ'' යන නම්වලින් හැඳින්වෙන කාසි විය හැක. ඒ ගත්කරුවන් විශෙෂයෙන් ම ''පුරාණ'' යන නාමය මේවාට යොදා ගන්නට පෙළඹෙන්නට ඇත්තේ ඇකිමීනිය (පර්සියානු), ග්‍රීක, ශක ආදී විදේශිකයන් සිය ඉන්දීය විජිතයන්හි තමන්ගේ ම කාසි නිකුත් කරන්නට පටන් ගත් පසු, ඊට පෙර ඉන්දියාවේ ස්වදේශිකව ම නිපදවන ලද වඩා පැරණි කාසි ඒ අලුත් කාසිවලින් වෙන් කොට හඳුනා ගැනීම සඳහා විය හැක.

වර්තමාන නාණක විද්‍යාඥයන් ''හස් යෙදූ කාසි'' යන නමින් හඳුන්වන්නේ ද මෙම ''පුරාණ'' නමින් හඳුන්වන ලද කාසි ම බව පිළිගත් අදහසයි. ඇතැම් විට පොත පතෙහි මේවාට ''ධරණ'' යන නාමය ද යෙදෙයි. වර්තමානයේ මේ කාසි වර්ගයට ''හස් යෙදූ කාසි'' යන නම භාවිත කෙරෙන්නේ ඒවායේ නිෂ්පාදන ක්‍රමයේ විශෙෂතා සලකාගෙනයි.

මෙම හස් යෙදූ කාසි ගණයට වැටෙන රිදී හා තඹ කාසි හමු වී තිබේ. එහෙත් තඹ කාසි ඇත්තේ ඉතා විරල වශයෙනි. ඒවා නිපද වූ ක්‍රමය ද ලෝහ වර්ගය අනුව විවිධ විය. තඹ කාසි නිර්මාණය කර ගන්නා ලද්දේ ලෝහ දණ්ඩක් කුඩා පෙතිවලට කපා ඒ පෙති එකිනෙකෙහි හස් යොදා ගැනීමෙනි. පැරණි භාරතීය නීති කාරකයන් වූ මනු හා යාඥවල්ක්‍ය දක්වා ඇති අයුරු, ''කාර්ෂාපණ'' නාමයෙන් හඳුන්වන ලද්දේ මෙසේ නිපදවා ගත් කාර්ෂ ඵලයක බරැති තඹ කාසි පමණක් බව සිතන්නට ඉඩ තිබේ. (කාර්ෂාපණස්තු විඥෙයස්තාම්‍රිකඃ කාර්ෂිකඃ පණඃ). රිදී කාසි සඳහා තළන ලද තුනී රිදී තහඩු අවශ්‍ය ප්‍රමාණය අනුව හතරැස් කැබැලිවලට කපා අනතුරුව ඒවායේ බර නියමිත ප්‍රමාණයට ගෙන ඊම සඳහා කොන්වලින් කපා සකස් කර ගන්නා ලදී. මේ හේතුවෙන් මෙම වර්ගයේ කාසිවල ඒකරූපීභාවයක් දක්නට නොලැබේ. මෙසේ සකස් කර ගන්නා ලද තඹ හා රිදී ලෝහ කැබැලි මතු පිට සංකේත කිහිපයක් අච්චු භාවිතයෙන් වෙන් වෙන් වශයෙන් යොදනු ලැබිණි. හස් යෙදූ කාසිවල අභිමුඛයේ හා ප්‍රතිමුඛයේ මෙසේ යොදන ලද හස් හැර පාඨ ආදි අන් කිසිදු ලක්ෂණයක් දක්නට නොලැබේ. පාඨ, රාජරූප ආදී ලක්ෂණවලින් තොර හෙයින්, මේ කාසිවල අභිමුඛය හා ප්‍රතිමුඛය වෙන් කොට හඳුනාගත හැක්කේ ද එක් එක් පැත්තේ හස් යෙදී ඇති අයුරිනි. වැඩි ප්‍රමාණයක් හස් යෙදී ඇති පැත්ත අභිමුඛය ලෙස සලකනු ලැබේ. ප්‍රතිමුඛය බොහෝ විට හිස්ව හෝ එක ම හස් සලකුණක් සහිතව හෝ තිබෙනු දක්නට ලැබේ. සමහර කාසිවල ප්‍රතිමුඛයේ ද හස් සලකුණු දෙකක් හෝ තුනක් ඇතත් ඒවා අභිමුඛයේ සලකුණු හා සසඳන විට ප්‍රමාණයෙන් ඉතා කුඩා බව පෙනේ. (චිත්‍රය III, 3–9).

හස් යෙදූ කාසි නිපැදවූවන් ඒ ශිල්පයෙහි වැඩි පළපුරුද්දක් ලබත් ම, ඔවුන් නිපැදවූ කාසිවල යම් යම් වෙනස්කම් ඇති විණි. මේ වර්ගයට අයත් කාසි වර්ග කිරීමේ දී ඒවායේ හැඩය පිළිබඳ විවිධත්වයන් නාණක විද්‍යාඥයන්ගේ සැලකිල්ලට භාජන වේ. හස් යෙදූ කාසි අතර පැරණිතම ඒවා හතරැස්, තරමක් දුරට වෘත්තාකාර ආදී අසමරූපී හැඩයන්ගෙන් යුත් තුනී පුළුල් ඒවා බව කනිංහැම් අදහස් කරයි.

හස් යෙදූ කාසි නිපදවා ගැනීම සඳහා මැටියෙන් සාදන ලද අච්චු මථුරා, ශිශුපාලගර් හා කොණ්ඩපූර් යන ස්ථානවලින් හමු වී ඇත. මේවාට උණු කළ ලෝහ වත් කොට එක් වර කාසි කිහිපයක් නිපදවා ගන්නා ලද බව පෙනේ. නියම හස් යෙදූ කාසි කිසි විටෙක මේ ක්‍රමයෙන් නිපදවනු නොලැබූ බව කියන දුර්ගා ප්‍රසාද් මේ අච්චු හොර කාසි සකස් කර ගැනීම සඳහා යොද ගන්නා ලද බව දක්වයි (චිත්‍රය, III, 10).

හස් යෙදූ කාසි මුල් ම අවස්ථාවේ දී ඉන්දියාවේ වයඹ දිග ප්‍රදේශවල භාවිතයේ යෙදී තිබී පසුව මුළු ඉන්දියාව තුළ ම පැතිර ගිය බව පෙනේ. සමහර ශාස්ත්‍රඥයන්ගේ අදහස් අනුව මේවා මෙසේ පැතිර යාමට හේතු වූයේ මෞර්ය අධිරාජ්‍යයේ බලය ව්‍යාප්තියට පත් වීමයි. තක්ෂශිලාවේ පුරාවිද්‍යා කැණීම්වල දී සොයා ගන්නා ලද හස් යෙදූ කාසි ගැන ඉහත සඳහන් කරන ලදි. උතුරු ඉන්දියාවේ චම්පාරන් දිස්ත්‍රික්කයේ ලෞරිය-නන්දන්ගර්හි තිබී රිදී හස් යෙදූ කාසියක් සොයා ගන්නා ලද බව කනිංහැම් වාර්තා කරයි. 1807 දී දකුණු ඉන්දියාවේ කොයිම්බටෝර්හි පණ්ඩුකුලි නම් ස්ථානයේ පැරණි සොහොන් ගැබක් විවෘත කළ අවස්ථාවේ දී මේ වර්ගයට අයත් කාසි රාශියක් ම සොයා ගනු ලැබිණි. දක්ෂිණාපථයේ සංස්කෘතික හා දේශපාලන ඉතිහාසය අතින් ඉතා වැදගත් ප්‍රදේශයක් වන හයිදරාබාදයේ විවිධ ස්ථානවලින් හමු වූ මේ වර්ගයට අයත් කාසි විශාල සංඛ්‍යාවක් ආන්ධ්‍ර ප්‍රදේශයේ රජයේ කෞතුකාගාරයේ වෙයි. මේ සොයා ගැනීම්වලින් හස් යෙදූ කාසි ඉන්දියාව පුරා ම ව්‍යාප්තව භාවිතයට පත් වූ බව පෙනේ. ඉන්දියාවේ දකුණු ප්‍රදේශවල පමණක් නොව ලංකාවේ ද මේ කාසි භාවිතය වී ඇති බව ඒ ඒ ප්‍රදේශවලින් ලැබී ඇති කාසිවලින් පෙනියයි. අනුරාධපුරය, කන්තරෝඩේ වැනි තැන්වලින් සොයා ගනු ලැබූ මේ වර්ගයට අයත් කාසි ද ඉන්දියාවේ ම නිපදවන ලද කාසි බව පෙනී යයි.

ඉන්දියාවේ යටත් ප්‍රදේශ ඇති කරගෙන ඒවා පාලනය කළ විදේශීයයන් නිකුත් කළ කාසි මුලින් ම භාවිතයට පැමිණියේ වයඹ දිග ප්‍රදේශවලයි. ඒ විදේශීය පාලකයන්ගේ අලුත් කාසිවල බලපෑම නිසා හස් යෙදූ කාසි භාවිතය ඉක්මනින් ම වෙනස් ව ගියේ ඒ ප්‍රදේශවල බව පෙනේ. එහෙත් මේ විදේශීය පාලකයන් තමන්ගේ ම කාසි නිකුත් කරන්නට ආරම්භ කළ පසු ද, ඒ අලුත් කාසි සමඟ සෑහෙන තරම් දුරට හස් යෙදූ කාසි ද භාවිත වූ බවට පුරාවිද්‍යා සාක්ෂි හමු වී තිබේ. පළමුවන හා දෙවන කැඩ්ෆිසිස්, කණිෂ්ක හා වාසුදේව යන කුෂාණ රජවරුන්ගේ කාසි සමඟ තක්ෂශිලාවේ ආරාමයක නටබුන් අතර තිබී මේ වර්ගයට අයත් කාසි ද හමු වී තිබේ. ක්‍රිස්තු වර්ෂාරම්භයෙන් පසු සමයෙහි ද උතුරු ඉන්දීය ප්‍රදේශවල මේ කාසි වර්ගය භාවිත වෙමින් පැවැති බවට මේ හොඳ සාධකයකි.

වයඹ දිග ප්‍රදේශවල විදේශීය පාලකයන්ගේ බලය තහවුරු වී සෑහෙන කලක් ගත වන තුරු ඔවුන්ගේ බලපෑම්වලට හසු නොවූ මධ්‍යම හා දකුණු ඉන්දීය ප්‍රදේශයන්හි හස් යෙදූ කාසි නිෂ්පාදන ක්‍රමය ස්වාධීනව දියුණු වී ගිය අයුරු දක්නට ලැබෙයි. අනතුරුව දකුණේ භාවිතයට පත් ''පද්මටංක'' නමින් හැඳින්වෙන කාසි වර්ගය හස් යෙදූ කාසිවල ම විකාශයක් ලෙස දක්වන්නට පුළුවන. මධ්‍යම ඉන්දියාවේ එරාන්, බේස්නගර් වැනි ප්‍රදේශවලින් සොයා ගන්නා ලදුව කනිංහැම් විසින් ''එරාන් කාසි'' යයි නම් කරන ලද කාසි වර්ගය ද මෙබඳු ම විකාශයක ප්‍රතිඵලයකි. හස් යෙදූ කාසි නිපැදවීමේ දී වෙන වෙන ම මුද්‍රා කිහිපයක් යොදා ගැනීමෙන් ඔබ්බන ලද හස් සලකුණු කිහිපයක් එකම අච්චුවක් මඟින් එක්වරක දී ම මුද්‍රණය කර ගැනීමෙන් මේ කාසි නිපදවා ගන්නා ලදි. මධ්‍යම ඉන්දීය ගෝත්‍රයක් ලෙස සැලැකෙන උද්දේහිකයන්ගේ කාසිවල ද මේ ලක්ෂණය දක්නට ලැබේ.

හස් යෙදූ කාසි නිකුත් කරන ලද්දේ කවුරුන් විසින් ද යන්න විශාරදයන් අතර මතභේදයට හේතු භූත වී ඇති ප්‍රශ්නයකි. වී. ඒ. ස්මිත් (1906) මේ පිළිබඳව දැක්වූ අදහස වූයේ, මේ කාසි පාලකයන්ගේ අවසරයෙන් රිදීකරුවන් හා වෙළෙඳ ශ්‍රේණි මඟින් නිකුත් කරන ලද පෞද්ගලික කාසි වර්ගයක් වූ බවයි. ඒවායේ ප්‍රතිමුඛයේ දැක්වෙන හස් සලකුණු කාසි නිකුත් කිරීම පාලනය

කළවුන් සිය සම්මතය දැක්වීම සඳහා යොදන ලද අතර, අභිමුඛයේ සලකුණු තමන් අතට මේ කාසි පත් වූ අවස්ථාවන්හි දී වෙන වෙන කාසි නිකුත් කරන්නන් විසින් යොදන ලද බව ඔහු සඳහන් කරයි. එහෙත් මේ කාසි හමු වූ තැන් ගැන පිළිගත හැකි නිවැරැදි වාර්තා නැති හෙයින්, මේ පිළිබඳ තීරණාත්මක නිගමනයකට බැසීමට නොහැකි බව ද ස්මිත් තව දුරටත් පෙන්වා දෙයි. ඊ. ජේ. රැප්සන් ද (1914) මේ මතය පිළිගන්නා නමුදු, ඔහුගේ අදහස අනුව, ප්‍රතිමුඛයේ හස්වලින් දැක්වෙන්නේ ඒ කාසිය නිකුත් කරන ලද්දේ කවර ප්‍රදේශයක ද යන්න හඳුනා ගැනීම සඳහා යොදන ලද සලකුණකි.

මේ කාසි නිකුත් කරන ලද්දේ පාලකයන්ගේ අධිකාරයෙන් මිස විවිධ පුද්ගලයන් විසින් නොවන බව නිසැකව ම කිව හැකි යයි ජෝන් ඇලන් පවසයි. මේ වර්ගයට අයත් කාසිවල අභිමුඛයේ නිරතුරුව ම හස් සලකුණු පහක් යෙදී තිබෙන බව පෙන්වා දෙන ඇලන් ඉන් රාජ්‍ය පාලනය යටතේ කාසි නිකුත් කළ නිලධාරීන් පස්දෙනෙකුගෙන් යුක්ත මණ්ඩලයක් ගැන අදහසක් ඇති කර ගත හැකි බව දක්වයි. මෙගස්තිනිස්ගේ වාර්තාවල සඳහන් වන පරිදි, මෞර්‍ය පාලන තන්ත්‍රයේ දෙපාර්තමේන්තු බොහොමයක් පාලනය වූයේ උසස් නිලධාරීන් පස් දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයකිනි. අභිමුඛයේ නිතර එකට යෙදෙන හස් ගැන තව දුරටත් කරුණු දක්වන ඇලන් මේවා වෙන් වෙන් වශයෙන් වුව ද එක ම අවස්ථාවක දී යොදන ලද සලකුණු බව පිළිගත හැකි යැයි කියයි.

ඩී. බී. ස්පූනර්, ඩී. ආර්. භාණ්ඩර්කර් හා ඩබ්ලිව්. ඊ. ඇම්. කැම්බල් යන විශාරදයන් විසින් නියත වශයෙන් හමු වූ ප්‍රදේශ ගැන වාර්තා සහිත කාසි තොග කිහිපයක් පරීක්ෂා කර බලා තනි තනිව මීට වඩා වෙනස් නිගමනයකට පැමිණ ඇත. ඔවුන්ට ද මේ කාසි තොග පිරික්සීමේ දී පෙනී ගිය වැදගත් කාරණයක් නම්, ඒ කාසි සමහරක හස් අතරින් කිහිපයක් නිත්‍ය වශයෙන් එකට යෙදී තිබීමයි. මේ ගැන අවධානය යොමු කරන එච්. සී. වොල්ෂ් (1924) මෙසේ නිතර එකට යෙදෙන හස් කිහිපයක් තිබීමෙන් පෙනී යා යුත්තේ ඒවායේ හස් යෙදීම විටින් විට විවිධ අය අතින් පමණක් ම සිදු නොවූ බව යයි නිගමනයකට බසියි. මේ අනුව ඔහුගේ අදහස වනුයේ මේ කාසි සම්මත කාසි ක්‍රමයක් වූ බවත්, ඒවායේ අභිමුඛයේ ඇති හස් කාසි නිකුත් කළ පාලකයන් විසින් යොදන ලද ඒවා වූ බවත් ය. තව දුරටත් මේ හස් සලකුණු ගැන විමැසීමේ දී, කාසි නිකුත් කළ රාජ්‍යය, එවකට පාලනය කළ පාලකයා, කාසි නිපදවූ ස්ථානය යනාදිය දක්වන සංකේතයන් ද සමහර විටෙක මීට අතිරේකව ආගමික වැදගත්කමෙකින් යුත් සංකේතයක් ද ඒ අතර විය හැකි යයි වොල්ෂ් දක්වයි. විසුද්ධිමග්ගයේ ඛන්ධනිද්දේසයෙන් උපුටා පහත දැක්වෙන පාඨයෙන් කියැවෙන්නේ මේ අදහස් තහවුරු කරන්නට සාධක කොට ගත හැකි හස් යෙදූ කාසි පිළිබඳ විස්තරයකි.

> "යම් සේ හිරණ්‍ය ඵලකයක තබන ලද මහත් කහවණු රැසක් පිරික්සන නුවණ මුහුකුරා නොගිය දරුවකු, ගම්වැස්සකු හා රන්කරුවකු යන තිදෙනා අතරින් නුවණ මුහුකුරා නොගිය දරුවා කහවණුවල වටකුරු හතරැස් ආදී විසිතුරු හැඩ ඇති බව පමණක් දනියි; ඒවා මිනිසුන්ගේ උපභොග පරිභොග පිණිස සම්මත වූ සුවර්ණ යැයි නොදනියි. ගම්වැසි තෙමේ ඒවායේ විසිතුරු හැඩ ඇති බව ද ඒවා මිනිසුන්ගේ උපභොග පරිභොග පිණිස සම්මත වූ සුවර්ණ බව ද දනියි; එහෙත් මේ හොඳ කාසියකි, මේ හොර (කූට) කාසියකි, මේ මිශ්‍ර කාසියකි යනාදී වශයෙන් ඒවායේ විභාග නොදනියි. රන්කරු තෙමේ ඒ කහවණු සර්වප්‍රකාරයෙන් ම හඳුනයි. කහවණුව දෙස බැලීමෙන් ද, ඊට තට්ටු කොට නාදය ශ්‍රවණයෙන් ද, සුවඳ ආඝ්‍රාණයෙන් ද, දිව ගා බැලීමෙන් හා අතේ දැරීමෙන් ද, එය අසුවල් ගමෙහි දී, නියම් ගමෙහි දී, නුවර දී, පර්වතයේ දී හෝ නදී තීරයේ දී කරන ලද්දේ ය, අසුවල් ශිල්පියා විසින් කරන ලද්දේ ය යනුවෙන් දනියි."
>
> (යථා හි හෙරඤ්ඤික ඵලකෙ ඨපිතං මහාකහාපණරාසිං එකො අජාතබුද්ධිදාරකො එකො ගාමික පුරිසො එකො හෙරඤ්ඤිකො ති තීසු ජනෙසු පස්සමානෙසු අජාතබුද්ධිදාරකො කහාපණානං චිත්තවිචිත්තදීඝචතුරස්ස පරිමණ්ඩලභාවමත්තමෙව ජානාති. ඉදං මනුස්සානං උපභොග පරිභොගං රතනසම්මතන්ති න ජනාති. ගාමික පුරිසො චිත්ත

විවිත්තාදිභාවඤ්ච ජානාති ඉදං මනුස්සානං උපභොග පරිභොගං රතන සම්මතං'ති ච. අයං ඡෙකො අයං කූටො අයං අඩසාරොති ඉදං පන විභාගං න ජානාති. හෙරඤ්ඤිකො සබ්බෙපි තෙ පකාරෙ ජානාති. ජානන්තො ච කහාපණං ඔලොකෙත්වා පි ජානාති. ආකොටිතස්ස සද්දං සුත්වා'පි ගන්ධං සායිත්වා'පි රසං සායිත්වා'පි හත්ථෙන ධාරයිත්වා'පි අමුකස්මිං නාම ගාමෙ වා නිගමෙ වා නගරෙ වා පබ්බතෙවා නදීතීරෙවා කතො'ති'පි. අසුකාචරියෙන කතො'ති'පි ජානාති.)

චන්ද්‍රගුප්ත මෞර්‍ය්‍ය අධිරාජයාගේ පුරෝහිත බ්‍රාහ්මණයා ලෙස පිළිගනු ලැබෙන කෞටිල්‍යයන්ගේ ''අර්ථශාස්ත්‍ර'' නම් ග්‍රන්ථයේ ද කාසි නිපදවීම ගැන වැදගත් කරුණු අඩංගු වෙයි. එහි එන විස්තර අනුව, ''ලක්ෂණාධ්‍යක්ෂක'' නම් නිලධාරියා කාසි නිපදවීම භාරව ක්‍රියා කළ අතර, ''රූපදර්ශක'' නම් තවත් නිලධාරියෙක් එම කාසි ගනුදෙනු සඳහා රජය පිළිගත් මාධ්‍යයක් බව (ව්‍යවහාරික බව) හා රාජ්‍ය භාණ්ඩාගාරය විසින් පිළිගනු ලැබෙන බව (කොෂප්‍රවෙශ්‍යං) සහතික කළේ ය. මෞර්‍ය්‍ය අධිරාජ්‍ය සමය වන විට කාසි නිකුත් කිරීම හා ඒවා නිපදවීම පිළිබඳ කටයුතු මුළුමනින් ම රජයේ පාලනය යටතේ පැවති බව මින් පැහැදිලිව ම පෙනී යයි.

භාවිතයේ දී ගෙවී යාම නිසා දැනට හමු වී ඇති හස් එබූ කාසිවල බර ප්‍රමාණය බෙහෙවින් අඩු වී ගොස් ඇතත්, ඒවා පිරික්සා බැලීමෙන් ඒ කාසි මුල දී කිසියම් සම්මත බර ප්‍රමාණයකට අනුව නිකුත් කරන ලද බව පෙනී යේ. මේ බර මිනුම් ක්‍රමය සකස් කර ගන්නා ලද්දේ විවිධ බීජ වර්ග මූලික ඒකකයන් ලෙස යොදා ගැනීමෙනි. රාක්තික ඇටයක බර රතියක් විය. රාක්තික ඇට හැරුණු විට මාෂ, කාෂ්ඨඵල ආදී ඇට වර්ග ද මූලික බර මිම් ලෙස යොදා ගන්නා ලදි. මනු හා යාඥවල්ක්‍ය යන පැරණි නීතිකාරකයන්ගේ ස්මෘති ග්‍රන්ථයන්හි සඳහන් වන අයුරු, රිදියෙන් කළ ''පුරාණ'' කාසියක බර රති 32 ක් විය. කනිංහැම්ගේ පර්යේෂණවලින් ඔහු බැස ගත් නිගමනය අනුව රති 32 ක් ''ට්‍රොයි'' මිම්මෙන් ග්‍රේන් 58·56 කට සමානය. මේ ප්‍රමාණයට ඉතා ආසන්න බර ප්‍රමාණයන්ගෙන් යුත් හස් යෙදූ කාසි හමු වී තිබීම මෙහි ලා වැදගත් වෙයි. තක්ෂශිලාවේ හස් යෙදූ කාසි අතර තිබී හමු වූ රිදී ''බෙන්ට්-බාර්'' කාසි ගණනාවක් බරින් ග්‍රේන් 169-178 අතර ප්‍රමාණයනට අයත් විය. ශතපථ බ්‍රාහ්මණයේ රති සියයෙක බරින් යුත් ''ශතමාන'' නම් කාසි වර්ගයක් ගැන සඳහන් කරයි. (රති = ග්‍රේන් 1·8; රති 100 = ග්‍රේන් 180). ඇතැම් විට ඉහත සඳහන් කළ රිදී''බෙන්ට්-බාර්''කාසි මේ ශතමාන වර්ගයට අයත් කාසි විය හැක.

මධ්‍ය ප්‍රදේශයෙන් හා තක්ෂශිලාවෙන් ලැබී ඇති සමහර රිදී හස් යෙදූ කාසි ඒ වර්ගයේ සාමාන්‍ය කාසිවලට වඩා ප්‍රමාණයෙන් කුඩා ය. බරින් ද අඩුය. ඒවායේ බර ග්‍රෙන් 2·3 හා 2·6 අතර වේ. අර්ථශාස්ත්‍රයේ සඳහන් කරුණු අනුව ''ධරණ'' කාසියක් රිදී මාෂ කාසි 16 කට සමාන වටිනාකමෙකින් යුක්ත ය. මේ අනුව මාෂ නමින් හඳුන්වන ලද්දේ කුඩා රිදී හස් යෙදූ කාසි ද යන්න අනුමාන කරන්නට ඉඩ ඇත. ඉහත දැක්වුණු කරුණුවලින් පෙනී යන්නේ රිදී හස් යෙදූ කාසි අතර වටිනාකම් කිහිපයකට අයත් කාසි වර්ග තිබුණු බවයි.

තඹයෙන් කළ හස් යෙදූ කාසි ඒ ඒ වර්ගවලට අයත් රිදියෙන් කළ කාසිවලට වඩා බර ප්‍රමාණයෙන් අධික ය. ඒවායේ බර සාමාන්‍යයෙන් ග්‍රෙන් 160 හා 360 අතර ප්‍රමාණය වේ. පැරණි ස්මෘති ග්‍රන්ථවල කාෂ්ඨපණ කාසියක් සඳහා නියම කර ඇත්තේ රති 80 ක බරෙකි. මේ අනුව නම් තඹ කාසියක බර ග්‍රෙන් 146·4 පමණ විය යුතුය. රිදී කාසි මෙන් ම, තඹ කාසි ද විවිධ බර ප්‍රමාණයන් අනුව නිකුත් කරන ලද හෙයින්, වෙන වෙන ප්‍රදේශවල ඒවා සඳහා විවිධ මිම් තිබුණ විය හැකි යැයි ජේ. ඇන්. බැනර්ජි අදහස් කරයි.

අකුරු හා පාඨ රහිත, අච්චුවෙහි වත් කර නිම වූ තඹ කාසි වර්ගයක් ද (uninscribed cast coins) උතුරු ඉන්දියාවෙන් ලැබී ඇත. ඒවා බර ප්‍රමාණයෙන් ග්‍රෙන් 10 හා 144 අතර ප්‍රමාණයන්ගෙන් යුක්ත වන හෙයින්, නිශ්චය වශයෙන් වර්ග කිරීම දුෂ්කර ය. සමහර විට මේවා කහාපණ හා ඒවායේ භාග කොටස් සඳහා නිකුත් කරන ලද කාසි විය හැක. කාෂ්ඨපණ (කහාපණ), අර්ධ (කාෂ්ඨ පණ) (අඩ්ඩ) හා පාද යනුවෙන් විවිධ වටිනාකම් යෙදුණු කාසි වර්ග වූ බව කියැවෙන ප්‍රකාශයක් විනය පිටකයේ චූල්ල වග්ගයේ දෙවැනි සංගායනාව පිළිබඳ විස්තරයෙහි හමු වෙයි.

''පුරාණ'' හෙවත් හස් යෙදූ කාසිවල විශෙෂ ලක්ෂණය වනුයේ ඒවායේ අභිමුඛයේ හා ප්‍රතිමුඛයේ යොද ඇති විවිධ සලකුණු ය. නාණක විද්‍යාඥයන්ගේ පර්යේෂණවලින් මේ කාසිවල මෙබඳු වෙනස් සලකුණු 300 කට අධික සංඛ්‍යාවක් යෙදී ඇති බව හෙළි වී තිබේ. මේවා අතරින් සමහරක් කාසිවල අභිමුඛයටත් තවත් සමහරක් ප්‍රතිමුඛයටත් සීමා වී ඇති අතර, සමහර සලකුණු දෙපැත්තේ ම අවිශේෂයෙන් යෙදෙයි. මිනිස් රූප, වෘක්ෂලතාදිය, ග්‍රහ තාරකා හඳුන්වන සංකේත සවස්තිකය හා එබඳු තවත් සංකේත ආදිය හස් මගින් මේ කාසිවල සටහන් කර ඇති බව පෙනේ. හස් සටහන් ගණනාවක් රැස් කොට පරීක්ෂා කළ ඩබ්ලිව්. තියෝබෝල්ඩ් ඒවා වර්ග හයකට බෙද දැක්වීමට උත්සාහ කළේ ය. ඔහුගේ වර්ගීකරණය පහත දැක්වේ:—

(1) මිනිස් රූප
(2) ආයුධ, ගොඩනැගිලි ආදිය, දුන්න, හීය, ස්තූපය වැනි සටහන්
(3) සත්ව රූප, ඇතා, වෘෂභයා, කහවෙණා ආදීන්
(4) ගස් අතු හා ඵල වර්ග
(5) සූර්ය, ග්‍රහ හා ශෛව ඇදහිලි සම්බන්ධ සංකේත සටහන්
(6) වෙනත් හඳුනාගත නොහැකි විවිධ සටහන්.

මේවා අතර මිනිස් රූප දක්නට ඇත්තේ ඉතා අල්ප වශයෙනි. රැස් දහර සොළොසක් සහිත සෞර චක්‍රය මේ සටහන් අතර ඉතාමත් ම බහුල වශයෙන් දක්නට ලැබෙන සටහන වන අතර, ඇත් රුව, පර්වතය (ස්තූපය) ආදිය ද බහුල ලෙස යෙදී තිබේ. මෙ සංකේත අතර දක්නට ලැබෙන චෛත්‍ය වෘක්ෂය, වෘෂභ රූපය, ශිඛර එකක් හෝ වැඩි ගණනක් සහිත පර්වතය, නදිය, සෞර සංකේත, නන්දිපදය, ත්‍රිශූලය, ස්වස්තිකය, පද්මය, වැනි සලකුණු ආගමික සංකේත ලෙස අදහස් කොට යොදන ලදැයි සිතිය හැක. මේ සටහන් හැමෙකක් ම ආගමික වුව ද නොවුව ද, හස් මුද්‍රාවන් සඳහා තෝරා ගන්නා ලද්දේ කිසියම් නිශ්චිත අදහසක් දැනවීමට බව පැහැදිලි ය.

# 3. ඉන්දු - ග්‍රීක කාසි

පසුගිය පරිච්ඡේදයේ දී විස්තර කරන ලද හස් යෙදූ කාසිවලින් ඇරඹෙන ඉන්දියාවේ කාසි පිළිබඳ ඉතිහාසයෙහි වැදගත් හා ශීඝ්‍ර විපර්‍යාසයන් බොහොමයක් ම ඇති වූයේ ක්‍රිස්තු පූර්ව යුගයේ සිට ම විදේශීය ආක්‍රමණිකයන් මෙරටට ගෙනා ඔවුන්ගේ වඩා දියුණු කාසි නිෂ්පාදන ක්‍රම සමඟ ගැටීමෙනි. නව කාසි ක්‍රම ඉන්දියාවට හඳුනවා දුන් විදේශිකයන් අතර ඉන්දු-ග්‍රීක, ශක-පහ්ලව හා කුෂාණ යන පාලකයෝ වූහ. එහෙයින් මින් අනතුරුව අප අවධානය යොමු විය යුත්තේ ඉන්දු-ග්‍රීක පාලකයන් ඉන්දියාවේ දී නිකුත් කළ කාසි කෙරෙහි ය.

භාරතයේ දී ප්‍රථම වරට සිදු වූ පෙරදිග හා අපරදිග සංස්කෘතීන්ගේ සම්මිශ්‍රණයක් පිළිබිඹු කෙරෙන ඉන්දු-ග්‍රීක කාසි තරම් උගතුන්ගේ සැලැකිල්ලට භාජන වූ පැරැණි ඉන්දීය කාසි වර්ගයක් නැති තරම්ය. මේ කාසි මෙසේ විශේෂයෙන් ම සැලකිල්ලට භාජන කරන්නට තුඩු දෙන තවත් කරුණක් නම් ඓතිහාසික මූලාශ්‍ර වශයෙන් ඒවාට හිමි වන වැදගත්කමයි. ලතින් හා භාරතීය ග්‍රන්ථවල ඉන්දීය ප්‍රදේශ පාලනය කළ ඉන්දු-ග්‍රීක ආදී විදේශීය පාලකයන් ගැන සඳහන් වන ඓතිහාසික ප්‍රවෘත්ති ඉතා අල්ප ය. ඉන්දියාවේ නිපදවූ ග්‍රීක කාසි දහනව වන සියවසේ මුල් භාගයේ දී මුල් වරට සොයා ගනු ලැබීමෙන් පසු ඒවා ආශ්‍රයෙන් වයඹදිග ඉන්දීය ප්‍රදේශ පාලනය කළ විදේශීය පාලකයන් ගැන ඓතිහාසික සාක්ෂි රැසක් ලබා ගත හැකි විය.

මහා ඇලෙක්සැන්ඩර් රජුගේ ආක්‍රමණයේ ප්‍රතිඵල වශයෙන් ඉන්දියාවේ ඇතිවුණු මැසිඩෝනියානු ආධිපත්‍යය වැඩි කල් නොපැවතිණි. මෙරජුගේ මරණයත් සමඟ ම ඔහු විසින් යටත් කර ගන්නා ලද ඉන්දීය ප්‍රදේශ සෙන්පතියන් අතර බෙදී ගියේ ය. මෞර්‍ය අධිරාජ්‍යය පිහිටුවූ චන්ද්‍රගුප්ත රජු ඉන්දියාවේ වයඹ දිග ප්‍රදේශයන්හි සිය බලය තහවුරු කර ගත්තේ මෙසේ අලුතින් පිහිටුවන ලද, සිරියාව කේන්ද්‍ර කරගත් සෙලූකස් නිකටෝර් ගේ අධිරාජ්‍යය හා ගැටීමෙන් පසුව ය. දකුණෙන් හා නැඟෙනහිරින් හින්දුකුෂ් කඳුවැටියෙන් ද, උතුරින් ඔක්සස් නදියෙන් ද, සීමා වූ බැක්ට්‍රියාව සෙලූකිඩ් අධිරාජ්‍යයට යටත් වූ ප්‍රදේශයක් විය. සෙලූකිඩ් අධිරාජ්‍යය යටතේ ශතකයකට අධික කාලයක් පාලනය වීමෙන් පසු ක්‍රමයෙන් බැක්ට්‍රියාව නිදහස් රාජ්‍යයක් බවට පත් විය. ස්ට්‍රාබෝ, ජස්ටින් වැනි ලේඛකයන්ගේ වාර්තාවලින් පෙනෙන පරිදි, ඇන්ටියෝකස් තියොස් අධිරාජයාගේ මරණින් පසු, සෙලූකිඩ් අධිරාජ්‍යයේ ඇති වූ අසහන තත්ත්වයෙන් ප්‍රයෝජන ගත් ඩයොඩෝටස් නම් බැක්ට්‍රියානු ප්‍රදේශ පාලකයා අධිරාජ්‍ය ආධිපත්‍යයෙන් නිදහස් ව ස්වාධීන පාලනයක් ඇති කර ගත්තේ ය. මේ සිද්ධිය ක්‍රි. පූ. 240 දී පමණ සිදු වූවකැයි සලකනු ලැබේ. ඩයොඩෝටස්ගෙන් පසු ඔහුගේ පුත්‍ර දෙවැනි ඩයොඩෝටස් රජ විය. බැක්ට්‍රියාවෙන් ග්‍රීක ආධිපත්‍යය යළිත් වරක් හින්දුකුෂ් වැටියෙන් දකුණු දිගට කාබුල් නිම්නය අවට ප්‍රදේශය දක්වා ව්‍යාප්ත කළේ දෙවැනි ඩයඩොටස්ගෙන් බැක්ට්‍රියාවේ පාලන බලය පැහැර ගත් යුතිඩීමොස් නම් පාලකයා විසිනි. ක්‍රි. පූ. දෙවැනි ශතකයේ මුල් හරියේ දී මෞර්‍ය අධිරාජ්‍යය දුබල ව යාමත් සමඟ ම, යුතිඩීමොස්ගේ පුත්‍රයා වූ ඩිමීට්‍රියොස් නමැත්තා සිය පාලන බලය පංජාබය දක්වා විහිදුවා තහවුරු කර ගත්තේ ය. එහෙත් මේ බැක්ට්‍රියානු පාලකයාගේ රාජ්‍ය කාලයේ අවසාන භාගයේ දී ඔහු හා සටන් වැදුණු බැක්ට්‍රියානු ප්‍රතිමල්ලයකු වූ යුක්‍රටිඩීස්ට බැක්ට්‍රියාවත්, ඩිමිට්‍රියොස් සතුව තුබූ ඉන්දියානු ප්‍රදේශවලින් කොටසකුත් පැහැර ගත හැකි විය. මේ අයුරින්, ඉන්දියාවේ යටත් ප්‍රදේශ පාලනය කළ, බැක්ට්‍රියාවෙන් ආ ග්‍රීක පාලක පෙළපත් දෙකක් ඇති විය. ඒවා නම් කාබුල්, කන්දහාර් හා ගන්ධාර යන ප්‍රදේශ පාලනය කළ හෙලියොක්ලීස්, ඇන්ටියල්කිඩාස්,

ග්‍රන්ථාගාර අංකය
Accession No. 00117
Class No. 934

හර්මියස් ආදී පාලකයන් ඇතුළත් වූ යුක්‍රටීඩීස්ගේ පෙළපතත්, නැගෙනහිර ගන්ධාරය හා පංජාබය පාලනය කළ අපොලෝඩෝටස්, මෙනැන්ඩර්, ස්ට්‍රාටෝ 1, සොයිලොස් හා හිපොස්ට්‍රාටොස් ආදී පාලකයන් අයත් වූ යුතිඩීමොස්ගේ පෙළපතත් ය. කාබුල් නුවරට උතුරින් වූ ප්‍රදේශ පාලනය කළ සුළු පාලකයන් වූ පැන්ටැලියොන්, ඇගතොක්ලීස් හා ඇන්ටිමැකොස් වැනි පාලකයන් ද යුතිඩීමොස්ගේ පෙළපතට අයත් වූ බව පෙනේ. ශක ගොත්‍රිකයන්ගේ ආක්‍රමණ හේතුවෙන් හෙලියොක්ලීස් බැක්ට්‍රියාව හැර යාම නිසා ඔහුගෙන් පසු බැක්ට්‍රියාවේ ඉන්දු-ග්‍රීක පාලනයක් නොවීය. ක්‍රි. පූ. පළමුවැනි ශත වර්ෂයේ මැද හරිය වන තෙක් හර්මියස් රජු දක්වා හෙලියොක්ලීස්ගෙන් පැවැත ආ ඉන්දු-ග්‍රීක රජවරු කාබුල් නුවර මධ්‍යස්ථානය කරගෙන ඉන්දියාවේ සිය විජිත ප්‍රදේශ පාලනය කළහ.

ග්‍රන්ථාගත සාක්ෂිවලින් යුතිඩීමොස් පරපුරට අයත් ඉන්දු-ග්‍රීක පාලකයන් අතුරින් තතු සපයා ගත හැක්කේ ඇපොලෝඩෝටස් හා මෙනැන්ඩර් යන රජවරුන් දෙදෙනා ගැන පමණි. ක්‍රි. ව. 80 දී පමණ බරිගාසා (භාරුකච්ච) හි මේ රජුන් දෙදෙනාගේ නම් සඳහන් ග්‍රීක පාඨ සහිත කුඩා රිදී කාසි භාවිත වූ බව ''පෙරිප්ලස් ඔෆ් ද එරිත්‍රියන් සී'' නම් ග්‍රන්ථයෙහි සඳහන් වේ. ඉන්දු-ග්‍රීක පාලකයන් අතරින් ඉන්දීය සාහිත්‍යයේ වඩාත් ම ප්‍රකට මෙනැන්ඩර් රජු ය. මිලින්ද-පඤ්හ නම් පාලි ග්‍රන්ථයේ මිලිඳු-නාගසේන සංවාදයට සම්බන්ධ සාගල නුවර පාලකයා මෙනැන්ඩර් බව සාමාන්‍ය පිළිගැනීමයි. එතෙක් වයඹදිග ප්‍රදේශවලට පමණක් සීමා වී තුබුණු ඉන්දු-ග්‍රීක බලය මෙනැන්ඩර් රජුගේ රාජ්‍ය කාලයේ දී මගධ දේශය දක්වා විහිදී ගිය බව පතඤ්ජලි හා ස්ට්‍රාබෝ සිය ග්‍රන්ථවල දක්වන ඇතැම් ප්‍රකාශයන්ගෙන් පෙනී යයි. ඉතා සුලභව මේ රජුගේ කාසි හමු වීම දිගු කලක් තිස්සේ පුළුල් ප්‍රදේශයක් පාලනය කළ බවට නාණක විද්‍යාමය සාධකයකි. මෙනැන්ඩර් රජුගේ බිසව ලෙස සැලකිය හැකි ඇගතොක්ලියා ද කාසි නිකුත් කර ඇත. ඒවා වර්ග දෙකකට අයත් වේ. මුල දී ඇගතොක්ලියා රැජිණ තමන්ගේ නමින් තනිව ද, පසුව සිය පුත් පළමුවැනි ස්ට්‍රාටෝ හා සමඟ ඒකාබද්ධව ද යනුවෙනි. ස්ට්‍රාටෝගේ රාජ්‍ය සමයේ අවසාන භාගය වන විට ඉන්දු-ග්‍රීක කාසි ඒවායේ ලෝහ අගයෙන් මෙන් ම කලාත්මක අගයෙන් ද පිරිහීමට පටන් ගෙන ඇත. ඉන් පෙනී යන්නේ මේ සමය වන විට ඉන්දු-ග්‍රීක රජවරුන්ගේ පාලන බලය කෙමෙන් පරිහානි තත්ත්වය කරා ගමන් ගත් බවයි.

යුක්‍රැටීඩීස් ගේ පෙළපතට අයත් ඇන්ටියාල්කිඩාස් ගැන බෙස්නගර් (වේදිස) නුවර තිබී සොයා ගන්නා ලද ගරුඩ ස්තම්භ ලිපියේ සඳහන් වේ. භාගභද්‍ර නම් භාරතීය පාලකයා වෙතට ඇන්ටියල්කිඩාස් රජුගේ තානාපතියකු ලෙස එවන ලද තක්ෂශිලාවේ හෙලියොඩෝරස් නම් යවනයා මේ ලිපියේ තමන් භාගවතයකු ලෙස හඳුන්වා ගනී. (භාගවත නම් විෂ්ණු භක්තිකයෙකි). අවසාන ඉන්දු-ග්‍රීක පාලකයා වූ හර්මියස්ගේ කාසි වර්ගවලින් ක්‍රම ක්‍රමයෙන් ඔහුගෙන් කුෂාණයන් අතට බලය පත්වීම මැනැවින් පැහැදිලි වෙයි.

ඉන්දියාවේ ව්‍යවහාර වූ පැරණි මුදල් අතර පළමු වරට නියම වශයෙන් ම කාසි යැයි හැඳින්විය හැක්කේ ඉන්දු-ග්‍රීකයන් නිකුත් කළ කාසි වේ. බරෙහි ප්‍රමාණය හා ආකෘතිය යන ලක්ෂණවල සමරූපී බව, අභිමුඛය හා ප්‍රතිමුඛය අතර විශේෂය, නිකුත් කළවුන්ගේ රූප සටහන් හා පාඨ ආදී කාසියක විය යුතු යයි අපේක්ෂා කෙරෙන ලක්ෂණ හැමෙකක් ම වාගේ මේ කාසිවල දක්නට පුළුවන. බැක්ට්‍රියාවේ ග්‍රීක පාලකයන් මෙන් ම ඉන්දු-ග්‍රීක පාලකයන් ද සිය කාසි මුද්‍රණය කිරීම සඳහා බහුල ලෙස යොදා ගත්තේ රිදී හා තඹ යන ලෝහ වර්ග දෙකයි. මුල් ම ඉන්දු-ග්‍රීක පාලකයන් විසින් නිකුත් කරන ලද රන් කාසි කිහිපයක් ද පසු කාලීනව නිකුත් කරන ලද නිකල් කාසි කිහිපයක් ද ලැබී ඇතත්, ද්විභාෂාමය පාඨයන් ඒවායේ දක්නට නොලැබෙන නිසා, ඒවා ඉන්දියාවේ නොව බැක්ට්‍රියාවේ පමණක් ව්‍යවහාරය සඳහා ඒ රටේ දී නිකුත් කරන ලද කාසි බව සලකන්නට පුළුවන. සාමාන්‍යයෙන් ඉන්දු-ග්‍රීක පාලකයන්ගේ කාසිවල අභිමුඛයේ ඒවා නිකුත් කළ පාලකයාගේ පිළිරුව හා නම සඳහන් වන ග්‍රීක පාඨයක් ද, ප්‍රතිමුඛයේ දේවතා රූපයක් හෝ සංකේතයක් සමඟ රාජ විරුද නාමයක් ද දක්නට ලැබේ. ඉන්දියාවේ දේශීය කාසිවල ද අභිමුඛයේ රජුගේ හිස දැක්වෙන රූ සටහනක් යෙදීමේ ක්‍රමය ආරම්භ වන්නේ මේ ඉන්දු-ග්‍රීක කාසිවල බලපෑමෙන් බව කිව හැක. ඉන්දු-ග්‍රීක කාසි ගැන සමාලෝචනයක් කෙරෙමින් ඊ. ජේ. රැප්සන් පහත සඳහන් අදහස් ඉදිරිපත් කරයි. ''බැක්ට්‍රියාවේ සිට ඉන්දියාව වෙත ග්‍රීක පාලනය මාරුවීම ඉතා පැහැදිලි වශයෙන් පිළිබිඹු වනුයේ කාසිවල ශෛලිය වෙනස් වන

විමර්ශන අංශය

ආකාරයෙනි. බැක්ට්‍රියාවේ දී මේ කාසි හුදෙක් ග්‍රීක ලක්ෂණ පමණක් ඇතිව, ග්‍රීක බර මිමිවලට අනුව නිකුත් කැරිණි. ඉන්දියාවේ දී තමන්ගේ තරම ම නියුණු ශිෂ්ටාචාරයක් හා සම්පර්කයට පත්වීම නිසා මෙ පිළිබඳව සකස් කිරීමක් අවශ්‍ය විය. කාසි ක්‍රමය පාලකයන්ගේ මෙන් ම පාලිතයන්ගේ ද අවශ්‍යතාවනට අනුකූල වන පරිදි යළි සකස් කර ගත යුතු විය. මේ අනුව අභිමුඛයේ ග්‍රීක පාඨය ද, ප්‍රතිමුඛයේ ඉන්දීය අක්ෂරවලින් එහි පරිවර්තනයක් ද ඇතිව ද්විභාෂාමය කාසි නිකුත් කිරීම ආරම්භ විය......''

ඉන්දු-ග්‍රීක පාලකයන්ගේ කාසි අතර ග්‍රීක හා ඛරොෂ්ඨී අක්ෂර පාඨ (උදා: BASILEOS ANIKETOU DEMETRIOU – 'මහරජස අපරජිතස දිමෙ......') සහිතව ද්විභාෂාමය කාසියක් මුල් වරට නිකුත් කරන ලද්දේ ඩිමිට්‍රියස් රජු විසිනි. ඒ හතරැස් තඹ කාසියක් විය. යුක්‍රැටිඩීස් රජු විසින් ග්‍රීක බර මිමිවලට අනුව නිපදවූ බැක්ට්‍රියානු කාසි ද, ද්විභාෂාමය ඉන්දීය වර්ගයේ කාසි ද, රිදී හා තඹ යන ලෝහ වර්ග දෙකින් ම නිකුත් කැරිණි. මේ දෙවර්ගයට ම අයත් කාසි හේලියොක්ලීස් හා ඇන්ටියාල්කිඩාස් යන පාලකයන් දෙදෙනා විසින් ද නිකුත් කරන ලද නමුත් මෙතෙක් හමු වී ඇති ඔවුන්ගේ කාසි සියල්ල රිදියෙන් පමණක් නිපැදුණු ඒවා ය. මින් පසු අනෙක් ඉන්දු-ග්‍රීක පාලකයන් විසින් නිකුත් කරන ලද්දේ ද්විභාෂාමය ඉන්දීය වර්ගයට අයත් රිදී හා තඹ කාසි පමණකි. ද්විභාෂාමය කාසිවල ග්‍රීක අකුරින් ලියැවුණු පාඨය අභිමුඛයේ ද, ඛරොෂ්ඨී අකුරින් ලියැවුණු ග්‍රීක පාඨයේ අනුවර්තනය ප්‍රතිමුඛයේ ද යෙදීම සාමාන්‍ය සිරිතවූ බැව් මීට පෙර සඳහන් කරන ලදි. ඇගතොක්ලීස් හා පැන්ටැලියන් විසින් නිකුත් කරන ලද හතරැස් තඹ කාසි කිහිපයක ප්‍රතිමුඛයේ ප්‍රාකෘත භාෂාමය පාඨය ලිවීමට යොදගෙන ඇත්තේ සාමාන්‍යයෙන් භාවිත වූ ඛරොෂ්ඨී අකුරු නොව බ්‍රාහ්මී අකුරු ය. (උද: රජනෙ පතලෙවෂ.) සිය කාසිවල ප්‍රතිමුඛයේ පාඨය සඳහා බ්‍රාහ්මී අක්ෂර යොද ගත් අන් කිසිම ඉන්දු-ග්‍රීක පාලකයකු ගැන තොරතුරු සොයා ගෙන නැත. ඇගතොක්ලීස් විසින් නිකුත් කරනු ලැබූ තවත් තඹ කාසි වර්ගයක ප්‍රතිමුඛයේ මෙන් ම අභිමුඛයේ ද ඛරොෂ්ඨී අකුරින් ලියැවුණු පාඨ (අභිමුඛය: අකථුක්‍රෙයස; ප්‍රතිමුඛය: හිරඤාශ්‍රමෙ) යෙදී ඇත. ග්‍රීක හා ඛරොෂ්ඨී පාඨ යෙදීමේ දී රජවරුන්ගේ නම්වලට විශෙෂණ වශයෙන් යොදන ලද විරුදනාමයන් විවිධ අයුරින් යොද ගැනීම සිරිතක් කොට ගත් බව පෙනේ. පහත දැක්වෙන උදහරණවලින් මෙම පාඨ පිළිබඳ අදහසක් ඇති කර ගත හැකි වේ.

| ග්‍රීක | ඛරෝෂ්ඨී | අදහස |
|---|---|---|
| (1) BASILEOS SOTEROS APOLLODOTOU (බැසිලියොස් සෝතේරොස් අපොල්ලොඩොටොඋ) | මහරජස ත්‍රතරස අපලදතස | මුක්තිදයක අපොලෝඩෝටස් මහරජුගේ (කාසිය) |
| (2) BASILEOS MEGALOU SOTEROS HIPPOSTRATOU (බැසිලියොස් මෙගලොඋ සෝතේරොස් හිප්පොස්ට්‍රාටොඋ) | මහරජස ත්‍රතරස මහතස ජයංතස හිපුස්ත්‍රතස | මහා විමුක්තිදයක ජයග්‍රාහක හිපොස්ට්‍රාටොස් මහරජුගේ (කාසිය) |
| (3) BASILEOS NIKEPHOROU ANTIALKIDOU (බැසිලියොස් නීකේපොරොඋ අන්ටියල්කිඩොඋ) | මහරජස ජයධරස අන්තියල්කිඩස | ජයධාරී ඇන්ටියල්කිඩස් මහරජුගේ (කාසිය) |

මේ කාසිවල අභිමුඛයේ යෙදී ඇති රූ සටහන් අතර ප්‍රධාන තැන ගන්නේ ඒවා නිකුත් කළ පාලකයන්ගේ ප්‍රතිරූප ය. කාසි නිකුත් කළ පාලකයන්ගේ පෞද්ගලිකත්වය මනාව නිරූපණය වන අයුරු කුඩා ප්‍රතිරූප සකස් කිරීමෙහි ලා ඉන්දු-ග්‍රීක රජවරුන්ට සේවය කළ කලා ශිල්පීන් මහත් කුශලතාවක් දක්වා ඇති බව කිව හැක. රජ හිස සහිත අභිමුඛය ඇති මුල් ම ඉන්දීය කාසිය ලෙස සැලකිය හැක්කේ ඇලක්සැන්ඩර්ගේ ආක්‍රමණ සමයේ දී ඉන්දියාවේ වයඹ දිග ප්‍රදේශයේ පාලකයකුව සිටි සෞභූති විසින් නිකුත් කරන ලදැයි පිළිගනු ලැබෙන කාසියයි. එහි අභිමුඛයේ දෙකපොල හා නිකට වැසී යන පරිදි ආරක්ෂක පටයක් ද හිසෙහි යුද හිස්වැස්මක් ද පැළඳ දකුණු පසට මුහුණ ලා සිටින රජුගේ හිස දක්වා තිබෙයි. ප්‍රතිමුඛයේ දකුණු පසට පා නහන සැවුල් රුවක් දක්වා තිබෙයි. ප්‍රතිමුඛයේ දකුණු පැත්තේ 'සොfපයිටීස්' යන පාඨය දක්නට ලැබේ.

කාසිවල අභිමුඛයේ රජහිස දැක්වීමේ දී සාමාන්‍යයෙන් දකුණට හැරී සිටින ආකාරයෙන් එය පිළිබිඹු කිරීම සිරිත වුව ද, මෙනැන්ඩර් රජුගේ ඇතැම් කාසියක වම් පසට හැරී සිටින රජුගේ උඩුකය ද පෙන්වා තිබේ. ඒ කාසියේ රජු කරට උඩින් හෙල්ලක් අල්වා ගෙන සිටින ආකාරය නිරූපිත ය. රජුන්ගේ ශීර්ෂවල රූප සටහන් දැක්වීමේ දී මැසිඩෝනියානු කෞසියා (Kausia) හිස්වැස්ම, යුද හිස්වැස්ම, ඇත් හිසක ස්වරූපයට සකස් කළ හිස් වැස්ම, ගව අං හා කන් යොදා සකස් කළ මුදුන සහිත හිස්වැස්ම යනාදී වශයෙන් ආකෘති කිහිපයක හිස් වැසුම් යොදාගෙන තිබේ. ඇතැම් විට, රජුන් සිය හිස සරසා ගෙන ඇත්තේ හිස් වැස්මකින් නොව, කෙස් වැටිය එක් කොට බැඳ හිස වටා යවන ලද පීත්ත පටියකින් පමණි. සමහර විටෙක දෙදෙනකුගේ උඩුකයේ ප්‍රතිරූප ද කාසිවල අභිමුඛයේ එකට යෙදෙයි. හර්මියස් හා කැලියෝප් දෙදෙනාගේ උඩුකය පිළිරූ එකට දැක්වෙන අභිමුඛය සහිත රිදී කාසිය මීට නිදසුනකි. ඇතැම් කාසිවල රජ රුව වෙනුවට අභිමුඛයේ වෙනත් රූප යෙදෙයි. ඉහත සඳහන් කරන ලද ඇගතොක්ලීස්ගේ හා පැන්ටලියන්ගේ බ්‍රාහ්මී පාඨ සහිත හතරැස් තඹ කාසියේ අභිමුඛයේ යෙදී ඇත්තේ දකුණට හැරී සිටින කෙශර රහිත සිංහයකුගේ රුවකි. ඇතැම් විටෙක, මේ වෙනුවට ඇත් හිස හා සම්පූර්ණ ඇත් රුව ද, යොදා ගෙන තිබේ. ඇපොලෝඩෝටස්ගේ වටකුරු හා හතරැස් රිදී කාසි දෙකක ගමන් කරන ඇතකු ද, මෙනැන්ඩර් රජුගේ හතරැස් තඹ කාසියක ගෙලෙහි සීනුවක් සහිත ඇත් හිසක් ද, අභිමුඛයේ රූප සටහන් ලෙස දැක්වෙයි. ඇපොලෝඩෝටස්ගේ තඹ කාසියක අභි-මුඛයේ යගදවක් වැනි කිසිවක් (මොහු දරා සිටින්නේ දුන්නකැයි සමහරුන් දරන මතය පිළිගත හැකි නොවේ.) අතින් දරා සිටින පුරුෂයකුගේ සම්පූර්ණ රූපයක් වෙයි. සමහරුන් මේ රූපයෙන් ඇපොලෝ දෙවියා දැක්වෙතැයි අදහසක් ඉදිරිපත් කරතත්, සාමාන්‍යයෙන් ඉන්දු-ග්‍රීක කාසිවල අභිමුඛයේ දේවතාරූප යෙදීමේ සිරිතක් නොවන හෙයින්, මේ රූ සටහනින් දැක්වෙන්නේ ඇපොලෝඩෝටස් රජුගේ ම පිළිරුව යැයි සිතන්නට පිළිවන.

ඉන්දු-ග්‍රීක පාලකයන්ගේ කාසිවල ප්‍රතිමුඛයේ වැඩි වශයෙන් ම යෙදී ඇත්තේ ග්‍රීක දෙවිවරුන්ගේ රූප සම්පූර්ණ ශරීරය ම දැක්වෙන ආකාරයෙනි. සියුස්, හෙරක්ලීස්, පලස්, ඇපොලෝ, ඩයොස්කුරි හා පොසීඩොන් මේ දෙවිවරුන් අතර සමහරෙකි. ඉන්දු-ග්‍රීක කාසි නිපදවූ ශිල්පීන් දේවතාරූප සකස් කිරීමේ දී සිරියානු කාසිවල දැක්වෙන දෙවි දේවතා රූප ආදර්ශ ලෙස ගත් බව පැහැදිලි ය. ඒ ඒ දෙවිවරුන් විවිධ ඉරියව්වලින් ඇතැම් විටෙක හුදෙකලාව ද, ඇතැම් විටෙක තවත් රූප සහිතව ද නිරූපණය කොට ඇත. අසුන් පිට නැඟී යන ඩයොස්කුරි දෙවිවරුන් ද, නිකේ නම් දෙවඟන අතින් ඔසවාගෙන සිටින සියුස් දෙවියා ද නිරූපණය කෙරෙන අවස්ථා ඒ දෙවැනි ගණයට වැටේ. ගලක් මත හිඳගෙන ගදවක් අතින් ගෙන සිටින ආකාරයෙන් ද, සිටගෙන තම හිස මත කිරුළක් පැළඳ ගැනීමෙහි යෙදී සිටින ආකාරයෙන් ද, හෙරක්ලීස් දේවතාවා කාසි දෙකක නිරූපණය වී ඇත. සිටගෙන දුන්නක් හා හීයක් දැතින් ගත් ඉරියව්වෙන් ඇපොලෝ දෙවියා ද, සිටගෙන වජ්‍රයක් හා කුන්තයක් දැතින් ගෙන සිටින ආකාරයෙන් සියුස් දෙවියා ද නිරූපණය වෙයි. යුක්‍රැටිඩීස්ගේ එක්තරා හතරැස් තඹ කාසියක සියුස් දෙවියා නිරූපණය කර ඇති අතර, එහි පාඨයෙහි ඒ දෙවියා කපිශ නුවරට අධිගෘහිත දේවතාවා ("කවිශියෙ නගර-දෙවතා") යයි හඳුන්වා දී තිබේ. මේ අනුව, මේ කාසි අතරින් සමහර ඒවායේ දේවතා රූප දක්වන්නට ඇත්තේ ඒ කාසි නිකුත් කළ නගරවල අධිගෘහිත දේවතාවුන් දක්වා ලීමට යැයි අනුමාන කළ හැක. පෙර සඳහන් කළ අයුරු, සිරියානු කාසිවල එන දේව රූප ආදර්ශ වශයෙන් ගෙන ග්‍රීක සම්ප්‍රදාය අනුගමනය කෙරෙමින්, ඉන්දු-ග්‍රීක කාසි තැනූවන් ඒවායේ දේවතා රූප සකස්

කළ බව සැබෑ වුව ද, ඒ කලා ශිල්පීහු සම්පූර්ණ අනුකරණයෙන් තොරව, ආදර්ශයනට ගැති නොවී, නිදහස් ලෙස සිය අදහස් ඉදිරිපත් කළහ. මීට පෙර ද වරක් සඳහන් වුණු ඇගතොක්ලීස්ගේ හා පැන්ටලියන්ගේ බ්‍රාහ්මී පාඨය සහිත හතරැස් තඹ කාසියේ ප්‍රතිමුඛයේ සුරතින් මලක් ගත්, දිග තෝඩු පැළඳ සිටින නිළියකගේ රුවක් දක්වේ. මේ කාසිය නිපදවීමේ දී ඉන්දියාවේ දේශීය කාසි නිපදවීමේ ක්‍රමයේ ආභාසය හා බලපෑම බෙහෙවින් ලැබී ඇති බවත්, ප්‍රතිමුඛයේ දක්වී ඇත්තේ ඉන්දීය ලක්ෂ්මී දෙවඟනගේ පිළිරුව විය හැකි බවත්, ජේ. ඇන්. බැනර්ජි ප්‍රකාශ කරයි. ඇතැම් කාසියක ප්‍රතිමුඛයේ දේවතා රූපයක් යොදනු වෙනුවට දේවතාවා පිළිබඳ අදහස ප්‍රකාශ වන පරිදි, එම දේවතාවාගේ ආයුධය වැනි කිසියම් වස්තුවක් සංකේතයක් ලෙස යොදගෙන ප්‍රතිමුඛයේ සටහන් ඊට සීමා කළ බව ද පෙනේ. මෙනැන්ඩර්ගේ හතරැස් තඹ කාසියක ප්‍රතිමුඛයේ දක්වෙන (හෙරාක්ලීස් දෙවියාගේ අවිය වන) ගදව මීට නිදසුන් සේ දක්විය හැක.

ඉන්දු-ග්‍රීක කාසි හැමකෙක ම ප්‍රතිමුඛය දේවතා රූප දක්වීමට පමණක් සීමා වී ඇතැයි කිව නොහැක. සමහර කාසිවල ප්‍රතිමුඛයේ ද දක්වෙන්නේ අශ්වාරෝහක ඉරියව්වෙන් සිටින රජුගේ ම පිළිරුවකි. මේ ප්‍රතිරූපය දක්වීමේ දී ද අශ්වයා නිසලව සිටින ආකාරය, ඉදිරි පා ඔසවා ගෙන සිටින ඉරියව්ව වැනි විවිධ ස්වරූපයෙන් එය දක්වේ. ඉන්දු-ග්‍රීක පාලකයන් සිය කාසිවල ප්‍රතිමුඛයේ විවිධ සත්ව රූප යොද ගත් අවස්ථා ද හමු වේ. මෙනැන්ඩර් රජුගේ කාසි දෙකක බකමූණකුගේ හා මොල්ලිය සහිත වෘෂභයකුගේ රූප ද, හර්මියස්ගේ කාසියක අශ්වයකුගේ රූපයක් ද ප්‍රතිමුඛයේ සටහන් වශයෙන් යෙදී තිබේ.

මෙම කාසිවල අභිමුඛයේ හා ප්‍රතිමුඛයේ විවිධ ආකාරයෙන් සකස් කර ගන්නා ලද ග්‍රීක අක්ෂර සංයුක්තයන් (monogrammes) යොද ගැනීම සිරිතක් විය (චිත්‍රය II, 1-35). එහෙත් එම සංකේතයන් යෙදීම කවර අර්ථයක් සඳහා කරන ලද්දේ ද යන්න තවමත් නොපැහැදිලි ය. එසේ වුව ද, මේ කාසිවලින් හඳුනාගන්නට ලැබෙන පාලකයන් බොහෝ දෙනෙකු පිළිබඳව ලිඛිත මූලාශ්‍රයන්ගෙන් ඓතිහාසික තොරතුරු සොයා ගත නොහැකි නිසා, ඒ ඒ රජවරුන්ගේ කාල නිර්ණය කර ගැනීමේ දී මෙම අක්ෂරසංයුක්ත සංකේතයන්ගේ ද, පාඨ ලිවීමේ දී යෙදී ඇති ග්‍රීක අක්ෂරයන්හි දක්නට ලැබෙන වෙනස් වීම් ද, ඉතා ප්‍රයෝජනවත් වේ.

## 4. ශක හා පහ්ලව කාසි

ක්‍රි. පූ. පළමුවැනි සියවසේ දී ඉන්දු-ග්‍රීකයනට අයත්ව තිබුණු ඉන්දියානු විජිත ශක (සිතියන්) හා පහ්ලව (පාර්තියන්) යන ජාතීන් විසින් අයත් කර ගනු ලැබිණි. මේ ජාතීන් දෙක අතර අඛණ්ඩ සබඳතාවක් වූ බවට ඉන්දීය ග්‍රන්ථ හා ලිපි සාක්ෂි සපයයි. මධ්‍ය ආසියාතික ගෝත්‍රයකට අයත් වූ සිතියන්වරුන් හා පාර්තියන්වරුන් අතර මුල දී දෙශපාලන ගැටුම් ඇති වුව ද, පසුව ඔවුන් අතර දෘඩ සබඳතාවෙක් විය. දෙවැනි මිත්‍රිඩේටස් නම් පාර්තියන් පාලකයාගෙන් පසුව, ශක හා පහ්ලව ගෝත්‍රිකයෝ ක්‍රමයෙන් ඉන්දියානු විජිතයන් ආක්‍රමණය කළහ. මේ ආක්‍රමණයන්ට මූලික හේතුව වශයෙන් සැලැකෙනුයේ මධ්‍ය ආසියාවේ සිට ආ කුෂාණයන් ශක, පහ්ලව ජාතීනට අයත්ව තුබූ බටහිර රටවලට පහර දීමයි. සීස්තානය, දකුණු අප්ඝනිස්තානය හා බලූකිස්තානය හරහා මොවුහු සින්දු නිම්නයේ පහළ කොටස් දක්වා සිය බලය හා ආධිපත්‍යය පැතිරවූහ. ලතින් ලෙඛකයන් දකුණු සින්ධු නිම්න ප්‍රදේශය සිතියාව (ශකස්තානය) යනුවෙන් නම් කරන ලද්දේ ද මේ හේතුවෙනි. ශක, පහ්ලව දෙපස අතර පැවති මේ සම්බන්ධය නිසා ඔවුන් වෙන් කොට හැඳින ගැනීම ද තරමක් අසීරු ය. එසේ වුව ද, වැඩි වශයෙන් සිතියානු නම් සහිත මොආස් හා වොනොනීස් රජුන් ප්‍රධාන පාලක පෙළපත් ශක යන නමින් ද, පර්සියානු නම් බහුලව දක්වෙන ගොන්ඩොපාරීස් රජු ප්‍රධාන පරපුර පහ්ලව පෙළපත වශයෙන් ද, සලකනු ලැබේ.

පංජාබය හා අවට ප්‍රදේශයන්ගේ ආධිපත්‍යය කලකට දැරූ මොආස් රජු හා ඔහුගේ පෙළ-පතත්, කන්දහාරය හා බලූකිස්තානය අවට ප්‍රදේශ පාලනය කළ වොනොනීස් හා ඔහුගේ සහායකයන් පෙළත්, ඉන්දියාවේ ශක පාලකයන්ගේ ප්‍රධාන ශාඛා දෙක ලෙස ගැණෙයි. මොවුනතුරින් පංජාබයේ මුල් ශක රජුන් ගැන සෙල් ලිපිවලින් සමහර සාක්ෂි ලැබෙතත්, වොනොනීස් හා ඔහුගෙන් පසුව ඒ ප්‍රදේශ පාලනය කළවුන් ගැන එබඳු සාක්ෂි ලැබී නැත. සාමාන්‍ය වශයෙන් මොආස් හා වොනොනීස් සමකාලීනයන් ලෙස පිළිගත හැකි වුව ද, ඉන්දීය ප්‍රදේශවල මුලින් ම සිය බලය තහවුරු කර ගත් ශක පාලකයා ලෙස ගිණිය යුත්තේ මොආස් ය. මොආස් තක්ෂශිලා තඹ සන්නසෙහි ''මෝග'' නමින් හැඳින්වෙන රජු බව සාමාන්‍ය පිළිගැනීමය.

තක්ෂශිලා තඹ සන්නසේ සඳහන් වනුව හඳුනා ගැන්ම පිළිබඳව ඉතිහාසඥයන් අතර මතභේද පැවැතිණි. කාසිවලින් මෙආස් රජු ගැන ලැබෙන සාක්ෂි සමඟ ද එකඟතාවක් දක්වන, බොහෝ දෙනා විසින් පිළිගනු ලැබෙන මතය අනුව, මෝග හෙවත් මොආස් රජුගේ රාජ්‍ය සමය ක්‍රි. පූ. 72 ට ආසන්න කාලයට වැටෙයි. මෙකල වයඹදිග ඉන්දීය ප්‍රදේශවල පැවති ඉන්දු-ග්‍රීක රජ පෙළපත් දෙකකට අයත් ව තුබූ ප්‍රදේශවලට අතරින් මථුරාව තෙක් සිය ආධිපත්‍යය ව්‍යාප්ත කරගන්නට මොආස් රජුගේ රාජ්‍යකාලයේ දී ශකයෝ පොහොසත් වූහ. ඉහත දක්වූ තඹ සන්නස ලියැවුණු අවදිය වන විට තක්ෂශිලාවේ මොආස් රජුගේ ක්ෂත්‍රපයකු (ප්‍රාදේශීය යටත් පාලක නිලධාරියකු) වූ බවට ඒ ලෙඛනය සාක්ෂි සපයයි.

මොආස්ගෙන් පසුව ඔහු යටතේ වූ ප්‍රදේශවල පාලන බලය හිමි වූයේ පළමුවන අසිස් නම් ශක පාලකයාටයි. මේ අලුත් පාලකයාට තමාට උරුම වූ ප්‍රදේශවලට ඉන්දු-ග්‍රීක පාලකයන් වූ යුතිඩීමොස්ගේ පරපුරට අයත් ව තුබූ ප්‍රදේශ අතරින් සමහරක් ද එකතු කර ගන්නට හැකි විය. පළමුවන අසිස්ගේ රාජ්‍ය කාලයේ දී මෙසේ ශක ආධිපත්‍යය පුළුල් වීම දක්වන ප්‍රධාන සාක්ෂි වනුයේ කාසියි.

වැලිගම

පළමුවන අසිස්ගේ කාසි අතර, ඔහුගේ නම සඳහන් කාසි මෙන් ම, අසිලිසිස් නම් තවත් පාලකයකුගේ නම සමඟ ඔහුගේ නම සඳහන් වන කාසි වර්ගයක් ද වෙයි. ජ්‍යෙෂ්ඨ පාලකයකු සමඟ කනිෂ්ඨ පාලකයකු ඒකාබද්ධ ව රාජ්‍ය පාලනයේ නිරත වීම ඉන්දියාවේ ද ශක ඉතිහාසයේ වැදගත් ලක්ෂණයක් විය. මෙබඳු ඒකාබද්ධ පාලනයක් පැවැති බව හඳුනා ගැනීමට ඒ අවස්ථා-වල දී නිකුත් කරන ලද කාසි බොහෝ දුරට ඉවහල් වෙයි. මෙබඳු පාලනයක් යටතේ නිකුත් කරන ලද කාසිවල ප්‍රධාන පාලකයාගේ නම අභිමුඛයේ ග්‍රීක පාඨයකින් ද, ද්විතීය පාලකයාගේ නම ප්‍රතිමුඛයේ ඛරොෂ්ඨී අක්ෂර පාඨයකින් ද, යෙදීම සාමාන්‍ය සිරිත විය. මේ අනුව අසිස් හා අසිලිසිස් දෙදෙනාගේ ම නම් සඳහන් ඉහත දැක්වුණු කාසිවලින් අසිස් ප්‍රධාන පාලකයා ලෙස ද, අසිලිසිස් ද්විතීයයා ලෙස ද, ඒකාබද්ධ පාලනයක නිරතව සිටි අවස්ථාවක් පිළිබිඹු වන බව ඉතිහාසඥයෝ නිගමනය කරති. කලක් මෙසේ ද්විතීයයකු වශයෙන් ඒකාබද්ධ පාලනයක යෙදුණු අසිලිසිස් පසුව තනිව ඒ ප්‍රදේශ තමන් යටතට ගෙන පාලනය කළේ ය. අසිලිසිස්ගේ නම අභිමුඛයේ ද, "අසිස්" යන නම ප්‍රතිමුඛයේ ද, (පිළිවෙළින් ග්‍රීක හා ඛරොෂ්ඨී අකුරින්) යෙදී තිබෙන තවත් කාසි වර්ගයක් වේ. මේ වර්ගයට අයත් කාසිවල නම සඳහන් අසිස් අසිලිසිස්ගේ තනි පාලනයට පසු, ඔහු හා හවුලේ පාලනය ගෙන ගිය දෙවැනි අසිස් නම් ද්විතීය පාලකයකු බව පිළිගත හැක. දෙවැනි අසිස් තනිව නිකුත් කළ කාසි ද දක්නට ලැබේ. අසිලිසිස් හා පළමුවැනි අසිස් දෙදෙනාගේ නම් සඳහන් කාසිවල අභිමුඛයේ පාඨවල යෙදෙන ග්‍රීක අකුරු හා අසිලිසිස්, දෙවැනි අසිස් යන පාලකයන්ගේ කාසිවල ග්‍රීක අකුරු සසඳා බැලීමේ දී ඉහත සඳහන් කළ නිගමනය තහවුරු කරන අකුරු පිළිබඳ වෙනස්කම් දක්නට ලැබේ. මේ අනුව, ඉන්දියාවේ ශක පාලකයන් අතර හුදෙකලා පාලනයක් පමණක් ගෙන ගිය එක ම රජතුමා ලෙස ගිණිය හැකි වන්නේ මොආස් පමණි.

ඇරකොසියාවේ පාර්තියන් ප්‍රදේශ පාලකයකු වූ ගොන්ඩොපාරිස් වයඹදිග ඉන්දියාවේ විශාල ප්‍රදේශයක් තමන් යටතට ගෙන පාර්තියානු අධිරාජ්‍යයෙන් ස්වාධීන වන්නට ක්‍රියා කළේ දෙවැනි අසිස්ගේ පාලන සමයේ දී බව පෙනේ. මුල දී ඉරානයේ පාර්තියානු අධිරාජ්‍යයේ ප්‍රදේශයක් පාලනය කළ ගොන්ඩොපාරිස් සිය බලය පතුරුවා ගෙන ස්වාධීන පාලකයකු බවට පත් වී රජ කළ සමය ක්‍රි. ව. 20-60 අතර කාලයට අයත් බව සලකනු ලැබේ. හේ දෙවැනි අසිස්-ගෙන් ශක පාලකයන් සතුව තුබූ ඇතැම් ප්‍රදේශ උදුරා ගත් අතර, ඊට අතිරේකව උතුරු ප්‍රදේශයේ හර්මියස් යටතේ පාලනය වූ ඉන්දු-ග්‍රීක පරපුරට අයත්ව තුබූ ඇතැම් ප්‍රදේශ හා නැඟෙනහිර ඉරානයේ පාර්තියානු අධිරාජ්‍යය යටතේ වූ සමහර ප්‍රදේශ ද තම පාලනය යටතට පත් කරගෙන තිබිණි. ශක පාලකයන් යටතේ වූ රාජ්‍යයේ බටහිර ප්‍රදේශ මෙසේ පහ්ලවයනට හිමි වී, ශක පාලකයන් දුබල වනවාත් සමඟ ම, ඔවුන් යටතේ ප්‍රදේශ පාලනයේ යෙදී සිටි ක්ෂත්‍රපයෝ ද නිදහස් ව ස්වාධීන පාලකයන් බවට පත් වූහ. මේ තර්ජන ඉදිරියේ ස්වකීය බලය රැක ගන්නට නොපොහොසත් වූ ඉන්දියාවේ ශක පාලකයන් තත්කාලීනව උතුරේ තමන්ගේ බලය තහවුරු කර ගන්නට වෑයම් කරමින් සිටි කුෂාණ නායකයන්ගේ ආධාර අපේක්ෂා කළ බව පෙනෙයි. උතුරේ ප්‍රදේශවල ආධිපත්‍යය සඳහා ඉන්දු-ග්‍රීක පාලකයන් හා සටන් වැදී මේ වන විට සාර්ථක ප්‍රතිඵල ලබා සිටි කුෂාණයෝ ගන්ධාර ප්‍රදේශයෙන් පහ්ලව බලය පලවා හරින්නට සමර්ථ වූහ. ගොන්ඩොපාරිස්ගෙන් පසුව වයඹදිග ඉන්දියාවේ ප්‍රදේශ අතර පහ්ලවයන්ගේ පාලනය යටතේ වූ ප්‍රදේශවල පාලකයා බවට පත් වූයේ ඇකොරිස් ය. ඔහුගේ පාලන සමයේ දී ද කුෂාණයෝ තම යටත් ප්‍රදේශ පුළුල් කර ගැනීමෙහි හා බලය වර්ධනය කර ගැනීමෙහි නිරතව සිටියහ. මෙසේ ක්‍රමයෙන් තව තවත් හීන වී ගිය පහ්ලව බලය සුළු කලක් යන තුරු ඉන්දියාවේ දේශ සීමා තුළ පැවැති නමුදු, ඒ සින්ධු-නිම්නයේ දකුණු ප්‍රදේශයේ බෙදී ගිය කුඩා ප්‍රදේශවල සුළු ප්‍රාදේශීය පාලනයක් ලෙස පමණි.

ශක-පහ්ලව ආක්‍රමණිකයන්ගේ පාලන සමය මෙසේ අවසන් වුව ද, ඔවුන් යටතේ ප්‍රදේස පාලනයේ නිරත වූ ක්ෂත්‍රපයෝ මින් පසු දිගු කලක් තිස්සේ ස්වාධීන ප්‍රදේශ පාලකයන් ලෙශ ක්‍රියා කළහ. බටහිර ක්ෂත්‍රපයන් නමින් ශක-පහ්ලව ආක්‍රමණිකයන්ගෙන් පැවත ආ මේ ප්‍රාදේශික පාලකයන් ගැන මතු පරිච්ඡේදයක විස්තර වෙයි.

ශක හා පහ්ලව පාලකයන් ඉන්දියාවේ දී ඉන්දු-ග්‍රීක රජවරුන්ගේ කාසි අනුකරණයෙන් සිය කාසි නිකුත් කළ බව පෙනේ. මොආස් රජුගේ කාසි අතර බහුලව දක්නට ලැබෙන තඹ කාසිවල අභිමුඛයේ, ඇත් හිසක් ද, ග්‍රීක හර්මිස් (Hermes) දෙවියාගේ ආයුධය ලෙස සැලකෙන කැඩුසියස් (Caduceus) අවියේ රූප සටහන ද නිරූපිත ය (චිත්‍රය IV, I). ඉන්දු-ග්‍රීක කාසි අතර ඩිමිත්‍රියස් රජු විසින් නිකුත් කැරුණු මෙම සටහන් ම දරන තඹ කාසියක් අනුව මොආස් රජුගේ මේ කාසි තනා ඇත. මොආස්ගේ තවත් හතරැස් තඹ කාසියක අභිමුඛයේ රජු අශ්වාරෝහකව සිටින ආකාරය දක්වේ. ඉන්දීය කාසි අතර අශ්වාරෝහක රජ රුව සහිත කාසි මුල්වරට ම හමු වන්නේ fපිලොක්සිනිස් හා හිපොස්ට්‍රාටොස් නම් ඉන්දු-ග්‍රීක රජවරුන් නිකුත් කළ කාසි අතරයි. ඒ රූප සටහන යෙදීමේ සිරිත පළමුවන අසිස්ගෙන් පසු නිතර ශක කාසිවල දක්නට ලැබෙන ලක්ෂණයකි (චිත්‍රය iv, 2). ඔවුන්ගෙන් පසු පහ්ලව පාලකයන්ගේ කාසිවල ද අශ්වාරෝහක රාජ රූපය බහුලව යෙදිණි. අධිරාජ්‍ය ගුප්ත පාලකයන් කිහිප දෙනෙකු විසින් ම නිකුත් කරන ලද අශ්වාරෝහක වර්ගයේ කාසිවලට ද පූර්වාදර්ශය වූයේ මේ විදේශීය පාලකයන්ගේ කාසි යැයි සිතිය හැක. ඉන් පසු ද ඇතැම් හින්දු පාලකයන්ගේ හා 14 වන ශතකය තෙක් සමහර මුස්ලිම් ආක්‍රමණිකයන්ගේ (ඉන්දීය) කාසිවල ද මේ රූප සටහන යෙදී තිබෙනු හමු වෙයි.

මොආස් රජුගේ සමහර රිදී හා තඹ කාසිවල අභිමුඛයේ සටහන ලෙස රජු අසුන් දෙදෙනකු යෙදූ රථයක ගමන් කරන ආකාරය දක්වේ. අශ්වරථාරූඪව ගමන් කරන රාජ රූපය කාසිවලට යෙදීම ශකයන්ගේ අලුත් ම නිර්මාණයක් සේ හැඳින්විය හැක.

මොආස් රජුගේ කාසි බොහොමයක අභිමුඛයේ රජ රුව වෙනුවට දෙවි දේවතාවුන්ගේ රූප යොදා තිබෙනු දක්නට ලැබේ. මේ රූ සටහන් බොහොමයක් ග්‍රීක කාසිවල එන සටහන් අනුව නිදහසේ සකසා ගත් ඒවා බව පෙනේ. සියුස්, පොසිඩොන්, පලස් ඇතිනි, හෙරක්ලිස් ආදී දේවතා රූප මෙන්ම, මොආස්ගේ කාසිවල එන හස්ති, වෘෂභ ආදී සත්ත්ව රූප ද, ඉන්දු-ග්‍රීක කාසිවල රූප සටහන් ඉතා ආසන්න ලෙස අනුගමනය කර සකසා ගන්නා ලද ඒවා ය. මේ අතර ම මොආස් ප්‍රධාන ශක පාලකයන්ගේ කාසිවල එන සමහර රූප සටහන් ඔවුන්ට ම විශෙෂ වූ නව නිර්මාණයන් ලෙස ද හඳුන්වා දෙන්නට පුළුවන. මේ නව නිර්මාණ අතර සමහර සටහන් ඉතා සංකීර්ණ ස්වරූපයක් ගන්නා අතර, සමහරෙක ඇත්තේ ඉන්දීය ලක්ෂණයි. ඉන්දු-ග්‍රීක හා ශක කාසි අතර විද්‍යමාන කිට්ටු සමානතාවට හේතු දක්වන පී. ගාඩ්නර් ''ග්‍රීකයන් විසින් පුහුණු කරන ලද කලා ශිල්පීන්ගේ සේවය ස්වකීය කාසි නිෂ්පාදනය කිරීම සඳහා මොආස් හා ඔහුගේ පරපුරට අයත් වූවන් විසින් ලබාගෙන ඇතැ''යි පවසයි. මොආස් රජුගේ කාසිවල එන ඉන්දීය දෙවිවරුන් යයි අනුමාන කළ හැකි සමහර රූප අතර ශිව දෙවියන් දක්වෙන රූපය පැහැදිලි ලෙස ම හඳුනා ගත හැක. ඔහුගේ හතරැස් තඹ කාසියක අභිමුඛයේ පීඨයක් මත ධ්‍යානී මුද්‍රාවෙන් හිඳගෙන සිටින මිනිස් රූපයක් යෙදී ඇත. සමහරු මෙය බුදු රුවකැයි අනුමාන කෙරෙති. එහෙත් ඉන් නිරූපණය වන්නේ ආසනයක් මත හිඳගෙන සිටින රජ රුවකැයි යන මතය වඩාත් පිළිගත හැකි බව පෙනේ. කෙසේ වුව ද, බුදු පිළිමයේ ප්‍රභවය ගැන හදරන විට මේ කාසියේ රූපය සම්බන්ධ ඉරියව්ව ඉතා වැදගත් ලෙස සැලකිය යුතු වෙයි.

මොආස් රජු විසින් නිකුත් කරන ලද කාසි සංඛ්‍යාව ඉතා විශාල බව හමු වී ඇති කාසි තොගවලින් පෙනී යයි. මෙය රජුගේ රාජ්‍ය කාලය දීර්ඝ එකක් වූ බවට සාක්ෂියකි. ඔහු විසින් තඹ හා රිදී යන ලෝහ දෙවර්ගයෙන් ම කාසි නිකුත් කර ඇති නමුත් රිදී කාසි හමු වී ඇත්තේ ඉතා විරල වශයෙනි.

පළමුවන අසිස්, අසිලිසිස් හා දෙවැනි අසිස් යන ශක පාලකයන් තිදෙනකු මොආස්ගෙන් පසු රජ කළ බවට සාක්ෂි ඇති අතර, ශක රජුන් විසින් නිකුත් කරනු ලදුව, දැනට හමු වී ඇති කාසිවලින් ද මේ බව තව දුරටත් තහවුරු වෙයි. එක් වර්ගයකට අයත් රිදී ශක කාසිවල අභිමුඛයේ ''බැසිලියොස් බැසිලියොන් මෙගලො , අසොළ'' (Basıleos Basileon Megalou Azou) යන ග්‍රීක පාඨය ද, ප්‍රතිමුඛයේ ''මහරජස රජතිරජස මහතස අයිලිෂස'' යන ඛරොෂ්ඨී අක්ෂර පාඨය ද, යොද ඇත. තවත් සමහර විට රිදී හා තඹ කාසිවල අභිමුඛයේ ''අසොළ'' (Azou) යන්න වෙනුවට ''අසිලිසොළ'' (Azilisou) යන්න ද, ප්‍රතිමුඛයේ පාඨයෙහි ''අයිලිෂස'' යන්න වෙනුවට ''අයස'' යන්න ද, යෙදී ඇත. මේ කාසි වර්ග දෙකෙහි ග්‍රීක පාඨ වඩා හොඳින් පිරික්සීමේ

දී පළමුවන වර්ගයේ කාසිවල යෙදී ඇති ග්‍රීක අකුරුවලට වඩා දූෂිත අකුරු දෙවැනි වර්ගයේ භාවිත වී ඇති බව පෙනී යයි. එය කාල නිර්ණය අතින් ඒවා අවස්ථා ද්වයකට අයත් බව පෙන්වන සාක්ෂියකි. මේ අනුව පළමුවන අයිස් නමින් අයිලිසිස් රජුට පෙර එක් රජකු ද, දෙවැනි අයිස් නමින් අයිලිසිස් රජුට පසු තවත් රජකු ද, රජ කළ බව ඉතිහාසඥයෝ නිගමනය කරති.

පළමුවන අයිස් හා අයිලිසිස් යන පාලකයන් දෙදෙනා තඹ මෙන් ම රිදී කාසි ද බහුල වශයෙන් නිකුත් කළ බව පෙනේ. විශේෂයෙන් ම පළමුවැනි අයිස්ගේ රිදී කාසි ඉතා වැඩි වශයෙන් හමු වී ඇත. මේ රජුන්ගේ රිදී, තඹ දෙවර්ගයේ ම කාසි සියුස්, හෙරක්ලීස්, පලස්, පොසීඩොන් යනාදි ග්‍රීක දෙවිදේවතාවුන්ගේ රූපවලින් යුක්ත වෙයි ( චිත්‍රය IV, 2 ). පළමුවන අයිස්ගේ තඹ කාසි අතර බහුලව ම දක්නට ලැබෙන්නේ අභිමුඛයේ වෘෂභ රූපයක් ද ප්‍රතිමුඛයේ සිංහ රූපයක් ද සහිත ප්‍රමාණයෙන් විශාල වටකුරු කාසි වර්ගයකි. අයිලිස්ගේ තඹ කාසි අතර වැඩි සංඛ්‍යාව හතරැස් ඒවා ය. ඒ රජ තමන්ට පෙර නිකුත් කැරුණු ශක කාසිවල රූප සටහන් බොහෝමයක් ම තවදුරටත් භාවිත කළ අතර, අලුත් නිර්මාණයන් ලෙස හැඳින්විය හැකි රූප සටහන් ද යොදා ගත්තේ ය. මේ නව නිර්මාණයන් අතර අභිෂේක – ලක්ෂ්මියගේ රූපය ඉතා වැදගති. ඉන් දැක්වෙන්නේ පියුමක් මත ඉදිරිපසට මුහුණ ලා සිටින ලක්ෂ්මියගේ හිස මතට ඇය දෙපස ඇති දිගු නටු දෙකක් සහිත පියුම් පත් දෙකක් මත සිටින කුඩා ඇතුන් දෙදෙනකු විසින් ජලය වත් කරන ආකාරයයි. ක්‍රි. පූ. දෙවන හා පළමුවන ශතකවලට අයත් යයි සැලැකෙන භාරුත් හා සාංචි යන ස්ථානවල බෞද්ධ ස්තූප ආශ්‍රිත කැටයම් අතර ගජ–ලක්ෂ්මියගේ යයි සැලැකෙන මේ රූපය දක්නට ලැබේ. සමහර විචාරකයෝ ඉන් නිරූපණය වන්නේ මායා දේවිය යැයි අනුමාන කරති. ලංකාවේ පැරැණි ම කාසි අතර වැදගත් තැනක් ගන්නා ලක්ෂ්මී තහඩු කාසිවල ඇත්තේ ද මේ රූප සටහන ම බව පෙනේ.

මේ හැරුණු විට, මේ රජු විසින් නිකුත් කරන ලද කාසි සමහරක හඳුනාගත නොහැකි ව ඇති දෙවි දේවතා රූප කීපයක් ම වෙයි. ඒවායින් සමහරක් ඉන්දීය දේවතා රූප බව පැහැදිලිව ම පෙනෙන අතර, එම රූප සටහන්වලින් ශක පාලකයන් කල් යාමේ දී වඩවඩා ඉන්දිය සංස්කෘතිය හා සම්බන්ධතා ඇති කර ගත් ආකාරය පැහැදිලි වෙයි. ඉන්දු – ග්‍රීක කාසිවල මෙන් ම ශක කාසිවල ද අභිමුඛයේ ග්‍රීක පාඨයක් ද, ප්‍රතිමුඛයේ ඛරොෂ්ඨී පාඨයක් ද යෙදීම සාමාන්‍ය සිරිත විය. රජුන්ගේ විරුදනාම වශයෙන් ''බැසිලියොස් බැසිලියොන් මෙගලොඋ'' (Basileos Basileon Megalou ) යන්න අභිමුඛයේ ග්‍රීක අකුරින් ද, ''මහරජස රජතිරජස මහතස'' යනුවෙන් පෙර කී පාඨයේ අනුවර්තනයක් ප්‍රතිමුඛයේ ඛරොෂ්ඨී අකුරින් ද යෙදිණි. මේ පාඨ යෙදීමේ දී ශක පාලන පරපුරෙහි එකිනෙක පාලකයාගේ කාසි අතර, ඔවුන්ගේ නාම මාත්‍රයන් හැරුණු විට විරුදනාමයන් සම්බන්ධයෙන් කිසිදු වෙනසක් දක්නට නොලැබේ.

වොනොනීස් පාලක පරපුරට අයත් වූ ශක පාලකයන් මොආස් පවුලට අයත් වූවන් තරම් බලවත් නොවූ බවට සාක්ෂි ඔවුන්ගේ කාසිවලින් හමු වේ. මේ පාලකයන් නිකුත් කළ කාසි හැම විට ම වාගේ හමු වී ඇත්තේ සින්ධු නදියෙන් බටහිර පෙදෙසිනි. වොනොනීස් රජුගේ නම පමණක් තනිව යෙදෙන කාසි හමු වී නැත. නිතර ම ඔහුගේ කාසිවල වොනොනීස් යන නම සමඟ ''ස්පැලහොරස්'' හා ''ස්පැලගදමස්'' යන දෙදෙනාගෙන් එකකුගේ නම ද සඳහන් වේ. සමහර කාසිවල ඇත්තේ මේ දෙදෙනාගේ නම් පමණි. මේ පෙළපතේ පාලකයන් නිකුත් කළ රිදී කාසි සියල්ලේ ම දක්නට ඇත්තේ අශ්වාරෝහක රජකුගේ රූප සටහනකි. ඒවායේ ප්‍රතිමුඛයේ එක් අතකින් ජයකුන්තය හා අනිකෙන් වජ්‍රය දරා සිටින සියුස් දේවතාවාගේ ප්‍රතිරූපය යොදා ඇත. ඔවුන් නිකුත් කළ තඹ කාසිවල අභිමුඛයේ හා ප්‍රතිමුඛයේ පිළිවෙළින් හෙරක්ලීස් දේවතා රූපය හා පලස් ඇතිනී දේවතාවියගේ රූපය යොදා තිබේ. මේ තඹ කාසි අතර වටකුරු හැඩයෙන් යුත් කාසි හමුවන්නේ ඉතා කලාතුරකිනි. වොනොනිස්ගේ තඹ කාසිවල අභිමුඛයේ පාර්තියානු ක්‍රමයට නිරූපිත රජ හිසක් ද ප්‍රතිමුඛයේ ග්‍රීක දේවතා රුවක් ද දැක්වේ. ප්‍රතිමුඛයේ නිතර ම යෙදී ඇත්තේ නිකේ හා පලස් යන දේවතාවියන්ගෙන් එක් අයකුගේ රුවකි. මේ රජුගේ සමකාලීනයකු හා සහායක පාලකයන් හැම දෙනකුගේ ම කාසිවල දක්නට ඇත්තේ මේ ලක්ෂණ ම යි.

කාසි නිකුත් කළ ඉන්දියාවේ පහ්ලව පාලකයන් අතර ප්‍රථමයා ලෙස ගිණිය හැකි ගොන්ඩොපාරිස් තනිව හා සිය ප්‍රාදේශීය පාලකයන් සමඟ එක්ව නිකුත් කළ කාසි හමු වී තිබේ. ඔහුගේ නමින් නිකුත් කරන ලද කාසි සංඛ්‍යාවෙන් බහුල ය. කාසිවල ඔහුගේ නම සමඟ නම් සඳහන් වන පාලකයන් අතර ගුඩ හා අබ්ඩගසිස් ඔහුගේ ඥාතීහු වූහ. ගොන්ඩොපාරීස්ගේ කාසිවල නම් සඳහන් ප්‍රාදේශීය පාලකයන් අතර අස්පවර්මන් වැදගත්. මේ රජුගෙන් පසු බිඳී ගිය ඉන්දියාවේ පහ්ලව රාජ්‍යයේ කොටස් පාලනය කළවුන් ලෙස සලකනු ලැබෙන පැකෝරිස්, සනබරීස් යන පාලකයෝ ද තමන්ගේ ම කාසි නිකුත් කළහ. මේ පහ්ලව පාලකයන් නිකුත් කළ කාසි බොහෝ දුරට ඉන්දු–ග්‍රීක හා ශක කාසි අනුගමනයෙන් සකසා ගන්නා ලද නිසා ඒවායේ නව්‍ය ලක්ෂණ ඇතොත් ඒ ඉතා විරල වශයෙනි.

ගොන්ඩොපාරීස්ගේ හා ඔහුගේ සහායකයන්ගේ කාසිවල බහුලව යෙදෙන, ශක හා ඉන්දු – ග්‍රීක කාසිවල නොයෙදෙන, සැලැකිය යුතු විදේශීය ලක්ෂණයක් නම් දිගු රවුළක් සහිත රජ හිසක් යෙදීමයි. මේ හැරුණු විට ගොන්ඩොපාරීස්ගේ කාසිවල අභිමුඛයේ නිතර ම පාහේ යෙදෙන රූපය, ඉන්දු – ග්‍රීකයන් හා ශකයන් නිතර යොදගත් අශ්වාරෝහක රාජ රූපයයි (චිත්‍රය IV, 2). ඔහුගේ එක් වර්ගයක කාසිවල ප්‍රතිමුඛයේ ශිව දෙව් රුව යෙදී ඇත. මේ පහ්ලව කාසිවල දක්නට ඇති, විශේෂයෙන් ම ඉන්දීය යැයි කිව හැකි එක ම ලක්ෂණය යි. ශිව ප්‍රතිරූපය මෙසේ යොද තිබීමෙන් ද, මේ රජුගේ ඇතැම් කාසිවල ඛරොෂ්ඨී අක්ෂර පාඨයෙහි ''දේවව්‍රත, සුදෙවව්‍රත'' යන පද යොද තිබීමෙන් ද, ඔහු ශෛව භක්තයකු වූ බව හෙළි වෙතැයි ජේ. ඇන්. බැනර්ජි කල්පනා කරයි. ඔහුගේ කාසි නිපදවීම සඳහා වැඩි වශයෙන් භාවිත කර ඇත්තේ තඹ කොටස් හතරකට එක රිදී කොටසක් සංයෝග කර සකසා ගත් බිලන් නම් මිශ්‍ර ලෝහයයි. ඉන්දු – පාර්තියන් රජවරු තඹ කාසි ද නිකුත් කළහ.

ගොන්ඩොපාරීස් රජුගේ කාසිවල ද, ඉන්දු – ග්‍රීක හා ශක කාසිවල මෙන්ම අභිමුඛයේ ග්‍රීක හා ප්‍රතිමුඛයේ ඛරෝෂ්ඨී අක්ෂර පාඨයක් යෙදී ඇත. එහෙත් බොහෝ විට මේවායේ ග්‍රීක පාඨය ඉතා දූෂිත, කියවීමට පවා නොහැකි, නොපැහැදිලි අකුරින් ලියැවී ඇත. ගොන්ඩොපාරීස් රජු ද සිය විරුද නාමය ලෙස යොද ගෙන ඇත්තේ ''බැසිලියොස් බැසිලියොන් මෙගලොළ'' යන්නයි. මේ කාසිවල පාඨ යෙදීමේ විශේෂ ලක්ෂණයක් ලෙස ගිණිය හැක්කේ මීට වඩා වැඩි යමක් ප්‍රාකෘත භාෂාමය ඛරෝෂ්ඨී පාඨයෙන් කීමට තැත් දරා තිබීමයි. ''මහරජස මහතස ත්‍රතරස දෙවව්‍රතස ගුඩුඵරස සසස'' යන පාඨය හෝ ඊට සමාන පාඨයක් හෝ ප්‍රතිමුඛයේ ඛරොෂ්ඨී අකුරින් යෙදෙයි. මේ පාඨයේ එන ''සසස'' යන්න ඔහු හා එක්ව පාලනයෙහි යෙදුන සසන් නම් අනෙක් පාලකයකුගේ නම බව සැලැකේ.

## 5. කුෂාණ කාසි

ඉන්දියාවේ පාලන බලය තහවුරු කර ගත් විදේශීය පාලකයන්ගේ කාසි අතරින් ඉන්දීය කාසිවලට වැඩි වශයෙන් ම බල පා ඇත්තේ කුෂාණ රජවරුන්ගේ කාසි යැයි කිව හැකි ය. එබැවින් ඉන්දීය කාසි හැදෑරීමෙ දී කුෂාණ කාසි විශේෂ වැදගත්කමකින් යුක්ත වෙයි. දේශපාලන ඉතිහාසය අතින් ද, මෞර්‍ය්‍යයන්ගේ වැටීමෙන් පසු, පළමු වරට ඉන්දියාවේ මෙන් ම, ඉන්දියාවෙන් පිටත ද, මධ්‍ය ආසියාව තෙක් පැතිර ගිය විශාල අධිරාජ්‍යයක් පිහිටුවන ලද්දේ කුෂාණයන් විසිනි. දේශපාලන අංශයෙන් මෙන් ම, ආගමික හා සාංස්කෘතික වශයෙන් ද, කුෂාණයන්ගේ පාලන සමයෙහි ඉන්දියාවේ විශාල දියුණුවක් ඇති විය. මහායාන බුදු සමයේ නැඟීමත්, මථුරා සහ ගන්ධාර කලා සම්ප්‍රදයයන්ගේ සංවර්ධනයත්, මෙකල ඇති වූ ආගමික හා සාංස්කෘතික ප්‍රබොධයේ වැදගත් ලක්ෂණයන් ලෙස හැඳින්විය හැකි ය.

මධ්‍ය ආසියාතික ගොත්‍රයක් වූ යූඑ - චි වරු (Yueh-chi) ඒ ප්‍රදේශයේ විසූ තවත් සටන්කාමී ගොත්‍රික පිරිස් විසින් පලවා හරින ලදුව, නැගෙනහිර දෙසට සංක්‍රමණය වී අවසානයේ දී ක්‍රි.පූ. දෙවැනි ශතකයේ මැද භාගයේ දී පමණ බැක්ට්‍රියාව පාලනය කළ ශක වංශිකයන් පරදවා එහි බලය අත්පත් කර ගත්හ. බැක්ට්‍රියාවේ දී යූඑ – චි වරුන් කණ්ඩායම් කිහිපයකට බෙදී ගිය අතර, ඔවුන් අතරින් වඩා ම බලගතු වූවෝ කුජුල – කැඩ්ෆිසිස් (Kujula Kadphisis) නායකත්වය පිළිගත් කුෂාණයෝ යි. ඔවුන් බැක්ට්‍රියාවේ සිට ඉන්දියාව දෙසට බලය විහිදුවා ලීමට උත්සාහ කළේ මේ නායකයාගේ සමයේ දී ය. කුජුල කැඩ්ෆිසිස් සාර්ථක ලෙස ක්‍රමයෙන් තම බලය තහවුරු කර ගත් අයුරු ඉන්දියාවේ අවසාන ඉන්දු – ග්‍රීක පාලකයා වූ හර්මියස්ගේ හා කුජුල කැඩ්ෆිසිස්ගේ කාසිවලින් පැහැදිලි වේ. ඇතැම් කාසිවල අභිමුඛයෙහි රාජ විරුදනාම සහිතව හර්මියස් රජුගේ නම දක්වෙන අතර, ඒවායේ ප්‍රතිමුඛයේ විරුදවලින්ගෙන් තොරව, කුෂාණ නායකයාගේ නම ඛරොෂ්ඨී පාඨයෙහි ( කුජුල කසස, කුෂාණ යෞගස ධ්‍රම ඨීදස ) දක්වෙයි. මෙයින් කුජුල කැඩ්ෆිසිස් මුල් අවදියේ දී හර්මියස් රජුගේ ආධිපත්‍යය පැවැති ප්‍රදේශයේ සාමාන්‍ය පාලකයකු ලෙස ක්‍රියා කළ බව පෙනී යයි. අනතුරුව කුජුල කැඩ්ෆිසිස් තමන්ගේ කාසි නිකුත් කරමින් රාජවිරුදයන් සහිතව ස්වකීය නාමය ( මහරජස මහතස කුෂණ – කුයුල – කසස ) යොද තිබීමෙන් පැහැදිලි වන්නේ ඒ වන විට කුෂාණයන් හර්මියස් සතුව තුබූ පාලන බලය තමන් අතට ගන්නට සමත් වූ බවයි. ක්‍රි. ව. 50 පමණ වන විට කුජුල කැඩ්ෆිසිස් විසින් මෙසේ කුෂාණ බලය ඉන්දීය ප්‍රදේශවල තහවුරු කර ගන්නා ලද අතර, අනතුරුව පිළිවෙළින් වීම කැඩ්ෆිසිස්, කණිෂ්ක, හුවිෂ්ක හා වාසුදේව යන රජවරු ක්‍රි.ව. 180 පමණ වන තුරු කුෂාණ බලය අඛණ්ඩව පවත්වා ගත්හ. කණිෂ්කගේ රාජ්‍ය සමය වන විට, මේ පෙළපතේ බලය ඉන්දියාවේ විශාල ප්‍රදේශයක මෙන් ම, මධ්‍ය ආසියාව දක්වා ද විහිදී තුබුණු බැව් පෙනේ. ඉන්දියාව තුළ මධ්‍ය දේශ, උත්තරාපථ, අපරාන්ත යන ප්‍රදේශයන් ද, මධ්‍ය ආසියාවේ ඛෝතාන් දක්වා ප්‍රදේශය ද, කණිෂ්කගේ අධිරාජ්‍යය යටතේ පැවැතිණි. වසුමිත්‍ර, අශ්වඝොෂ ආදී මහායාන බෞද්ධ ආචාර්යවරයන්ගේ ප්‍රධානත්වයෙන් සිව්වන ධර්ම සංගීතියක් පවත්වන ලද්දේ ද මේ අධිරාජයාගේ රාජ්‍ය කාලයේ දී ය. කණිෂ්ක රජතුමා ශක සංවත්සරයේ ( ශක වර්ෂ 1 = ක්‍රිස්තු වර්ෂ 78 ) ආරම්භකයා ලෙස ද සලකනු ලැබේ.

විදේශීය පාලක පරපුරක් වුව ද, ඉන්දියාවේ කුෂාණ පාලකයන්ගේ සංස්කෘතික කටයුතු පිරික්සන විට පෙනී යන ඉතා වැදගත් කරුණක් නම්, විවිධ ආකාරයෙන් ඔවුන් ස්වදේශිකයන් ලෙස ක්‍රියා කිරීමට මහත් අභිරුචියක් දක්වා තිබීමයි. රජුන්ගේ නාමයන් පවා භාරතීය

ස්වරූපයකින් සකස් කර ගැනීමට ඔවුන් තැත් කළ බව මෙම රජ පරපුරේ අවසානයාගේ නම ''වාසුදේව'' යනුවෙන් යෙදී තිබීමෙන් පැහැදිලි වෙයි. වාසුදේවගෙන් පසු කුෂාණ ඉතිහාසය අවිනිශ්චිත ය. සමහර ඉතිහාසඥයන් විසින් පශ්චාත් – කුෂාණයන් නමින් හඳුන්වනු ලැබෙන පාලකයන් අතර වැදගත් යැයි සැලැකිය හැක්කේ තුන්වැනි කණිෂ්ක හා වාසු හෙවත් දෙවැනි වාසුදේව යන නම් දරූ රජවරු දෙදෙනක් පමණි. ඔවුන් ගැන ද දැනගත හැකි ඓතිහාසික තතු ඔවුන් නිකුත් කළ කාසිවලට පමණක් සීමා වී ඇත.

ආරම්භයේ දී කුෂාණ පාලකයන් ඉන්දියාවේ දී නිකුත් කළ කාසි ඉන්දු – ග්‍රීක කාසි අනුගමනයෙන් නිකුත් කරන ලද බව පෙනේ. මේ දෙවර්ගයේ කාසි අතර සමානකම් දක්නට ලැබෙන අතර ම, ඉන්දු – ග්‍රීක කාසිවල දක්නට ඇති ඇතැම් ලක්ෂණ ද කුෂාණ රජවරු ස්වකීය කාසිවලට ඇතුළු කළහ. බහුල වශයෙන් රන් කාසි නිකුත් කිරීම කුෂාණ කාසි ඉතිහාසය පිළිබඳ වැදගත් ලක්ෂණයක් ලෙස දැක්විය හැක. ඉන්දියාවේ මීට පෙර කාලයකට අයත් යැයි සැලැකෙන රන් කාසි ලැබී ඇත්තේ තක්ෂශිලා ප්‍රදේශයේ නිකුත් කරන ලදැ යි නිගමනය කෙරෙන කාසි කිහිපයක් පමණි. මිනුදු ඉන්දු – ග්‍රීක පාලකයන්ගේ රන් කාසි ඉන්දියාව තුළ භාවිත කිරීම සඳහා නිකුත් කළ ඒවා නොවන බව පසුගිය පරිච්ඡේදයක ඉන්දු – ග්‍රීක කාසි ගැන අධ්‍යයනය කරද්දී පෙන්වා දෙනු ලැබිණි. මේ නයින් බලන කල, ඉන්දියාවේ මුල් වරට පුළුල් වශයෙන් භාවිතයට පත් වුණු රන් කාසි නිකුත් කරන ලද්දේ කුෂාණ පෙළපතට අයත් වීම කැඩ්ෆිසිස් විසිනැයි පිළිගත හැකි වේ. මේ වටිනාතම ලෝහය කාසි සම්පාදනය සඳහා යොද ගැනීමට තුඩු දුන් ප්‍රධාන හේතුවක් වූයේ මේ සමයෙහි ඉන්දියාව හා රෝම අධිරාජ්‍යය අතර පැවැති දියුණු වෙළෙඳ සම්බන්ධතාවයි. ඉන්දියාවෙන් ගෙන යන ලද සුඛොපභොගී වෙළෙඳ ද්‍රව්‍යයන් සඳහා මෙකල රෝම අධිරාජ්‍යයෙන් විශාල ප්‍රමාණයන්ගෙන් ඉන්දියාව වෙත මුදල් හා රන් ඇදී ආ බව පෙනේ.

කුෂාණයන් රන් කාසි නිපදවීමේ දී රෝම ඖරියස් (Aurius) කාසිවල මිම් ක්‍රමය යොද ගත් අතර, එසේ කරන ලද්දේ ඒ කාසි තම කාසි නිෂ්පාදනයේ දී ආදර්ශ කොට ගැනීමත්, මෙසේ නිපදවූ කාසිවලින් රෝම වෙළෙඳුන් හා ගනුදෙනු කිරීමේ අවශ්‍යතාවත් නිසා යැයි කිව හැක. කුජුල – කැඩ්ෆිසිස්ගේ තඹ කාසියක අභිමුඛයේ රාජ ශීර්ෂය දැක්වීමේ දී ඔගස්ටස් නම් රෝම අධිරාජයාගේ රන් කාසිවල රාජ ශීර්ෂය දැක්වෙන ක්‍රමය අනුගමනය කර තිබීම ද මේ රෝම බලපෑම නිසා ඇති වූ ලක්ෂණයකි.

රිදී කාසි දක්නට නොලැබීම ද කුෂාණයන්ගේ කාසි පිළිබඳ ඉතිහාසයේ තවත් වැදගත් ලක්ෂණයකි. මෙකල රිදී හිඟයක් පැවතීම මීට හේතුව ලෙස අනුමාන කරන්නට පුළුවන. මේ සමයේ දී එබඳු රිදී හිඟයක් වූ බවට සාධකයක් ලෙස රෝම අධිරාජ්‍යයේ පවා මෙකල නිකුත් කරන ලද රිදී කාසි සංඛ්‍යාවෙන් මෙන් ම රිදීවල ලෝහ අගයෙන් ද අඩු වීම පෙන්වා දිය හැකි වේ. මේ කරුණු අනුව පෙනී යනුයේ කුෂාණ පාලකයන් සිය කාසි රන් හා තඹ යන ලෝහ වර්ගයන්ගෙන් පමණක් නිකුත් කළ බවයි.

තමන්ගේ රන් කාසි නිපදවීමේ දී කුෂාණ පාලකයන් ඒවා වටිනාකම් කිහිපයකට අයත් වන සේ නිකුත් කළ බව පෙනේ. දිනාර 1 (Dinara) ( රෝම ඖරයි කාසිය = දිනාර 1 = ග්‍රෙන් 124 ) දීනාර 2 හා දීනාර 1/4 යන වටිනාකම්වලින් යුතුව වීම කැඩ්ෆිසිස් වර්ගත්‍රයක කාසි නිකුත් කළේ ය. පැරැණි ඉන්දීය ලේඛනවල දීනාර යන නාමය වටිනාකම් ගැන නොතකා පොදුවේ සියලු රන්කාසි නම් කරනු සඳහා යොද ගෙන තිබේ.

කුෂාණ රජවරුන් නිකුත් කළ කාසිවල අභිමුඛයෙහි හැම විට ම පාහේ යොද තිබෙන්නේ රජුගේ ප්‍රතිරූපයයි. මෙය හිස, උඩු කය හා සම්පූර්ණ ශරීරය යන විවිධ ආකාරයන්ගෙන් දක්නට ලැබේ. සම්පූර්ණ රාජ රූපය දැක්වීමේ දී සිටි ඉරියව්වෙන් මෙන් ම හිඳි ඉරියව්වෙන් ද එය නිරූපණය වෙයි. කුජුල – කැඩ්ෆිසිස්ගේ සමහර කාසිවල රාජ ශීර්ෂය යෙදීම ඔගස්ටස් නම් රෝම අධිරාජයාගේ කාසියක දැක්වෙන අභිමුඛයේ රූප සටහන අනුගමනය කළ අවස්ථාවක් වෙයි. වීම කැඩ්ෆිසිස්ගේ කාසිවල රජුගේ උඩුකය වලා පටල මැදින් මතු වී එන ආකාරයකින් යෙදී ඇත.

ඔහුගේ සම්පූර්ණ පිළිරුව දැක්වෙන කාසිවල රජු සයනයක් මත එරමිණිය ගොතාගෙන හිඳින ආකාරය පිළිබිඹු කර ඇත. බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ඇති මේ රජුගේ ඉතා දුර්ලභ ගණයේ කාසියක රජු අසුන් දෙදෙනකු යෙදූ රථයක ගමන් කරන ආකාරය නිරූපිත ය. ඔහුගේ තඹ කාසිවල හැම විට ම වාගේ කාසියේ දකුණු පස ඇති පූජාසනයක් අසලින් සිටගෙන රජු ඊමත සුවඳ ද්‍රව්‍යයක් වැනි යමක් සුරතින් දමන ආකාරය දක්වයි. කුෂාණයන්ගේ ඇඳුම වූ දිගු කබාය (ෂර්වානිය) හැඳ උස් පාවහන් ලා හිසෙහි කේතුකාකාර හිස් වැස්මක් සහිතව සැරැසී සිටින රජ රුවකි, මෙහි දැක්වෙන්නේ. කණිෂ්ක රජුගේ රන් කාසිවල සම්පූර්ණ පිළිරුව දැක්වීමේ දී වැඩි වශයෙන් යෙදී ඇත්තේ රාජ – දණ්ඩ (ඇතැම් විටෙක අංකුසයක් ද) වමතින් ගෙන, අනෙක් අතින් ඉහත දැක්වූ පරිදි පූජාසනයක් මත යම් ද්‍රව්‍යයක් දමමින් සිටින රජුගේ රූපයයි (චිත්‍රය III, 4 ). මේ රජුගේ තඹ කාසිවල රාජ ප්‍රතිරූපය සයනයක් මත එරමිණිය ගොතා වාඩිගෙන සිටින ඉරියව්වෙන් හෝ අත් ඔසවාගෙන සිටින විලාසයෙන් හෝ හස්ත්‍යාරෝහක ආකාරයෙන් හෝ යෙදී තිබේ.

හුවිෂ්ක රජුගේ රන් කාසිවල අභිමුඛයේ රාජ රූපය දැක්වෙන්නේ හිඳගෙන හෝ හස්ත්‍යාරෝහකව හෝ සිටින අයුරිනි. හස්ත්‍යාරෝහකව දැක්වෙන රාජ රූපය ඇති කාසිවල රජුගේ අතේ අංකුසයක් ද වෙයි. සාමාන්‍යයෙන් රජුගේ ඇඳුම ෂර්වානිය වුව ද, ඇතැම් අවස්ථාවක ලෝහමය සන්නාහයකින් සැරැසී සිටින ආකාරයක් ද දැක්වෙයි.

කුෂාණයන්ගේ කාසිවල ද ඉන්දු – ග්‍රීක කාසිවල මෙන් ම රජ රුව දැක්වීමේ දී ඉන් රජුගේ පෞද්ගලිකත්වය පිළිබිඹු වන සේ එය සකස් කිරීමට කාසි.තැනූ ශිල්පීන් උත්සාහ දරා ඇති බව කාසිවල රූපසටහන් විභාග කිරීමේ දී පෙනේ. රාජ රූපවල යටි රවුළ හා දිගු නාසය විශේෂයෙන් කැපී පෙනෙන අංග ලක්ෂණ ලෙස හඳුන්වා දිය හැක.

කුජුල – කැඩ්ෆිසිස්ගේ වටකුරු තඹ කාසියක අභිමුඛයේ යොද ඇත්තේ මොල්ලිය සහිත වෘෂභ රූපයකි. සාමාන්‍ය සිරිත ලෙස අභිමුඛයේ රාජ රූපය දැක්වීම වෙනුවට මෙසේ සත්ත්ව රූපයක් දක්වා තිබීම සාමාන්‍යයෙන් අනුගමනය කළ ක්‍රමය ඉක්මවා ගිය අවස්ථාවක් ලෙස විශේෂයෙන් සඳහන් කළ හැක.

මේ රජවරුන්ගේ කාසිවල ප්‍රතිමුඛයේ සුමේරියානු, පර්සියානු, ග්‍රීක හා ඉන්දීය දෙවි දේවතාවන්ගේ රූප සටහන් විශාල සංඛ්‍යාවක් යොදගෙන තිබෙනු දක්නට ලැබෙයි. කෙසේ වුව ද, මෙම දේවතා රූප ස්වකීය කාසිවල යොද ගැනීමේ දී කුෂාණ පාලකයෝ ඉන්දු – ග්‍රීකයන් අනුගමනය කළ ක්‍රමයට වෙනස් ක්‍රමයක් අනුගමනය කළහ. කාසිවල දෙවිදේවතා රූප සටහන් සමග ඔවුන්ගේ නම් සඳහන් ග්‍රීක අකුරින් ලියූ පාඨ යොද තිබීම නිසා එම දේවතාවුන් නිශ්චිත ලෙස හඳුනා ගැන්ම පහසු වී ඇත. මෙසේ ප්‍රතිමුඛයේ දේවතා රූප සමඟ දේවතාවන්ගේ නම් ග්‍රීක අකුරින් සඳහන් කිරීමේ ක්‍රමය කුෂාණ පාලකයන් විසින් ආරම්භ කරන ලද නව්‍ය පිළිවෙළක් ලෙස සැලැකිය හැක.

වීම – කැඩ්ෆිසිස් රජුගේ කාසිවල බෙහෙවින් ම දක්නට ලැබෙන්නේ ශිව දෙවියාගේ රූප සටහනයි. මේවායේ එම දෙවියා අත් දෙකක් හෝ සතරක් හෝ සහිතව ද, සිය වෘෂභ වාහනය සමඟ හෝ එය රහිතව ද නිරූපණය වෙයි. ශිව දෙවි පිළිරුව දැක්වෙන විට දේව රූපයේ අත්වලින් එම දෙවියා හා සම්බන්ධ වස්තූන් වන ත්‍රිශූලය, පරශුව, අංකුසය, දිවිසම, වජ්‍රය යනාදිය දරා සිටින ආකාරය නිරූපණය කෙරේ (චිත්‍රය III, 3).

කණිෂ්ක රජුගේ කාසිවල ප්‍රතිමුඛ සටහන් මඟින් දක්වනු ලැබෙන දේවතා සමූහය සංඛ්‍යා වශයෙන් මීට වඩා විශාල ය. පර්සියානු දෙවිවරුන් අතර ''වාඩෝ''(Oado)නමින් හැඳින්වෙන වායු දෙවියා ද, ''අත්ෂෝ'' (Athsho) නමින් හැඳින්වෙන අග්නි දේවතාවා ද, ''මාඕ'' (Mao) නම් චන්ද්‍රදෙවියකු ද වන අතර, ''නානා'', ''නානියා'' හා ''නානාෂාඕ'' යන නාමයන්ගෙන් හැඳින්වෙන සුමේරියානු මාර්තෘ දෙවඟන හා fපරෝ (Pharro) නම් අග්නි දේවයා ද, ග්‍රීකයන්ගේ සූර්ය දේවතාවකු වන හෙලිඕස් (Helios) ආදීන් ද, ඉන්දීය ශිව (Oesho) දෙවියා හා බුදුන් (Boddo) ද, කණිෂ්ක රජුගේ කාසිවල ප්‍රතිමුඛයේ රූප සටහන් මගින්

දක්වා තිබේ. මෙම දේවතා රූප නිරූපණයේ දීද, අභිමුඛයේ රජවරුන් දැක්වීමේ දී මෙන් ම හිස වටා රශ්මි මාලාවක් යෙදීම සිරිතක් ලෙස අනුගමනය කරන ලදී. බුදු රුව හිඳි හා හිටි යන ඉරියව්වලින් නිරූපණය වී ඇත. ඒ රූප සටහන්වල අත් දක්වා ඇත්තේ ධම්වක්‍ර හා අභය මුද්‍රාවන්ගෙනැයි සිතන්නට ඉඩ ඇත. දිගු කන්, උෂ්ණීෂය වැනි ශරීර ලක්ෂණයන්ගෙන් හා දෙවුර වසා පෙරවූ සිවුරෙන් ද යුත් බුදු රුව මුළු සිරුර වටා දිවෙන රැස් මාලාවක් සහිතව නිරූපණය කොට ඇත (චිත්‍රය IV, 4). ක්‍රිස්තු වර්ෂාරම්භයට පෙර කාලයට ගිණිය හැකි බුදු පිළිම ඉන්දියාවේ නොමැති හෙයින්, බුදු පිළිමයේ ප්‍රභවය හැදෑරීමේ දී ද කණිෂ්ක රජුගේ මේ කාසිය ඉතා වැදගත් තැනක් උසුලයි. කණිෂ්ක බෞද්ධයකු වී ය යන මතය තහවුරු කිරීමේ දී ද බුදුරුව සහිත ප්‍රතිමුඛයෙන් යුත් මේ කාසිය වැදගත් නාණක විද්‍යාමය සාධකයක් සේ ගිණිය හැකි වෙයි. කෙසේ වුව ද, ඉහත දැක්වූ පරිදි,කණිෂ්ක රජුගේ කාසිවල ප්‍රතිමුඛයේ රූප සටහන් විවිධ ආගමික සම්ප්‍රදයයනට අයත් දෙවි දේවතා රූප යොද තිබෙනු දක්නට ලැබීමෙන් ඔහු වෙත පැවැති සමයසහනශීලීභාවය කොතරම් දැයි වටහා ගත හැකි වෙයි. ඇතැම් විටක මෙම පාලකයා කාසිවල දක්වන ලද විවිධ දෙවි දේවතා රූප මඟින් දක්වන්නට අදහස් කළේ ස්වකීය අධිරාජ්‍යය තුළ පැවැති විවිධ ප්‍රදේශවල ජීවත් වූ වැසියන්ගේ ඇදහිල්ලට හා ගෞරවයට පාත්‍ර වූ දෙවි දේවතාවන් වූ බව ද සැලැකිය හැක.

හුවිෂ්ක රජුගේ කාසිවල ප්‍රතිමුඛයන්හි කණිෂ්ක රජු විසින් සිය කාසිවල නොයොදන ලද ඇතැම් දෙවි දේවතාවුන්ගේ රූප සටහන් යෙදී ඇත. රෝමා (Roma) හෙරක්ලීස් (Heracles) අර්දෙක්ෂෝ (Ardoksho) වැනි ග්‍රීක හා පර්සියානු දෙවිවරුන් මෙන් ම, විෂ්ණු (Ooshna) හා මහාසේන (Maasena) යන භාරතීය දෙවිවරුන් ද, මෙම කාසිවල යෙදෙන රූප සටහන්වලින් දැක්වේ. හුවිෂ්ක රජුගේ එක් කාසි වර්ගයක "ගණෙශ" යන බ්‍රාහ්මී පාඨය සහිත ප්‍රතිමුඛයේ දුන්නක් අතින් ගත් දෙවියකුගේ රූපයක් යෙදී තිබේ.

වාසුදේව රජු නාමාර්ථයෙන් වෛෂ්ණව භක්තිකයකු ලෙස පෙනෙතත්, ඔහුගේ කාසි සියල්ලේ ම වාගේ ප්‍රතිමුඛයේ යෙදෙන්නේ ශිව දෙවියා නිරූපණය කෙරෙන රූප සටහන් ය. මේවා අතර දක්නට,ලැබෙන විශෙෂයෙන් සඳහන් කළ යුතු ලක්‍ෂණයක් ලෙස සැලැකිය හැක්කේ, ඇතැම් විටෙක ශිව දෙවියා ත්‍රිමුඛ ස්වරූපයෙන් දක්වා තිබීමයි (චිත්‍රය iv, 5). මධ්‍යකාලීන මූර්ති නිර්මාණයන් අතර උසස් තැනක් ගන්නා ඇලිfපන්ටාවේ ත්‍රිමූර්ති නමින් හැඳින්වෙන ශිව රූපය ගැන විග්‍රහයක් කළ ජේ. ඇන්. බැනර්ජි මෙහි වූ මුඛත්‍රයෙන් ශිව දෙවියාගේ "සෞම්‍ය" හා "ඝොර" ගුණයන් ද ඔහුගේ "ශක්ති" ද නිරූපණය කෙරෙන බව නිගමනය කරයි. මේ අනුව බලන කල, මෙම කාසියේ දැක්වෙන ත්‍රිමුඛ ශිව රුව ද එබඳු අදහසක් පළ කැරෙන ආදිතම නිරූපණයක් බව කල්පනා කළ හැක.

කණිෂ්ක දක්වා රජකළ කුෂාණ රජවරු සිය කාසිවල ඉන්දු-ග්‍රීක ක්‍රමයට ම අභිමුඛයේ පාඨය ග්‍රීක අකුරුන් හා ප්‍රතිමුඛයේ පාඨය ඛරොෂ්ඨී අකුරින් යෙදූ මුත්, ඒ රජුගෙන් පසු කුෂාණ රජවරුන්ගේ කාසිවල ඛරොෂ්ඨී පාඨය නොයෙදෙයි. ඒ වෙනුවට ප්‍රතිමුඛයේ ද ග්‍රීක අකුරින් ලියැවුණු පාඨයක් දකින්නට ලැබෙයි. කුෂාණ පාලකයන්ගේ කාසිවල පාඨයන් ලිවීමට ඔවුන් භාවිත කළ ග්‍රීක අක්ෂර මාලාව ද ඉන්දු-ග්‍රීක රජුන්ගේ කාසිවල භාවිත වන අක්ෂර මාලාවට වෙනස් කුෂාණ පාලකයන්ට ම විශෙෂ වූවකි. මෙසේ කණිෂ්ක රජුගෙන් පසු ප්‍රතිමුඛයේ ඛරොෂ්ඨී අකුරින් පාඨයක් යෙදීම අත්හැර දැමීමත් සමඟ ම අභිමුඛයේ යෙදූ පාඨයෙහි ම පරිවර්තනයක් ප්‍රාකෘතයෙන් ප්‍රතිමුඛයෙහි යෙදීමේ ක්‍රමය ද මග හැරී ගොස්, ප්‍රතිමුඛයේ දැක්වුණු දේවතා රූප විස්තර කරන පාඨයක් යෙදීම ඇරැඹිණි. ග්‍රීක අක්ෂර භාවිතයෙන් ලියැවී තිබෙන මෙම පාඨයන් සඳහා යෙදී ඇති භාෂා මාධ්‍යය බෝතානයේ ශක භාෂාව වන බව ස්ටෙන් කොනොව් අදහස් කරයි. කුෂාණ රජවරුන් ස්වකීය කාසිවල යොදාගෙන ඇති විරුදනාමය වන "ෂාඕ නානොෂාඕ" (Shāo–nāno–shāo) යන්න ඉන්දු-ග්‍රීක පාලකයන්ගේ "බැසිලියොස් බැසිලියොන්" (Basileos Basileon) යන්න තමන් භාවිතාකළ භාෂා මාධ්‍යයට හැරවීමෙන් සකසා ගත්තකි.

ඉන්දු-ග්‍රීක කාසිවල යෙදී ඇති අක්ෂර සංයුක්ත අනුකරණයෙන් කුෂාණ කාසිවල ද කිසියම් සංකේත විශෙෂයක් යොදා තිබෙනු පෙනේ. එහෙත් මේ සංකේත ඉන්දු-ග්‍රීකයන්ගේ සංකේත මෙන් ග්‍රීක අකුරු එක් කොට සකසා ගන්නා ලද අක්ෂර සංයුක්ත විශෙෂයක් නොවන බව පැහැදිලි ය. මේ සංකේත යෙදීමෙන් මෙම පාලකයන් විසින් කවර අදහසක් ඉදිරිපත් කරන්නට අදහස් කරන ලදදැයි යන්න නිශ්චය වශයෙන් පෙන්වා දිය හැකි නොවේ (චිත්‍රය, II 29-49).

# 6. ක්ෂත්‍රප කාසි

ඉන්දු-ග්‍රීක පාලකයන්ගෙන් පසුව ක්‍රි. පූ. ප්‍රථම ශතවර්ෂයේ පමණ නැගෙනහිර අධිරාජයෙන් පැමිණි ශක පාලක පංතියක් සින්ධු නදියේ පහළ නිම්න ප්‍රදේශයේ සිය බලය තහවුරු කර ගත් අයුරු ඉහත දක්විණි. මොවුන්ගෙන් පැවැත ආ ශක පාලක පරපුරට අයත් වූවෝ මුල් වරට ගුප්ත අධිරාජයන් හා සමකාලීනව බටහිර ඉන්දියාවේ සැහෙන ආධිපත්‍යයක් පාලනය කිරීමෙහි යෙදී සිටියහ. ඔවුන්ගේ බලය අවසාන වරට යටපත් කෙරෙමින් ඔවුන්ට අයත් ප්‍රදේශ ද ගුප්ත අධිරාජ්‍යය යටතට පත් කර ගන්නා ලද්දේ දෙවැනි චන්ද්‍රගුප්ත අධිරාජයා විසිනි. මේ පාලකයන් අතර විශෙෂයෙන්ම බටහිර ක්ෂත්‍රප පාලකයන් පිළිබඳව තතු සොයා ගැනීමට ඇති එකම මූලාශ්‍රය ඔවුන් විසින් නිකුත් කරන ලද කාසි ය. ඉන්දීය ඉතිහාසයේ මෙම යුගය යළි සකස් කර ගැනීමේදී නාණක විද්‍යාමය මූලාශ්‍ර ඉතා සාර්ථක ලෙස උපයෝගී කරගනු ලැබෙන හෙයින්, මෙහි දී ඒ පිළිබඳව මදක් විස්තරාත්මකව කරුණු දැක්වීම සුදුසුය.

මේ පාලකයෝ ''ක්ෂත්‍රප'' යන නමින් තමන් හඳුන්වා ගත්හ. පැරැණි පර්සියානු නිල නාමයක් වූ ''ක්ෂත්‍ර-පාවන්'' යන්නෙන් බිඳී ඉන්දීය ස්වරූපයෙන් ''ක්ෂත්‍රප'' යනුවෙන් සකස් කර ගන්නා ලද මේ පදයේ අර්ථය ''විජිතය ආරක්ෂා කරන්නා'' යන්නයි. මේ අනුව, මොවුන් ප්‍රාදේශීය පාලකයන් කොටසක් ලෙස හැඳින්විය හැක. ඇකිමීනියානු අධිරාජ්‍යය සෛරස් හා ඩේරියස් යන අධිරාජයන් යටතේ පාලනය වූයේ ක්ෂත්‍රප ප්‍රදේශ පාලකයන් මඟිනි. අධිරාජයා විසින් ක්ෂත්‍රප පාලකයන් අනියත කාල පරිච්ඡේදයක් සඳහා පත් කිරීම මුල දී අනුගමනය කරන ලද සිරිත වුවත්, පසු කලෙක ඇතැම් ක්ෂත්‍රප තනතුරු පිය පුත් පරපුරෙන් හිමිවන නිල බවට පත් විය. අධිරාජයා හා ක්ෂත්‍රප පාලකයා අතර දැඩි කිට්ටු සම්බන්ධතාවක් නොවූයෙන්, මුල පටන් ම ක්ෂත්‍රප පාලකයන් සිය ප්‍රදේශ පාලනය කළේ බොහෝ දුරට ස්වාධීනව ය. ක්‍රි. පූ. පළමුවන ශතවර්ෂයේ සිට ශතවර්ෂ කීපයක් තිස්සේ ම ඉන්දියාවේ බටහිර ප්‍රාන්ත පාලනය කළ ක්ෂත්‍රපවරු ඇතැම් විටෙක වඩා බලගතු මධ්‍යම පාලකයකුගේ ප්‍රදේශ පාලක යටත් නිලධාරීන් ලෙස ක්‍රියා කළ ද, ඔවුන් නිතර ම වාගේ ස්වාධීන පාලකයනට හිමි බලතල හා වරප්‍රසාද භුක්ති විඳිමින් ස්වෛරීව ක්‍රියා කළ බව පෙනේ.

ඉන්දියාවේ ප්‍රදේශ යටත් කරගෙන සිටි බලගතු ඉන්දු-ග්‍රීක හා බැක්ට්‍රියානු රජවරුන් ද සිය පාලනය ක්‍රියාත්මක කළේ ක්ෂත්‍රප පාලකයන් මඟිනි. මෙනැන්ඩර් (මිලින්ද) රජු යටතේ ප්‍රදේශ පාලකයකු ලෙස ක්‍රියා කළ ''අප්‍රජ රජ වියක මිත්‍ර'' (අප්‍රත්‍යග් රාජවීර්යක මිත්‍ර) නමැත්තා ඔහුගේ ක්ෂත්‍රපයකු ලෙස ක්‍රියා කළ බව පෙනේ. මේ ප්‍රාදේශීය පාලක පරම්පරාව මෙනැන්ඩර්-ගෙන් පසුව දිගින් දිගට පැවැත ගෙන ආ බව නාණක විද්‍යා හා ශිලා ලෙඛන සාක්ෂිවලින් හෙළි වන විජයමිත්‍ර, ඉත්‍රවර්ම, ඉන්ද්‍රවර්ම, අස්පවර්ම, උෂවදත්ත (වෘෂභදත්ත) යනාදි ප්‍රාදේශික පාලක නාමාවලියෙන් පෙනී යයි. මේ පාලකයන් කල් ගත වීමේ දී ''වර්මන්'' ''දත්ත'' යනාදියෙන් කෙළවර වන ඉන්දීය නම් භාවිත කිරීමෙන් තමන් ඉන්දීය ක්ෂත්‍රියයන් බවක් පෙන්වා දීමට ප්‍රයත්න දැරූ බව පෙනී යයි. මෙසේ ඉන්දු-ග්‍රීක පාලකයන් යටතේ ද ක්ෂත්‍රප පාලකයන් මඟින් යටත් ප්‍රදේශ පාලනය කිරීමේ සිරිත පැවැති නමුත්, ඉන්දියාවේ මෙය ප්‍රචලිතව ගියේ උතුරු ප්‍රදේශ ශක පාලකයන් යටතට පත්වීමෙන් පසුවය. ඉන්දියාවේ ශක ආධිපත්‍යය ව්‍යාප්තියට පත්වීමේ දී ද නියම වශයෙන් ක්‍රියාත්මකව ආක්‍රමණාදියෙහි යෙදුණේ මේ ක්ෂත්‍රප පාලකයන් මිස ශක රජවරු ම නොවෙති. මොආස් රජුගේ සමයෙහි ලියක කුසුලක (Liaka Kusulaka) නම් වූ මෙබඳු ක්ෂත්‍රප පාලකයෙක් චුක්ෂා නම් වූ ප්‍රදේශයේ පරිපාලන කටයුතුවල නිරතව

සිටියේ ය. මේ ක්ෂත්‍රප පාලකයා රිදී කාසි කිහිපයක් තමන්ගේ ම නමින් නිකුත් කරන්නට තරම් ස්වෛරීව සිය පාලන කටයුතු කරගෙන ගිය බව පෙනේ. ඔහුගේ පුත්‍රයා වූ පතික නමැත්තා සිය පියාගෙන් පසුව ප්‍රාදේශීය පාලක තනතුරට පත්ව පියාට ද වඩා ස්වාධීන ලෙස සිය බලතල භාවිතකළ බව ඔහු තමන් ''මහාක්ෂත්‍රප'' යනුවෙන් මථුරා සිංහ ස්තම්භ සෙල්ලිපිවල හඳුන්වාගෙන තිබීමෙන් පෙනී යයි. මේ හැර ඉන්දියාවේ උතුරු ප්‍රදේශවල ශක-පහ්ලව හා කුෂාණ රජවරුන් යටතේ ප්‍රාදේශීය පාලකයන් ලෙස ක්‍රියා කළ ක්ෂත්‍රපවරුන් ගණනාවක් ගැන සඳහන් වන කාසි හා සෙල්ලිපි ඒ ප්‍රදේශවලින් හමු වී තිබේ. ඉන් පෙනී යන්නේ ක්ෂත්‍රප නිලය හා ඔවුන් උපයෝගී කරගත් පාලන ක්‍රමය දිගින් දිගට ම ඉන්දියාවේ වයඹදිග ප්‍රදේශවල හා ඒ අවට විදේශීය ආක්‍රමණික පාලකයන් යටතේ කාලයක් තිස්සේ ම පැවැති බවයි.

මෞර්ය අධිරාජ්‍යය බිඳී යාමෙන් පසු මථුරා හා ඒ අවට ප්‍රදේශය ''මිත්‍ර'' හා ''දත්ත'' යන්නෙන් කෙළවර වූ නම් සහිත පාලකයන් පරම්පරාවක් යටතේ සෑහෙන කාලයක් ගත වන තුරු පාලනය විය. ''රාජ'' යනුවෙන් (රාඥ බලභූතිස, රාඥ රාමදතස) තමන් හඳුන්වා ගත් මේ පාලකයන් නිකුත් කළ තඹ කාසි විශාල සංඛ්‍යා වශයෙන් හමු වී තිබේ. ක්‍රි. පූ. පළමුවැනි ශත වර්ෂයේ මැද භාගයේ දී පමණ මේ පාලක පෙළපත පරදවා ක්ෂත්‍රප පාලක පෙළපතක් මෙම ප්‍රදේශයේ පාලන බලය අත්පත් කර ගති. මථුරාහි ක්ෂත්‍රපවරුන් යනුවෙන් හැඳින්වෙන මේ පාලකයන් අතර අවසාන සාමාජිකයන් දෙදෙනා මහාක්ෂත්‍රප රජුවුල හා ඔහුගේ පුත්‍ර ශොඩාස යන දෙදෙනා යයි ඇලන් කල්පනා කරයි. ක්ෂත්‍රප ශිවදත්ත, ශිවඝොෂ, ක්ෂත්‍රප හගමාෂ, ක්ෂත්‍රප හගාන ආදී පාලකයෝ ද මේ පරපුරට අයත් වූහ. මොවුන් පිළිබඳව තතු දැනගැනීමට උපයෝගී කර ගත හැකි මූලාශ්‍රයන් මථුරා ප්‍රදේශයෙන් ලැබෙන සෙල්ලිපි කිහිපයකට හා ඔවුන් නිකුත් කළ කාසිවලට පමණක් සීමා වන අතර, ඔවුන් පාලනය කළ අනුපිළිවෙළ සම්බන්ධයෙන් විශාරදයන් අතර ඒකමතික නිගමනයක් නොවෙයි. මේ ක්ෂත්‍රප පාලකයන් අතර සමහරුන් ඉන්දීය නාමයන්ගෙන් තමන් හඳුන්වා ගත් නමුදු, ඉන්දීය චාරිත්‍ර වාරිත්‍ර හා භාෂා මාධ්‍යයන් හුරු කරගත් ශක වාර්ගික විදේශීයයන් බව නිගමනය කළ හැක.

ශක හා පහ්ලව පාලකයන් යටතේ පවතිද්දී බටහිර හා මධ්‍යම ඉන්දියාවේ සමහර ප්‍රදේශ-වල ක්ෂත්‍රප පාලකයන් සිටිය ද, ක්ෂත්‍රප ක්‍රමය නියම වශයෙන් තහවුරු වූයේ කුෂාණයන්ගේ සමයේ දී ය. කාසිවලින් හා ශිලාලෙඛනවලින් ලැබෙන සාධක අනුව, මේ ප්‍රදේශයේ විසූ ක්ෂත්‍රපයන් විශාල සංඛ්‍යාව අතරින් වැදගත් පෙළපත් දෙකක් වෙන් කොට හඳුනා ගත හැකි ය. මින් මුල් පෙළපත භූමක හා නහපාන යන දෙදෙනාගෙන් සමන්විත ක්ෂහරාත ක්ෂත්‍රප වංශයයි. චෂ්ටන නම් ක්ෂත්‍රප පාලකයාගෙන් ආරම්භ වන අනෙක් ක්ෂත්‍රප පෙළපත මීට වඩා අධික සාමාජික සංඛ්‍යාවකින් යුක්ත ය. මේ පෙළපතට අයත් වූ මුල් ක්ෂත්‍රප පාලකයන්ගේ නම් විදේශීය ස්වරූපයක් ගනියි. ඔවුන් තමන්ගේ කාසිවල භාවිත කරන්නේ ද ඛරොෂ්ඨී අක්ෂර ක්‍රමය නිසා, ඔවුන් උතුරේ ප්‍රදේශවලින් මෙහි සංක්‍රමණය වූ විදේශීය පාලක පංතියක් වූ බව පෙනේ. ඉන්දීය ඉතිහාසයේ බටහිර ක්ෂත්‍රපයන් හෙවත් සුරාෂ්ට්‍ර හා මාල්වා ප්‍රදේශවල ක්ෂත්‍රප පාලකයන් ලෙස හැඳින්වෙන්නේ මේ පෙළපත් දෙකට අයත් ක්ෂත්‍රප පාලකයෝ ය. මොවුන් අතර ක්ෂහරාත පරපුරට අයත් වූවන් පහ්ලව වාර්ගිකයන් වූ බවත්, චෂ්ටනගේ වංශයට අයත් වූවන් ශකයන් වූ බවත් ඉතිහාසඥයන්ගේ නිගමනය වෙයි.

බටහිර ක්ෂත්‍රපයන් අතර ක්ෂහරාත පෙළපතට අයත් යයි කාසිවලින් පෙනී යන මුල් ම පාලකයා භූමක නමැත්තෙකි. ඔහු නිකුත් කළ තඹ කාසි ගුජරාටයේ හා කඨියවාර්හි සමුද්‍රාසන්න ප්‍රදේශවලින් හා මාල්වා ප්‍රදේශයෙන් ලැබී ඇත. ඔහුගේ සියලු ම කාසිවල භාවිත කෙරෙන එක ම විශේෂණය ''ක්ෂත්‍රප'' යන්න පමණි. භූමකගේ අනන්තරාගාමිකයා ලෙස සැලැකෙන නහපාන තඹ කාසි පමණක් නොව රිදී කාසි ද නිකුත් කළ බව පෙනේ. මේ පාලකයා සිය කාසිවල ''රාඥෙ ක්ෂහරාතස නහපානස'' යනුවෙන් සිය විරුදනාමයන් අතර ''රාජ'' යන්න ද භාවිත කරන හෙයින්, ඔහු භූමකට වඩා බලගතු පාලකයකු වී යැයි සැලැකිය හැක. මොහුගේ රිදී කාසි බර ප්‍රමාණය, නිමාව (fabric) හා ප්‍රමාණය යනාදී අංග විසින් ඉන්දු-ග්‍රීක රජවරුන්-ගේ හෙමි-ඩ්‍රැම් (hemi–drachm) කාසි බෙහෙවින් අනුකරණය කොට ඇති බව පෙනේ. මේ කාසිවල ආකෘතිය ශතවර්ෂ තුනක පමණ කාල පරිච්ඡේදයක් තිස්සේ බටහිර ක්ෂත්‍රප පාලකයන්

විසින් දිගින් දිගට ම ස්වකීය රිදී කාසි නිෂ්පාදනයේ දී අනුගමනය කරන ලදි. බටහිර ක්ෂත්‍රපයන්ගෙන් පසු ඔවුන් යටතේ පැවැති ප්‍රදේශවල පාලන බලය නතු කර ගත් ගුප්ත හා ත්‍රෛකූටක පාලකයන් විසින් ද රිදී කාසි නිපදවීම සඳහා අනුගමනය කරන ලද්දේ මේ කාසිවල ආකෘතියයි. රාජ ශීර්ෂයක ප්‍රතිරූපයක් දැක්වීම මෙම රිදී කාසිවල අභිමුඛයේ රූප සටහන ලෙස යොදු ගන්නා ලදි. මෙය මෙකල රෝම වෙළෙඳ සම්බන්ධතා නිසා ඉන්දියාවේ බටහිර වෙරළේ වරායවලට විශාල සංඛ්‍යාවලින් ගෙන එන ලද රෝම දිනාර (dinarii) කාසිවලින් ලත් ආභාසයක් ලෙස ගිණිය හැක. මෙම ඉන්දීය කාසිවල අභිමුඛයේ පාඨ සඳහා ග්‍රීක අකුරු යොදු ගන්නා ලද්දේ ද මේ මූලාශ්‍රයෙන් ම ලත් බලපෑමක් නිසා යැයි නිගමනය කරන්නට පුළුවන.

නහපාන රජුගේ රිදී කාසි නාණක විද්‍යාඥයන්ට මුල් වරට විස්තර සහිතව අධ්‍යයනය කරන්නට අවස්ථාව සැලැසුණේ 1906 දී උතුරු මරාඨ ප්‍රදේශයේ නාසික් දිස්ත්‍රික්කයේ ජොගල්තෙම්බි (Jogalthembi) නම් ස්ථානයේ තිබී දස දහසකට අධික කාසි තොගයක් සොයා ගැනීමෙන් පසුව ය. එසේ වුව ද, මේ ක්ෂත්‍රප පාලකයා නිකුත් කරන ලද තඹ කාසි තවමත් ඉතා දුර්ලභය. නාසික්හි හා ජුන්නාර්හි තිබී හමු වී ඇති නහපානගේ සෙල්ලිපිවලින් පෙනී යන පරිදි, ඔහුගේ පාලන සමයට ක්‍රි. ව. 119-124 කාලය ඇතුළු වූ බව පැහැදිලි ය. එහෙත් ඔහුගේ පාලන සමය ආරම්භ වූ හා අවසාන වූ අවුරුදු මොනවා දැයි නිශ්චය වශයෙන් පෙන්වා දීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි නැත. ශිලා ලේඛන ආශ්‍රයෙන් ඔහු යටතේ පාලනය වුණු ප්‍රදේශ සමහරක් ගැන ද අදහසක් ඇති කර ගන්නට පුළුවන. භාරුකච්ච සිට සොපාරා දක්වා උතුරු කොන්කාන් ප්‍රදේශ ද, දකුණු ගුජරාටය ද, නාසික් හා පූනා යන දිස්ත්‍රික්කවලට අයත් වන ප්‍රදේශය ද, කථියවාරය (සුරාෂ්ට්‍ර), රාජපුටානාවේ සමහර ප්‍රදේශ ද, නැගෙනහිර හා බටහිර මාල්වා (අවන්ති) ප්‍රදේශයන් ද, ඔහුගේ අණසක යටතේ පාලනය වූ බව පෙනේ. නහපානගේ පාලන සමයෙහි අවසාන භාගයේ දී මොහුට විරුද්ධව සටනට එළඹුණු, බාල ශ්‍රී නම් දේවියගේ පුත්‍රයා වූ ගෞතමී පුත්‍ර නම් ආන්ධ්‍ර පාලකයා විසින් ක්ෂහරාත ක්ෂත්‍රප පෙළපතට අයත් ව තුබූ ප්‍රදේශ අතරින් බොහොමයක් ම තමන්ගේ පාලනය යටතට ගන්නා ලදි. මෙතැන් පටන් මේ ක්ෂත්‍රප පාලක පෙළපත අභාවයට පත් විය.

බටහිර ක්ෂත්‍රප පාලකයන් අතර මීළඟට වැදගත් පෙළපත වන චෂ්ටනගෙන් ඇරඹෙන පෙළපතෙහි ආරම්භක පාලකයා වන චෂ්ටනගේ පියා ඝසමෝතික (Ghsamotika) නමැත්තෙකු විය. ඝසමෝතික විසින් නිකුත් කරන ලදැයි සැලකෙන එකම කාසියක් ගැන සඳහන් වෙතත්, සාමාන්‍යයෙන් රැප්සන් ආදී නාණක විද්‍යාඥයන්ගේ පිළිගැනීම වනුයේ එය චෂ්ටනගේ ම කාසියක් බවයි. "රාඥො ක්ෂත්‍රපස ඝසමොතිකපුත්‍රස චෂ්ටනස" යනුවෙන් චෂ්ටනගේ කාසිවල එන පාඨයෙන් පමණි, ඝසමොතික නම් මෙම පාලකයාගේ නම පවා දැනගන්නට ලැබෙන්නේ. චෂ්ටනගෙන් ඇරඹෙන ක්ෂත්‍රප පරපුරට අයත් පාලකයන් ක්‍රි. ව. 305 පමණ වන තුරු අඛණ්ඩ පාලනයක් ගෙන ගිය බව ඔවුන්ගේ කාසිවලින් පෙනේ. මේ කාලය තුළ වූ පාලකයක් සියලු දෙනා විසින් ම තමන්ගේ කාසි පාඨවල පිය පුත් සම්බන්ධය දක්වා තිබෙන හෙයින්, ඒ ක්ෂත්‍රප පෙළපත අනුපිළිවෙළින් සකස් කර ගැනීම අපහසු කාර්‍යයක් නොවේ. මෙසේ චෂ්ටනගෙන් පසු ක්‍රි.ව. 305 වනතුරු (එනම් ක්‍රි. ව. 150-305 කාලය තුළ) මේ ප්‍රදේශ පාලනය කළ පාලකයන් සියලු දෙනා ම පිය පුත් සම්බන්ධය අනුව පාලන බලය උරුම කර ගත්තවුන් බව පෙනේ. නහපානගෙන් අවසන් වුණු ක්ෂහරාත ක්ෂත්‍රප පෙළපත හා චෂ්ටනගෙන් ඇරඹුණු පෙළපත අතර කිසියම් ඥාති සම්බන්ධතාවක් වී ද යන්න ස්ථිරව නිගමනය කළ නො හැක. එහෙත් මේ පෙළපත් දෙකට අයත් වූවන් නිකුත් කළ කාසි අතර දක්නට ලැබෙන කිට්ටු සමානකම්වලින් (ඔවුන්ගේ කාසිවල යෙදෙන ග්‍රීක, බ්‍රාහ්මී, හා ඛරොෂ්ඨි පාඨ අතර ඇති සාම්‍යය) මේ පිරිස් දෙක අතර කාල වශයෙන් හා ප්‍රදේශ වශයෙන් වැඩි විෂමතාවක් නුවූ බව පැහැදිලිව පෙනී යයි. තව ද, ශිලා ලේඛනවලින් ලැබෙන සාක්ෂිවලට අනුව එකම ප්‍රදේශයක් මේ පෙළපත් දෙකට අයත් පාලකයන්ගේ අණසකට යටත් ව අවස්ථා දෙකක දී පැවැති බව ද පෙනී යයි. සමහර විට නහපාන අතින් උදුරා ගන්නා ලද සමහර ප්‍රදේශවල පාලනය ගෞතමීපුත්‍ර නම් ආන්ධ්‍ර පාලකයාගේ යටත් කෂත්‍රපයකු ලෙස චෂ්ටන වෙත පැවැරෙන්නට ඇත. නහපානගෙන් පසු කුෂාණ අධිරාජ්‍යයේ නිරිතදිග කොටසේ ක්ෂත්‍රප පාලකයා වශයෙන් ඔවුන් චෂ්ටන පත් කරන ලද බවත්, නහපාන සමයේ දී සාතවාහන ආධිපත්‍යයට යටත් වීමෙන් කුෂාණ අධිරාජ්‍යයෙන් ගිලිහී ගිය ප්‍රදේශ යළි ලබා ගැනීම චෂ්ටනට

පැවැරුණු බවත්, සමහරු අනුමාන කරති. වැඩිකල් ගත වන්නට පෙර ම චෂ්ටන හා ඔහුගේ අනන්තරාගමිකයෝ ක්ෂහරාත ක්ෂත්‍රපවරුන් යටතේ පාලනය වෙමින් තිබී ආන්ධ්‍ර පාලකයන් විසින් උදුරා ගන්නා ලද ප්‍රදේශ අතරින් වැඩි ප්‍රමාණයක් යළි ඒවායේ නව පාලකයන් (ආන්ධ්‍රයන්) අතින් සිය ආධිපත්‍යය යටතට පත් කොට ගෙන ස්වාධීන පාලක පෙළපතක් බවට පත් වූහ. ටොලමිගේ වාර්තාවනට අනුව චෂ්ටනගේ පාලන මධ්‍යස්ථානය ලෙස පැවැත්තේ බටහිර මාල්වා ප්‍රදේශයේ උජ්ජයිනී නුවරයි. ගෞතමීපුත්‍ර රජුට අනතුරුව ආන්ධ්‍ර පාලකයා බවට පත් වූ වාශිෂ්ඨී-පුත්‍ර ශ්‍රී පුළුමාවී චෂ්ටනගේ සමකාලීනයකු වූ බව පෙනේ.

ක්ෂත්‍රපයකු හා මහා ක්ෂත්‍රපයකු වශයෙන් චෂ්ටන රිදී කාසි නිකුත් කළේ ය. ඔහුගේ නම සඳහන් වන තඹ කාසි විරල ය. පැහැදිලිව කියවා ගත නොහැකි පාඨයක් සහිත හතරැස් තඹ කාසියක් ඔහු විසින් නිකුත් කරන ලද්දක් ලෙස නාණක විද්‍යාඥයන් විසින් සැක කරනු ලැබේ. චෂ්ටනගේ පුත්‍රයා වූයේ ජයදමන් නමැත්තෙකි. ඔහු ක්ෂත්‍රපයකු වශයෙන් කාසි නිකුත් කළේ ය. ඔහුට සිය පියා විසින් යොදු ගන්නා ලද ''මහාක්ෂත්‍රප'' යන විරුද නාමය යොදු ගන්නට නොහැකි වූයේ, මේ සමයේ දී ආන්ධ්‍ර පාලකයන් හා ගැටෙන්නට වීම නිසා පෙළපතේ බලය තරමක් දුරට හීන වී යාමෙන් විය හැක. ජයදමන් සිය පියාවූ මහාක්ෂත්‍රප චෂ්ටන යටතේ ක්ෂත්‍රපවරයකු වශයෙන් පාලනයෙහි නිරත වූ බැව් නිගමනය කිරීමට කරුණු ඇත. ජයදමන්ගේ යැයි සැලැකෙන, දැනට හමුවී ඇති කාසි සියල්ලම තඹයෙන් කළ හැඩයෙන් හතරැස් ඒවා පමණි. ඔහුගෙන් පසු මේ පෙළපතට අයත් ක්ෂත්‍රප පාලකයන්ගේ නම් ඉන්දිය ස්වරූපයෙන් හැඩ ගැසී තිබෙනු දක්නට ලැබේ.

මීළඟට මෙම ක්ෂත්‍රප පෙළපතේ බලගතු පාලකයකු බවට පත් වූ ක්ෂත්‍රප ජයදමන්ගේ පුත්‍ර මහාක්ෂත්‍රප රුද්‍රදමන් පිළිබඳ තතු සපයන වැදගත් මූලාශ්‍රයක් නම් ගිර්නාර් සෙල්ලිපියයි. බටහිර ක්ෂත්‍රප පාලකයනට මේ අවදිය වන විට යටත් ව තුබුණු විශාල ප්‍රදේශයේ සීමාවන් බොහෝ දුරට පැහැදිලි ලෙස නිර්ණය කර ගැනීමට මෙය උපකාරී වෙයි. මොහුගෙන් පසු බටහිර ක්ෂත්‍රප පාලක පරපුර අවසන් වනතුරු මේ යටත් ප්‍රදේශ කවර පාලකයන් යටතේ කිනම් අයුරින් අඩු වැඩි බවට පත් වී ද යන්න ගැන තීරණයකට බසින්නට අවශ්‍ය තරම් සාධක සපයන මූලාශ්‍ර දක්නට නොලැබේ. රුද්‍රදමන් යටතේ නැඟෙනහිර හා බටහිර මාල්වා ප්‍රදේශ, වින්ධ්‍යා කඳුවලට එපිටින් නර්මදා නදියට උතුරින් හා මාල්වා ප්‍රදේශයට දකුණින් පිහිටි ප්‍රදේශය, කඨියවාර් හා ඒ අවට ප්‍රදේශය, කච් අර්ධ ද්වීපය, උතුරු ගුජරාටය, රාජපුතානාවේ මාර්වාර්හි සීමාවන් තුළට වැටෙන ප්‍රදේශය, බටහිර රාජපුතානාවේ කොටසක් හා ඒ ආසන්න සින්ධ් ප්‍රදේශය හා උතුරු කොන්කන් දේශය යනාදී විශාල විජිතයක් පාලනය වූ බවට ගිර්නාර් සෙල් ලිපිය සාක්ෂි දරයි. මේ හැර යෞධෙයයන් පරදවා ඔවුන් සතු ප්‍රදේශ තමන් යටතට ගත් බව ද, ඩෙකානයේ ආන්ධ්‍ර පාලකයා වූ ශාතකර්ණී දෙවරක් ම පරදවා මහාක්ෂත්‍රප තත්ත්වයට පත් වූ බව ද, රුද්‍රදමන් තමන්ගේ මෙම ශිලා ලේඛනයේ තව දුරටත් සඳහන් කරයි.

මහාක්ෂත්‍රප රුද්‍රදමන් විසින් නිකුත් කරන ලද කාසි ප්‍රමාණය ඉතා විශාල ය. ඒ හැමෙකක ම ඔහුගේ විරුද නාමය ලෙස යෙදී තිබෙන්නේ ''මහාක්ෂත්‍රප'' යන්නයි. රුද්‍රදමන් බටහිර ක්ෂත්‍රපයන් පිළිබඳ දීර්ඝ ඉතිහාසයෙහි ඉතා වැදගත් තැනක් ගන්නා පාලකයෙකි (චිත්‍රය II, 2).

ඔහුගෙන් පසුව මේ විශාල විජිතයෙහි පාලන බලය උරුම වූයේ දමඝසද (දමය්සද) යන නාමයෙන් හැඳින්වුණු ඔහුගේ පුත්‍රයාටයි. සිය පිය මහාක්ෂත්‍රප වරයා ජීවමාන සමයේ දී ක්ෂත්‍රප පාලකයකු වශයෙන් ඔහු යටතේ ක්‍රියා කළ දමඝසද, ක්‍රි. ව. 150 ට පසුව මහාක්ෂත්‍රප පාලකයකු හැටියට යටත් ප්‍රදේශයේ සම්පූර්ණ පාලන බලය තමන් අතට ගත් බව පෙනේ. ක්ෂත්‍රපවරයකු වශයෙන් පාලනයෙහි නිරතව සිටිය දී ඔහු විසින් නිකුත් කරන ලද රිදී කාසි විශාල සංඛ්‍යාවක් හමු වී තිබේ.

දමඝසදගේ පාලන සමයෙන් අනතුරුව මේ ක්ෂත්‍රප පෙළපතෙහි ඊළඟ පාලකයා කවරකු විය යුතු ද යන්න ගැන උරුමකරුවන් දෙදෙනකු අතර තරගයක් පැන නැඟීම නිසා වියවුල් සහිත තත්ත්වයක් උද වූ බව පෙනේ. මේ තරගයට සහභාගි වූ ප්‍රතිමල්ල උරුමකරුවන් වූයේ දමඝසදගේ පුත්‍ර ජීවදමන් හා සහෝදර රුද්‍රසිංහ යන දෙදෙනා ය. දෙදෙනා ම මේ තරගය පවතිද්දී ක්ෂත්‍රප පාලකයන් ලෙස ක්‍රියා කළ නමුත් අවසාන වශයෙන් ජයග්‍රහණය හිමි වූයේ රුද්‍රසිංහට බව පෙනේ.

ශක වර්ෂ 102 දී (ක්‍රි.ව. 180 දී) දමඝසද ගේ සොහොයුරු පළමුවැනි රුද්‍රසිංහ ක්ෂත්‍රපවරයකු වශයෙන් කාසි නිකුත් කළ බව පෙනේ. මේ සමයේ දී ඔහු සිය බෑනණුවන් මහාක්ෂත්‍රප ජීවදමන් යටතේ ක්ෂත්‍රපයකු වශයෙන් ක්‍රියා කරන්නට ඇත. මින් පසු ශක වර්ෂ 103-110 (ක්‍රි. ව. 181-89) හා 113-118 (ක්‍රි. ව. 191-197) යන කාල පරිච්ඡේද දෙකෙහි දී ම රුද්‍රසිංහ ''මහාක්ෂත්‍රප'' විරුද නාමයෙන් යුත් පාඨ සහිත කාසි නිකුත් කළේ ය. මේ අතරතුරු සමයේ දී, එනම් ශක වර්ෂ 110-112 (ක්‍රි. ව. 188-191) සමයේ දී රුද්‍රසිංහ විසින් නිකුත් කරන ලද කාසිවල ඔහු විසින් යොද ගන්නා ලද්දේ ''ක්ෂත්‍රප'' යන විරුදනාමය පමණි. යළි වරක් ශකවර්ෂ 119 – 120 (ක්‍රි. ව. 198 – 199 ) යන අවුරුදු දරන ජීවදමන්ගේ කාසි හමු වී තිබේ. ඒවායේ ජීවදමන් ''මහාක්ෂත්‍රප'' යන විරුදනාමයෙන් තමන් හඳුන්වා ගැනීමෙන් පෙනී යන්නේ යළිත් වරක් ඔහු සිය ප්‍රතිමල්ලයා පරදවා බලය අත්පත් කර ගත් බවයි. ජීවදමන්ගේ සමයේ පටන් ක්ෂත්‍රපයන්ගේ කාසිවල ඒවා නිකුත් කරන ලද වර්ෂයන් බ්‍රාහ්මී ඉලක්කමින්, ශක වර්ෂයෙන් සඳහන් කරනු ලැබෙන හෙයින් ක්ෂත්‍රප පාලක පරම්පරාවේ අනුපිළිවෙළ පමණක් නොව, නියම වශයෙන් ඔවුන් රජ කළ අවුරුදු පිළිබඳව ද අදහසක් ඇති කර ගන්නට හැකි වෙයි.

ජීවදමන් දෙවැනි වරට මහා ක්ෂත්‍රපවරයකු වශයෙන් පාලනය කළ සමයෙන් පසු, මේ ප්‍රදේශවල ඊළඟ පාලකයා බවට පත් වූයේ පළමුවැනි රුද්‍රසිංහගේ පුත්‍ර පළමුවැනි රුද්‍රසේනයි. ශක වර්ෂ 121 (ක්‍රි. ව. 199-200) දරන ඔහු විසින් නිකුත් කරන ලද රිදී කාසි හමු වී තිබේ. මහාක්ෂ-ත්‍රප විරුදනාමය සහිතව ඔහුගේ නම සඳහන් වන කාසිවල දක්නට ලැබෙන අවුරුදු ගණන් අනුව, ඔහුගේ මහාක්ෂත්‍රප පාලන සමය ශක වර්ෂ 122- 144 (ක්‍රි. ව. 200-222) අතර කාලයට සීමා වූ බැව් පෙනී යයි. මාල්වා ප්‍රදේශයෙන් සොයා ගන්නා ලද, පාඨයන්ගෙන් තොර, එහෙත් ශක වර්ෂයෙන් 131-135 අවුරුදුවල නිකුත් කරන ලද බැව් සඳහන්, පොටින් මිශ්‍ර ලෝහයෙන් කළ කාසි කිහිපයක් ද ඔහු විසින් නිකුත් කරන ලද බැව් සැලැකේ. පළමුවැනි රුද්‍රසේනගේ කාසි හමු වී තිබෙන ප්‍රදේශ කවරේ දැයි සියුම් ලෙස විභාග කිරීමෙන් මාල්වා, ගුජරාට, කථියවාර යන ප්‍රදේශ හා රාජපුතානාවේ සමහර ප්‍රදේශ පමණක් මේ කාලය වන විට බටහිර ක්ෂත්‍රප පාලකයන්-ගේ ආධිපත්‍යය යටතේ පැවැති බව නිගමනය කළ හැක. නහපානගේ පාලන සමයෙන් පසු බටහිර ක්ෂත්‍රප පාලකයන් හා ගැටෙමින් ක්‍රමයෙන් ඔවුන්ගේ විජිත ප්‍රදේශයන් හිමි කර ගැනීමෙන් තම ආධිපත්‍යය ව්‍යාප්ත කර ගත් සාතවාහන පාලක පෙළපත යටතට උතුරු කොන්කන් හා නාසික් ප්‍රදේශ ඇතුළු ප්‍රදේශ කිහිපයක් ම මේ වන විට පත් වී තිබිණි. එහෙත් පළමුවැනි රුද්‍රසේනගේ පාලන සමයේ දී ද සෑහෙන ප්‍රමාණ පාලන බලයක් ඇතිව සිටි මහාක්ෂත්‍රප පාලකයෝ බටහිර මාල්වාහි උජ්ජයිනී නුවර මූලස්ථානය කොට ගෙන විශාල ප්‍රදේශයක් පාලනය කළෝය.

ජීවදමන් හා පාලන බලය සඳහා ගැටුණු රුද්‍රසිංහට මහාක්ෂත්‍රපවරයා වීම සඳහා තමන්ට වූ උරුමය ලෙස ඉදිරිපත් කළ හැකි කරුණ වූයේ තමන් ඊට පෙර වූ මහාක්ෂත්‍රපවරයාගේ සොහොයුරා වීමයි. රුද්‍රසේනගෙන් පසු සහෝදර උරුමයෙන් රාජ්‍යය ලැබීමේ චාරිත්‍රය බටහිර ක්ෂත්‍රපයන් අතර තහවුරුව ගිය බව පෙනේ. රුද්‍රසේනට පුතුන් දෙදෙනකු වූ බවට සාක්ෂි ඇතත්, ඔහුගෙන් පසු මහාක්ෂත්‍රපවරයා බවට පත්ව පාලන බලය අතට ගත්තේ සංඝදමන් නම් ඔහුගේ සහෝදරයාය. මේ පාලකයාගේ රිදී කාසිවල සඳහන් වන අවුරුදු දෙකකි. ඒ ශකවර්ෂ 144 හා 145 (ක්‍රි. ව. **222, 223**) යන දැවුරුද්දයි. ශක වර්ෂ 145 දරන කාසි ඔහුගෙන් අනතුරුව මහාක්ෂත්‍රප ධුරයට පත් වූ දමසේන විසින් ද, නිකුත් කර ඇති හෙයින්, සංඝදමන්ගේ පාලන සමය දැවුරුද්දකට ද අඩු වූ බව පෙනේ. මහාක්ෂත්‍රප රුද්‍රසේනගේ පුත්‍ර පෘථිවිසේන විසින් ක්ෂත්‍රප යන විරුදනාමය සහිතව නිකුත් කරන ලද ශකවර්ෂ 144 (ක්‍රි.ව. 222) දරන කාසි ඉතා විරල වශයෙන් ලැබී තිබේ. තම පියාගේ රාජ්‍ය සමයේ දී හෝ ඔහුගෙන් පසුව බලයට පත් සංඝදමන් යටතේ හෝ පෘථිවිසේන මේ නිලය දරන්නට ඇත.

මහාක්ෂත්‍රප දමසේන ශකවර්ෂ 145-158 (ක්‍රි. ව. 223-230) සමය තුල කාසි නිකුත් කළේ ය. ඔහුගේ රාජ්‍ය සමය ඇතුළත කාල පරිච්ඡේදයකට වැටෙන ශක වර්ෂ 154-155 (ක්‍රි. ව. 232-233) අවුරුදුවල නිකුත් කරන ලද ''රාඥෙ මහාක්‍ෂත්‍රපස රුද්‍රසෙනපුත්‍රස රාඥඃ ක්‍ෂත්‍රපස දමජශ්‍රියඃ'' යන පාඨයෙන් යුත් රිදී කාසි හමු වී තිබේ. ඒ පාඨයෙන් දැක්වෙන පරිදි, මේවා මහාක්ෂත්‍රප

රුද්‍රසේනගේ පුත්‍රයකු වූ දමජද නමැත්තා විසින් මහාක්ෂත්‍රප දමසේන යටතේ ක්ෂත්‍රපයකු වශයෙන් නිකුත් කරන ලද කාසි ය. දමජදගෙන් පසුව මහාක්ෂත්‍රප දමසේනගේ ම පුත්‍රයා වූ වීරදමන් නමැත්තා ක්ෂත්‍රප ධුරයට පත් විය. ඔහු විසින් ශකවර්ෂ 156-160 (ක්‍රි. ව. 234-238) අතර අවුරුදුවල දී රිදී කාසි නිකුත් කරන ලදී. එහෙත් වීරදමන් ක්ෂත්‍රපවරයා ද පසු කලෙක මහාක්ෂත්‍රප තනතුරට පත් නොවීය. දමසේනගෙන් පසුව ඒ තනතුරට උරුමය තහවුරු කරගත්තේ යසෝදමන් නමැති දමසේනගේ තවත් පුත්‍රයෙකි. ඔහු ද ශක වර්ෂ 160-161 (ක්‍රි. ව. 238-39) අවුරුදුවල දමසේන මහාක්ෂත්‍රපව සිටිය දී ක්ෂත්‍රපවරයකු වශයෙන් කාසි නිකුත් කළේ ය.

මහාක්ෂත්‍රප දමසේනගේ පාලන සමය තුළ නිකුත් කරන ලදැයි නාණක විද්‍යාඥයන් විසින් සලකනු ලැබෙන, නිකුත් කළ පාලකයාගේ නම සඳහන් නොවන, පොටින් මිශ්‍ර ලෝහයෙන් කළ කාසි හමු වී තිබේ. මෙයින් අනතුරුව බටහිර ක්ෂත්‍රප පාලකයන් විසින් පොටින් නම් මෙම මිශ්‍ර ලෝහ වර්ගීය කාසි නිපදවීම සඳහා භාවිතයට ගැනීම අත්හිටවන ලද බවයි, පෙනෙන්නේ. මේ මිශ්‍ර ලෝහ වර්ගයෙන් නිපදවන ලද කාසි පිළිබඳ සාමාන්‍ය පිළිගැනීම නම් ඒවා මාල්වා ප්‍රදේශය ආශ්‍රිතව නිකුත් කරන ලද බවයි. මේවා අත්හිටුවන ලද්දේ එම ප්‍රදේශය ක්ෂත්‍රප පාලනයෙන් ගිලිහී ගිය නිසා හෝ ඒ ප්‍රදේශයේ ද පොටින් මිශ්‍ර ලෝහයෙන් කළ කාසි වෙනුවට ක්ෂත්‍රප ආධිපත්‍යය යටතේ පැවැති අනෙකුත් ප්‍රදේශවල නිකුත් කැරුණු රිදී කාසි ම භාවිතය සඳහා යොදා ගත් නිසා හෝ විය යුතු ය.

බටහිර ක්ෂත්‍රප පාලකයන්ගේ කාසිවල ආකෘතිය අනුකරණය කරමින් කාසි නිපදවූ ඊශ්වරදත්ත නම් පාලකයෙක් විය. ''මහාක්ෂත්‍රප'' යන විරුද නාමයෙන් තම කාසිවල පාඨයන්හි තමන් හඳුන්වාගනිතත්, මේ පාලකයා මෙතෙක් සඳහන් කරන ලද බටහිර ක්ෂත්‍රප පාලක පෙළපතට අයත් කිසිම පාලකයකු හා තමන් අතර ඥාති සම්බන්ධතාවක් දක්වා නැති බව ඔහු නිකුත් කළ කාසිවල පාඨයන් පිරික්සීමෙන් පෙනේ. ඊශ්වරදත්ත නිකුත් කළ කාසිවල එන තවත් විශේෂ ලක්ෂණයක් නම්, ඒවායේ බටහිර ක්ෂත්‍රප කාසිවල මෙන් නිකුත් කළ වර්ෂය ශක සංවත්සරයෙන් දක්වනු නොලැබීමයි. ඒ වෙනුවට මේ පාලකයා ඒ ඒ කාසිය නිකුත් කළ අවුරුද්ද තමන්ගේ රාජ්‍ය සංවත්සරය අනුව (උදා: රාඥො මහාක්ෂත්‍රප ඊශ්වරදතස වර්ෂෙ ප්‍රථමෙ) දක්වයි. බටහිර ක්ෂත්‍රප පෙළපතට අයත් නොවූ, එහෙත් මහාක්ෂත්‍රපවරයකු ලෙස මේ ප්‍රදේශ පාලනය කිරීමෙහි නිරතව සිටි මෙම පාලකයාගේ රාජ්‍ය සමය ක්‍රි. ව. 236-239 අතර කාල පරිච්ඡේදයට වැටුණු බව ඊ. ජේ. රැප්සන් නිගමනය කරයි.

ශක වර්ෂ 160-161 (ක්‍රි. ව. 238-39) අවුරුදුවල දී ක්ෂත්‍රප පාලකයකු ලෙස රිදී කාසි නිකුත් කළ යශෝදමන් නම් මහාක්ෂත්‍රප දමසේනගේ පුත්‍රයා ඊශ්වරදත්තගෙන් පසු මෙම ප්‍රදේශවල මහාක්ෂත්‍රප තනතුරට පත් වූ බව පෙනේ. එහෙත් ඔහුගේ පාලන සමය ඉතා කෙටි එකක් වී ය.

යශෝදමන්ගෙන් පසු මහාක්ෂත්‍රප තනතුරට පත් වූයේ ඔහුගේ සහෝදර විජයසේන නමැත්තායි. මහාක්ෂත්‍රප තනතුරට පත් වන්නට පෙර ක්‍රි. ව. 238-240 අතර සමයේ හේ ක්ෂත්‍රපවරයකු ලෙස ක්‍රියා කළේය. මේ කාලයේ දී ද, ශක වර්ෂ 162 (ක්‍රි.ව. 240) දී මහාක්ෂත්‍රප ධුරයට පත්ව, ඒ තත්ත්වයෙන් ස්වකීය ප්‍රදේශ පාලනය කිරීමෙහි නිරතව සිටි දස අවුරුද්දක දීර්ඝ කාලය තුළදී ද විජයසේන විසින් නිකුත් කරන ලද කාසි හමු වී තිබේ. මෙසේ වාර්ෂිකව නිකුත් කළ කාසි ගුජරාට හා කඨියවාර් ප්‍රදේශවල ඉතා බහුල වශයෙන් ද, රාජපුතානාවේ නිරිතදිග ප්‍රදේශයේ සැලැකිය යුතු ප්‍රමාණයන්ගෙන් ද, හමු වී තිබේ. මහාක්ෂත්‍රප විජයසේනගේ කාසි බටහිර ක්ෂත්‍රප පාලක පෙළපතට අයත් අනෙක් අයගේ කාසි සමඟ තුලනාත්මකව පරීක්ෂා කර බැලීමෙන් පසුව, ඊ. ජේ. රැප්සන් නිගමන දෙකකට බසියි. එකක් නම්, මේ පෙළපතට අයත් පාලකයන් විසින් නිකුත් කරන ලද කාසි අතරින් ඉතා ම දර්ශනීය අන්දමින් නිපදවන ලද කාසි මේවා බවයි. මේ හැරුණු විට, මහාක්ෂත්‍රප විජයසේනගේ ශකවර්ෂ 167-168 (ක්‍රි. ව. 245-46) අවුරුදු සඳහන් කාසිවලින් බටහිර ක්ෂත්‍රප පාලකයන්ගේ නාණක ශිල්පයේ පරිහානියේ ආරම්භක අවස්ථාව දක්නට හැකි බව ද පවසයි. කාසි නිෂ්පාදනය අතින් පෙනෙන මෙම පරිහානිය ක්ෂත්‍රප පාලකයන් පිළිබඳ ඉතිහාසයේ එම අංශයට පමණක් සීමා වූවක් නොව, ඔවුන්ගේ දේශපාලන බලය ක්‍රමයෙන් අවනතියට පත් වී යාමේ ප්‍රතිඵලයක් ලෙස ද පැවැසිය හැක.

දමසේන මහාක්ෂත්‍රපවරයාගේ තවත් පුත්‍රයකු වූ තුන්වන දමජදශ්‍රී ශකවර්ෂ 172 සිට 177 තෙක් (ක්‍රි. ව. 250-255) මහාක්ෂත්‍රප බලය තමන් සතු කරගෙන පාලනය ගෙන ගියේය. මොහුගෙන් අනතුරුව පාලන බලය අත්පත් කරගෙන ඉතා දීර්ඝ රාජ්‍ය සමයක් ගත කළ දෙවැනි රුද්‍රසේන මහාක්ෂත්‍රප දමසේනගේ මුණුබුරෙක් විය. ඩී. ආර්. භාණ්ඩර්කර් විසින් බෙස්නගර්හි දී කරන ලද පුරාවිද්‍යා කැණීම්වල දී මහාක්ෂත්‍රප රුද්‍රසේන විසින් ශකවර්ෂ 177 දී (ක්‍රි. ව. 255) නිකුත් කරන ලද කාසියක් සොයා ගනු ලැබිණි. ශකවර්ෂ 198 (ක්‍රි. ව. 276) දක්වා ඔහු මහාක්ෂත්‍රපවරයකු ලෙස පාලනයෙහි නිරත වී සිටි බවට නාණක විද්‍යා සාක්ෂි ලැබී තිබේ. මේ පාලකයා විසින් නිකුත් කරන ලද කාසි ඉතා විශාල සංඛ්‍යා වශයෙන් හමු වී ඇති නමුත්, ඒවායේ ශිල්ප ක්‍රමය ඉතා දුර්වලය. බොහෝ අවස්ථාවල දී ඔහුගේ කාසිවල වර්ෂය හා පාඨයන් කියවා ගත හැකි තරම් පැහැදිලි තත්ත්වයක නොපවතී.

විජයසේන හා දමජද ශ්‍රී යන මහා ක්ෂත්‍රපවරුන්ගේ රාජ්‍ය සමයයන්හි දී කිසිවකු ක්ෂත්‍රපවරයකු වශයෙන් ඔවුන් යටතේ පාලනයෙහි නිරත ව සිටි බවට සාක්ෂි හමු වී නැත. යළිත් වරක් දෙවැනි රුද්‍රසේනගේ පාලන සමයේ අග භාගයේ දී, එනම් ශක වර්ෂ 197 – 199 (ක්‍රි: ව: 275 – 277) සමයේ දී, විශ්වසිංහ නම් ඔහුගේ පුත්‍රයා ක්ෂත්‍රප පාලකයකු වශයෙන් නිකුත් කළ කාසි හමු වී තිබේ. මීළඟට මහාක්ෂත්‍රප තනතුරට පත් වූයේ ද විශ්වසිංහයි. සිය පියා මෙන් ම ඔහු ද අධික ලෙස කාසි නිකුත් කළ බවට සාක්ෂි ඇතත්, එම කාසිවල ද තත්ත්වය හා ශිල්ප ක්‍රමය ඉතා දුර්වල ය. විශ්වසිංහගේ මහාක්ෂත්‍රප පාලන සමය ඉතා සුළු කාල පරිච්ඡේදයකට සීමා වූ බව පෙනේ. ක්‍රි. ව. 278 දී මහාක්ෂත්‍රප ධුරයට පත් වූ ඔහුගේ පාලන සමය ක්‍රි. ව. 282 වන විට කෙළවර වී තුබුණ බව ඒ අවුරුද්දේ දී (ශකවර්ෂ 204) ඔහුගේ සහෝදර භර්තෘදමන් විසින් මහාක්ෂත්‍රපවරයා වශයෙන් නිකුත් කරන ලද කාසියක් හමුවීමෙන් පෙනී යේ. මහාක්ෂත්‍රපවරයා බවට පත්වීමට පෙර සිවු හවුරුද්දක පමණ කාලයක් තිස්සේ භර්තෘදමන් ද තමන්ගේ සහෝදර මහාක්ෂත්‍රපවරයා යටතේ ක්ෂත්‍රපයකු ලෙස පාලන කාර්යයෙහි නිරත වී සිටි බවට එකල ඔහු විසින් නිකුත් කරන ලද කාසි සාක්ෂි දරයි. ශක වර්ෂ 217 (ක්‍රි. ව. 295) වන තෙක් භර්තෘදමන් මහාක්ෂත්‍රපවරයකු ලෙස ක්‍රියාකළ බවට නාණක විද්‍යාමය සාක්ෂි ඇතත්, ඔහුගේ පාලන සමය ඒ අවුරුද්දේ දී අවසානයට පත් වී යයි නිගමනය කරන්නට කරුණු නැත. ඔහුගේ පුත්‍රයා හා අනන්තරාගමිකයා වූ විශ්වසේන ශකවර්ෂ 215 – 226 (ක්‍රි. ව. 293 – 304) අතර කාලයේ දී ක්ෂත්‍රපවරයකු වශයෙන් නිකුත් කළ කාසි සොයාගෙන ඇත. විශ්වසේන පිළිබඳ සාමාන්‍ය පිළිගැනීම නම්, ඔහු කිසි විටෙක මහාක්ෂත්‍රප පාලකයා බවට උසස් නොවූ බවයි. බටහිර ක්ෂත්‍රප පාලකයන් අතර ඉතා වැදගත් පාලක පෙළපතක් ලෙස හැඳින්විය හැකි චෂ්ටනගෙන් ඇරැඹුණු ක්ෂත්‍රප පාලක වංශය විශ්වසේනගෙන් කෙළවර වෙයි.

විශ්වසේනගෙන් පසුව ක්ෂත්‍රප නමින් ශකවර්ෂ 227 දී (ක්‍රි. ව. 305) කාසි නිකුත් කළ (දෙවැනි) රුද්‍රසිංහ නම් පාලකයකු ගැන නාණක විද්‍යා සාක්ෂි හමු වෙයි. ඔහු තමන්ගේ ඥාති සම්බන්ධය දක්වන්නේ චෂ්ටන ක්ෂත්‍රප පෙළපතට අයත් කිසියම් පාලකයකු සමඟ නොව, ''ස්වාමි'' යන විශේෂණයෙන් විස්තර කෙරෙන ජීවදමන් නමැත්තකු සමඟය. (ස්‌වාමි ජීවදමපුත්‍රස රාඥෙ ක්‍ෂත්‍රපස රුද්‍රසිහස). ඉතිහාසඥයන්ගේ සාමාන්‍ය පිළිගැනීම වන්නේ ස්වාමි ජීවදමන් නමින් හැඳින්වෙන මෙම පුද්ගලයා අලුත් ක්ෂත්‍රප පාලක වංශයක ආරම්භකයා බවයි. ස්වාමි ජීවදමන් හා චෂ්ටනගෙන් ඇරැඹුණු පාලක පරපුරේ අවසානයා හා කිසියම් ඥාති සම්බන්ධයක් ද වූ බවක් සිතන්නට ද ඉඩ ඇත.

දෙවැනි රුද්‍රසිංහගෙන් ඇරඹෙන ක්ෂත්‍රප පාලක පෙළපත යටතේ පාලන සංවිධානය පිළිබඳව දක්නට ලැබෙන වැදගත් ම ලක්ෂණයක් නම් ''මහාක්ෂත්‍රප'' නිලය සෑහෙන කාලයක් ගත වන තුරු අත්හැර දමනු ලැබීමයි. දෙවැනි රුද්‍රසිංහ ක්ෂත්‍රප වරයාගේ පාලන සමය ආරම්භ වූයේ ශකවර්ෂ 226 හෝ 227 ( ක්‍රි. ව. 304 හෝ 305 ) දී ය. ඔහුගේ පාලන සමයේ අවසාන සීමාව දැනගන්නට නිශ්චය වශයෙන් ගත හැකි සාක්ෂි නැත. ඔහු ළඟට ක්ෂත්‍රප තනතුර හිමි කරගත් දෙවැනි යශෝදමන්ගේ කාසිවල සඳහන් වන පූර්වතම සීමාව ලෙස පෙනෙන්නේ ශකවර්ෂ 239 (ක්‍රි:ව:317)යි. යශෝදමන් විසින් ශකවර්ෂ 254 (ක්‍රි. ව. 332) දී නිකුත් කරන ලද කාසියක් හමු වී තිබීම නිසා ඔහු අඩු ම වශයෙන් ක්‍රි. ව. 317–332 අතර කාලය තුළ වත් ක්ෂත්‍රපවරයා ලෙස මේ ප්‍රදේශ පාලනය කළ බව නිගමනය කරන්නට පිළිවන.

මීළඟට ශක වර්ෂ 270 දරන ''රාඥ මහාක්ෂත්‍රපස ස්වාමි රුද්‍රදමපුත්‍රස රාඥ මහාක්ෂත්‍රපස ස්වාමි රුද්‍රසෙනස'' යන ප්‍රතිමුඛ පාඨය සහිත කාසියක් හමු වී තිබේ. මේ ඉතිහාසඥයන් විසින් තෙවන රුද්‍රසේන යන නමින් හඳුන්වනු ලැබෙන පාලකයා විසින් නිකුත් කරන ලද්දක් බව පෙනේ. මේ පාලකයා විසින් යළිත් වරක් ''මහාක්ෂත්‍රප'' යන විරුද නාමය භාවිත කරනු ලැබීමෙන් අප විසින් බැස ගත යුතු නිගමනය වන්නේ මෙකල වන විට පිරිහෙමින් තුබුණු ක්ෂත්‍රප පාලකයන්ගේ බලය නැවත වරක් සවිමත් ව ව්‍යාප්ත වීමක් සිදු වූ බව ද යන්න සැක සහිත ය. තෙවන රුද්‍රසේනගේ කාසියෙන් උපුටා ඉහත සඳහන් කරන ලද පාඨයෙහි මහාක්ෂත්‍රප ස්වාමි රුද්‍රසේනගේ පියා ලෙස හැඳින්වෙන ''මහාක්ෂත්‍රප ස්වාමීන් රුද්‍රදාම'' නම ඇති පාලකයකු ගැන මේ වනතුරු අන් නාණක විද්‍යා මූලාශ්‍රවලින් නම් දැනගන්නට ලැබී නැත. ඔහු ශකවර්ෂ 254–270 අතර කිසියම් අවස්ථාවක පාලන බලය දැරූවකු විය යුතුය. ඔහු පිළිබඳ නාම මාත්‍ර සඳහනක් පවා දක්නට ලැබෙන්නේ මේ කාසි පාඨයෙන් පමණකි.

තෙවන රුද්‍රසේනගේ සමයේ දී රිදියෙන් හා ඊයම්වලින් නිකුත්කරන ලද කාසි හමු වී තිබේ. මේ වන විට බටහිර ක්ෂත්‍රප පාලකයන්ගේ කාසිවල ශිල්ප ක්‍රමය කොතරම් දුරට පිරිහීමට පත් වී තිබුණේ ද යත් කාසිවල පාඨ ලිවීමට යොදා ගෙන ඇති අකුරු එකිනෙක වෙන් කොට හඳුනා ගැනීම පවා අපහසු ය. මේ රජුගේ රාජ්‍ය කාලය මැද සමයේ, එනම් ශකවර්ෂ 273 – 286 අතර සමයේ දී (ක්‍රි. ව. 354 – 367) නිකුත් කරන ලද කාසි කිසිවක් හමු වී නැත. මේ කාල සීමාව පූර්ව සමයේ දී ශක වර්ෂ 270 - 273 අතර සමයේ නිකුත් කරන ලද මේ පාලකයාගේ කාසි, ඊට පසු ඉහත දැක්වූ අන්තර් කාල පරිච්ඡේදයෙන් අනතුරුව, එනම් ශකවර්ෂ 286 – 300 අතර සමයේ ඔහුගේ නමින් ම නිකුත් කරන ලද කාසිවලට කිහිප අයුරකින් ම වෙනස් වෙයි. මෙම නාණක විද්‍යාමය සාධක උපයෝගී කොට ගෙන ක්‍රි. ව. 354 – 367 අතර සමයේ දී තෙවන රුද්‍රසේන මහාක්ෂත්‍රප පාලකයාගේ විජිත ප්‍රදේශවල කිසියම් වියවුල් තත්ත්වයක් තිබුණු බැව් නිගමනය කිරීමට ඉඩ ඇති බව පෙනේ. උපර්කොට්හි තිබී හමු වූ කාසි තොගයක් හැදෑරීමේ දී මෙබඳු නිගමනයක් වැඩි දුරටත් තහවුරු කරන සාක්ෂි ලැබුණු බව එම කාසි තොගය පිරික්සා බැලූ එච්. ආර්. ස්කොට් පවසයි.

බටහිර ක්ෂත්‍රපයන් විසින් ශතක තුනකට ආසන්න කාලයක් තිස්සේ තමන්ගේ පාලනය යටතේ පවත්වා ගන්නා ලද ප්‍රදේශ දෙවැනි චන්ද්‍රගුප්ත වික්‍රමාදිත්‍ය අධිරාජයා යටතේ ගුප්ත අධිරාජ්‍යයේ කොටසක් බවට පත් කර ගන්නා තෙක්, තෙවැනි රුද්‍රසේනගෙන් පසුව මේ ප්‍රදේශ පාලනය කළ ක්ෂත්‍රප පාලකයන් සිවු දෙනකු ගැන නාණක විද්‍යාමය මූලාශ්‍රවලින් කරුණු සපයා ගත හැකි වේ. මේ පාලකයන් සිවු දෙනා නම් (1) මහාක්ෂත්‍රප ස්වාමි සිංහසේන (2) මහාක්ෂත්‍රප ස්වාමි (සිවුවන රුද්‍රසේන) (3) මහාක්ෂත්‍රප ස්වාමි සත්‍යසිංහ හා (4) මහාක්ෂත්‍රප ස්වාමි (තුන්වන) රුද්‍රසිංහ ය. මහාක්ෂත්‍රප ස්වාමි සිංහසේන විසින් නිකුත් කරන ලද කාසිවල ප්‍රතිමුඛයේ යෙදෙන පාඨවල මේ පාලකයාගේ මයිලණුවන් වූ තුන්වන රුද්‍රසේන විරුදනාම දෙකක් භාවිත-යෙන් හැඳින්වෙයි. එක් වර්ගයකට අයත් කාසිවල ඔහු ''රාජා මහාක්ෂත්‍රප'' යනුවෙන් ද, තවත් වර්ගයක කාසිවල ''මහාරාජ ක්ෂත්‍රප'' යනුවෙන් ද හැඳින්වේ. මේ අතර ''මහාරාජ'' යන විරුද නාමය සමහර විට ක්‍රි. ව. තුන්වන ශතවර්ෂයේ මුල් භාගයේ දී පමණ සිය බලය තහවුරු කරගත් ත්‍රෛකූටක රජවරුන්ගේ කාසිවලින් ලත් බලපෑමක් නිසා යොදා ගත්තක් විය හැකියි. මහාක්ෂත්‍රප සිංහසේනගේ කාසිවල අභිමුඛයේ ඉලක්කමින් වර්ෂය සඳහන් කිරීමට පෙර ''වර්ෂේ'' යන සංස්කෘත පදය යෙදී තිබෙනු දක්නට ලැබේ. කාසිවල අවුරුද්ද යෙදීමට පෙර මෙසේ අකුරින් ''වර්ෂේ'' යනුවෙන් සඳහන් කිරීමේ ක්‍රමය පසුව මේ ප්‍රදේශය යටත් කරගෙන බටහිර ක්ෂත්‍රප-යන්ගේ කාසිවල ආකෘතියෙන් රිදී කාසි නිකුත් කළ දෙවන චන්ද්‍රගුප්ත අධිරාජයා විසින් ද අනු-ගමනය කරන ලදි.

මහාක්ෂත්‍රප ස්වාමි (හතරවැනි) රුද්‍රසේන විසින් නිකුත් කරන ලදැයි සලකනු ලැබෙන කාසි මෙතෙක් හමු වී ඇත්තේ එකකි. ස්වාමි සත්‍යසිංහ නම් පාලකයකු වූ බවට ඇති එක ම සාක්ෂිය ඔහුගේ පුත්‍රයා වූ ස්වාමි (තුන්වන) රුද්‍රසිංහ තමන්ගේ කාසිවල සිය පියාගේ නාම මාත්‍රය සඳහන් කර තිබීම පමණකි. මහාක්ෂත්‍රප ස්වාමි (තුන්වන) රුද්‍රසිංහගේ කාසිවල හඳුනාගත හැකි තරම් පැහැදිලි වශයෙන් සඳහන් වන එක ම වර්ෂය ශකවර්ෂ 310 (ක්‍රි. ව. 388) යි. ක්‍රි. ව.

පස්වන ශතකයේ ආරම්භයේ දී පමණ සිදු වූ ගුප්ත ආක්‍රමණයෙන් බටහිර ක්ෂත්‍රප පාලකයන්ගේ බලය සම්පූර්ණයෙන් බිඳී යන තෙක්, මේ ප්‍රදේශය පාලනය කළ බටහිර ක්ෂත්‍රප පාලක පංතියේ අවසාන සාමාජිකයා මොහු වී යැයි සලකන්නට ඉඩ ඇතත්, එය තහවුරු කරන්නට අවශ්‍ය සාධක හමු වී නැත.

ඉහත විස්තර කරන ලද මථුරා ක්ෂත්‍රපයන් නමින් හැඳින්වෙන්නවුන් අතර රාජුවුලගේ කාසි වැදගත් වේ. මුල දී ඔහු පළමුවැනි හා දෙවැනි ස්ට්‍රාටෝ රජ වරුන්ගේ හෙමිඩ්‍රැම් (hemidrachm) කාසි අනුකරණය කරමින් රිදී කාසි නිකුත් කළේ ය. මේවායේ අභිමුඛයේ දකුණට හැරී සිටින රජුගේ උඩුකය ශක පාලකයන්ගේ කාසිවල රජුගේ උඩුකය දක්වෙන ආකාරයෙන් ම දක්වේ. අභිමුඛයේ දූෂිත ග්‍රීක පාඨයකි. ( බැසිලිස් බැසිලිඕ සෝතේරෝස් රසු (Basileis Basileo Soteros Razu ) ප්‍රතිමුඛයේ පලිහ හා වජ්‍රායුධය දරා වමට හැරී සිටින පලස් දේවතාවියගේ පිළිරුව සමඟ ''අප්‍රතිහත චක්‍රස ඡත්‍රපස රජුවුලස'' යන ප්‍රාකෘත පාඨය ඛරෝෂ්ඨී අක්ෂරයෙන් ලියැවී තිබේ ( චිත්‍රය V, 1 ). මේ රජුවුල ගේ කාසි අතර ඉතා බහුල වශයෙන් දක්නට ලැබෙන, ඔහු විසින් ඉන්දු – ග්‍රීක පාලකයන්ගේ කාසි අනුකරණයෙන් තමන්ගේ දීර්ඝ රාජ්‍ය සමයේ මුල් අවදියේ දී නිකුත් කරන ලද කාසි වර්ගයයි. මීළඟට කල් යාමේ දී බලයෙන් වැඩී ගිය පසු ''මහා-ක්ෂත්‍රප'' යන නිල නාමය සහිතව ඔහු නිකුත් කළ කාසිවලට ආදර්ශය කර ගෙන ඇති බව පෙනෙන්නේ මථුරා ප්‍රදේශයේ ඔහුට පෙර පාලන බලය නතු කරගෙන සිටි දේශීය පාලක වංශයකට අයත් වූ බලභූති, රාමදත්ත ආදීන් විසින් නිකුත් කරන දේශීය කාසියි. මථුරාවේ දේශීය පාලකයන්ගේ කාසිවල එන රූ සටහන් ලෙස සමහර නාණක ශාස්ත්‍රඥයන් විසින් හඳුන්වනු ලැබෙන, අභිමුඛයේ සිටගෙන ඉන්නා ලක්ෂ්මියගේ හා ප්‍රතිමුඛයේ අභිෂෙක-ලක්ෂ්මියගේ පිළිරූ සහිත පෙර දක්වුණු වර්ගයේ මෙන් ද්විභාෂාමය කාසි පාඨයන් වෙනුවට, අභිමුඛයේ පමණක් යෙදෙන බ්‍රාහ්මී අකුරින් ලියැවුණු පාඨයක් සහිතව නිකුත් කරන ලද මෙම කාසි වර්ගය රාජුවුලගෙන් පසුව ක්ෂත්‍රප පාලකයන් බවට පත් වූ ෂොඩාස, හගමාෂ යන පාලකයන් විසින් ද ආදර්ශ කොට ගන්නා ලදී. මේවා රිදියෙන් කළ ඒවා නොව, බිලන් මිශ්‍ර ලෝහයෙන් නිමැවුණු ඒවා වේ. රාජුවුලගෙන් පසුව බලයට පත් ඔහුගේ අනන්තරාගමිකයන් විසින් ද තමන්ගේ කාසි නිකුත් කරන ලද්දේ මේ බාල මිශ්‍ර ලෝහයෙන් මිස රිදියෙන් නොවේ.

මථුරා අවට විශාල ප්‍රදේශයක දීර්ඝ කාලයක් තිස්සේ රජුවුල ගේ පාලන බලය ව්‍යාප්තව පැවැති බව, ඔහුගේ කාසි පංජාබයේ සිට ගංගා ඩොවාබ් ප්‍රදේශය දක්වා විශාල ප්‍රදේශයක් තුළ විවිධ ස්ථානවලින්, විශාල සංඛ්‍යා වශයෙන් හමු වී තිබීමෙන් පෙනී යයි.

ෂොඩාස ගේ කාසි අතරින් ඇතැමෙක බ්‍රාහ්මී අකුරින් ලියැවුණ ප්‍රාකෘත පාඨය ''මහා ඛත පස පුතස ඛතපස ෂොඩාසස'' යනුවෙන් ද, තවත් සමහරක ''රජුවුලපුතස ඛතපස ෂොඩාසස'' යනුවෙන් ද, තවත් වර්ගයක ''මහාඛතපස ෂොඩාසස'' යනුවෙන් ද, වෙනස් අයුරින් යෙදී තිබෙනු දක්නට ලැබේ. මෙය මෙසේ වුව ද, ඔහුගේ කාසිවල අභිමුඛයේ දක්වෙන වෘක්ෂයන් අතර සිටගෙන සිටින ලක්ෂ්මිය හා ප්‍රතිමුඛයේ අභිෂේක – ලක්ෂ්මිය නිරූපණය වන රූප සටහන්වලින් එකිනෙක කාසි වර්ගය අතර සැලැකිය යුතු වෙනස්කම් කිසිත් දක්නට නොලැබේ. මේ පාඨ ආශ්‍රයෙන් ෂොඩාස ගැන ඓතිහාසික ප්‍රවෘත්ති කිහිපයක් හෙළි කර ගත හැක. ඔහු රාජුවුලගේ පුත්‍රයා වූ බව ද, මුල දී තම පියාවූ මහාක්ෂත්‍රපවරයා යටතේ ක්ෂත්‍රප පාලකයකු ලෙස පාලනයෙහි නිරත ව සිට පසුව මහාක්ෂත්‍රපවරයා බවට පත් වූ බව ද පෙනී යයි.

ෂොඩාස විසින් බිලන් මිශ්‍ර ලෝහ කාසි පමණක් නොව තඹ හා ඊයම් කාසි ද නිකුත් කැරිණි. ඒ කාසි සියල්ලක ම දක්නට ලැබෙන්නේ ඉහත විස්තර කරන ලද රූප සටහන් ම වේ. මථුරා ක්ෂත්‍රප පාලක පරපුරට අයත් අනෙක් අය වන ශිවදත්ත, ශිවඝොෂ, හගමාෂ හා හගාන යන පාලකයන් නිකුත් කළ තඹ කාසිවල ද බ්‍රාහ්මී පාඨ හා මෙම රූප සටහන් ම යෙදී තිබෙනු දක්නට ලැබේ. හගමාෂ හා හගාන දෙදෙනා නිකුත් කළ ඇතැම් කාසිවල අභිමුඛයේ ආභරණයෙන් තොර අශ්ව රූපයක් හා ප්‍රතිමුඛයේ දකුණත ඔසවා සිටින මිනිස් රුවක් ද, බ්‍රාහ්මී පාඨයන් ද (අභිමුඛයේ) යෙදී තිබේ.

බටහිර ක්ෂත්‍රප පාලකයන් පිළිබඳව ඉහත දක්වන ලද විස්තරයෙන් ඔවුන්ගේ ඉතිහාසය සකස්කර ගැනීමෙහි ලා උපකාරී වන මූලාශ්‍රයක් ලෙස ඔවුන් විසින් නිකුත් කරන ලද කාසි කොතරම් වැදගත් වේ ද යන්න මනාව පැහැදිලි විය. ක්ෂහරාත ක්ෂත්‍රප පාලකයන් අතර පළමු වැන්නා ලෙස ගැණෙන භූමක ගැන තතු දැන ගැනීමට ඇති එක ම මූලාශ්‍රය ඔහුගේ තඹ කාසි කිහිපයක් පමණි. මෙම කාසි ගුජරාටයේ හා කථියවාරයේ වෙරළාසන්න ප්‍රදේශවල ද, ඇතැම් විට මාල්වා ප්‍රදේශයේ සමහර ස්ථානවලින් ද පමණක් වැඩි වශයෙන් ලැබීමෙන් ඔහුගේ පාලන ක්ෂේත්‍රය පිළිබඳ කිසියම් අදහසක් ඇති කර ගත හැකි වේ. මේ පාලකයා නිකුත් කළ කාසිවල අභිමුඛයේ රූප සටහන් ස්පලිරිසිස් හා අසිස් යන ශක පාලකයන් දෙදෙන විසින් ඒකාබද්ධව නිකුත් කරන ලද කාසිවල අභිමුඛයේ යෙදෙන රූප සටහනට බෙහෙවින් සමාන ය. මේ වර්ග දෙකේ ම කාසිවල යෙදී ඇත්තේ ඊයක් හා වජ්‍රායුධයක් හා ඒ ආයුධ දෙක අතර කාසියේ මැද කිසියම් වෘත්තාකාර පැතලි ආයුධයක් නිරූපණය කෙරෙන රූප සටහනකි. භූමකට පසුව ඔහුගේ පාලන බලයට උරුමකරු වූ මහාක්ෂත්‍රප නහපානගේ තඹ කාසිවල අභිමුඛයේ හා රිදී කාසිවල ප්‍රතිමුඛයේ දක්වෙන්නේ ද මේ රූප සටහන ම වේ.

භූමකගේ තඹ කාසිවල ප්‍රතිමුඛයේ සිංහ ස්තම්භ ශීර්ෂයක් හා ඒ පසෙකින් චක්‍රයක් ද දක්වෙන රූප සටහනක් වෙයි. මේ කාසිවල පාඨය යෙදෙන්නේ ප්‍රතිමුඛයේ ය. එය බ්‍රාහ්මී හා ඛරෝෂ්ඨී අකුරු වර්ග දෙකෙන් ම යෙදී තිබේ. එය හැම විට ම යෙදෙන්නේ "ක්ෂහරාතස ක්ෂත්‍රප භූමක" යනුවෙනි. භූමක කිසි විටෙක "මහාක්ෂත්‍රප" හෝ "රාජ" යන විරුදනාමයන් යොදා ගත් බවක් නොපෙනේ.

නහපානගේ තඹ කාසි සංඛ්‍යාවෙන් ඉතා අඩු ය. ඒවායේ අභිමුඛයේ දක්නට ලැබෙන්නේ භූමකගේ රිදී කාසිවල අභිමුඛයේ යෙදී ඇති රූප සටහන් ම වේ. ප්‍රතිමුඛයේ විශාල පත්‍ර සහිත ගසක් වේදියකින් වට කොට තිබෙන ආකාරය දක්නට ලැබේ. මේ පාලකයා විසින් නිකුත් කරන ලද රිදී කාසි සංඛ්‍යාව අතිවිශාල ය. ඒවායින් බොහොමයක් ගෞතමීපුත්‍ර ශාතකර්ණී නම් සාතවාහන පාලකයා විසින් නැවත මුද්‍රිත කාසිය. මෙම පාලකයන් දෙදෙනා සමකාලීනයන් බව ද, ශාතකර්ණී අතින් නහපාන පරාජයට පත් වූ බව ද, පෙන්වා දෙන නාණක විද්‍යා සාක්ෂියකි මෙය. මේ නහපාන නිකුත් කළ රිදී කාසිවල අභිමුඛයේ දකුණට හැරී සිටින ආකාරයෙන් නිරූපිත රාජ ශීර්ෂ ප්‍රතිරූපයක් දක්වෙයි. රාජ ශීර්ෂය රිදී කාසිවල යෙදීමේ දී නහපානගේ කාසි නිපැදවූ ශිල්පීන් ක්‍රි. ව. පළමුවැනි ශතකයේ රෝම අධිරාජ්‍යයෙන් නිකුත් කරන ලද කාසිවල යෙදුණු රාජශීර්ෂ රූප සටහන ආදර්ශ කොට ගෙන ඇති බවක් පෙනේ. මේ රිදී කාසිවල අභිමුඛයේ දූෂිත ග්‍රීක – රෝම අක්ෂරයන්ගෙන් ප්‍රතිමුඛයේ එන පාඨයන්හි පරිවර්තනයක් ද යොද තිබීම මෙම බලපෑම තව දුරටත් පෙන්වා දෙන සාක්ෂියකි. නහපානගේ රිදී කාසිවල ප්‍රතිමුඛයේ යෙදෙන්නේ භූමකගේ තඹ කාසිවල අභිමුඛයේ යෙදුණු රූප සටහන් ම බව ඉහත සඳහන් විය. මේවායේ "රඤෙ ක්ෂහරතස නහපනස" යන ප්‍රතිමුඛ පාඨය ඛරොෂ්ඨී හා බ්‍රාහ්මී යන අක්ෂර ක්‍රම දෙකින් ම ලියැවී තිබේ. මේ අනුව නහපානගේ කාසිවල විශෙෂ ලක්ෂණයක් වන්නේ අක්ෂර වර්ග තුනකින් කාසි පාඨ යොදා තිබීමයි. මේ පාලකයා සිය කාසි නිපැදවීමේ දී ඒවායේ බර හා ප්‍රමාණය අතින් ඉන්දු – ග්‍රීක රිදී කාසි අනුගමනය කරන ලද ක්‍රමය ම ගත් බව පෙනෙයි.

චෂ්ටනගෙන් ඇරඹෙන බටහිර ක්ෂත්‍රප පෙළපතට අයත් පාලකයෝ රිදී, තඹ, පොටින් මිශ්‍ර ලෝහ හා ඊයම් කාසි නිකුත් කළෝය. ඔවුන්ගේ රිදී කාසිවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් නම්, ශතවර්ෂ දෙක හමාරක පමණ කාලයක් තිස්සේ ඒවායේ අභිමුඛයේ හා ප්‍රතිමුඛයේ රූප සටහන්වල දක්නට ලැබෙන ඒකස්වරූපීතාවයි. මේ සාමාන්‍යයෙන් මෙබඳු කාසි පංතීන්හි දක්නට නොලැබෙන ලක්ෂණයකි. පාලක පෙළපතේ ආරම්භකයා වන චෂ්ටනගේ රිදී කාසි වර්ග දෙකකි. මෙසේ වර්ග දෙකකට ඒ රිදී කාසි වෙන් කළ හැක්කේ ඒවායේ ප්‍රතිමුඛයේ පමණක් දක්නට ඇති විෂමතාවන් අනුව ය. විරල වශයෙන් ලැබී ඇති ඔහුගේ එක් රිදී කාසි වර්ගයෙක ප්‍රතිමුඛයේ නිරූපිතව ඇත්තේ චන්ද්‍රවංකයක හා තරුවක රූ සටහන් පමණි. මේ වර්ගයට අයත් කාසිවල ප්‍රතිමුඛයේ ඛරොෂ්ඨී හා බ්‍රාහ්මී පාඨවලින් ඔහු හැඳින්වෙන්නේ ද "ක්ෂත්‍රප" නාමයෙන් පමණි. අනෙක් වර්ගයට අයත් රිදී කාසිවල ප්‍රතිමුඛයේ මේ රූප සටහනට අතිරේකව චන්ද්‍රවංකයට හා තරුවට මැදින් මුදුනේ චන්ද්‍රවංකයක් සහිතව ශිඛර තුනකින් යුක්ත පර්වතයක (චෛත්‍යයක) රූප සටහනක් දක්වේ. මේ කාසිවල "ක්ෂත්‍රප"

''මහාක්ෂත්‍රප'' යන නාම ද්වයෙන් ම ඔහු හැඳින්වේ. මුදුනේ චන්ද්‍රවංකයක් සහිත ශිඛර තුනකින් සැදි පර්වතය දක්වෙන රූප සටහන සාතවාහන (ආන්ධ්‍ර) රජවරුන් විසින් තම කාසිවල යොදන ලද්දකි. මුල පටන් ම බටහිර ක්ෂත්‍රපයන්ට සාතවාහන පාලකයන් හා ගැටෙන්නට සිදු වූ බව පෙනේ. ඇතැම් විට මුල දී ක්ෂත්‍රප පාලකයකු ලෙස බලය අත්පත් කර ගෙන සිට ඉන් පසු සාතවාහන බලය පසුබා ලත් ජයග්‍රහණයකින් අනතුරුව, ඒ පාලකයන්ගේ කාසිවල යෙදුණු සංකේතය ද ඒ ජයග්‍රහණය සිහිපත් කරවා ලීමට තම කාසිවලට චෂ්ටන විසින් යොද ගනු ලැබුවා විය හැක. ඒ කෙසේ වුව ද, මින් පසු දිගට ම බටහිර ක්ෂත්‍රප පාලකයන් විසින් තමන් නිකුත් කළ රිදී කාසිවල ප්‍රතිමුඛයේ යොදන ලද්දේ පර්වතය හා ඒ දෙපැත්තේ චන්ද්‍රවංකයත් තරුවත් සහිත මෙම සටහනයි. චෂ්ටනගේ හා ඔහුට අනතුරුව බලයට පත් බටහිර ක්ෂත්‍රප පාලකයන්ගේ රිදී කාසිවල අභිමුඛයේ යෙදුණු රාජ ශීර්ෂ ප්‍රතිරූපය බොහෝ දුරට නහපානගේ කාසිවල එන රාජ ශීර්ෂ ප්‍රතිරූපයට සමාන ස්වරූපයක් ගනියි. පාලකයන් හැමකකුගේ ම කාසිවල අභිමුඛයේ හා ප්‍රතිමුඛයේ රූප සටහන් මෙබඳු සමරූපීතාවක් දරුව ද, පරපුරට අයත් පාලකයන්ගේ කාසි ඉතා විමැසිල්ලෙන් පිරික්සීමෙදී, අභිමුඛයේ රාජ ශීර්ෂය දක්වීමේ දී තොල් හා නෙත් නිරූපණයෙහි දී ද, ප්‍රතිමුඛයේ පර්වතය හා එය දෙපස චන්ද්‍රවංකය හා තරුව යෙදීමේ දී ද, ඉතා සියුම් වෙනස් කම් ඇතැයි නිව්ටන් අදහස් කළේය. මේ අදහස ගැන තව දුරටත් කරුණු දක්වන ඊ. ජේ. රැප්සන් මෙබඳු වෙනස්කම් සැබැවින් ම දක්නට ඇති අතර, ඒවා ඉතා සියුම් ලෙස මේ කාසිවල කාල නිර්ණය සඳහා ද සාධක කොට ගත හැකි බව පවසයි.

චෂ්ටනගේ කාසිවල අභිමුඛයේ පාඨය ග්‍රීක හෝ ග්‍රීක-රෝමන් අකුරුවලින් සඳහන් වී ඇති අතර ප්‍රතිමුඛයේ ඛරෝෂ්ඨී හා බ්‍රාහ්මී අක්ෂරවලින් ''රාඤො මහාක්‍ෂත්‍රපස ඝසමොතිකපුතස චෂ්ටනස'' යනුවෙන් යෙදෙයි. පළමුවැනි රුද්‍රදාමන්ගේ කාසිවල ද අභිමුඛයේ ග්‍රීක පාඨය යෙදෙතත්, එතැන් පටන් එය කාසියේ හුදු සැරසිලි මාත්‍රයක් වශයෙන් යෙදෙනු දක්නට ලැබෙයි. ප්‍රතිමුඛයේ ප්‍රාකෘත පාඨය ද මුල දී ඛරොෂ්ඨී හා බ්‍රාහ්මී අක්ෂර වර්ග දෙකින් ම යෙදුණත්, පසු කාලීනව ඛරොෂ්ඨී පාඨය ද ගිලිහී ගොස් එය බ්‍රාහ්මී අකුරින් පමණක් යෙදී තිබෙනු දක්නට ලැබේ.

චෂ්ටන රිදියෙන් පමණක් නොව තඹයෙන් ද කාසි නිකුත් කළේ ය. ඒවා අභිමුඛයේ කණුවකට මුහුණ ලා දකුණු පැත්ත බලා සිටින අශ්වයකුගේ රූප සටහනකින් හා ග්‍රීක පාඨයකින් ද, ප්‍රතිමුඛයේ රිදී කාසිවල ප්‍රතිමුඛයේ දක්වෙන රූප සටහනින් ම හා බ්‍රාහ්මී පාඨයකින් ද යුක්තව සකස් වුණු හතරැස් කාසි වර්ගයකි. ගුප්ත අධිරාජයන්ගේ කාසි අතර දක්නට ලැබෙන අශ්වමෙධ වර්ගයට අයත් කාසිවල ද මීට සමාන අභිමුඛ රූප සටහනක් යෙදෙයි. බටහිර ක්ෂත්‍රප පාලකයන් අතර තඹ කාසි නිකුත් කළ අන් අයගේ කාසිවල ද අභිමුඛයේ වෘෂභ, හස්ති ආදී සත්ත්ව රූප, හිය, වජ්‍රය, ත්‍රිශූලය, පරශුව යනාදී ආයුධ එකක් හෝ කිහිපයක් සමඟ එකට යොදා තිබෙනු මිස කිසි විටෙකත් රිදී කාසිවල මෙන් රාජ ශීර්ෂ ප්‍රතිරූපය යොද තිබෙනු හමු නොවේ.

මෙම පාලකයන්ගේ කාසිවල පාඨ යෙදීමේ දී ඒ ඒ කාසිය නිකුත් කළ පාලකයාගේ නමත්, (රාඤක්ෂත්‍රප, මහාක්ෂත්‍රප, ස්වාමි ආදී වශයෙන්) ඔහු දැරූ විරුදනාමයත්, ඊට පෙර සිටි පාලකයා හා ඔහු අතර ඥති සම්බන්ධයත් දක්වා තිබීම ඉතා වැදගත් වේ. මේ අවදියේ ඉන්දීය ඉතිහාසය යළි සකස් කර ගැනීමට එක ම මූලාශ්‍රය මෙම කාසි වන හෙයින්, මේ කාසි පාඨයන්ගෙන් ලැබෙන ප්‍රවෘත්ති තවත් අගයෙන් වැඩිය. පෙළපතේ කාසි නිකුත් කළ පාලකයන් අතර පස්වැන්නා ලෙස ගිණිය හැකි ජීවදමන්ගේ කාසිවලින් බටහිර ක්ෂත්‍රපයන්ගේ කාසි ක්‍රමයට තවත් වැදගත් අලුත් ලක්ෂණයක් එකතු වෙයි. එනම්, කාසිය නිකුත් කළ වර්ෂය එහි අභිමුඛයේ රාජ ශීර්ෂ ප්‍රතිරූපයට පිටුපසින් පසුතලයේ බ්‍රාහ්මී ඉලක්කමින් දක්වීමයි. මෙතැන් පටන් බටහිර ක්ෂත්‍රප පාලකයන් නිකුත් කළ සියලුම රිදී කාසිවල මේ වැදගත් කරුණ සඳහන් වීම නිසා ඔවුන්ගේ රාජ්‍ය වර්ෂයන් ද නිශ්චය වශයෙන් දැනගැනීමට අවස්ථාව ලැබේ. ජීවදමන් හා අනෙක් පසුකාලීන ක්ෂත්‍රපවරුන් නිකුත් කළ ඇතැම් ඊයම් හා පොටින් මිශ්‍ර ලෝහ කාසිවල ද ඒවා නිකුත් කළ වර්ෂය දක්වේ. ජීවදමන් මහාක්ෂත්‍රප විරුදනාමය සහිතව නිකුත් කළ කාසිවල එකල භාවිතයෙහි යෙදුණු ශක සංවත්සරයෙන් 100 වැනි අවුරුද්ද සඳහන් වෙයි. ඒ ක්‍රිස්තු වර්ෂයෙන් 178/79 පමණ වෙතැයි නිගමනය කළ හැක. කාසිවල අවුරුද්ද සඳහන් කිරීමේ මෙම ක්‍රමයේ වෙනසක් ඇති කළේ චෂ්ටනගේ පෙළපතට අයත් නොවූ බැහැරින් පැමිණ බලයට පත් වූ

පාලකයකු ලෙස සලකනු ලැබෙන මහාක්ෂත්‍රප ඊශ්වරදත්ත විසින් පමණි. හේ එතෙක් අනෙක් ක්ෂත්‍රප පාලකයන් කළ අයුරින් කාසි නිකුත් කළ වර්ෂය දක්වනු වෙනුවට, තමන්ගේ රාජ්‍යාදයෙන් කීවෙනි වර්ෂයේ දී කාසිය නිකුත් කරන ලද්දේ ද යන වග (රාඥො මහාක්‍ෂත්‍රපස ඊශ්වරදත්තස වර්ෂෙ ප්‍රථමෙ'' යනාදී වශයෙන්) දැක්වීය.

සාමාන්‍යයෙන් මේ කාසිවල පාඨයන් යෙදෙනුයේ සංස්කෘත ව්‍යවහාරයට හුරු වන ලෙස සකස් කරගන්නා ලද ප්‍රාකෘත භාෂා මාධ්‍යයෙනි. සමහර විටෙක කාසිවල යෙදෙන පාඨයන් ප්‍රාකෘත භාෂා මාධ්‍යයෙන් නොව නිවැරදි සංස්කෘතයෙන් ද ලියැවී තිබෙනු දක්නට ලැබෙයි. උදහරණයක් වශයෙන් ක්ෂත්‍රප දමස්සද විසින් නිකුත් කරන ලද කාසියක ''රුද්‍රදමනඃ'' පුත්‍රස්ස ක්‍ෂත්‍රපසස දමස්ස...'' යනුවෙන් යෙදී ඇති පාඨය දැක්විය හැක.

වටිනාකමෙන් අඩු මිශ්‍ර ලෝහයන්ගෙන් කාසි නිකුත් කිරීම ආර්ථික පරිහානිය පෙන්වන ලක්ෂණයකි. බටහිර ක්ෂත්‍රප පෙළපතට අයත් ජීවදමන්, පළමුවන රුද්‍රසිංහ, පළමුවන රුද්‍රසේන වැනි පාලකයන් විසින් පොටින් මිශ්‍ර ලෝහයෙන් කාසි නිකුත් කළ අතර, මේ පාලක පෙළපතේ අවසාන කාල පරිච්ඡේදයට වැටෙන පාලකයකු වන තෙවැනි ස්වාමී රුද්‍රසේනගේ නම සඳහන් ඊයම් කාසි පමණි, හමු වී ඇත්තේ.

බටහිර ක්ෂත්‍රප පාලකයන් නිකුත් කළ කාසිවල වටිනාකම් හා නාමයන් පිළිබඳව නිශ්චය වශයෙන් යමක් සඳහන් කිරීම දුෂ්කරය. ඉන්දීය කාසි වර්ග සමඟ භාවිත වීමේ දී කාලාන්තරයක් තිස්සේ විවිධ පාලකයන් විසින් නිකුත් කරන ලද කාසි හැඳින්වීමට යෙදුණු කාර්ෂාපණ නාමය මේවා සඳහා ද යෙදෙන්නට ඇතැයි සැලැකේ. ඉන්දු-ග්‍රීක රිදී කාසි ආදර්ශයට ගෙන, ඒවා අනුකරණය කෙරෙමින් නිකුත් කරන ලද මෙම රිදී කාසිවලට ''ද්‍රම්ම'' (Dramma) යන ඉන්දු ග්‍රීක කාසි නාමය ද යෙදෙන්නට ඇතැයි අනුමාන කළ හැක. මේ සමයට අයත් නාසික්හි සෙල්ලිපියක ''කුෂාණ මූල'' නම් කාසි වර්ගයක් ගැන සඳහන් වෙයි. එහි කියැවෙන්නේ කුෂාණ රජුන්ගේ යටත් ප්‍රදේශ පාලකයකු ලෙස ක්‍රියා කළ ක්ෂත්‍රප නහපානගේ රිදී කාසි ගැන යැයි ඩී. ආර්. භාණ්ඩර්කර් තර්ක කරයි. පාලි පොත පතෙහි ''රුද්‍රදමක'' නමින් හැඳින්වෙන්නේ බටහිර ක්ෂත්‍රප පාලකයන් අතර ඉතා වැදගත් තැනක් ගන්නා පළමුවන රුද්‍රදමන් මහාක්ෂත්‍රප වරයාගේ කාසි විය යුතුය. මින් පසුව බලයට පත් වූ අන් ක්ෂත්‍රප පාලකයන්ගේ කාසි සඳහා පාලි අටුවා පොත්වල භාවිත වන්නේ ''රුද්‍රදමකාදී'' යන පදයයි.

## 7. ගෝත්‍රික කාසි

ඉන්දු-ග්‍රීක පාලනයෙන් අනතුරුව උතුරු ඉන්දියාවේ ප්‍රාදේශික පාලකයන් වශයෙන් ක්‍රියා කළ දේශීය පෙළපත් කීපයක් පිළිබඳ තතු ශිලාලේඛන, පුරාණ ග්‍රන්ථ ආදියේ එන විස්තර හා නාණක විද්‍යාමය සාක්ෂිවලින් දත හැකිව ඇත. රාජපුතානාවේ ආග්‍රා, මථුරා නගරවලට නැඟෙනහිර පෙදෙසේ ''ආර්ජුනායන'', වර්තමාන ජායිපූර් ප්‍රදේශය බද ''මාලව'', නැඟෙනහිර පංජාබයේ ''යෞධෙය'', අහිච්ඡත්‍ර රාජධානි කොට ගත් පඤ්චාල, කුලූත නිම්නයේ කුලූත, සත්ලෙජ් හා රාවි ගංගා නම්න අතර ප්‍රදේශයේ ඖදුම්බර'', ''උද්දේහික'', ''සිබි'' ආදී ගෝත්‍ර රාශියක් ම ගුප්ත අධිරාජ්‍යය බලයට පත් වන තුරු ස්වාධීනව සිය ප්‍රදේශ පාලනය කළ බව පෙනේ. කුෂාණයන් බලයට පත්වීම නිසා ඔවුන්ගේ බලය තාවකාලික වශයෙන් යටපත් වූ නමුත් කුෂාණයන්ගේ පිරිහීමෙන් පසු නැවත ඔවුහු බලයට පත්වූහ. ඔවුන්ගේ කාසිවල ගෝත්‍රික බව ප්‍රකාශ කෙරෙන ''ගණ'' යන පදය යෙදී තිබීමෙන් මෙය වඩා පැහැදිලි වේ. මේ අතර ඇතැම් ගෝත්‍රවල පාලන සමය ඉතා දීර්ඝ විය. යෞධෙය ගෝත්‍රිකයන් මෞර්යයන්ටත් පූර්වයෙහි සිට ඇලෙක්සැන්ඩර්ගේ ආක්‍රමණ සමයේ දී ද සින්ධු-නිම්නයේ නැඟෙනහිර ප්‍රදේශ පාලනය කළ බව සඳහන් කෙරෙන වාර්තා ඇත. ඔවුන්ගේ කාසි ලැබී ඇති තැන් විමසන විට සිය බලය උපරිම අවස්ථාවක පවතිද්දී යෞධෙයයන් මුළු නැඟෙනහිර පංජාබය ම වාගේ තමන්ගේ අණසක යටතට පත් කර ගන්නට සමත් ව සිටි බැව් පෙනේ. මොවුහු මෞර්ය බලය බිඳ වැටී කුෂාණ බලය වර්ධනය වනතුරු, සිය ප්‍රදේශ ස්වෛරීව පාලනය කළහ. කුෂාණයන්ගේ වැටීමෙන් පසු ද බලයට පත් වූ ඔවුන් ක්ෂත්‍රප පාලකයන් සමඟ ද ගැටුණු බැව් මහාක්ෂත්‍රප පළමුවන රුද්‍රදමන්ගේ ගිර්නාර් සෙල්ලිපියේ සඳහන් කරුණුවලින් පැහැදිලි වෙයි. මෙසේ ඔවුහු සමුද්‍රගුප්ත රජුගේ පාලන බලයට යටත් වන තුරු ම සිය ආධිපත්‍යය පවත්වා ගත්හ.

කාසිවලින් දත හැකි පරිදි නැඟෙනහිර රාජපුතානාවේ සීමිත ප්‍රදේශයක පාලන බලය ඇතිව සිටි මාලව ගෝත්‍රිකයන්ගේ ඉතිහාසය ද මහා ඇලෙක්සැන්ඩර් සමය තෙක් ඈතට දිවෙයි. ලතින් හා ග්‍රීක වාර්තාවල ''මල්ලි'' නමින් හඳුන්වනු ලැබූ මෙම පාලක කොටස ක්‍රමයෙන් දකුණු දෙසට පසු බැස ක්‍රි. ව. 2–4 ශතක අතර කාලයේ දී නැඟෙනහිර රාජපුතානාවේ වර්තමාන ජායිපූර් ප්‍රදේශයේ මාලව නගර (වර්තමාන කර්කොට නගර) ආශ්‍රිත ප්‍රදේශ පාලනය කළහ. අලහබාද් ප්‍රශස්තියේ සඳහන් වන පරිදි මාලවයෝ ද සමුද්‍රගුප්ත රජු විසින් සිය අධිරාජ්‍ය පාලනය යටතට ගන්නා ලදහ.

ඉහත සඳහන් කරන ලද නිදසුන්වලින් සමහර ගෝත්‍රිකයන්ගේ ඉතිහාසය ඉතා පැරණි සමයක් දක්වා දිවෙන බැව් පැහැදිලි වෙයි. ඔවුන්ගේ කාසි පරීක්ෂා කර බලන විට ද, ඒවා අතර වැඩි ප්‍රමාණය ක්‍රි. පූ. 3–1 ශතක කාලයට අයත් බව පෙනේ. ඔවුන්ගේ පාලන සමයයන් පිළිබඳ කාල නිර්ණය කිරීමේ දී අපට වැඩි වශයෙන් ම ආධාර කර ගත හැක්කේ මේ ගෝත්‍රික පාලකයන් නිකුත් කළ කාසි ය. ඒවායේ සඳහන් වන පාඨවල යෙදෙන අක්ෂර අනුව ඒවා නිකුත් කළ වකවානු බොහෝ දුරට නිවැරදිව සිතා ගත හැකි වේ. කාසිවල ඒවා නිකුත් කළ පාලකයන්ගේ නම් සඳහන් කෙරෙන පාඨ යෙදීමේ සිරිත මේ ගෝත්‍රික පාලකයන් ඉන්දු-ග්‍රීක කාසි ඇසුරු කිරීමෙන් ලත් ආභාසයක් ලෙස සැලැකේ. මේ අනුව සිතන විට පාලක නම් සඳහන් පාඨ සහිත දේශීය කාසි මුලින් ම නිකුත් කරන ලද්දේ ගෝත්‍රික පාලකයන් විසින් යැයි නිගමනය කරන්නට පුළුවන. එසේ ම මේ කාසිවල සංකේත මීට පෙර ඉන්දියාවේ

දේශීය කාසි ගණයට අයත් ''පුරාණ'' කාසිවල යොදන ලද සංකේත හා ඒවා ආශ්‍රයෙන් විකාශනයට පත් වූ සංකේත බව පැහැදිලි ය. මෙසේ බලන කල ''පුරාණ'' කාසිවලින් පසු ඇති වූ දේශීය කාසි වශයෙන් මෙම ගොත්‍රික කාසි හැඳින්වීමට පුළුවන. විදේශීය ආභාසයන් නිසා ඇති වූ නාණකශිල්ප ක්‍රමයේ දියුණුව නිසා, මෙම ගොත්‍රික කාසි ''පුරාණ'' කාසි මෙන් වෙන් වෙන් වශයෙන් හස් සටහන් යොද නිපදවනවා වෙනුවට අච්චුවක් මගින් මුද්‍රණය කිරීමෙන් හෝ වාත්තු කිරීමෙන් හෝ නිපදවා ගන්නා ලදි.

අච්‍යුත, අල්මෝරා, අපරාන්ත, ආර්ජුනායන, ඖදුම්බර, අයෝධ්‍යා, එරාන්, (එරකෙන), කාච, කනෞජ්, කෞශාම්බි, කුලූත, කුණින් ද, මාල්ව, මථුරා, පඤ්චාල, පූරී, රාජන්‍ය, සිබි, තක්ෂශිලා, ත්‍රිගර්ත, ත්‍රිපුරී, උද්දේහික, උජ්ජයිනී, උපගොද, උපාතික්‍යා, වටාශ්වක, යෞධෙය ආදී වශයෙන් ගොත්‍ර රාශියකට අයත් කාසි වර්ග පුරාවිද්‍යාඥයන් විසින් සොයාගෙන වර්ග කොට තිබේ. මේවා අතුරින් ප්‍රධාන තන්හි ලා සැලකිය හැකි වැදගත් ගොත්‍ර කීපයක කාසි පිළිබඳ කෙටි විස්තර පහත සඳහන් වෙයි.

## ආර්ජුනායන

මහාභාරතයේ එන පාණ්ඩව අර්ජුනගෙන් පැවැතෙන ගොත්‍රයක් වශයෙන් සාහිත්‍ය මූලාශ්‍රවල විස්තර වන ආර්ජුනායනයන් ගැන සමුද්‍රගුප්ත රජුගේ අලහබාද් ප්‍රශස්තියේ සඳහන් වන්නේ, යෞධෙය ගොත්‍රිකයන් සමඟ වූ ප්‍රාන්තීය ගොත්‍රික කණ්ඩායම් අතර එකක් වශයෙනි. මොවුන් විසින් නිකුත් කරන ලද කාසි ඉතා දුර්ලභ වන අතර දැනට සොයාගෙන ඇති කාසි විවිධ ප්‍රභේදයන්ගෙන් යුක්ත වේ. පසුව විස්තර කෙරෙන යෞධෙය ගොත්‍රිකයන්ගේ කාසිවල ''යෞධෙයානාස්‍ය ජය'' යන පාඨය මෙන්, ආර්ජුනායනයන්ගේ කාසිවල ද ''ආර්ජුනායනානාම් ජයඃ'' යන පාඨය බ්‍රාහ්මී අක්ෂරවලින් ලියැවී තිබෙනු දක්නට ලැබේ. මෙම කාසිවල දක්නට ලැබෙන විවිධ සංකේත අනුව, ආර්ජුනායන ගොත්‍රික කාසි ප්‍රභේද කිහිපයකට බෙද හැදෑරිය හැක.

(1) මේ වර්ගයට අයත් කාසිවල අභිමුඛයේ වම් පැත්තට හැරුණු වෘෂභයකු කන්දක් මත සිටින ආකාරය දක්වෙන රූප සටහනක් වෙයි. ප්‍රතිමුඛයෙහි ලක්ෂ්මී දේවතාවිය දෝ හෝ යි සැක කළ හැකි ස්ත්‍රී රූපයක්, ''ලිංගයක්'' හා වෘක්ෂයක් දක්වෙන රූප සටහන් දෙකක් අතර යොද තිබෙනු පෙනේ.

(2) මේ වර්ගයේ කාසිවල අභිමුඛයෙහි දක්වෙන සත්ත්ව රූපය වෘෂභයකු හෝ ඇතකු වන්නට පුළුවනි. මෙය ඇත් රුවක් වුවහොත් මේ කාසියෙහි අභිමුඛයේ රූප සටහන ඖදුම්බර කාසිවල අභිමුඛයට සමාන යයි සලකන්නට පුළුවන. කාසියෙහි ප්‍රතිමුඛයෙහි වෘෂභයකු ''ලිංගයක්'' ඉදිරියෙහි සිටින ආකාරය දක්වෙන රූප සටහනක් වෙයි.

(3) මෙහි අභිමුඛයේ දක්නට ලැබෙන්නේ වෘෂභ රූපයකි. කාසියේ ප්‍රතිමුඛයේ ''ටෝරීන්'' (taurine) නම් වෘෂභ සංකේතයක් ද, ස්වස්තික රූප සටහනක් හා තාල වර්ගයට අයත් ගසක ශාඛාවක් ද යෙදී තිබේ.

ඉහත සඳහන් කරන ලද බ්‍රාහ්මී පාඨය අක්ෂර විද්‍යාත්මක ලක්ෂණ අනුව විභාග කරන විට, මේ කාසි ක්‍රි. පූ. 100 තරම් ඈත යුගය දක්වා දිවෙන බැව් නිගමනය කරන්නට පුළුවන. ගොත්‍රික පාලන තන්ත්‍රයෙහි ආධිපත්‍යය දිල්ලිය, ජායිපූරය හා ආග්‍රා නුවර අතරට වැටෙන ත්‍රිකෝණාකාර ප්‍රදේශයෙහි පැතිර පැවැති බව කාසි හමු වී ඇති ස්ථාන අනුව තීරණය කළ හැක.

## උජ්ජයිනි

මාල්වා ප්‍රදේශයට අයත් උජ්ජයිනිය ඉතා පැරැණි නගරයකි. බින්දුසාර රජුගේ පාලන සමයෙහි අශෝක කුමරා ප්‍රාදේශීය පාලකයකු වශයෙන් ක්‍රියා කළේ උජ්ජයිනි නුවර මධ්‍යස්ථානය කරගෙනයි. ගොත්‍රික කාසි අතර ඉතා වැදගත් තැනක් ගන්නා උජ්ජයිනි කාසි ද අක්ෂර සහිත හා රහිත යනුවෙන් ප්‍රධාන ප්‍රභේද දෙකකට බෙදිය හැක. අක්ෂර රහිත

කාසි ජෝන් ඇලන් විසින් ප්‍රභේද සයකට බෙදා වෙන් කොට දක්වනු ලැබෙයි. උජ්ජයිනි කාසි ද නිපැදවී ඇත්තේ තඹයෙනි. එමෙන් මෙම කාසි හැමෙකක් ම පාහේ හැඩයෙන් වටකුරු ය. මේ අනුව, මාල්වා ප්‍රදේශයේ ස්ථානවලින් හමුවන, ඒ ප්‍රදේශයේ ම පාලක පිරිසක් විසින් නිකුත් කරන ලද හතරැස් හැඩයෙන් යුත් එරාන් කාසිවලින් උජ්ජයිනි කාසි වෙන් කොට හඳුනා ගත හැකි බව කනිංහැම් පෙන්වා දී ඇත.

''පුරාණ'' හෙවත් හස් යෙදූ කාසිවල දක්නට ලැබෙන සංකේත සටහන් රාශියක් උජ්ජයිනි කාසි හදරන විට හමු වෙයි. සටහන් යෙදීමේ දී ද හස් යෙදූ කාසිවල මෙන් ම, මේවායේ ද අභිමුඛයේ මෙම සටහන් අතරින් වැඩි ගණනක් (පහක් පමණ) යෙදී ඇත. ඉන්දියාවේ කාසි පිළිබඳ ඉතිහාසයේ හස් සලකුණු සහිත ''පුරාණ'' කාසි ක්‍රමයෙන් නියමිත කාසි ක්‍රමයක් බවට විකාශය වූ අයුරු පෙන්වා දෙන කාසි විශෙෂයක් ලෙස උජ්ජයිනි කාසි වැදගත්වේ. ''පුරාණ'' කාසිවල යෙදෙන සංකේත සටහන් ම කිසියම් නිශ්චිත පිළිවෙළක් අනුව සකසා එක් වර අච්චු ගැසීමෙන් මේ කාසි නිපදවා ඇති බව පෙනේ. මුල දී ඒවා එම සටහන්වලින් පමණක් යුක්තවූ අතර, පශ්චාත් අවදියක දී, කාසි නිකුත් කළහු කවුරු දැයි දැක්වීම සඳහා බ්‍රාහ්මී අක්ෂර භාවිත කරමින් පාඨයක් ද යෙදීමෙන් කාසි නිපදවීමේ ශිල්පය පිළිබඳ තවත් පියවරක් ඉදිරියට යාමට මෙම කාසි නිපද වූ ශිල්පීන් සමත් වූ අයුරු මේ කාසිවලින් පැහැදිලි ලෙස පෙනී යයි.

වේදිය සහිත බොධි වෘක්ෂය, සූර්යයා දැක්වෙන සටහන, කවයක් වටා ඊතල හා ටෝරීන් සංකේතය යෙදීමෙන් සකසා ගත් සටහන්, වෘෂභ රූපය, මත්ස්‍ය රූපය, උජ්ජයිනි සංකේතය (කුරුසිය හා කව සතර), ස්වස්තිකය, මිනිස් රූප තුන, ශිව, මහාකාල හා කාර්තිකෙය යන දෙවිවරුන් ලෙස හඳුනා ගත හැකි රූප යනාදිය මෙම කාසිවල යෙදී ඇති සංකේත අතර සමහරකි. පාඨය සහිත කාසි වර්ගයෙහි ''උජෙනි'' යන කෙටි පාඨය සඳහන් වී ඇති අතර ඒ කාසිවල අභිමුඛයෙහි ඇත් රුව යොද ඇත. උජ්ජයිනියේ ගොත්‍රික කාසි ක්‍රි. පූ. තුන්වන හා දෙවන ශත වර්ෂවලට අයත් ඒවා ලෙස සලකනු ලැබේ (චිත්‍රය, I,64-70).

**එරාන් (එරකෙන)**

ඉන්දියාවේ මධ්‍ය ප්‍රදේශයට අයත් වන හිල්සා ප්‍රදේශයට සැතැපුම් පනසක් පමණ ඊසාන දිගින් පිහිටි එරාන් හෙවත් එරකෙන ප්‍රදේශය ගැන සමුද්‍රගුප්ත, බුඩගුප්ත හා තොරමාණ යන රජවරුන් ගේ ශිලාලෙඛනවල සඳහන් වෙයි. මෙම වැදගත් ප්‍රදේශය ඉන්දියාවේ කාසි පිළිබඳ ඉතිහාසය අතින් ද උසස් ස්ථානයක් උසුලයි. ඇලෙක්සැන්ඩර් කනිංහැම් විසින් මේ ප්‍රදේශයෙන් සොයා ගන්නා ලද හස් යෙදූ කාසි ඉතා වැදගත් වෙයි. මේවා රිදී ''පුරාණ'' කාසිවලට සමාන ස්වරූප ඇතිව තඹයෙන් නිපදවා ඇති කාසි විශේෂයක් වෙයි. ප්‍රමාණයෙන් විශාල හතරැස් තඹ කාසිවල අභිමුඛයේ දක්නට ලැබෙන රූප සටහන් අතර නාණක විද්‍යාඥයන් විසින් උජ්ජයිනි සංකේතය යනුවෙන් හඳුන්වනු ලබන සටහන සුලභව හමු වේ. එමෙන් ම ඇතා, අශ්වයා හා වෘෂභයා දක්වන රූප ද, ස්වස්තිකය, ටෝරීන් සංකේතය හා වේදියකින් වට කරන ලද වෘක්ෂය ආදිය දැක්වෙන සටහන් ද ''එරාකන්‍ය'' හෝ ''එරකන'' යනුවෙන් සඳහන් වන පාඨය ද මේ කාසිවල දැක ගත හැකි වේ.

ඉන්දීය කාසි අතර අක්ෂර සහිතව පැරැණිතම දේශීය කාසිය හමු වී ඇත්තේ එරානයෙනි. එහි ''ධමපාලස'' යන්න අභිමුඛයේ වට පාඨයක් ලෙස දක්වේ. මෙම කාසිය ක්‍රි. පූ. තුන්වැනි ශතවර්ෂයට අයත් වූවක් හැටියටයි නාණක විශෙෂඥයන් විසින් සලකනු ලබන්නේ. ඉහත සඳහන් කරන ලද පරිදි, ඉන්දීය කාසි නිර්මාණ ශිල්ප ක්‍රමයේ විකාශනය පිළිබඳ කරුණු සෙවීමේ දී මෙම ''ධමපාලස'' යන පාඨය සහිත කාසියට හිමි වන්නේ ඉතා වැදගත් ස්ථානයකි.

**ඖදුම්බර**

පංජාබයේ වර්තමාන කාන්ග්‍රා හා කුනෙන් දිස්ත්‍රික්කවලට අයත් ප්‍රදේශයක විසූ ඖදුම්බර ගෝත්‍රික පාලකයන් විසින් නිකුත් කරන ලද කාසි අතර පැහැදිලි වර්ග තුනකට බෙදා වෙන් කළ හැකි කාසි දැනට හමු වී තිබේ. මේ වර්ගත්‍රය නම්:

(1) ගොත්‍ර නාමය සහිතව නිපදවන ලද හතරැස් හැඩයෙන් යුත් තඹ කාසි

(2) දුර්ලභ ගණයක් වන ඖදුම්බර රිදී කාසි හා

(3) තඹ හා බිලන් මිශ්‍ර ලෝහයෙන් නිමවන ලද කාසි යන ඒවායි. මේ අතර තුන් වැනිව දක්වන ලද වර්ගයට වැටෙන කාසි ද ඖදුම්බර කාසි සොයා ගන්නා ලද ප්‍රදේශවල ම තිබී හමු වී ඇතත්, ඒවා නියම වශයෙන් ම ඖදුම්බර කාසි වශයෙන් හැඳින්විය හැකි ද යන්න ගැන මත භේද පවතියි. මේ වර්ගත්‍රය අතරින් පැරැණි ම ඖදුම්බර කාසි වශයෙන් නම් කළ හැක්කේ ක්‍රි. පූ. 100 තරම සමයට වැටෙන (ඉහත ප්‍රථම වර්ගයට අයත් කොට දක්වන ලද) හතරැස් තඹ කාසි ය.

සාමාන්‍යයෙන් ඖදුම්බර පාලකයන්ගේ කාසිවල අභිමුඛයෙහි ඛරොෂ්ඨී පාඨයක් යෙදී ඇති අතර, ප්‍රතිමුඛයේ බ්‍රාහ්මී අක්ෂරයෙන් ලියැවුණු පාඨයක් වෙයි. මෙම පාඨවල ඇති පාලක නාම අතරින් ශිවදාස, රුද්‍රදස, මහාදේව හා ධරඝොෂ යන සිව් දෙනකුගේ නම් පැහැදිලිව හඳුනා ගන්නට පුළුවන.

ශිවදස නම් පාලකයාගේ නම සඳහන් හතරැස් තඹ කාසිවල අභිමුඛයෙහි වේදියකින් වට වී තිබෙන ගසක් ද (ඖදුම්බර ගෝත්‍රිකයන්ගේ කාසිවල දැක්වෙන රූප සටහනක් නිසා මෙයින් අදහස් කරන්නේ උදුම්බර වෘක්ෂයක් නිරූපණය කිරීම යැයි කනිංහැම් අදහස් කරයි), ඇතකු ගේ ඉදිරි පාර්ශ්වය ද පහළින් තරංග රේඛාවක් ද දක්වා තිබේ. ඛරොෂ්ඨී පාඨය ''මහදෙවස රඤ සිවදසස ඔදුම්බරිස'' යනුවෙන් කියැවිය හැක. මෙම කාසියෙහි ප්‍රතිමුඛයෙහි කණු පෙළක් මත පිහිටුවන ලද අර්ධ ගෝලාකාර පියස්සකින් ද යුත් දෙමහල් ගොඩනැඟිල්ලක ආකෘතියක් වේ. පසෙකින් පරශුව සහිතව ත්‍රිශූලායුධයෙකි. ප්‍රතිමුඛයේ රූප සටහනෙහි දැක්වෙන ගොඩනැගිල්ලේ ආකෘතිය බයිරාට්, ජුනාර් වැනි ස්ථානවල පිහිටි වෘත්තාකාර බිම් සැලැස්මෙන් යුත් චෛත්‍යගෘහවල (වටදාගෙවල) ආකෘති දක්වන හෙයින්, මෙම කාසි භාරතීය වාස්තු විද්‍යාව පිළිබඳව හැදෑරීමේ දී ද වැදගත් වෙයි (චිත්‍රය V, 5).

අවශෙෂ පාලකයන් විසින් නිකුත් කරන ලද හතරැස් තඹ කාසි ද අභිමුඛයේ හා ප්‍රතිමුඛයේ රූප සටහන්වලින් ඉහත විස්තර කරන ලද වර්ගයේ කාසිවලට ම සමාන වෙයි.

මහාදේව නම් පාලකයා විසින් නිකුත් කරන ලද වටකුරු රිදී කාසිවල අභිමුඛයෙහි වෘෂභ රූපයක් හා පද්මයක් ද, සමහර විටෙක නන්දිපද සංකේතය ද යෙදී තිබෙන බව පෙනේ. ඒවායේ ප්‍රතිමුඛයේ දක්නට ලැබෙන්නේ හස්ති රූපය හා ත්‍රිශූල සංකේතයයි.

සම් කඩක් වමතින් දරා සුරත ඔසවාගෙන සිටින ආකාරයෙන් නිරූපිත විශ්වාමිත්‍රගේ (පාඨයේ නම් කෙරෙනුයේ ''විශ්පමිත්‍ර'' යනුවෙනි) රූපයක් ධරඝෙන නම් ඖදුම්බර පාලකයා නිකුත් කළ රිදී කාසිවල අභිමුඛයෙහි දක්නට ලැබේ. මේවායේ ප්‍රතිමුඛයෙහි යෙදී ඇත්තේ ත්‍රිශූලය හා වේදිය සහිත වෘක්ෂය දක්වන රූප සටහන් ය. මේ කාසිවල අභිමුඛයේ දැක්වෙන්නේ විදේශීය (ඉන්දු-ග්‍රීක) පාලකයන් ඉන්දියාවේ දී භාවිතයට පත් කරන ලද කාසිවල යෙදෙන හර්කියුලස් නම් ග්‍රීක දේවතාවාගේ ප්‍රතිරූපය අනුකරණය කිරීමෙන් සකස් කර ගන්නා ලද ඉන්දීය විශ්වාමිත්‍ර ප්‍රතිරූපයකැයි ජේ. ඇලන් පවසයි.

මේ ප්‍රදේශයෙන් හමු වී ඇති, ඉහත දක්වන ලද ලක්ෂණ අඩංගු, ආර්යමිත්‍ර, මහිමිත්‍ර හා භානුමිත්‍ර යන නාමයන් යෙදුණු කාසි ද සොයා ගෙන තිබේ. මේවා ඒ නාමයන්ගෙන් යුත් ඖදුම්බර පාලකයන් විසින් නිකුත් කරන ලද කාසි බව අනුමාන වශයෙන් සලකන්නට පුළුවන.

**කෞශාම්බි**

වර්තමානයේ කෝසාම් නමින් හැඳින්වෙන පැරැණි කෝසම්බියෙන් වැදගත් යයි සැලැකිය හැකි ගොත්‍රික කාසි ගණනාවක් ඇලෙක්සැන්ඩර් කනිංහැම් ඇතුළු පුරාවිද්‍යාඥයන් කිහිප දෙනකු විසින් සොයාගෙන තිබේ. මේ කාසි පුරාණ වත්ස (වංස) රජදරුවන් හා සම්බන්ධතා දක්වන ඒවා බව පැහැදිලිය.

කෞශාම්බි කාසි සියල්ල ම ලෝකඩයෙන් නිම කරන ලද ඒවා ය. අයොධ්‍යාවේ හා ඖදුම්බර ගොත්‍රිකයන්ගේ කාසි මෙන් ම, මේ ප්‍රදේශයේ කාසි ද වාත්තු කළ හා මුද්‍රණය කළ යනුවෙන් දෙකොටසකට අයත් වේ. මේවායින් වාත්තු කර නිපදවන ලද කාසි අතරින් බොහො-මයක් ම පාඨ විරහිත ඒවා ය. මෙම පාඨ රහිත කාසිවල දක්නට ඇති යම් යම් රූප සටහන් අනුව ඒවා ප්‍රභේද කිහිපයකට අයත් වන බව පෙන්වා දිය හැක.

කෞශාම්බියේ කාසිවල අභිමුඛයේ සුලභ ලෙස දක්නට ලැබෙන රූප සටහන් නම් වෘෂභ රූපය. ඇත් රූපය, තිතක් වටා නන්දිපද හතරක් නිමැවෙන සේ සකසා ඇති රූප සටහන වැනි ඒවාය. මේ අතර එක් කාසි වර්ගයක අභිෂෙක - ලක්ෂ්මියගේ රූපය යෙදී තිබීම විශෙෂ වැදගත් කමකින් යුක්තය. ලංකාවේ කාසි අතර වූ, නියම වශයෙන් කාසි දැයි නිශ්චිත නිගමනයක් නැති, "ලක්ෂ්මී තහඩු" නමින් හඳුන්වනු ලැබෙන කාසි වර්ගයක ද මේ රූප සටහන යෙදී ඇත. අභිමුඛයේ මෙන් ම ප්‍රතිමුඛයේ රූප සටහන් අතර ද බොහොමයක් ම මීට පෙර හස් යෙදූ කාසිවල යෙදුණු ඒවා වේ. මෙම කාසිවල ප්‍රතිමුඛයේ දක්වෙන සටහන් අතර වේදියෙන් වට වූ වෘක්ෂය, පර්වතය, නන්දිපදය, චක්‍රය, උජ්ජයිනි සංකේතය හා ස්වස්තිකය වැනි රූප සුලභව හමු වෙයි.

වාත්තු කිරීමෙන් නිපදවන ලද කාසි අතර අකුරු හා පාඨ සහිත ඒවායේ "සුදෙවස', (සුදෙව) හා "බහසතිමිතස" (බ්‍රහස්පතිමිත්‍ර) යන නම් සඳහන් වෙයි. ඒවායේ යෙදෙන අකුරු විභාග කිරීමෙන් මෙම කාසි ක්‍රි. පූ. දෙවැනි හා තෙවැනි සියවස්වලට අයත් යැයි සැලැකීමට පුළුවන. "බහසතිමිත" ගේ කාසියෙහි අභිමුඛයෙහි අශ්ව රූපය, උජ්ජයිනි සංකේතය හා නන්දිපද සතර දක්වෙන සටහන ද, ප්‍රතිමුඛයේ සොඬ ඔසවා ගත් ඇතකු හා වේදිය සහිත වෘක්ෂය දක්වෙන රූප සටහන් ද උජ්ජයිනි සංකේතය ද යොද ඇත.

මුද්‍රිත කාසිවල අශ්වඝොෂ (අශ්වගොෂස), පර්වත (පවතස), බ්‍රහස්පතිමිත්‍ර (බහසතිමිතස) (මේ ඉහත දක්වුණු වාත්තු කළ කාසිවල නම් සඳහන් වන පාලකයා නොව අනෙකෙකි), අග්නිමිත්‍ර (අගිමිතස), ජ්‍යෙෂ්ඨ මිත්‍ර (ජෙඨමිතස), ධනදෙව (ධනදෙවස්‍ය) යන පාලකයන්ගේ නම් සඳහන් වී ඇත. මේවා අතර මුලින් දක්වූ නම් ඇති කාසි ක්‍රි. පූ. තුන්වන ශතකයේ සිට පළමුවන ශතකය දක්වා සමයට ද, ධනදේව යන නාමය සඳහන් වන කාසි ක්‍රිස්තු වර්ෂාරම්භයේ මුල් සියවස පමණට ද, අයත් වන බව නම් යෙදීම සඳහා භාවිත කර ඇති අක්ෂරයන්ගේ ලක්ෂණ අනුව නිගමනය කරන්නට පුළුවන. මේ කාසි හැමෙකක ම ද සාමාන්‍ය වශයෙන් යොද ඇත්තේ ඉහත විස්තර කරන ලද කාසිවල යෙදුණු රූප සටහන් හා සංකේත ම ය. නන්දිපදයක් සහිත ශිඛරයකින් යුත් පර්වතය (චෛත්‍යය) දක්වන රූප සටහන යෙදී තිබීම මේ කාසිවල විශෙෂ ලක්ෂණයක් ලෙස කිව හැක. මෙම කාසිවල යෙදෙන පර්වත සංකේතයෙහි වක්‍ර රේඛා පිහිටා ඇත්තේ වේදියක් මතයි. පර්වතය මුදුනේ ඡත්‍රයක් බඳු කෙටි හරස් රේඛාවක් ද ඊමත නන්දි පද සංකේතය ද යෙදී තිබේ. මේ සටහන වේදියකින් හා ඡත්‍රයකින් ද යුක්තව නිරූපණය වන හෙයින් කනිංහැම් සඳහන් කරන පරිදි, මෙය චෛත්‍ය සටහනක් ලෙස සලකන්නට පුළුවන. නන්දිපද සංකේතය ද කලක දී ත්‍රිරත්න සංකේතය වශයෙන් බෞද්ධ කලාවට අයත් රූප සටහනක් බවට පරිවර්තනය වූ බව අපි දනිමු. බ්‍රහස්පතිමිත්‍ර රජුගේ නම සඳහන් කාසියෙහි ප්‍රතිමුඛයෙහි දක්වෙන වේදිය සහිත වෘක්ෂය ද බොධි වෘක්ෂයක් බව එහි පත්‍ර දක්වා ඇති ආකාරය පිරික්සීමෙන් හඳුනා ගත හැක. මථුරාවේ කාසිවල මෙන් ම මේ වර්ගයේ ඇතැම් කාසිවලත් ලක්ෂ්මී දේවතාවියගේ රූපය යොද තිබෙනු පෙනේ.

### තක්ෂශිලා

වයඹ දිග ඉන්දියාවේ භාරෝ නදි නිම්නයෙහි පිහිටි පැරැණි තක්ෂශිලා නගරය ඉන්දියානු කාසිවල ඉතිහාසයෙහි ඉතා වැදගත් තැනක් උසුලයි. කනිංහැම් හා ජෝන් මාර්ෂල් විසින් මෙහි පවත්වන ලද පුරාවිද්‍යා කැණීම්වල දී පැරැණි ගොඩනැඟිලි හා අවශෙෂ පුරාවස්තූන් සමඟ පැරැණි කාසි ද දහස් ගණනින් සොයාගෙන ඇත. මෙසේ හමු වී තිබෙන කාසි අතර දක්නට ලැබෙන ගොත්‍රික කාසි ද සෑහෙන ප්‍රමාණයක් වෙයි. මේවා අක්ෂර සහිත හා රහිත යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකට වෙන් කරන්නට පුළුවන. අක්ෂර සහිත කාසි ඒවායේ සඳහන් වන:

(1) ''නෙගම''
(2) ''පඤ්චනෙකම''
(3) ''හිරඤසම''

යන පාඨ තුනක් අනුව වර්ග තුනකට වෙන් කළ හැක. මෙම පාඨවලින් අදහස් කරන ලද්දේ ඒ ඒ කාසි නිකුත් කළ ශ්‍රේණි හැඳින්වීමයි. අභිමුඛයේ මෙම ශ්‍රේණි නාම යෙදෙන කාසිවල ප්‍රතිමුඛයේ ද ''රලිමක අන්තරොතක දොජක'' බඳු පාඨ සඳහන් කෙරෙයි. මේවා නාගරික කොට්ඨාස හැඳින්වීම සඳහා යොදන ලද නාමයන් යැයි ඇලන් අදහස් කරයි.

තක්ෂශිලා කාසි ද අනික් ගෝත්‍රික කාසි බොහොමයක් මෙන් ම තඹයෙන් නිපදවූ ඒවා ය. චන්ද්‍රවංකය සහිත පර්වතය, වෙදිය සහිත වෘක්ෂය, ස්වස්තිකය, නන්දිපදය යන හස් යෙදූ කාසිවල සුලභව දක්නට ලැබෙන රූප සටහන් හා ලක්ෂ්මී දේවතාවිය දක්වෙන ප්‍රතිරූපය මේ කාසිවල අභිමුඛයේ හා ප්‍රතිමුඛයේ අවිශෙෂයෙන් යොද තිබෙනු දක්නට ලැබෙයි. මෙසේ ගෝත්‍රික කාසිවල යෙදෙන පොදු රූප සටහන් සුලභව යෙදෙන නමුදු, තක්ෂශිලා කාසි විශෙෂයෙන් වෙන් කර හඳුනා ගැනීම සඳහා උපකාරී වන ලක්ෂණ ද මේ කාසිවල අඩංගු වෙයි.

නාණක විශෙෂඥයන් විසින් අධ්‍යයන පහසුව තකා තක්ෂශිලා කාසි ප්‍රභේද රාශියකට වෙන් කොට දක්වනු ලැබෙතත්, සංකේත හා වර්ග විසින් මේ ප්‍රභේදයන් අතර සැලැකිය යුතු සමරූපිතා දක්නට ලබෙයි. මේ අනුව, ඒවා උජ්ජයිනි ආදී අනෙක් ගෝත්‍රික කාසිවලින් වෙන් කොට හඳුනා ගත හැකි වේ. තක්ෂශිලා කාසි ක්‍රි. පූ. දෙවැනි ශතකය හා ක්‍රි. ව. දෙවැනි ශතකය අතර කාල පරිච්ඡේදයට අයත් වේ.

**පඤ්චාල**

හිමාලය පර්වත ප්‍රාන්තයේ සිට චම්බාල් නදී නිම්නය දක්වා වූ විශාල ප්‍රදේශය පුරාතන පඤ්චාල දේශයට අයත් විය. මේ රාජ්‍යය උත්තර පඤ්චාලය හා දක්ෂිණ පඤ්චාලය යනුවෙන් කොටස් දෙකකට බෙදී තිබිණි. උතුරු පඤ්චාලය අහිච්ඡත්‍ර නුවර රාජධානිය කොට ඇතිව පාලනය වූ අතර, දක්ෂිණ පඤ්චාල දේශයේ අගනුවර වූයේ කාම්පිල්‍ය නුවරයි. කනිංහැම් විසින් මුල දී සොයා ගනු ලැබූ කාසි සියල්ලක් ම පාහේ අහිච්ඡත්‍ර, අම්හිල හා බදඕන් යන ස්ථාන වලින් ලැබුණු ඒවා වූ හෙයින්, ඒ කාසි උත්තර පඤ්චාලයට අයත් ඒවා විය. මෙම කාසි මෞර්යයන්ගෙන් පසු උතුරු ඉන්දියාවේ බලය ලබා ගත් සුංග රජවරුන් විසින් නිකුත් කරන ලද ඒවා යැයි මුල දී අදහස් කරන ලද නමුදු, ඒවා පැරණි උතුරු පඤ්චාල රාජ්‍යයට අයත් වූ ප්‍රදේශයන්ගෙන් ඔබ්බට නොයැවෙන හෙයින්, ඒ ප්‍රදේශයේ විසූ කිසියම් ගෝත්‍රික පිරිසක් විසින් නිකුත් කරන ලද කාසි විශෙෂයක් ලෙස ගිණිය හැකි බව කනිංහැම් අදහස් කළේ ය.

පඤ්චාල කාසි යනුවෙන් හඳුන්වනු ලැබෙන මේ සියල්ලක් ම තඹයෙන් නිම කරන ලද ඒවා වේ. ''මිත්‍ර'' යන පදයෙන් කෙළවර වන නම් සහිත පාලකයන් රාශියක් ගැන මේ කාසිවල නාම මාත්‍ර වශයෙන් සඳහන් වෙයි. අග්නිමිත්‍ර (අග්නිමිත්‍රස), භානුමිත්‍ර (භානුමිත්‍රස), භූමිමිත්‍ර (භූමිමිත්‍රස) ආදී වශයෙනි. මෙම නම් සඳහන් වන පාඨ සමඟ එකට යෙදී ඇති සටහන් තුනක් වේ. ප්‍රතිමුඛයෙහි වැඩි වශයෙන් දක්නට ලැබෙනුයේ දේවතාවකුගේ හෝ දේවතාවියකගේ රූපයකි. මෙය සමඟ වේදියක් මත පිහිටුවා ඇති තිශූලය, වෘෂභයා, සූර්යයා ආදී වස්තූන් දක්වෙන රූප සටහන් ද යෙදෙයි. වමත ඉහටිය මත තබාගෙන දකුණත ඔසවා ගෙන සිටින ආකාරයෙන් නිරූපණය කොට තිබෙන දේවතාරූපය අග්නි දෙවියා වශයෙන් හඳුන්වා ඇත. පියුමක් මත සිටින ආකාරයෙන් දක්වා ඇත්තේ ලක්ෂ්මී දේවතාවිය ලෙස සැලැකිය හැක. භූමිමිත්‍රගේ කාසියක දක්වෙන පුරුෂ රූපයෙහි හිසට පිටුපසින් නයි පෙණ කිහිපයක් දක්වා තිබේ. ඉන් එම රූපය නාග රාජයකු දක්වීම සඳහා යොද ගන්නා ලද්දකැයි පෙනී යයි. ''ධ්‍රැවමිත්‍ර'' නම සඳහන් වන කාසියක ත්‍රිශූලයක් දරා සිටින සේ දක්වා ඇති රූපය ශිව දෙවියා ලෙස සිතිය හැක. ''ධ්‍රැව'' යන නාමය ද ශිව දෙවියා සඳහා යෙදෙන අපර නාමයකි. මෙසේ ම විෂ්ණුමිත්‍ර රජුගේ කාසියක දක්නට ලැබෙන චක්‍රධාරී රූපය විෂ්ණු දෙවියන් දක්වීමක් ලෙස සැලැකිය හැක. මෙසේ පඤ්චාල කාසිවල දක්නට ලැබෙන රූප සටහන් ප්‍රතිමා ලක්ෂණ විද්‍යාව පිළිබඳව කිසියම් වැදගත් කමක් දරයි.

වැලිගම
මහජන පුස්තකාලය.



## මථුරා

උතුරු ඉන්දියාවේ කාසි නිකුත් කරන ලද ස්ථාන අතරින් ඉතාම බහුලවශයෙන් ඒ කාර්‍ය්‍යය කළ ස්ථානයකි මථුරාව. මේ කාසි ක්‍රිස්තු පූර්ව දෙවැනි හා පළමුවැනි ශතවර්ෂවල හින්දු රාජ වංශිකයන් විසින් නිපදවා නිකුත් කරන ලද කාසි හා ඔවුන්ගේ අනන්තරාගමිකයන් වූ ශක ක්ෂත්‍රපයන් විසින් මුද්‍රණය කරන ලද කාසි යනුවෙන් වර්ග දෙකක් ලෙස පෙන්වා දිය හැක. (මින් ක්ෂත්‍රප පාලකයන් නිකුත් කළ කාසි ගැන ඒ පිළිබඳ පරිච්ඡේදයේ සාකච්ඡා කෙරේ.) මේ දෙවර්ගයෙන් මුල් වර්ගයයි, ගෝත්‍රික කාසි ලෙස සැලැකිය හැක්කේ. මේ වර්ගයට වැටෙන කාසි විවිධ වුව ද, ඒවා එකිනෙක අතර දක්නට ලැබෙන සමානතා බොහෝ ය. මේවායේ අභිමුඛයෙහි ඔසවා ගත් අතකින් පියුමක් දරා සිටින ලක්ෂ්මී දේවතා පිළිරුවක් ද, ප්‍රතිමුඛයෙහි ඉදිරියට මුහුණ ලා ගෙන ඇතුන් තිදෙනකු හා ඔවුන් සමඟ සිටුනා ඇතරුවකු දක්වෙන රූපයක් ද යෙදී තිබේ. ක්‍රිස්තු පූර්ව තුන්වන හා පළමුවන ශතවර්ෂ අතර සමයට අයත් වන මෙම කාසිවල ඒවා නිකුත් කළ පාලකයන් විශාල සංඛ්‍යාවකගේ නම් දක්වෙයි. මේ අතරින් ගොමිත්‍ර, බ්‍රහ්මමිත්‍ර, දෘඪමිත්‍ර, සූර්‍ය්‍යමිත්‍ර, හා විෂ්ණුමිත්‍ර යනාදි පාලකයන් එක් පාලක පරපුරකට ද, රාමදත්ත, කාමදත්ත, ශෙෂදත්ත, භාවදත්ත, උත්තමදත්ත ආදීන් තවත් පෙළපතකට ද අයත් වූවන් ලෙස ගිණිය හැකි වේ.

## මාලව

මහා ඇලෙක්සැන්ඩර් රජුගේ ආක්‍රමණ සමයෙහි, එනම් ක්‍රි. පූ. 4 වන ශතකයෙහි මාලව ගෝත්‍රිකයන් පංජාබයේ රාවි – චෙනාබ් ගංගා සන්ධියට ඉහළින් ප්‍රදේශයේ විසූ බව කියැවේ. නාණක විද්‍යාමය මූලාශ්‍රයන්ගෙන් ලැබෙන සාධක අනුව, ක්‍රි. ව. දෙවන හා සිවුවන ශතවර්ෂ අතරතුර කාලයේ මොවුන් නැගෙනහිර රාජපුතානාවේ සීමිත ප්‍රදේශයක බලයට පත් ව සිටි බව පැහැදිලි ලෙස පෙනේ. මාලව ගෝත්‍රිකයන්ගේ කාසිවල ඔවුන් විසින් යොද තිබෙන පාඨයන් ආර්ජුනායන හා යෞධෙය ගෝත්‍රිකයන්ගේ කාසි පාඨයනට බෙහෙවින් සමාන හෙයින්, මෙකී පිරිස් තුන අසල්වාසීන් වන්නට ඇතැයි කල්පනා කරනු ලැබේ. මුල් කාලයේ දී පංජාබයේ විසූ මාලවයන් ක්‍රි. පූ. දෙවන ශතවර්ෂයේ දී පමණ ග්‍රීක හා කුෂාණ ආක්‍රමණවලට පෙරාතුරව දකුණු ප්‍රදේශයට සංක්‍රමණය වන්නට ඇතැයි ජේ. ඇලන් අදහස් කරයි.

මාලවයන්ගේ කාසි ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා දක්විය හැක:

(1) ''මාලවානම් ජය'' යන පාඨය සහිත කාසි හා

(2) පාලක නාම දක්වන පාඨ සහිත කාසි යනුවෙනි.

මෙයින් ප්‍රථම වර්ගයට අයත් කාසි බොහෝ දුරට ආර්ජුනායන හා යෞධෙය ගෝත්‍රික කාසිවලට සමාන වේ. ඒවායේ අභිමුඛයේ වේදිය සහිත වෘක්ෂ සටහන ද ''මලවන ජය'' වැනි ප්‍රාකෘත පාඨයක් ද යෙදී ඇත. ප්‍රතිමුඛයේ දක්නට ලැබෙන්නේ වෘෂභ රූපයකි. මේ කාසි නිපදවන ලද කාලය වශයෙන් සාමාන්‍යයෙන් ගිණිය හැක්කේ ක්‍රි. ව. දෙවැනි හා සිවු වැනි ශතවර්ෂ අතර කාල පරිච්ඡේදයයි.

දෙවැනි වර්ගයට අයත් වන කාසිවල ද වෘක්ෂයේ හා වෘෂභයාගේ රූප සටහන් පළමු වර්ගයේ මෙන් ම අභිමුඛයේ හා ප්‍රතිමුඛයේ පිළිවෙළින් යෙදී තිබේ. මේවායේ වෙනස දක්නට ලැබෙන්නේ කාසි පාඨය යෙදීමේ දී පමණකි. මේ වර්ගයට වැටෙන කාසිවල ''මජුප'', ''මසොජය'' ''මපය'' ''මපක'' ''මරජ'' ''ගජව'' ''ජමුක'' යනාදි පද යෙදී තිබෙනු දක්නට ලැබේ. මේ පාඨවලින් අදහස් කෙරෙන අර්ථය කුමක් ද යන්න ගැන නිශ්චිත තීරණයක් ගැනීම දුෂ්කර ය. ඒවා විදේශීය පාලකයන් පෙළකගේ නාම බව වින්සන්ට් ස්මිත් අදහස් කරතත්, ඒ කවර වර්ගයකට අයත් පාලක පිරිසක් ද යන්න පැහැදිලිව පළ වී නැත. මේ පාඨ බොහොමයක් ''ම'' කාරයෙන් ආරම්භ වන හෙයින් එය ''මහරජ'' යන්න කෙටියෙන් දැක්වීම සඳහා යෙදුණකැයි ඒ. පී. ජයස්වාල් කල්පනා කරයි. ජෝන් ඇලන්ගේ අදහස වන්නේ ''මාලවානම් ජයඃ'' යන පාඨය කෙටියෙන් දැක්වීම සඳහා ඒ පාඨයේ කොටස් අර්ථ විරහිතව වෙන් වෙන් ව දැක්වීමක් මින් කරන ලද බවයි.

**යෞධෙය**

මෞර්‍ය්‍යයන්ගේ වැටීමේ පටන් ගුප්ත යුගය දක්වා දීර්ඝ කාල සීමාවක් තුළ ස්වකීය බලය රඳවාගෙන සිටි යෞධෙය ගෝත්‍රිකයන්ගේ කාසි අවදි තුනකට බෙදා හඳාරනු ලැබෙයි. මේ අවදි තුන නම්:

(1) සුංග යුගයේ සිට කුෂාණයන්ගේ ආගමනය තෙක් යෞධෙය ගෝත්‍රිකයන් විසින් තමන්ගේ ම ස්වෛරී පාලනයක් කරගෙන ගිය ක්‍රි. පූ. දෙවන හා පළමුවන ශතක අතර කාලය.

(2) දෙවැනි ශතවර්ෂය තුළ රුද්‍රදමන් සමඟ ද කුෂාණයන් සමඟ ද යුද පැවැති කාලය හා

(3) කුෂාණයන් අබිබවාලීමෙන් පසු ගුප්ත යුගය දක්වා තුන්වැනි හතරවැනි සියවස්වලට අයත් කාලයයි.

මින් ප්‍රථම කාල පරිච්ඡේදයට අයත් කාසි නිර්මාණය හා සැකැස්ම අතින් ගෝත්‍රික ලක්ෂණ පිළිබිඹු කරයි. දෙවැනි අවදියට අයත් කොට ගිණිය හැකි කාසි එතරම් උසස් නිර්මාණයක් ලෙස සැලැකිය හැකි තත්ත්වයක් නොදරන, දුර්වල ශිල්පී ක්‍රමයක නිපැදවීම් බඳු ය. මීට හේතුව වන්නට ඇත්තේ මෙකල මෙම ගෝත්‍රිකයන් සතුරු උවදුරුවලට මැදි වී පීඩාවට පත් ව සිටීම යැයි සිතිය හැක. එහෙත් අවසාන යුගයට අයත් කාසි කුෂාණයන් ගේ කාසි නිර්මාණ ශිල්ප ක්‍රමයෙහි ආභාසයෙන් ඉතා උසස් තත්ත්වයකට පත් විය. මෙකලට අයත් කාසිවල දක්නට ලැබෙන ''යෞධෙයානස්‍ය ජය'' යන පාඨයෙන් ද, සමකාලීන මැටි මුද්‍රාවල යෙදෙන ''යෞධෙයානාම් ජයමන්ත්‍රධරානාම්'' යන පාඨයෙන් ද, මෙකල ඔවුන් ලබා තුබුණු විජයග්‍රහණයක් ස්මරණය කෙරෙන බැව් සලකා ගත හැක. මේ කාසි හා මුද්‍රා ගැන අදහසක් පළ කරන අල්ටෙකාර් මේවා නිපදවන ලද්දේ යෞධෙය ගෝත්‍රිකයන් කුෂාණයන් අබිබවා ලත් ජයග්‍රහණය සමරනු පිණිස යැයි පවසයි. දෙවැනි හා සිව්වැනි ශතවර්ෂ අතර කාලයට අයත් කාසිවල දේව සේනාපති (ස්කන්ද) කාර්තිකෙය දෙවියන් දක්වන රූපසටහන් යොදා තිබීම ද මේ අතින් ඉතා වැදගත් වේ.

යෞධෙය ගෝත්‍රිකයන්ගේ කාසි පොටින් (මිශ්‍ර ලෝහ), තඹ හා රිදී යන ලෝහ වර්ගවලින් නිමවා තිබේ. මොවුහු ද අනෙක් කාසි නිකුත් කළ ගෝත්‍රික පිරිස් මෙන් ම, රන් කාසි නිකුත් නොකළහ. ජෝන් ඇලන් යෞධෙය කාසි වර්ග හයකට බෙදා දක්වයි:

**1 වර්ගය:**

පොටින් මිශ්‍ර ලෝහයෙන් නිම කරන ලද මෙම වර්ගයට අයත් කාසි වටකුරු හැඩයෙන් යුක්ත ය. ඒවායේ අභිමුඛයෙහි වේදිය සහිත වෘක්ෂය, එරාන් සංකේතය, හා සෞර සංකේතය දක්නට ලැබෙයි. මේ සලකුණු බොහෝ දුරට හස් යෙදූ කාසිවල යෙදෙන ඒවා ම බව පැහැදිලි ය. මේ කාසි අතර සමහරෙක අභිමුඛයේ ''මහාරාජස'' යන පාඨයක් ද දක්නට ලැබේ. ප්‍රතිමුඛය බොහෝ දුරට සලකුණුවලින් තොර ය.

**2 වර්ගය:**

මේ වර්ගයට අයත් වන කාසි ද පොටින් ලෝහයෙන් ම නිමවා තිබේ. අභිමුඛයේ දැක්වෙන රූප සටහන්වලින් වේදියකින් වට වූ කණුවක් (යූප ස්තම්භයක් ?) හා වෘෂභයෙක් දැක්වෙයි. ප්‍රතිමුඛයේ නන්දිපද සංකේතයක් හා හස්තිරූපයක් යෙදී ඇත. කාසියේ අභිමුඛයේ පාඨ දෙකක් දක්නට ලැබෙතත්, හඳුනා ගත හැකි තරම් පැහැදිලි තත්ත්වයක ඇත්තේ ඉන් එකක් පමණි. සත්ත්වරූපයට ඉහළින් දක්නට ලැබෙන මෙම පාඨයේ ''යෞධෙයානාම්'' යන පදය සඳහන් වෙයි. නො පැහැදිලි, කියවා ගෙන නොහැකි පාඨය යෙදී ඇත්තේ ඊට පහළිනි.

### 3 වර්ගය:

මේ වර්ගයෙහි රිදී හා තඹ යන ලෝහ වර්ග දෙකින් ම තනන ලද කාසි ඇතුළත් වේ. රිදී කාසිවල අභිමුඛයෙහි ෂණ්මුඛ කාර්තිකෙය සුරතින් හෙල්ලක් දරා සිටින ආකාරයෙන් දක්වා ඇත. එහි ''භාගවත සවාමිනො බ්‍රහමණ්‍ය යෞධෙය'' යනුවෙන් යෙදෙන වට පාඨයක් ද දක්නට ලැබෙයි. ප්‍රතිමුඛයේ දේවතාවියක පියුමක් මත සිටින අයුරු දක්වෙන රූපයක් වේ. ප්‍රතිමුඛයෙහි ම දේවතාවියගේ රුව හැරුණ විට පර්වතය (චෛත්‍යය) දක්වෙන සටහන ඊ මත නන්දිපද සංකේතයෙන් යුක්තව ද, වේදියකින් වට වූ කොඩිගසක් වැනි වෘක්ෂ සටහනක් ද යෙදී තිබේ. මේ රූප සියල්ලට පහළින් කාසියෙහි පහළ කෙළවරට මදක් ඉහළින් තරංග රේඛාවකි. යෞධෙය ගොත්‍රිකයන් බ්‍රාහ්මණ්‍ය (කාර්තිකෙය) දේව භක්තිකයන් වූ බවට මේ වර්ගයට අයත් කාසිවල අභිමුඛයේ රූප සටහන හා වට පාඨය සාධක වේ (චිත්‍රය V, 6).

මෙම වර්ගයට අයත් වන තඹ කාසිවල ද අභිමුඛයෙහි ෂණ්මුඛ කාර්තිකෙය රූපය රිදී කාසිවල දක්වා තිබෙන ආකාරයෙන් ම දක්වෙයි. මේවායේ යෙදෙන වට පාඨය ''භාගවත සවාමිනො බ්‍රහ්මණ්‍ය දෙවස්‍ය කුමාරස්‍ය'' යන්නයි. ප්‍රතිමුඛයේ රූප සටහන් ආදිය ද ඉහත විස්තර කරන ලද රිදී කාසිවල ප්‍රතිමුඛයේ රූප සටහන්වලට සමාන වෙතත්, තඹ කාසියේ දේවතාවියගේ හිස වටා ප්‍රභා මාලාව ද දක්වී තිබේ.

මෙම වර්ගයට වැටෙන කාසි අතර ඒවායේ රූප සටහන් ආදිය පිළිබඳ සුළු වෙනස්කම් නිසා හඳුනා ගත හැකිවන ප්‍රභේදයෝ ද දක්නට ලැබෙති. සමහර කාසියක අභිමුඛයෙහි දක්වෙන කාර්තිකෙය රූපය එක් හිසකින් පමණක් යුක්ත වූවකි. තවත් සමහර කාසිවල අභිමුඛයේ දකුණත ඔසවා සිටින දේවතාවියකගේ රුව ද ප්‍රතිමුඛයේ ෂණ්මුඛ කාර්තිකෙය රූපය ද යෙදී තිබෙනු හමු වෙයි. තවත් ප්‍රභේදයකට අයත් වන කාසිවල ප්‍රතිමුඛයේ සාමාන්‍යයෙන් අන් (මේ වර්ගයට අයත්) කාසිවල දක්නට ලැබෙන දේවතාවියකගේ රූපය වෙනුවට, මුවකුගේ රූපයක් යොද තිබෙනු පෙනේ. තවත් ප්‍රභේදයකට වැටෙන කාසිවල අභිමුඛයේ කාර්තිකෙය රුව වෙනුවට ත්‍රිශූලායුධය අතින් ගත් ශිව දෙවියාත් ප්‍රතිමුඛයෙහි මුව රුවත් යොද ඇත.

### 4 වර්ගය:

මේ තඹයෙන් නිම කළ කාසි වර්ගයකි. අභිමුඛයෙහි ශිඛර ත්‍රයකින් යුත් පර්වතය (චෛත්‍යය) මත චන්ද්‍රවංකයේ සලකුණ හා සර්පයකුගේ රූප සටහනක් ද දක්වා තිබෙන අයුරු පෙනේ. ප්‍රතිමුඛයේ ත්‍රිශූලයක් හා රාජ යෂ්ටියක් දක්නට ලැබෙයි.

### 5 වර්ගය:

මෙය ද සිවුවැනිව විස්තර කළ වර්ගය මෙන් ම, තඹයෙන් නිපදවන ලද කාසි අඩංගු වන වර්ගයකි. අභිමුඛයේ යොද ඇත්තේ දකුණතින් දරා ගත් දිගු හෙල්ලක් සහිතව කාර්තිකෙය දෙවියන් දක්වෙන රූපයකි. ප්‍රතිමුඛයේ දේවතාවියක දකුණත ඔසවා වමත ඉහටිය මත තබා ඇවිදීමේ යෙදී සිටිනා අයුරු දක්වෙයි. ඇතැම් විට පූර්ණ ඝටයක් ද වේ.

### 6 වර්ගය:

මේ වර්ගයට අයත් කාසි නිර්මාණය අතින් උසස් ය. ඒවායේ ශෛලිය කුෂාණයන්ගේ කාසි නිෂ්පාදන ශෛලියේ ලක්ෂණ පිළිබිඹු කරයි.

# 8. ආන්ධ්‍ර කාසි

විදේශීය පාලක පෙළපත්වලට අයත් වූවන්ගේ කාසිවලින් පසු ඒවායේ බලපෑම් ලබා තමන්ගේ කාසි නිකුත් කළ දේශීය පාලක කොටස් කීපයක් ගැන පසුගිය පරිච්ඡේදයේ විස්තර විය. ගෝත්‍රික කාසි නිකුත් කළ පාලකයෝ කෙටි කාල සීමාවන් තුළ වඩා විශාල නොවූ ප්‍රදේශවල පාලන බලය ලබා සිටියෝ වූහ. දීර්ඝ කාලීනව විශාල ප්‍රදේශයක පාලන බලය හිමි කරගෙන සිටි දේශීය පාලක පෙළපත් අතුරෙන්, ප්‍රථම වරට තමන්ගේ ම කාසි ක්‍රමයක් පවත්වා ගත් පාලකයන් ලෙස ඉන්දීය කාසි පිළිබඳ ඉතිහාසයේ ආන්ධ්‍ර වංශිකයනට වැදගත් තැනක් හිමි වේ.

පුරාණ ග්‍රන්ථවල ''ආන්ධ්‍රභෘත්‍ය'' නමින් හඳුන්වනු ලැබෙන පාලක පෙළපතේ රාජධානිය වූයේ කෘෂ්ණ හා ගොදවරී නදීන් අතර ප්‍රදේශය ලෙස සලකනු ලැබේ. අශෝක ශිලාලෙඛනවල සඳහන් කෙරෙන පරිදි, ආන්ධ්‍ර දේශය මෞර්‍ය අධිරාජ්‍යයේ බලය පිළිගත් නමුත්, එය මෞර්‍ය පාලකයන්ගේ යටත් විජිතයක් නොවීය. මෞර්‍ය අධිරාජ්‍යයේ බිඳ වැටීමෙන් පසු ආන්ධ්‍ර රාජ්‍යයේ බලය ඉක්මනින් වර්ධනය විය. මොවුන් හා කාලිංග වංශිකයන් අතර කිසියම් සම්බන්ධතාවක් පැවැති බව ඛාරවේල නම් කාලිංග රජුගේ හාථිගුම්ඵා ශිලාලේඛනයේ සඳහන් වන කරුණුවලින් පැහැදිලි වෙයි. ක්‍රමයෙන් ආන්ධ්‍රයන්ගේ බලය වැඩෙමින් ඔවුන්ගේ රාජ්‍යය උතුරටත් දකුණටත් බටහිරටත් විහිදෙමින් විශාල ප්‍රදේශයක ව්‍යාප්ත වූ බව පෙනේ. සාමාන්‍ය වශයෙන් දක්ෂිණාපථය වෙන් කෙරෙන සීමාව ලෙස සැලැකෙන නර්මදා නදියට උතුරින් පිහිටි සුරාෂ්ට්‍ර, අපරාන්තික, අවන්ති ආදි ප්‍රදේශයන් ද ආන්ධ්‍රයන්ගේ ආධිපත්‍යය යටතට පත් වූ හෙයින්, උතුරු ඉන්දීය කාසි සමඟ ආන්ධ්‍ර කාසි ද හැදෑරීම සාමාන්‍යයෙන් නාණක විද්‍යාඥයන් අනුගමනය කරන සිරිතයි. පැරණි උතුරු ඉන්දීය කාසිවල දක්නට ලැබෙන ලක්ෂණ පැහැදිලි වශයෙන්ම ආන්ධ්‍ර කාසිවල ද දක්නට ලැබීම මෙසේ කරනු ලැබීමට තවත් හේතුවක් ලෙස දැක්විය හැක.

අප විසින් ආන්ධ්‍ර කාසි යනුවෙන් මෙහි දී විස්තර කැරෙන මෙම කාසිවල එන පාලකයන්ගේ නම් පුරාණ ග්‍රන්ථයන්හි ආන්ධ්‍රභෘත්‍යයන් පිළිබඳ නාම ලේඛන සකස් කළවුන් දක්වා ඇති පාලකයන්ගේ නම් හා බොහෝ දුරට සැසැඳෙන බව ඊ. ජේ. රැප්සන් පෙන්වා දී ඇත. වාසිෂ්ඨී පුත්‍ර ශ්‍රී පුළුමාවි, වාසිෂ්ඨී පුත්‍ර ශිව ශ්‍රී ශාතකර්ණි, වාසිෂ්ඨී පුත්‍ර ශ්‍රී චන්ද සාති, ගෞතමී පුත්‍ර ශ්‍රී යඥ ශාතකර්ණි, ශ්‍රී රුද්‍ර (ශාතකර්ණි) යන නාමයන් සඳහන් තඹ කාසි ද, ශ්‍රී කෘෂ්ණ ශාතකර්ණි නම සඳහන් පොටීන් (මිශ්‍ර ලෝහ) කාසි ද, ගෞතමීපුත්‍ර ශ්‍රී යඥ ශාතකර්ණි නාමය සඳහන් රිදී කාසි ද, ආන්ධ්‍ර පාලකයන්ගේ කාසි අතර ඉතා වැදගත් ඒවා වේ. වාසිෂ්ඨී පුත්‍ර විලිවයකුර, මාඨරිපුත්‍ර ශිවලිකුර හා ගෞතමීපුත්‍ර විලිවයකුර යන නම් සඳහන් වන තඹ කාසි ද රැප්සන් විසින් ආන්ධ්‍ර වංශයට අයත් ලෙස සලකතත්, මේ නම් දැරූ රජුන් ප්‍රාදේශීය පාලක පරපුරකට අයත් වෙනත් රජුන් පෙළක් විය හැකි බව ඩී. ආර්. භාණ්ඩර්කර් අදහස් කරයි. පසු අවස්ථාවල දී සොයා ගන්නට පුළුවන් වූ කාසි සමහරක සිවසිරි, ආපිලක හා විජය යන නම් සඳහන් වී ඇත. ආන්ධ්‍ර වංශයේ පාලකයන්ගේ නාමලෙඛන දැක්වීමේ දී පුරාණ ග්‍රන්ථවල මොවුන්ගේ නම් ද දක්වා තිබේ. මෙම වංශයට අයත් ශ්‍රේෂ්ඨතම රාජ්‍ය පාලකයකු වූ ගෞතමී පුත්‍ර ශාතකර්ණිගේ නම සඳහන් වී ඇත්තේ නහපාන නම් ශක පාලකයාගේ රිදී කාසි නැවැත තමන්ගේ නමින් ශාතකර්ණි විසින් මුද්‍රණය කරන ලද කාසිවල පමණි. පොටීන් කාසි රාශියක මීට පෙර දැන සිටි ආන්ධ්‍ර

කාසිවල හමු නොවූ සාතවාහන රජුන් කිහිප දෙනකුගේ ම නම් සඳහන් වේ. ඒ පාලකයෝ නම් ''කුම්භශාතකර්ණී'', ''කර්ණ ශාතකර්ණී'', ''සක ශාතකර්ණී'' යනාදිහු ය. ''රඤො සිරි සාදවාහ (නස)'' යනුවෙන් පාඨයක් යෙදී ඇති තඹකාසියක් ද මෙහි ලා ඉතා වැදගත් වේ. මෙම කාසිය ක්‍රි. පූ. තෙවන සියවසට අයත් වූවකැයි ද, එහි නම සඳහන් පාලකයා සාතවාහන (හෙවත් ආන්ධ්‍ර) වංශයේ ආරම්භකයා ලෙස ද, සලකනු ලැබේ.

ආන්ධ්‍ර පාලකයන් විසින් නිකුත් කරන ලද කාසි අතරින් වැඩි හරියක් ඊයම් හා මිශ්‍ර ලෝහ (පොටින්) වලින් තනා ඇති ඒවා ය. මේ හැරුණු විට මොවුන් විසින් භාවිතයට පත් කරන ලද රිදියෙන් කළ කාසි ද සුරාෂ්ට්‍ර ප්‍රදේශයෙන් සොයාගෙන තිබේ. මෙම රිදී කාසි නිකුත් කරන ලද්දේ ''ගෞතමී පුත්‍ර ශ්‍රී යඥ ශාතකර්ණී'' රජු විසින් බව සලකනු ලැබේ. සාමාන්‍යයෙන් බාහිර හැඩය අතින් ආන්ධ්‍ර කාසි වටකුරු වුව ද, හතරැස් පොටින් කාසි කිහිපයක් ද හමු වී තිබේ.

මෙම කාසිවලට භාවිත වූ නම් හා බර ප්‍රමාණයන් ගැන නියත වශයෙන් දැන ගැනීම අසීරු ය. කාන්හේරි, නානාඝාට් වැනි අභිලේඛනයන්හි සඳහන් වන පරිදි, මෙම කාසි ද සාමාන්‍යයෙන් ''කාෂාපණ'' නමින් හැඳින්වෙන්නට ඇතැයි විශ්වාස කරනු ලැබේ. එසේ වුව ද, ඒ ලිපිවල ''කාෂාපණ'' යන නාමය භාවිත වූයේ රිදී කාසිවලට පමණක් බව රැප්සන්ගේ මතය විය. මේ ගැන වැඩි දුරටත් පරීක්ෂණ පැවැත්වූ ජේ. ඇන්. බැනර්ජි සාතවාහනයන්ගේ යයි නිශ්චිතව කිව හැකි රිදී කාසි ඇත්තේ ඉතා අල්ප සංඛ්‍යාවක් පමණක් බවත්, එහෙයින් ''කාර්ෂාපණ'' යන්න ආන්ධ්‍ර කාසිවලට පොදුවේ ව්‍යවහාර වූ නාමයක් බවත්, පෙන්වා දීමට තැත් කරයි. ඔහුගේ අදහස අනුව ඇතැම් වාර්තාවල සඳහන් වන ''සීස කහාපණ'' යන්න ද ආන්ධ්‍ර කාසි සඳහා භාවිත වන්නට ඇතැයි සිතිය හැක.

ආන්ධ්‍ර පාලකයන්ගේ කාසිවල යොදා තිබෙන සංකේත අතරින් බොහොමයක් හස් යෙදූ කාසිවල දක්නට ලැබෙන කාසි සලකුණු හා සංකේතයන් ම බව පැහැදිලි වේ. මේවා අතර කඳු (චෛත්‍යය), වේදිය සහිත වෘක්ෂය, දුන්න හා ඊතලය, ස්වස්තිකය, නන්දිපද, ඇතා, අශ්වයා, සූර්යයා, සිංහයා යන රූපසටහන් ද, උජ්ජයිනි සංකේතය ද බහුල ලෙස යෙදේ. මේ කාසිවල යෙදෙන පර්වතය දක්වන රූප සටහන කිහිප ආකාරයකින් සකසා ගෙන යොද ඇති බව පෙනේ. ශිඛර 2, 3, 6 හා 10 යන ගණන්වලින් යුත් විවිධ ප්‍රමාණවල කඳු දැක්වෙන රූප සටහන් මේ කාසි පිරික්සන විට හමු වෙයි. පර්වතය මුදුනේ සමහර විටෙක චන්ද්‍රවංකයක් ඇති අතර, ඇතැම් විට ඒ වෙනුවට ස්වස්තිකයක් දක්නට ලැබේ. සාමාන්‍යයෙන් පර්වතය දක්වන චක්‍ර අතර පහළම පෙළේ චක්‍ර මත විශාල ස්තූපයක ගර්භය මෙන් විශාල චක්‍රයක් යෙදී තිබීමෙන් මේ සංකේතයෙන් පර්වතයක් නොව නියම වශයෙන් ම චෛත්‍යයක් දැක්වීම අපේක්ෂා කරන ලදැයි සිතන්නට ඉඩ ඇත. මෙහි දී, මුල දී පර්වතයක් දැක්වීමට යොද ගන්නා ලද සංකේතයක් චෛත්‍යයක් නිරූපණය කරන සංකේතයක් බවට හැඩ ගසා ගන්නා ලද අයුරු පෙනෙතැයි සිතිය හැක. මෙම කාසිවල උජ්ජයිනී සංකේතය දක්නට ලැබෙනුයේ සාතවාහන සාතකර්ණී හා චුටුසාතකර්ණී යන වංශද්වයෙන් සාතවාහන කාසිවල පමණකි. මෙය ඔවුනට විශෙෂ වූ සටහනක් වී යැයි සැලැකෙන හෙයින්, මේ සලකුණ සහිත උජ්ජයිනියේ පාඨ විරහිත කාසි මාල්වා ප්‍රදේශය ආන්ධ්‍ර වංශිකයන්ගේ ආධිපත්‍යය යටතේ පවතිද්දී, භාවිතයට පත් වූ කාසි විශේෂයක් ලෙස සැලැකේ.

ඉහත සඳහන් කරන ලද සංකේත යුග්ම වශයෙන් ද අභිමුඛයේ හා ප්‍රතිමුඛයේ යෙදෙනු දක්නට ලැබේ. එබඳු යුග්ම සංකේත ආන්ධ්‍ර අධිරාජ්‍යයේ ඒ ඒ ප්‍රදේශ රාජ්‍යවල කාසි හඳුනා ගැනීම පිණිස උපකාරී වේ. මේවා අතර සුලභව යෙදෙන චෛත්‍යය හා උජ්ජයිනි සංකේතය, අන්ධ්‍ර දේශයට ද, පසෙකින් ගසක රූ සටහනක් ඇතිව යෙදෙන (චක්‍ර කීපයකින් යුත්) චෛත්‍යයත්, ආයත චතුරශ්‍රයක් තුළ තිත් සහිත තරංග රේඛාවක් හා ඊතලය සහිත දුන්න යොද සකසා ගත් සංකේතයත් කොලපූර් ප්‍රදේශට ද, උඩුකුරු කළ හොඬය සහිත ඇත් රුව හා උජ්ජයිනි සංකේතය මධ්‍ය ප්‍රදේශට ද, අයත් කාසිවල පිළිවෙළින් යොදන ලද බව පෙනේ. ආන්ධ්‍ර දේශයේ නිකුත් කරන ලද කාසි සඳහා ම භාවිත වූ තවත් සටහන් යුග්මයක් ලෙස ''අශ්වයා හා උජ්ජයිනි සංකේතය'' ගිණිය හැක. වෘෂභයා වේදිය සහිත ගස හා චෛත්‍යය මයිසූරයේ චිතල්ඩ්‍රග් දිස්ත්‍රික්කය ආශ්‍රිත ප්‍රදේශයේ කාසිවලට ද, නැව හා උජ්ජයිනි සංකේතය චොළ මණ්ඩල ප්‍රදේශයේ නිකුත්

කරන ලද කාසි සඳහා ද, විශෙෂයෙන් යොදා ගන්නා ලද බව පෙනේ. මෙසේ මෙම සටහන් මඟින් ඒ ඒ කාසි ආන්ධ්‍ර ආධිපත්‍යය යටතේ පැවැති කවර ප්‍රදේශයක නිකුත් කරන ලද ඒවා ද යන්න තීරණය කර ගත හැක. ආන්ධ්‍ර රජවරුන්ගේ කාසිවල යෙදෙන සටහන් අතර ඉතා සුලභ වශයෙන් යෙදෙන සංකේතද්වය ලෙස ''වෙදිය සහිත වෘක්ෂය'' හා ''චෛත්‍යය'' සැලැකිය හැක.

ආන්ධ්‍ර පාලකයන් අතර ශ්‍රී යඥ ශාතකර්ණිගේ රිදී කාසිවල පමණක් රජුගේ උඩුකය දක්වෙන ප්‍රතිරූපයක් යොද තිබෙනු දක්නට ලැබේ. මෙය වූ කලි බටහිර ක්ෂත්‍රපයන්ගේ කාසි අනුකරණය කිරීමෙන් භාවිතයට පත්, ටික කලකට පමණක් සීමා වුණු, සිරිතක් බව පැහැදිලි ය.

ආන්ධ්‍ර පාලකයන්ගේ කාසිවල යෙදී ඇති පාඨ හැමෙකක් ම ප්‍රාකෘත භාෂාමය වන අතර, ඒවා ලියැවී ඇත්තේ බ්‍රාහ්මී අක්ෂරවලිනි. ඇතැම් කාසිවල පාඨ යෙදී ඇත්තේ ප්‍රතිමුඛයෙහි පමණක් වුව ද, සමහරෙක අභිමුඛයේ හා ප්‍රතිමුඛයේ පාඨද්වයක් ම වෙයි. වට පාඨ වශයෙන් යොද ඇති මේවායින් කාසිය නිකුත් කළ පාලකයාගේ නම සමඟ මව්පස පෙළපත් නාමය ද යොද තිබීම විශෙෂ වූ ද, වැදගත් වූ ද, ලක්ෂණයකි.

''රඤො වාසියීපුතස විලිවායකුරස''
''රඤො මාධරිපුතස සිවලකුරස''
''රඤො වාසියීපුතස සිරි පුළුමාවිස''
''රඤො වාසියීපුතස සිව සිරි සාතකංණිස''

යනාදී වශයෙන් මේ පාලකයන්ගේ නම් මෙම කාසිවල යෙදී තිබෙනු දක්නට ලැබේ. මෙසේ මව් පස සම්බන්ධතා විශෙෂයෙන් දක්වීම මේ රජ පෙළපතට අයත් වූවන්ගේ විශෙෂ චාරිත්‍රයක් වූ හෙයින්, මොවුන් මාතෘ මූලික සමාජයකට අයත් වූවන් බව ද පැහැදිලි වේ.

ආන්ධ්‍ර වංශික පාලකයන් විසින් නිකුත් කරන ලද ඉහත විස්තර වූ ලක්ෂණ සහිත කාසි කිහිපයක් උදහරණ වශයෙන් පහත දක්වනු ලැබේ.

1. වාශිෂ්ඨීපුත්‍ර වලිවායකුර රජු විසින් මහාරාෂ්ට්‍රයේ කොලපූර් ප්‍රදේශයේ නිකුත් කරන ලද ඊයම් කාසි විශෙෂය:

මේවා ක්‍රි. ව. පළමුවැනි ශතවර්ෂයේ අග භාගයට පමණ අයත් වන බව මෙම වංශයට අයත් රජවරුන්ගේ නාම ලෙඛන හා අන් මූලාශ්‍ර නාණක විද්‍යා සාධක සමඟ තුලනාත්මකව පිරික්සන විට තීරණය කළ හැක.

අභිමුඛය: මේ කාසි වර්ගයේ අභිමුඛයේ දක්වෙන ප්‍රධාන රූප සටහන නම් හුම් හතරකින් යුත් චෛත්‍යයයි. චෛත්‍යය නිර්මාණය කිරීම සඳහා යෙදෙන එක් එක් වක්‍ර රේඛාව තුළ එක බැගින් තිත් යොද තිබෙනු දක්නට ලැබේ. චෛත්‍යයේ වම් පැත්තේ වේදියකින් වට වූ වෘක්ෂයක් ද, චෛත්‍යය මුදුනේ චන්ද්‍ර වංකයක් ද යෙදී ඇත. මුදුනේ ස්වස්තික රූප සටහනකි.

ප්‍රතිමුඛය: දුනුදිය පහතට හැරවී තිබෙන පරිදි දක්වා ඇති හීයක් රැඳවූ දුන්නක රූප සටහනක් ප්‍රතිමුඛයේ දක්නට ලැබේ. මේ කාසිවල අභිමුඛයේ පාඨයක් දක්නට ලැබෙන්නේ නැත. ප්‍රතිමුඛයේ පාඨය ''රඤො වාසියීපුතස විළිවයකුරස'' යනුවෙන් යෙදෙයි.

2. වාශිෂ්ඨී පුත්‍ර ශ්‍රී පුළුමාවි රජු විසින් ආන්ධ්‍ර දේශයේ කෘෂ්ණ ගොදවරී දිස්ත්‍රික්ක ආශ්‍රිත ප්‍රදේශවල නිකුත් කරන ලද ඊයම් කාසි:

මේවා නිකුත් කරන ලද කාල පරිච්ඡෙදය ක්‍රිස්තු වර්ෂයෙන් දෙවන ශතකයේ මැද කොටසට පමණ වැටෙතැයි නාණක විද්‍යාඥයෝ කල්පනා කරති.

අභිමුඛය: මේ කාසියෙහි අභිමුඛයේ ප්‍රධාන රූප සටහන වක්‍ර රේඛා තුනකින් සකස් කර ගන්නා ලද චෛත්‍ය රූප සටහනකි. මේ රූප සටහනට යටින් තරංග රේඛාවක් යෙදී තිබේ. මෙම කාසි වර්ගයේ රාජ නාමය දැක්වෙන පාඨය ලියැවී ඇත්තේ අභිමුඛයේ වට පාඨයක් වශයෙනි. එය ''රාඤො වාසිඨිපුතස සිරි පුළුමාවිස'' යනුවෙන් දිවෙයි.

ප්‍රතිමුඛය: මේ කාසියෙහි ප්‍රතිමුඛයෙහි දක්නට ලැබෙන්නේ එක ම රූප සටහනක් පමණි. ඒ උජ්ජයිනි සංකේතය යි. එහි හරස් රේඛා දෙක කෙළවර ඇති කව හතර සමකේන්ද්‍රිය කව දෙකක් අයුරින් යෙදී තිබේ.

3. ශ්‍රී පුළුමාවි රජු මධ්‍යම ඉන්දිය ප්‍රදේශවල (චන්ද්‍ර දිස්ත්‍රික්කය ආශ්‍රිත ප්‍රදේශය) නිකුත් කරන ලද පොටින් මිශ්‍ර ලෝහයෙන් කළ කාසි වර්ගය:

මේ කාසිවල ප්‍රතිමුඛයේ ඇති ඇතැම් වෙනස්කම් නිසා එක ම වර්ගය ඇතුළත ප්‍රභෙද කිහිපයක් දක්නට ලැබේ.

අභිමුඛය: සොඬය ඉහළට ඔසවා ගත් ඇතකු දකුණට හැරී සිටින ආකාරයෙන් මේ කාසිවල අභිමුඛයේ රූප සටහනෙහි දැක්වේ. අභිමුඛයේ රූප සටහන මීට සීමිත ය. පාඨය ද ඉතා කෙටි එකකි. ''සිරි පුළුමාවිස'' යනුවෙන් මාතෘ පක්ෂයේ සම්බන්ධය දක්වන්නේ ද නැති ව රජුගේ පුද්ගල නාමය පමණක් යොද තිබේ.

ප්‍රතිමුඛය: උජ්ජයිනි සංකේතය හා ඊමත යෙදෙන චන්ද්‍රවංකයකින් පමණි, මේ කාසියේ ප්‍රති-මුඛයේ රූප සටහන යුක්ත වන්නේ. එක් අනුකොටසක ප්‍රතිමුඛයේ රූප සටහනෙහි චන්ද්‍ර-වංකයට දෙපැත්තෙන් උජ්ජයිනි සංකේතයට සම්බන්ධ කොට සැරසිල්ලක් වශයෙන් මෙන් යොදන ලද කොල සහිත රිකිලි දෙකක් ද දැක්වේ.

4. ගෞතමීපුත්‍ර ශ්‍රී ශාතකර්ණි රජු ආන්ධ්‍ර දේශයෙහි නිකුත් කළ කාසි:

අභිමුඛය: දකුණට මුහුණ ලා නැඟී සිටින අශ්වයකුගේ රූපයක් හා අශ්ව රූපයට ඉහළින් කාසියේ ක්ෂේත්‍රයේ දැක්වෙන චන්ද්‍ර වංකයකින් මේ කාසියේ අභිමුඛයේ රූප සටහන් යුක්ත වේ.

අභිමුඛයේ වට පාඨය ''රාඤො ගෞතමී පුතස සිරි යඤ සාතකංණිස'' යනුවෙන් යෙදෙයි.

ප්‍රතිමුඛය: උජ්ජයිනි සංකේතය පමණි, මේ කාසියේ ප්‍රතිමුඛයේ රූප සටහනක් වශයෙන් යෙදෙන්නේ. එහි ද රූප සටහන යෙදෙන්නේ ඉහත විස්තර කරන ලද වාශිෂ්ඨී පුත්‍ර ශ්‍රී පුළුමාවී රජුගේ කාසියේ යෙදුණු උජ්ජයිනි සංකේතය දරන රූපාකාරයෙන් ම ය.

# 9. ත්‍රෛකූටක හා බෝධි කාසි

ත්‍රෛකූටක පෙළපතට අයත් පාලකයන් ගැන අප සතුව ඇති මූලාශ්‍ර හා ඔවුන් පිළිබඳව ඒවායින් දත හැකි කරුණු ද ඉතා ම අල්ප ය. මේ කරුණුවලින් ඔවුන් නතුව පැවැති ප්‍රදේශ පවා හරි හැටි නිශ්චය කර ගැනීමට ඉතිහාසඥයෝ අපොහොසත් වෙති. මේ පාලකයන් හා ඔවුන්ගේ ප්‍රදේශ ගැන අල්ප මාත්‍ර සටහන් රඝුවංශාදී සංස්කෘත සාහිත්‍ය ග්‍රන්ථයන්හි දක්නට ලැබෙතත්, ඒ ප්‍රදේශ කවරේ දැයි නිගමනය කිරීම පිළිබඳව තත්ත්වඥයන් අතර මත භේද පවතී. තඹ සන්නස් කීපයකින් හා ඔවුන්ගේ කාසිවලින් ලැබෙන මඳ සාක්ෂි අනුව, මෙම පෙළපතට අයත් වූ පාලකයන් ක්‍රි. ව. පස්වැනි ශතකයේ අග භාගයේ පමණ බටහිර ඉන්දියාවේ සුළු ප්‍රදේශයක පාලන බලය හිමි කරගෙන සිටි බව සාමාන්‍ය වශයෙන් කිව හැක. සූරත් අසල කාණ්හේරි හි දී හමු වූ ත්‍රෛකූටක සංවත්සරයෙන් 245 වැනි වර්ෂය දක්වන සන්නසක කෘෂ්ණගිරියේ (වර්තමාන කාණ්හේරි) ගොඩනංවන ලද චෛත්‍යයක් ගැන සඳහනක් එයි. සූරත් සිට මයිල පනහක් පමණ දුරින් පිහිටි ස්ථානයක තිබී සොයා ගන්නා ලද අභිලේඛනයක ධරසේන නම් ත්‍රෛකූටක පාලකයා කාණ්හේරි සන්නසෙහි වර්ෂයට අවුරුදු සතළිසකට පමණ පෙර කරන ලද දීමනාවක් හා ඒ රජුගේ ජයග්‍රහණයක් ගැන ද ඒ පාලකයා විසින් අශ්වමෙධ යාගය පවත්වන ලද බව ද සඳහන් වෙයි. මේවායින් හා අන් සාධකවලින් පෙනී යන පරිදි, ත්‍රෛකූටක රජවරුන් සිය පාලනය ගෙන ගියේ දකුණු ගුජරාටය හා කොන්කන් දේශය ආශ්‍රිත ප්‍රදේශයේ යයි සලකන්නට පුළුවන. ඔවුන්ගේ පෙළපතට අයත් වූවන් විසින් නිකුත් කරන ලද කාසි සොයා ගන්නා ලද ස්ථාන පිළිබඳ වාර්තා පිරික්සීමෙන් මේ අනුමිතිය තහවුරු වෙයි.

ත්‍රෛකූටක පාලකයන් විසින් නිකුත් කරන ලදැයි සැලැකෙන කාසිවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් නම්, ඒවා බටහිර ක්ෂත්‍රප පාලකයන්ගේ කාසි ඉතා ළඟින් අනුගමනය කර තිබීමයි. මේ කෙතරම් ආසන්න වශයෙන් සිදු වී තිබේ ද යත් ත්‍රෛකූටක කාසි බටහිර ක්ෂත්‍රප කාසිවල අනුකරණයන් ලෙස හඳුන්වා දීමට පුළුවන. ත්‍රෛකූටකයන් තමන්ගේ කාසි නිකුත් කරන ලද්දේ බටහිර ක්ෂත්‍රපයන්ගේ කාසි නිකුත් කරන ලද, ඒවාට හොඳින් හුරුව තිබුණු, ප්‍රදේශවල දී බව මෙයින් පැහැදිලිව පෙනේ. කාසි හමු වී තිබෙන ස්ථාන පිළිබඳව ඇති වාර්තාවලින් පෙනෙන ප්‍රදේශය ඉහත දක්වන ලද ප්‍රදේශයේ සීමාවන්ට වඩා සැහෙන තරමින් පුළුල් වන නමුත්, වැඩි පුර ම මේ කාසි ලැබී ඇත්තේ එම සීමාවන් තුළ බව පෙනී යයි. මේ රජවරුන්ගේ අභිලේඛනවල සඳහන් කෙරෙන සංවත්සරය චේදි ප්‍රදේශය පාලනය කළ කලචූරි රජුන්ගේ ශිලා ලේඛනවල යෙදෙන සංවත්සරය ම බව වැඩි දෙනා විසින් දැන් පිළිගනු ලැබේ. කාල නිර්ණ අවශ්‍යතාවන් සඳහා මෙම සංවත්සරය ක්‍රි. ව. 248/249 පමණ ඇරැඹුණක් බව සැලැකේ. මෙසේ ත්‍රෛකූටක රජවරුන්ගේ පාලන සමය පිළිබඳව ද දළ අදහසක් ලබා ගැනීමට ඉඩ ඇත.

මේ පාලකයන් අතරින් දෙදෙනකු විසින් නිකුත් කරන කාසි පමණෙකි, දැනට හමු වී තිබෙන්නේ. මේ පාලකයන්ගේ නම් ඉහත දක්වන ලද අභිලේඛනයන්ගෙන් ද සපයා ගත හැක. ක්‍රිස්තු වර්ෂ 456 දී (අභිලේඛනයේ දැක්වෙන සංවත්සරයෙන් 207) පමණ පාලන කාර්යයෙහි නිරතව සිටි ධරසේන හා ඔහුගේ පුත්‍ර ව්‍යාඝ්‍රසේන යන පාලකයෝ දෙදෙනා යි, මෙසේ කාසිවලින් හඳුනා ගත හැක්කේ. ධරසේන රජුගේ කාසිවල සඳහන් වන නාම මාත්‍රයෙන් පමණක් ඔහුගේ පියා වූ ඉන්ද්‍රදත්ත නම් ත්‍රෛකූටක පාලකයකු වූ බව ද දත හැකිය. මේ පාලකයන් දෙදෙනාගේ කාසිවල යෙදී තිබෙන පාඨ සැහෙන තරම් දුරට පැහැදිලිව කියවා ගත හැකි වී තිබේ.

**සේනගේ කාසි:**

මේ රජු විදියෙන් නිකුත් කළ එක ම වර්ගයකට අයත් කාසි සෑහෙන සංඛ්‍යාවක් සොයා ත තිබේ. මේ කාසිවල අභිමුඛය සැරැසී ඇත්තේ ක්ෂත්‍රප කාසිවල යෙදුණු රාජ ප්‍රතිරූපය කරණයෙන් සකසා ගන්නා ලද රජුගේ උඩු කය දක්වෙන රූප සටහනකිනි. මෙහි රජු ණට හැරී සිටින අයුරින් දක්වී ඇත. බටහිර ක්ෂත්‍රප කාසිවල මෙන්, මේවායේ රජ රුව පසින් කාසිය නිකුත් කරන ලද වර්ෂය දක්වීමක් හෝ ග්‍රීක අකුරු භාවිතයෙන් පාඨයක් යෙදීම ් කර නැත.

මෙම කාසිවල ප්‍රතිමුඛයේ දක්වෙන රූප සටහන්වල දක්නට ලැබෙන ඇතැම් සුළු වෙනස්- අනුව මෙම කාසි වර්ගය අනුකොටස් කිහිපයකට බෙද දක්වීමට නාණක විශෙෂඥයෝ හොසත් වෙති. සාමාන්‍යයෙන් මේ වර්ගයේ කාසිවල ප්‍රතිමුඛයේ දක්නට ලැබෙන්නේ චත්‍ය සංකේතය හා තරුවක රූප සටහනකි. එහි සැරැසූ බ්‍රාහ්මී අක්ෂරවලින් රාජ නාමය හන් කරමින් යොදන ලද වට පාඨයක් සෑහෙන තරම් දුරට පැහැදිලි ලෙස කියැවිය හැකි දි සටහන් වී ඇත. චෛත්‍යය සමඟ දක්වන තරුව චෛත්‍යයට දකුණෙන් හා වමෙන් දක්වා මින්, වට පාඨයේ පැහැදිලිකම හා නොපැහැදිලිකමත් අනුව අනුකොටස්වලට බෙදනු ලැබේ.

මේවායේ යෙදෙන වට පාඨය 'මහාරාජාධිරාජෙන්ද්‍රදත්ත පුත්‍ර පරම වෛෂ්ණව ශ්‍රී මහාරාජ සේන'' යනුවෙන් යෙදී තිබේ. මෙම පාඨයේ යෙදෙන රජුගේ නාමය ''ධරසේන'' හා රගණ'' යන දෙකෙන් එකක් විය හැක. මේ සැකය පිළිබඳ තීරණාත්මක නිගමනයකට ස ගන්නට මෙතෙක් හමු වී ඇති අභිලෙඛන ආදී මූලාශ්‍ර ප්‍රමාණවත් නොවේ.

**ඝ්‍රසේනගේ කාසි:**

මේ පාලකයා නිකුත් කළ කාසිවල ද ප්‍රතිමුඛයේ හා අභිමුඛයේ රූප සටහන් ඉහත විස්තර ත ලද කාසි වර්ගය අනුකරණයෙන් සකසා ගන්නා ලද ඒවා ය. මෙහි ප්‍රතිමුඛයේ යෙදෙන පාඨය ''මහාරාජ ධරසේන පුත්‍ර, පරම වෛෂ්ණව ශ්‍රී මහාරාජ ව්‍යාඝ්‍රසෙන'' යන්නයි. මෙහි දු ඝ්‍රසේන යන පදය නියම වශයෙන් ම ව්‍යාඝ්‍රගණ යන්න දැයි සැක පහළ කළ හැක.

**ධි කාසි:**

මෙබඳු පෙළපතකට අයත් වූ පාලකයන් පිරිසක් විසින් ඉන්දියාවේ කිසියම් ප්‍රදේශයක් ලනය කරන ලදැයි දැනගන්නට ඇති කරුණු සියල්ල ඔවුන්ගේ කාසි මූලාශ්‍ර කරගෙන ලැබිය කි ඒවා පමණකි. ඔවුන්ගේ පාලනය යටතේ පැවැති ප්‍රදේශ බටහිර ඉන්දියාවේ ක්ෂත්‍රප ලකයන් සතුව පැවැති කොටසට අයත් සුළු ප්‍රදේශයකට වූ බව පමණි, කිව හැක්කේ. ධි පෙළපතට අයත් පාලකයන්ගේ කාසිවල දක්නට ලැබෙන බ්‍රාහ්මී පාඨ වෘෂභදත්ත, ද්‍රමන්, නහපාන වැනි ක්ෂත්‍රප පාලකයන්ගේ කාසිවල යෙදී ඇති පාඨයනට අතිශයෙන්ම සම පි ය. කාසිවලින් ලබා ගත හැකි කරුණු අනුව, බෝධි වංශයට අයත් රජවරුන් ක්‍රිස්තු වර්ෂයෙන් වැනි ශතවර්ෂයේ මුල් භාගයේ දී පමණ පාලන කාර්යයෙහි නිරතව සිටි බව අනුමාන වශයෙන් න්නට පුළුවන.

කාල වශයෙන් හා ප්‍රදේශ වශයෙන් නිශ්චිත ව හඳුනා ගත නොහැකි මෙම පෙළපතට ත් රජවරුන් තිදෙනකු විසින් නිකුත් කරන ලදැයි සැලැකිය හැකි කාසි හමු වී තිබේ. ඒ දෙනා නම්:

(1) වීරබෝධි හෙවත් වීරබෝධිදත්ත
(2) ශිවබෝධි හා
(3) චන්ද්‍රබෝධි හා යනුයි.

මේ පෙළපතට අයත් පාලකයන් සියලු දෙනා විසින් ම නිකුත් කරන ලද්දේ ඊයම් කාසි ය. ශිවබොධි හා චන්ද්‍රබොධි යන දෙදෙනාගේ කාසිවල විශෙෂ ලක්ෂණයක් නම් ඒවායේ අභිමුඛය හිස්ව තිබීමයි. ප්‍රතිමුඛයෙහි මුදුනේ චන්ද්‍රවංකයක් සහිත චෛත්‍යයක් ද, එය දෙපස සිරස් අතට යෙදූ තරංග රේඛා දෙකක් ද වේ. පාලකයාගේ නම සඳහන් වන්නේ ද ප්‍රතිමුඛයේ ය. මෙකී ලක්ෂණවලින් යුත් ප්‍රතිමුඛය සහිත ව ''බොධි'' යන පාඨය පමණක් යෙදී ඇති තවත් කාසි විශෙෂයක් හමු වී තිබේ. මේවායේ ද අභිමුඛය හිස්ව ඇත. එහෙයින් මෙම කාසි ද ශිවබොධි හෝ චන්ද්‍රබොධි හෝ විසින් නිකුත් කරන ලද යැයි සැලැකේ.

වීරබොධි රජුගේ කාසිවල ''වීරබොධිස'' ''වීරබොධිදතස'' යනුවෙන් දෙයාකාරයක පාඨයන් යෙදී ඇති හෙයින්, එම කාසි අනුකොටස් දෙකකට බෙදිය හැක. මෙම කාසි අතුරින් අභිමුඛයේ කිසියම් රූප සටහනක් සහිත කාසි නිකුත් කරන ලද්දේ වීරබෝධි විසින් පමණි. ඒවායේ දැක්වෙන්නේ වම් පැත්තේ වේදියකින් වට වූ වෘක්ෂයක රූප සටහනක් හා ඊට දකුණින් සිටගෙන ඉන්නා මිනිස් රූපයකි.

# 10. ගුප්ත කාසි

ක්‍රි. ව. 320-500 පමණ අතර කාල සීමාව ඉන්දීය ඉතිහාසයේ ගුප්ත අධිරාජ්‍ය සමය ලෙස ැකේ. ගුප්ත අධිරාජ්‍යය යටතේ මෙකල ඇති වූ ආගමික, සාංස්කෘතික හා ශාස්ත්‍රීය දියුණුව ා මේ සමය ඉන්දීය ඉතිහාසයේ ස්වර්ණමය යුගය ලෙස ගිණිනු ලැබේ. කාලිදාස වැනි ලේඛක- ් විසින් සංස්කෘත සාහිත්‍යය එතෙක් නොවූ දියුණු තත්ත්වයකට පත් කරන ලද්දේ මේ අවදියේ . ගුප්ත කලාකරුවන් අතින් නිර්මාණය වූ අජන්තාවේ සිතුවම් හා මූර්ති කැටයම් හා වාස්තු ාත්මක නිර්මාණ ද එබඳු ම උසස් තත්ත්වයක් උසුලයි. ගණිත, නක්ෂත්‍ර ආදී විෂයයන් අතින් ්දියයන් අතර උසස්තම දියුණුවක් ලබා සිටි පඬිවරු මෙම කාලයට අයත් වූහ. බුදු සමයේ ජ්තිය නිසා අඩපණ ව තුබූ බ්‍රාහ්මණාගම හින්දු සමය වශයෙන් සකස් ව උසස් දියුණුවක් ූයේ ගුප්ත පාලකයන්ගේ අනුග්‍රහයෙනි. එමෙන් ම ගුප්ත අධිරාජයන් විසින් නිකුත් කරන කාසි ද ඉන්දීය කාසි පිළිබඳ ඉතිහාසයේ උපරිම දියුණු අවස්ථාව පිළිබිඹු කරයි. මේ අයුරින්, කාල පරිච්ඡේදය ගුප්ත අධිරාජ්‍ය නිර්මාපකයන් දේශපාලන වශයෙන් ලත් ජයග්‍රහණය ාකුත් සාංස්කෘතික අංශයන්හි ද පැහැදිලි ලෙස පිළිබිඹු වූ යුගයක් වෙයි.

ගුප්ත පාලන පරපුරෙහි ආරම්භය පැහැදිලි නොමැත. අධිරාජ්‍ය ගුප්තයන් අතර ශ්‍රේෂ්ඨ ානයක් උසුලන සමුද්‍රගුප්ත රජුගේ අලහබාද් ප්‍රශස්තියෙහි ඔහුගේ පියා මහාරාජාධිරාජ චන්ද්‍ර- ්ත යනුවෙන් ද, මව කුමාරදේවී නම් ලිච්ඡවී කුමරිය යනුවෙන් ද සඳහන් වේ. චන්ද්‍රගුප්ත සඳහා යෙදී ඇති ''මහාරාජාධිරාජ'' යන විරුද නාමයෙන් හැඟී යනුයේ, ඔහුගේ සමය වන ගුප්තයන්ගේ දේශපාලන බලය සෑහෙන දියුණුවක් ලබා තුබූ බවයි. චන්ද්‍රගුප්තගේ පියා ස හැඳින්වෙන ඝටෝත්කච හා ඔහුගේ පියා ලෙස දක්වෙන ශ්‍රී ගුප්ත යන දෙදෙනා ම අලහබාද් ස්තියේ ''මහාරාජ'' යන විරුද නාමයෙන් පමණක් හඳුන්වා ඇත. කුෂාණ පාලනය දුර්වල මන් පසු, ඉන්දීය දේශපාලන තත්ත්වය ද දුර්වල වීමේදී, මහාරාජ ශ්‍රී ගුප්ත සිය පාලන බලය ුරු ව පිහිටුවා ගන්නට ඇත. ''මහාරාජ'' යන නාමය ප්‍රාදේශීය පාලකයන් සඳහා භාවිත ් නිසා ඔහු ප්‍රාදේශීය පාලකයකු වූවාට සැක නැත. ඔහුගේ පාලනය යටතේ පැවැත්තේ ලිපුත්‍ර නගරය අවට ප්‍රදේශය පමණක් බව පිළිගැනීමට තරම් සාක්ෂි ඇත. ඔහුගෙන් අනතුරුව වූ ඝටෝත්කච ද සිය පිය රජු සතුව තුබූ ප්‍රදේශ උරුම කරගත් ප්‍රාදේශීය පාලකයකු වූ බව නේ.

ගුප්ත රජ පරපුරෙහි නියම දියුණුවක් ඇති වූයේ ගුප්ත වංශයේ තෙවැනියා වූ චන්ද්‍රගුප්ත ගේ සමයේ දී බව පෙනේ. චන්ද්‍රගුප්ත රජු කුමාර දේවිය හා විවාහ වීමෙන් ඇති වූ ගුප්ත- ඡවි සම්බන්ධය ගුප්ත පාලක පරපුරෙහි බලය ව්‍යාප්ත කරලීමට හේතු වූ බව පැහැදිලි ය. ව විස්තර කැරෙන පරිදි, චන්ද්‍රගුප්ත රජු තමන් විසින් කරන ලද කාසියක පවා මෙම සම්බන්ධය සඳහන් කිරීමට තරම් වැදගත් කොට සැලැකුවේ මේ නිසා යයි සිතිය හැක. කුමාරදේවිය පූ. හත්වන ශතකය පමණ තරම් ඈත අවදියක සිට වෛශාලී නුවර පාලනය කළ ලිච්ඡවි ළපතට අයත් වූ කුමරියක් වූවා ය. පසුකාලීන ගුප්ත අධිරාජයන් විසින් චන්ද්‍රගුප්ත ගේ ජ්‍ය සමය ආරම්භ වුණු වර්ෂය ගුප්ත වර්ෂයේ ආරම්භක වර්ෂය ලෙස සලකන ලද්දේ ඔවුන්ගේ ශපාලන ආධිපත්‍යය පිළිබඳ නියම පදනම ඔහුගෙන් ඇති වූ බව තමන් මනාව දත් නිසා ය.

චන්ද්‍රගුප්තගෙන් පසු රජ පැමිණියේ ඔහු පුත් සමුද්‍රගුප්ත ය. මොහුගේ රාජ්‍ය සමය ගුප්ත අධිරාජ්‍යයේ ආරම්භක අවදිය ලෙස හැඳින්විය හැක. අනෙකුත් ඉන්දිය පාලකයන් අතර ද, සමුද්‍රගුප්ත රජ ශ්‍රෙෂ්ඨ ස්ථානයක් ඉසිලී ය. ''මහාරාජාධිරාජ'' යන විරුද නාමය දැරූ සමුද්‍රගුප්තගේ ගුණ කථනයක් කරන අලහබාද් ප්‍රශස්තිය ඔහු යටතේ ගුප්ත අධිරාජ්‍යය ව්‍යාප්ත වී ගිය ආකාරය පිළිබඳ දීර්ඝ විස්තරයක් සපයයි. නර්මදා නදියෙන් උතුරෙහි පිහිටි ඉන්දීය ප්‍රදේශ සියල්ලම පාහේ තම ආධිපත්‍යය යටතට ගෙන පුළුල් අධිරාජ්‍යයක පාලකයා බවට පත් වන්නට සමුද්‍රගුප්තට හැකි වූ බව මෙම ලිපියෙහි අඩංගු වන කරුණු අනුව නිගමනය කළ හැක. සමුද්‍ර-ගුප්ත රජු සිය විජයග්‍රහණ කාර්‍යයන් අවසන් වූ පසු, කලක් තිස්සේ අභාවයට ගොස් තුබුණු අශ්වමෙධ යාගය යළි පැවැත්වූ බව අලහබාද් ප්‍රශස්තිය සඳහන් කරයි. මේ ප්‍රවෘත්තිය තහවුරු කැරෙන සාක්ෂි මේ රජුගේ කාසිවලින් ද ලැබේ. සංගීත කලාව පිළිබඳ ව සමුද්‍රගුප්ත රජු වෙත වූ කුසලතාව ද අලහබාද් ප්‍රශස්තියෙන් මෙන් ම ඔහුගේ කාසිවලින් ද පෙනී යයි.

මේ රජුගෙන් අනතුරුව ගුප්ත අධිරාජ්‍යය හිමි කර ගත්තේ ''වික්‍රමාදිත්‍ය'' නාමයෙන් ද තමන් හඳුන්වා ගත් දෙවැනි චන්ද්‍රගුප්තයි. මෙතෙක් ගුප්ත ආධිපත්‍යයට යටත් නොවී පැවැති උතුරු ඉන්දීය ප්‍රදේශයන් ද තම පාලන බලය යටතට ගන්නට මේ රජ සමත් විය. දෙවැනි චන්ද්‍රගුප්තගේ වැදගත් ම ජයග්‍රහණය ලෙස සැලැකිය යුතු වන බටහිර ක්ෂත්‍රප පාලකයන් ගුප්ත ආධිපත්‍යය යටතට ගෙන ඒම පිළිබඳ සාක්ෂි ලැබෙනුයේ ඔහුගේ කාසිවලිනි. බටහිර ක්ෂත්‍රපයන් යටත් කර ගැනීමෙන් අනතුරුව දෙවැනි චන්ද්‍රගුප්ත ඔවුන්ගේ කාසිවල ආකෘතිය අනුගමනය කරමින් තමන්ගේ රිදී කාසි ඒ ඒ ප්‍රදේශවල නිකුත් කිරීම ආරම්භ කළේ ය. මෙම ක්ෂත්‍රප පාලකයන් ගුප්ත අධිරාජ්‍යය යටතට පත් කරගැනීම ක්‍රිස්තු වර්ෂ 395-405 අතර කාල පරිච්ඡේදය තුළ සිදු වූ බව මේ කාසි අනුසාරයෙන් නිගමනය කළ හැකි ව තිබේ. මෙම ජයග්‍රහණ නිසා ගුප්ත අධිරාජ්‍යයේ අගනුවර වූ පාටලීපුත්‍ර නගරය පසු බාමින් උජ්ජෙනී නගරයේ දේශපාලන වැදගත් කම වැඩුණු බවක් පෙනී යයි.

දෙවැනි චන්ද්‍රගුප්තගෙන් පසු ගුප්ත අධිරාජ්‍යය උරුම කර ගත් කුමාරගුප්තගේ සෙල්ලිපිවල ඔහුගේ බිසව ධ්‍රැවදේවී නම් වූ බව සඳහන් ව ඇත. සාංචියේ හා බිල්සාද්හි ඇති මේ රජුන් දෙදෙනාගේ ශිලාලෙඛන දෙකක ඒවා ලියැවුණු වර්ෂයන් සඳහන් ව ඇති හෙයින්, ඒවා ආශ්‍රයෙන් කුමාරගුප්ත රජ වූයේ ක්‍රි. ව. 414 දී බව නිර්ණය කළ හැක. කුමාරගුප්තගේ රාජ්‍ය සමය පිළිබඳව කරුණු දක්වන ලෙඛනාදියක් ලැබී නැතත්, ඔහුගේ රාජ්‍ය සමයේ දී ලියැවුණු සෙල්ලිපි හා ඔහුගේ කාසි ව්‍යාප්ත වී ඇති ආකාරයෙන් කුමාරගුප්ත තමන්ට පියාගෙන් උරුම වූ අධිරාජ්‍යය විශාලත්-වයෙන් හා බලයෙන් අනූනව රැක ගන්නට පොහොසත් වූ බව පෙනී යයි. දෙවැනි චන්ද්‍රගුප්ත විසින් බටහිර ක්ෂත්‍රපයන් යටත් කොට අල්ලා ගත් ප්‍රදේශවල ආරම්භ කරන ලද ගුප්ත රිදී කාසි-අච්චු ගැසීම කුමාරගුප්ත රජුගේ රාජ්‍ය සමයේ දී බටහිර ප්‍රදේශවලින් පිටතට, එනම්, ගුප්ත අධි රාජ්‍යයට මුල දී අයත් ව තුබූ ප්‍රදේශවලට ද පැතිරිණි. මේ පාලකයා විසින් ද අශ්වමෙධ යාගයක් පවත්වන ලද බවට ඔහු විසින් නිකුත් කරන ලද එක් කාසි වර්ගයක් සාක්ෂි දරයි.

ක්‍රි. ව. 455 දී පමණ කුමාරගුප්ත රජුගෙන් පසු ස්කන්දගුප්ත ගුප්ත අධිරාජ්‍යයේ පාලනය තමන් අතට ගති. ස්කන්දගුප්තගේ සෙල්ලිපිවලින්, විශෙෂයෙන් ම ඔහුගේ භිතාරි සෙල්ලිපි-යෙන්, කුමාරගුප්තගේ රාජ්‍ය සමයෙහි අවසාන අවුරුදු කිහිපයේ දී ගුප්ත අධිරාජ්‍යයේ ස්ථාවරත්-වයට පහර වැදෙන්නට පටන් ගෙන තිබුණු බවක් පෙනී යයි. හූනයන්ගේ ආක්‍රමණ නිසා ද, ගුප්ත අධිරාජ්‍යයට අවනතව සිටි පුෂ්‍යමිත්‍රයන්ගෙන් ද, අධිරාජ්‍ය බලයට තර්ජන ඇති වූ බව පෙනේ. ස්කන්දගුප්ත යටතේ මේ තර්ජනයන්ට සාර්ථක ලෙස මුහුණ දීමට ගුප්ත බලය ශක්තිමත්ව තිබිණි. කෙසේ වුව ද, මේ රජුගේ සමයේ දී ඔවුන්ගේ ආර්ථික සම්පත් දුබල වී ගිය බව කාසි-වලින් පැහැදිලි වෙයි. මෙකලට අයත් ගුප්ත කාසි පූර්ව කාලීන ගුප්ත අධිරාජ්‍යයන්ගේ කාසිවලට වඩා බර ප්‍රමාණයෙන් අධික වුව ද, ඒවා සඳහා යොදාගෙන ඇති රත්රන් මිශ්‍ර කිරීම නිසා අඩු වටිනාකමින් යුත් ලෝහයක් විය. එමෙන් ම, මේ රජුගේ රන්කාසි සංඛ්‍යාව අතින් ද ඔහුට පෙර සිටි ගුප්ත පාලකයන්ගේ කාසිවලට වඩා අඩු විය.

ක්‍රි. ව. 470 දී ස්කන්දගුප්ත රජු මිය යාමත් සමඟ ම, ගුප්ත අධිරාජ්‍යයේ බලගතු බවද බිඳ වැටීමට පටන් ගති. ගුප්ත අධිරාජ පරපුරේ අවසාන බලගතු පාලකයා ලෙස සැලැකිය හැක්කේ ස්කන්දගුප්ත ය. ඔහුගෙන් පසුව රජ පැමිණි දෙවැනි කුමාරගුප්ත, පුරුගුප්ත, නරසිංහ ගුප්ත හා තුන්වන චන්ද්‍රගුප්ත යන පාලකයන්ගේ නාම මාත්‍රයන් ඔවුන් නිකුත් කළ කාසිවලින් ලබා ගත හැකි වුව ද, ඔවුන්ගේ රාජ්‍ය සමයන් හා රජ කළ අනුපිළිවෙළ පිළිබඳව නිසැක විවරණ සැකැසීමට ඉතිහාස ඥයෝ අසමත් වෙති.

පැරැණි ඉන්දිය කාසි පිළිබඳ ඉතිහාසයේ ගුප්ත කාසිවලට ලැබෙනුයේ අද්විතීය ස්ථානයකි. වර්තමානයේ භාවිතයට පත් ව ඇති කාසිවල ලක්ෂණ සියල්ලෙක් ම පාහේ ඇතුළත් ඉන්දියාවේ පැරැණි ම දේශීය කාසි ලෙස ගුප්ත පාලකයන් නිකුත් කළ කාසි හඳුන්වා දිය හැක. බර ප්‍රමාණයේ හා ආකෘතියේ සමරූපිතාව, නිකුත් කළවුන්ගේ රූප හා නම් සඳහන් පාඨ අභිමුඛයේ පිළිවෙළින් ක්‍රමානුකූලව යොදු තිබීම බඳු ලක්ෂණ ඉන්දියාවේ දේශීය කාසි අතර ප්‍රථම වරට දක්නට ලැබෙන්නේ ගුප්ත කාසිවල ය. පැරැණිතම දේශීය කාසි ලෙස මීට පෙර විස්තර කරන ලද ''පුරාණ'' ''ධරණ'' නම්වලින් හැඳින්වුණු හස් යෙදූ කාසිවල මේ ලක්ෂණ කිසිවක් දක්නට නොලැබෙයි. මේ ලක්ෂණයන්ගෙන් යුත් කාසි ඉන්දියාවේ දී මුල් වරට නිකුත් කරන ලද්දේ ඉන්දු-ග්‍රීක, ශක, පහ්ලව හා කුෂාණ යන රාජ වංශයනට අයත් පාලකයන් විසින් වුව ද, ඔවුන් විදේශීය පාලකයන් හෙයින්, ඒවා දේශීය කාසි වශයෙන් ගිණිය නොහැක. ඉන්දීය දේවතා රූප දැක්වීම වැනි ඇතැම් ලක්ෂණවලින් එම කාසි නිකුත් කිරීමේ දී තරමක් දුරට දේශීය බලපෑම ඇති වී තිබෙන බව පෙනෙතත්, ඒවා මූලික වශයෙන් අයත් වන්නේ විදේශීය පාලකයන් ගේ කාසි ගණයටයි. මේ පාලකයන් විසින් නිකුත් කරන ලද කාසිවල පාඨ පවා යෙදී ඇත්තේ ග්‍රීක හා ඛරොෂ්ඨී අක්ෂර භාවිතයෙනි.

කෙසේ වුව ද, අධිරාජ්‍ය ගුප්ත පාලකයන්ගේ කාසි සකස් වී ඇත්තේ ඉන්දු-ග්‍රීක හා කුෂාණ කාසිවල බලපෑම සැලැකිය යුතු ප්‍රමාණයක් ලැබීමෙන් බව කිව යුතු වේ. විශෙෂයෙන් ම ගුප්ත පෙළපතේ මුල් පාලකයන්ගේ කාසිවල කුෂාණ බලපෑම් සුලභ වශයෙන් දක්නට ලැබෙයි. එහෙත් කල් යාමේ දී මේ බාහිර බලපෑම්වලින් ක්‍රමයෙන් මිදී, සම්පූර්ණයෙන් ම දේශීය ලක්ෂණ-යන්ගෙන් යුක්තව කලාත්මක අගයෙන් ද ඉතා උසස් තත්ත්වයකට ගුප්ත කාසි පත් වී ඇත. අභිමුඛයේ රජ රුවක් හා ප්‍රතිමුඛයේ දෙවි රුවක් දැක්වීමේ ක්‍රමය ද, විරුදවලි සහිතව කාසි නිකුත් කළ පාලකයන්ගේ නම් සඳහන් කිරීමේ ක්‍රමය ද ගුප්ත අධිරාජයන් විදේශීය කාසිවලින් ලත් බලපෑම් ලෙස පෙනේ. තමන් නිකුත් කළ කාසිවල වට පාඨ දැක්වීමේදී බ්‍රාහ්මී අක්ෂර යොදු ගැනීම පමණක් නොව ඒවා උපගීති වැනි සංස්කෘත ගී වෘත්තයකට අනුව සකස් කොට යොදු තිබීම ද ගුප්ත පාලකයන්ගේ කාසිවල විශෙෂ ලක්ෂණයක් ලෙස හඳුන්වා දිය හැකි වේ.

ගුප්ත පාලකයෝ තමන්ගේ කාසි නිකුත් කිරීම සඳහා රන් රිදී හා තඹ යන ලෝහ වර්ග භාවිත කළහ. මේවා අතර විශෙෂ ස්ථානයක් ගන්නේ රන් කාසියි. ඔවුනට පෙර ඉන්දියාවේ ප්‍රදේශ පාලනය කළ විදේශීය පාලකයන් විසින් ද රන් කාසි නිකුත් කරන ලද නමුත් ගුප්ත පාලකයන් තරම් සුලභ ලෙස ඒ ලෝහය කාසි නිපදවීමට යොදු ගත් බවක් නොපනේ. දේශපාලන බලයෙන් හා ඒ සමඟ ම ආර්ථික සමෘද්ධියෙන් ද ගුප්තයන් ඉතා දියුණු තත්ත්වයකට පත් ව සිටි බව ඔවුන් විසින් ඉතා සුලභ වශයෙන් රන් කාසි නිකුත් කර තිබීමෙන් පෙනී යයි. මේ අතර ම ඔවුන්ගේ අනුග්‍රහය යටතේ මූර්ති හා චිත්‍ර කලාවන් ලද දියුණුව ද ඒ කාසිවලින් පිළිබිඹු වේ. ගුප්ත කලා කෘතීන්හි දක්නට ලැබෙන සම්භාව්‍ය ලක්ෂණයන් ඔවුන් නිකුත් කළ රන් කාසිවල යොදු තිබෙන විවිධ රූප සටහන්වල ද පැහැදිලි ලෙස ම දැක ගන්නට පුළුවන.

ඉහත විස්තර කරන ලද විදේශීය කාසිවල දක්නට ලැබෙනවාට වැඩි විවිධත්වයක් ගුප්ත පාලකයන්ගේ කාසිවල දක්නට ලැබේ. ගුප්ත කාසි හැදෑරීමේ දී මෙම රූප සටහන් පදනම් කරගෙන ඒවා ක්‍රමානුකූලව වර්ග කිරීමට පුළුවන. එක ම රජකුගේ කාසිවල රජ රුව දැක්වීමේ දී අශ්වාරොහක, ධනුර්ධර, හස්ත්‍යාරොහක, වීණාවාදක ආදී වශයෙන් විවිධ ස්වරූපයෙන් යොදු තිබීම නිසා ඒ අනුව නාණක විද්‍යා ඥයෝ ඒ ඒ රජුන්ගේ කාසි වර්ග කිහිපයකට බෙදු වෙන් කරති.

## පළමුවැනි චන්ද්‍රගුප්තගේ කාසි

දැනට හමු වී ඇති ගුප්ත කාසි අතුරෙන් මුලින් ම කාසි නිකුත් කරන ලද්දේ පළමුවන චන්ද්‍රගුප්ත විසිනැයි සැලැකේ. ''මහාරාජ'' යන විරුද නාමයෙන් පමණක් හැඳින්වුණු ශ්‍රී ගුප්ත හා ඝටෝත්කච දෙදෙන කාසි නිකුත් කිරීමට තරම් බලවත් නුවූ ප්‍රාදේශීය පාලකයන් දෙදෙනකු වූවා විය හැක.

පළමුවැනි චන්ද්‍රගුප්ත විසින් නිකුත් කරන ලද්දේ එක ම වර්ගයකට අයත් රන් කාසි පමණි. මේ වර්ගය ''රජ හා රැජින'' වර්ගය ලෙස හැඳින්වේ. මෙම වර්ගයට අයත් කාසි මථුරා, අයෝධ්‍යා, ලක්නව්, සීතපූර්, බරණැස් හා යුක්ත ප්‍රාන්තය වැනි ප්‍රදේශවලින් හමු වී ඇත. එහෙත් ඒවා ලැබී ඇත්තේ ස්වල්ප වශයෙනි. මේ කාසිවල විෂ්කම්භය අඟල් ·74 හා ·85 අතර ද, බර ග්‍රෙන් 113 හා 123·8 අතර ද වේ.

මේ වර්ගයට අයත් කාසිවල අභිමුඛයේ මුළු සිරුර ම දක්වෙන පරිදි රජු හා රැජින උනුන් දෙසට මුහුණ ලා සිටින ලෙස දක්වා ඇත. රජු වමතින් පොළොව මත සිරස් අතට සිට වූ රාජ යෂ්ටියක් අල්වා ගෙන සිටින අතර, දකුණතින් රැජිනට යම් වස්තුවක් ප්‍රදානය කරනු පෙනේ. මෙම වස්තුව ඉතා කුඩා හෙයින් ඒ කුමක් දැයි නිශ්චය වශයෙන් හඳුනා ගත නොහේ. සමහරුන් එය මුදුවක් ලෙසත්, තවත් සමහරුන් එය වළල්ලක් ලෙසත්, හඳුන්වන අතර, එයින් දක්වෙනුයේ සින්දූරදනියක් (ඉන්දීය කාන්තාවන් නළලේ තිලකය හා සීමාන්තයෙහි ගල්වන සින්දූර ආලේප කිරීමේ දී භාවිතා කරන උපකරණ) ලෙස ඇතැම්හු සලකති. රජු හා රැජින නිරූපණය කර ඇත්තේ හිස වටා දිවෙන ප්‍රභාමාලාවෙන් යුක්තව යි. යෂ්ටිය අල්වා ගැනීම සඳහා ඔසවාගෙන ඇති රජුගේ වම් අතට පහතින් සිරස් අතට ''චන්ද්‍ර'' යන නාමය ද, රැජිනගේ පිළිරුවට පිටුපසින් ''ශ්‍රී කුමාරදේවී'' නාමය ද යෙදී තිබේ.

මේ කාසියෙහි ප්‍රතිමුඛයේ සිංහයකු මත හිඳගත් දේවතාවියකගේ රූප සටහනක් වේ. එහෙත් ඇය කවරක් දැයි නියම වශයෙන් හඳුනා ගැනීම දුෂ්කර වේ. ඒ. එස්. අල්ටෙකාර්ගේ අදහස අනුව, මෙම රූප සටහන තුන්වැනි කණිෂ්ක රජුගේ කාසි වර්ගයෙක දක්වෙන සිංහයකු මත හිඳි දේවතාවිය හා ඊටත් පසුව භාවිතයට පත් අසුනක් මත හිඳගෙන සිටිනා අර්දොක්ෂෝ නම් දේවතාවිය දක්වෙන රූප සටහන් අනුකරණය කිරීමෙකි. කුෂාණ පාලකයාගේ කාසියෙහි එන දේවතාවියගේ ආසනය වෙනුවට මෙහි දී සිංහයකු යොදා ගෙන ඇත්තේ සිංහ වාහන සහිත දුර්ගා දෙවිඳුව දක්වීම සඳහා යයි අල්ටෙකාර් අදහස් කරයි. කුමාරදේවියගේ නාමය ප්‍රතිමුඛයෙහි ද සඳහන් වන හෙයිනුත් මෙහි දී දුර්ගා දේවිය නිරූපණය කර තිබීමෙන්, ලිච්ඡවී පාලකයන් දුර්ගා නමස්කාරය කළවුන් විය හැකි බවක් අනුමාන කරන්නට ද ඉඩ ඇතැයි අල්ටෙ-කාර් තව දුරටත් පෙන්වා දෙයි.

ඉහත විස්තර කරන ලද කාසිය නිකුත් කරන ලද්දේ පළමුවැනි චන්ද්‍රගුප්ත විසින් ද, නොඑසේ නම් ඔහු පුත් සමුද්‍රගුප්ත විසින් ද යන්න ගැන නාණක විද්‍යාඥයන් අතර මත භේදයක් පවතියි. මෙය සමුද්‍රගුප්ත රජු සිය පියාණන් ලිච්ඡවී පරපුර හා ඇති කර ගත් සම්බන්ධය සිහිපත් කරලීම සඳහා නිකුත් කරන ලද පදක්කමක් ලෙස ජෝන් ඇලන් සලකයි. මේ මතය පිළිගත නොහැකි සේ සලකන අලටෙකාර් ඒ පිළිබඳව මෙසේ කරුණු දක්වයි. පූර්ව පාලකයන් ගැන සිහිපත් කිරීම සඳහා පදක්කම් නිකුත් කරන විට, ඒවා නිකුත් කරන පාලකයන් ස්වකීය නාමයන් ද ඒවායේ යෙදීම සාමාන්‍ය සිරිතයි. ඇගතොක්ලීස්, ඇන්ටිමැකොස් තියොස්, යුක්‍රටීඩීස් යන ඉන්දු-ග්‍රීක පාලකයන් විසින් නිකුත් කරන ලද ස්මරණ පදක්කම්වල ඔවුන්ගේ නාමයන් ද අනිවාර්යයෙන් ම යෙදී තිබෙනු දක්නට ලැබේ. පසුව විස්තර කෙරෙන පරිදි, සමුද්‍රගුප්ත රජුගේ අශ්වමෙධ වර්ගයට අයත් කාසිවල රජුගේ නාමය කෙළින් ම යොදා නැතත්, ඒවා තමන් විසින් නිකුත් කරන ලද බව හැඟවීම පිණිස ''අශ්වමෙධ පරාක්‍රමඃ'' යන විරුද නාමය යොදා තිබෙනු පෙනේ. එහෙයින් මෙම ''රජ හා රැජින'' වර්ගයට අයත් කාසි ද නිකුත් කරන ලද්දේ සමුද්‍රගුප්ත විසින් නම් ඔහුගේ නාමය හෝ විරුද නාමයක් හෝ ඒවායේ යොදනු ඇතැයි අපේක්ෂා කළ හැකි වේ. එසේ එවැනි කිසිදු සාක්ෂියක් මේ කාසිවල දක්නට නොලැබීම ඔහු විසින් නොව පළමුවැනි චන්ද්‍රගුප්ත විසින් ම ඒවා නිකුත් කරන ලද බවට සාධකයකි.

''රජ හා රැජින'' වර්ගයට අයත් කාසි නිකුත් කරන ලද්දේ පළමුවැනි චන්ද්‍රගුප්ත විසිනැයි පිළිගත හොත්, ඒවා ගුප්ත පාලකයන් විසින් ප්‍රථමයෙන් ම නිකුත් කරන ලද කාසි ලෙස ගිණිය යුතු වෙයි. එහෙත් සමුද්‍රගුප්ත රජුගේ ''රාජ දණ්ඩ'' වර්ගයට අයත් කාසි ''රජ හා රැජින'' වර්ගයේ කාසිවලට වඩා කිට්ටු ලෙසින් කුෂාණ රජවරුන්ගේ කාසි අනුකරණය කර තිබෙනු දක්නට ලැබේ. මේ අනුව, ගුප්ත පාලකයන් ස්වකීය කාසි නිපදවීමේ දී කුෂාණයන්ගේ කාසි ආදර්ශයට ගත්තේ නම් ඔවුන් නිකුත් කළ මුල් ම කාසි වර්ගය කුෂාණ බලපෑම්වලින් බොහෝ දුරට නිදහස්, ස්වාධීන ලක්ෂණ දක්වන ''රජ හා රැජින'' වර්ගය විය නොහැකි බව ජෝන් ඇලන් පෙන්වා දී ඇත. ''රජ හා රැජින'' වර්ගයේ කාසිවල ස්වාධීන ලක්ෂණය ලෙස සැලැකිය හැකි අභිමුඛයේ රාජකීය යුවළගේ රූප යෙදීම ඉහත විස්තර කරන ලද පරිදි, හුදෙක් දේශපාලන අවශ්‍යතා නිසා සිදු වූවකි. ප්‍රතිමුඛයේ සිංහයකු මත ආරෝපිතව සිටින දේවතාවිය දක්වන සටහන ඇතැම් කුෂාණ කාසිවල ද දක්නට ලැබේ. මිනිස් රූ දෙකක් එක ම මුණතෙහි දක්වෙන අවස්ථාවක් ද ඇසිලිසීස් රජුගේ කාසියක ප්‍රතිමුඛයෙහි දක්වේ. ''රජ හා රැජින'' වර්ගයේ කාසි බොහෝ දුරට ස්වාධීන ලක්ෂණ දක්වන හෙයින්, ඒවා ගුප්ත පාලකයන් ප්‍රථම වරට නිකුත් කළ කාසි බව පිළිගත නොහැකි යයි කිම සනාථ කළ හැකි අදහසක් නොවේ.

**සමුද්‍රගුප්තගේ කාසි**

පළමුවැනි චන්ද්‍රගුප්තගෙන් අනතුරුව රජ පැමිණි සමුද්‍රගුප්ත බලවත් අධිරාජයකු වූ බව ඉහත දක්විණි. ඒ බව ඔහුගේ කාසිවලින් ද පෙනී යයි. මේ රජු විසින් වර්ග කිහිපයකට අයත් රන් කාසි විශාල සංඛ්‍යාවක් නිකුත් කළ බව දැනට සොයා ගෙන ඇති කාසිවලින් පෙනියේ. සිය දීර්ඝ පාලන සමයෙහි අවසාන කාලයේදී බොහෝ කලක් අභාවිතව තුබූ අශ්වමෙධ යාගය ද පැවැත්වීමට මේ පාලකයාට හැකි විය. සමුද්‍රගුප්ත රජු විසින් නිකුත් කරන ලදුව දැනට හමුවී ඇති රන් කාසි පහත දක්වෙන අයුරු වර්ග හයකට බෙද වෙන් කළ හැක.

i. දණ්ඩධර වර්ගය
ii. ධනුර්ධර වර්ගය
iii. පරශු වර්ගය
iv. ව්‍යාඝ්‍රපරාක්‍රම වර්ගය
v. වීණාවාදක වර්ගය
vi. අශ්වමෙධ වර්ගය

මේ කාසි වර්ග අතරින් මුලින් ම නිකුත් කරන ලද ලෙස ගිණිය හැකි දණ්ඩධර වර්ගය බෙහෙවින් කුෂාණ කාසිවල ආභාසය ලැබූවකි. පරශු හා ධනුර්ධර වර්ගවලට අයත් කාසිද දණ්ඩධර වර්ගයම අනුගමනයෙන් සකස් කර ගන්නා ලද බව සැලැකිය හැකි ය. මුල් වර්ගයේ දක්නට ඇති රාජදණ්ඩ වෙනුවට මේ වර්ග දෙකට අයත් කාසිවල රජු පිළිවෙළින් පරශුවක් හා දුන්නක් දරා සිටිනු මේවායේ විශේෂයයි. සිය බලය පතුරුවාලීම සඳහා සටන් වැදී සිටි කාල සීමාව තුළ මෙම කාසි නිකුත් කරන ලද්දේ යැයි සලකන්නට ඉඩ ඇත. සාර්ථක ලෙස සිය රණකාමීත්වය නිසා ලද දිග්විජයෙන් තහවුරු කරගත් බලයෙන් යුතුව අශ්වමෙධ යාගය පැවැත්වූ සමුද්‍රගුප්ත රජු එම සිද්ධිය අනුස්මරණය කිරීම සඳහා අශ්වමෙධ කාසි වර්ගය නිකුත් කළ බව පෙනේ. මේ රජු විසින් අශ්වමෙධය පවත්වන ලද්දේ ස්වකීය රාජ්‍යසමයේ අවසාන භාගයෙහි හෙයින්, මේ කාසි ද ඒ වකවානුවට අයත් ඒවා ලෙස සලකන්නට ඉඩ තිබේ. සමුද්‍රගුප්ත රජු දක්ෂ ධනුඩයක්කාරයකු හා වීණාවාදකයකු වූ බව ව්‍යාඝ්‍රපරාක්‍රම හා වීණාවාදක යන වර්ගවලට අයත් කාසිවලින් පැහැදිලි වේ. මේ අනුව අලහබාද් ප්‍රශස්තියේ සමුද්‍රගුප්ත රජුගේ විශේෂ හැකියාවන් ලෙස වර්ණනා කෙරෙන දක්ෂතා සියල්ල ම ඔහුගේ කාසිවලින් ද නිරූපණය කෙරෙයි. ඉහත සඳහන් වූ වර්ග සියල්ලට ම අයත් කාසි රනින් නිම වූ ඒවාය. මේ පාලකයා විසින් රිදියෙන් හා තඹවලින් කාසි නිකුත් කළ බවට සාක්ෂි මෙතෙක් හමු වී නැත.

### i. දණ්ඩධර වර්ගය

සමුද්‍රගුප්ත රජුගේ කාසි අතර ඉතාම බහුල වශයෙන් ලැබී ඇත්තේ දණ්ඩධර වර්ගයට අයත් ඒවාය. මේ රජු මුලින් ම නිකුත් කළ කාසි වර්ගය මෙය ලෙස සැලකිය හැකි අතර, මේ වර්ගයට අයත් කාසි ඔහුගේ රාජ්‍ය සමය තුළ කිහිප වරක් ම යළි යළිත් නිකුත් කරන ලද බව පෙනේ.

මේ වර්ගයට අයත් කාසිවල අභිමුඛයේ වමතින් රාජදණ්ඩක් දරා සිටින අතර දකුණතින් පූජාසනයක් මතට සුවඳ ද්‍රව්‍යයක් වැනි යමක් දමමින් සිටින රාජ ප්‍රතිරූපයක් දැක්වේ. රජු ඉදිරියේ ගරුඩද්ධ්වජයක් දක්නට ලැබෙයි. කාසියේ ප්‍රතිමුඛයේ වමතින් සමෘද්ධිශෘංගයක් ද (Cornucopiae) දකුණතින් පාශයක් ද දරා ගෙන සාරියකින් සැරැසී ආසනයක් මත හිඳින දෙවතාවියකගේ රුවක් දැක්වේ.

දණ්ඩධර වර්ගයේ කාසිවල අභිමුඛයේ දැක්වෙන රූප සටහන පංජාබයේ කුෂාණයන් විසින් නිකුත් කරන ලද රාජදණ්ඩ දරා සිටින රාජ ප්‍රතිරූපය සහිත කාසිවලට කිට්ටු අනුරූපීතාවක් දක්වයි. ගුප්ත කාසි නිපැදවූ ශිල්පීන් කුෂාණ කාසි ආශ්‍රය කළද, දෙශීය ලක්ෂණ ස්වකීය නිර්මාණයන්හි දක්වන්නට උත්සාහයක් දරා ඇති බව පෙනේ. රජුගේ ඇඳුම කුෂාණ කාසිවල දැක්වෙන දිගු කබාය හා කලිසම අනුගමනයෙන් සකස් කොට ගෙන ඇත. කුෂාණයන්ගේ මෙන් කබාය මුළුමනින් ම දණහිස දක්වා වැටෙනු වෙනුවට ඉදිරිපසින් ඉහටිය තෙක් පමණක් දික්ව යොදු ඇත. කුෂාණයන්ගේ කේතුකාකාර හිස්වැස්ම වෙනුවට හිසට ඇලී සිටින සේ සකස් ව මුතු ඇට පෙළකින් ද සරසන ලද හිස්වැස්මක් දක්නට ලැබේ. කුෂාණ රාජ දණ්ඩෙහි යෙදෙන ත්‍රිශූල සංකේතය වෙනුවට, ගුප්ත රාජ ලාංඡනය ලෙස අලහබාද් ප්‍රශස්තියේ සඳහන් කෙරෙන, ගරුඩධ්වජය යොදු ඇත.

ප්‍රථම වරට ගුප්ත කාසි අතර සංස්කෘත ගී වීරිතකට අනුව යොදන ලද වට පාඨයක් දක්නට ලැබෙන්නේ සමුද්‍රගුප්තගේ මෙම කාසියේ ය. උපගීති වෘත්තයෙන් ලියැවී ඇති මෙම පාඨය නම් ''සමරශත විතත විජයොජිතරිපුරජිතො දිවං ජයති'' (සිය ගණන් යුද බිම්හි ජයගත්, දිනන ලද සතුරු රජුන් ඇති රජ තෙමේ දෙව්ලොව දිනයි.) යන්නයි.

ප්‍රතිමුඛයේ ග්‍රීක පාඨය යෙදෙද්දී සාමාන්‍යයෙන් කුෂාණ කාසිවල සඳහන් වූයේ රූප සටහනෙන් දැක්වෙන දෙවතාවියගේ නාමය වුවද, මේ ගුප්ත කාසිවල ප්‍රතිමුඛයේ යොදු ඇත්තේ සමුද්‍රගුප්ත රජුගේ විරුද නාමය වූ ''පරාක්‍රමඃ'' යන්නයි.

කුෂාණ ආදර්ශයන් අනුගමනයෙන් නිපැදවූවද, ගුප්ත දණ්ඩධර කාසිවල ශිල්පක්‍රමය වඩා උසස් වූවකි. අගය අතින් සැලැකුවද කුෂාණ කාසි 1:1 යන අනුපාතයට අනුව මිශ්‍ර කරන ලද රත්රනින් නිමවා ඇති නමුත් ගුප්ත කාසිවල රත්රන් මිශ්‍රණය 9:1 ක් පමණ වේ.

කුෂාණ රජවරුන්ගේ කාසිවල ප්‍රතිමුඛයේ දැක්වෙන දෙවතාවිය ''අර්දොක්ෂො'' යන නමින් හඳුන්වා ඇත. එහෙත් ගුප්ත කාසිවල නිර්මාපකයන් මේ දෙවතා රූපයම ඒ නම යෙදීමෙන් තොරව, ප්‍රතිමුඛයේ රූප සටහන් ලෙස යොදු ගැනීමෙන් අදහස් කළේ ලක්ෂ්මිය හෝ දුර්ගා දෙවිය දැක්වීම ද යන්න නොපැහැදිලි ය.

මූලික රූප සටහන් අතින් සමාන වුවද, සුළු වෙනස් කම් නිසා දණ්ඩධර වර්ගයට අයත් කාසි අනුකොටස් වශයෙන් නාණක විද්‍යාඥයන් විසින් තව දුරටත් වර්ග කරනු ලැබේ. සාමාන්‍යයෙන් මේ කාසිවල රජු වම් පැත්තට හැරී සිටින ආකාරය දැක්වෙතත්, ඇතැම් කාසියක දකුණු පැත්තට හැරී සිටින රජුගේ රූපයද දක්නට ලැබෙයි. අභිමුඛයේ රාජ නාමය සඳහන් කිරීමේ දී බහුල වශයෙන් යෙදී ඇත්තේ රජුගේ වම් බාහුව යටින් ''සමුද්‍ර'' යන කෙටි නාමය පමණක් වුවද, සමහර කාසිවල ඊට අතිරේකව යෂ්ටියට පිටතින් ''ගුප්ත'' යන පදයද යෙදී තිබෙයි. ඇතැම් කාසිවල රජු ඉදිරියෙන් දැක්වෙන ගරුඩ ධ්වජයට ඉහළින් චන්ද්‍රවංකයක සටහනක් ද දැක්වේ.

මෙම වර්ගයට අයත් කාසිවල විෂ්කම්භය අඟල් ·75 සිට ·9 දක්වා වෙනස් වන අතර, බර ප්‍රමාණය ග්‍රෙන් 115 – 118 හා 122 අතර ප්‍රමාණයක් වේ.

### ii. ධනුර්ධර වර්ගය

ධනුර්ධර වර්ගය මුලින් විස්තර කරන ලද පරිදි, දණ්ඩධර වර්ගය ආශ්‍රයෙන් ම සකසා ගන්නා ලද්දකි. මේ කාසිවල අභිමුඛයේ දක්නට ලැබෙන්නේ වමතින් දුන්නක් හා දකුණතින් හීයක් ගත් රජරුවකි. එය විදේශීය ආභාසයෙන් මිදෙමින් වඩාත් ඉන්දීය ස්වරූපයකට හුරු කාසි නිපදවීමට ගත් වෑයමක් බව පෙනේ. අභිමුඛයේ එන බ්‍රාහ්මී වට පාඨයෙන් ''අපරාජිතව පෘථිවිය ජයගත් (රජ තෙමේ) යහපත් පැවැත්මෙන් ස්වර්ගය ජය ගනියි'' (අප්‍රතිරථො විජිත්‍ය ක්ෂිතිං සුචරිතෛර් දිවං ජයති) යන්න ද දක්වා ඇති හෙයින්, රජු ධනුර්ධරව දැක්වීමෙන් ඔහුගේ යුධ පරාක්‍රමය දැක්වීම අපෙක්ෂිත බව පැහැදිලි ය.

දකුණතින් හීයක් ගෙන සිටින ආකාරය දැක්වෙන හා පූජාසනයක් මත යමක් දමමින් සිටිනාකාරය දැක්වෙන යනුවෙන් ධනුර්ධර කාසි ද ප්‍රභේදද්වයකට බෙදිය හැක. ප්‍රතිමුඛයේ විරුද නාමය දැක්වීමේ දී ඇතැමෙක ''අප්‍රතිරථඃ'' යනුවෙන් ද, තවත් සමහරෙක ''පරාක්‍රමඃ'' යනුවෙන් ද වෙනස් වශයෙන් යොද තිබෙයි.

මෙම වර්ගයට අයත් කාසිවල විෂ්කම්භය අඟල් ·8 – ·9 අතර ප්‍රමාණයක් වේ. බර ප්‍රමාණයෙන් ඒවා ග්‍රේන් 110 හා 120 අතර වෙනස් වෙයි.

### iii. පරශු වර්ගය

පරශු වර්ගයට අයත් කාසිවල අභිමුඛයේ වමතින් පරශුවක් දරාගෙන සිටින රජ රුව දැක්වෙයි. දණ්ඩධර වර්ගයේ යෙදෙන ඇඳුමෙන් ම සැරසී දකුණත ඉඟටියෙහි රඳවාගෙන රජු නැඟිට සිටිනු පෙනේ. මේ කාසිවල රජ ඇඳුමෙහි වෙනසකට ඇත්තේ රජරුවෙහි හිණෙහි පැළැඳි අසිපතක් දැක්වීම පමණි. රජ රුව ඉදිරියෙහි සිට ගෙන ඔහු දෙස බලා සිටින ආකාරයෙන් නිරූපිත වාමන රූපයක් අභිමුඛයේ රූප සටහන් අතර වීම විශෙෂ ලක්ෂණයකි. රජු හා වාමනයා අතර මුදුනේ චන්ද්‍රවංකයක් සහිත යෂ්ටියක් දක්නට තිබේ. අභිමුඛයේ වට පාඨයේ මෙන් ම ප්‍රතිමුඛයේ විරුද නාමය දැක්වීමේ දී ද යෙදෙන ''කෘතාන්ත පරශුඃ'' (යම රජුගේ පරශුව දරන්නා) යන පදය රජුගේ බලපරාක්‍රමය විදහා දැක්වීම සඳහා සකස් කර ගත්තක් බව පැහැදිලි ය. සමුද්‍රගුප්ත අධිරාජයාට දේවත්වයක් ආරොපණය කිරීම පිණිස මෙය භාවිත කරන ලද්දේ යයි සමහරු කල්පනා කරති.

ප්‍රතිමුඛයේ දක්වා ඇති දෙව රූපය සම්බන්ධයෙන් ද මෙම වර්ගයට අයත් ඇතැම් කාසිවල මීට පෙර සඳහන් කැරුණු කාසි වර්ගවල දක්නට නොලැබෙන වැදගත් විශෙෂතාවක් වෙයි. සමහර කාසිවල දෙවතාවිය සාමාන්‍යයෙන් වමතින් දරා සිටින සමෘද්ධිශෘංගය වෙනුවට පියුමක් දරා සිටිනු දැක්වී ඇත. ඇතැම් කාසිවල ඇය සඳහා පියුමක රූපාකාරයෙන් සකසන ලද පාපුටුවක් ද දක්වා තිබේ. පද්මයක් අතින් ගත් දෙවතාවියක යෙදීමෙන් අදහස් කරන ලද්දේ ලක්ෂ්මිය නිරූපණය කිරීම බව අනුමාන කළ හැක. මෙම කාසිවලට මූලාදර්ශ වූ කාසිවල ප්‍රතිමුඛයේ අපරදිග සමයනට අයත් දේවතාවුන් දැක්වීමේ පිළිවෙළ මේ වන විට වඩාත් දේශීය ස්වරූපයකින් සකසා ගැනීමේ ආයාසයක් දැරුණු බවට මෙය සාධකයකි.

පරශු වර්ගයේ කාසිවල ද යම් යම් වෙනස්කම් දක්නා ලැබේ. සමහරෙක රජු වම් පසටත් වාමනයා දකුණු පසටත් මුහුණ ලා සිටින අතර, අන් සමහරෙක රජු දකුණටත් වාමනයා වමටත් හැරී සිටිනු පෙනේ. මේ ප්‍රධාන වෙනස් කම් දෙක හැරුණු විට, රාජ නාමය දැක්වෙන ශීර්ෂ පාඨය සම්බන්ධ විවිධතා අනුව තවත් අනුකොටස් කීපයක් වෙන්ව හඳුනා ගත හැක.

මේ කාසි විෂ්කම්භයෙන් අඟල් ·75 – ·85 අතර වේ. ඒවායේ සාමාන්‍ය බර ප්‍රමාණය ග්‍රෙන් 118 ක් පමණ වන අතර එකිනෙක කාසිවල බර ග්‍රෙන් 112 හා 123 අතර විවිධ වේ.

### iv. ව්‍යාඝ්‍රපරාක්‍රම වර්ගය

සමුද්‍රගුප්ත රජුගේ කාසි වර්ග අතර ඉතා විරලව ලැබී ඇත්තේ මේ වර්ගයට අයත් කාසියි. කලා නිර්මාණයක් වශයෙන් මෙම වර්ගයේ කාසිවලට ලැබෙන්නේ ඉතා උසස් තැනකි. මේ කාසිවල අභිමුඛයේ වම් දෙසට මුහුණ ලා ආලීඪ ඉරියව්වෙන් සිටින රජු ව්‍යාඝ්‍රයකු පයින් පාගා-ගෙන දුන්නෙන් විදින අයුරු නිරූපණය කෙරෙයි. රජුගේ හා ව්‍යාඝ්‍රයාගේ රූපවලට අතරින් මුදුනේ චන්ද්‍රවංකයක් සහිත යෂ්ටියක් දක්නට ලැබේ. මේ කාසියේ රජ රුව දැක්වීමේ දී සම්පූර්ණ-යෙන් දෙශීය වස්ත්‍රාභරණයෙන් සැරැසී ගත් අයුරින් මනාව වැඩුණු පෙශීන් සහිත හොඳින් පැහැදිලි ලෙස දක්නට ලැබෙන සේ ශරීරය දක්වා ඇත.

ප්‍රතිමුඛයේ දෙවතාවියගේ රුව දැක්වීමේ දී ද මකරකු පිට ආරෝපිත, දෙශීය වස්ත්‍රාභරණ-යෙන් සැරැසී ගත් කාන්තා රූපයක් නිරූපණය කර තිබේ. මකර වාහන සහිත මෙම දෙවඟන හඳුනා ගැන්ම පිළිබඳව උගතුන් අතර මත භේද පවතී. වින්සන්ට් ස්මිත් පවසන්නේ ඉන් රති දෙවිදුව හෝ වාරුණිය නිරූපිත බවයි. අල්ටෙකාර් එය ගුප්ත කලා කෘතින් අතර නිතර දක්නට ලැබෙන ගංගා දෙවියගේ රූපයක් ලෙස හඳුනා ගනී. ගංගා දෙවියගේ වාහනය ලෙස සැලැකෙන්නේ ද මකරාය.

මේ වර්ගයට අයත් කාසිවල අභිමුඛ පාඨය ''ව්‍යාඝ්‍රපරාක්‍රමඃ'' යනුවෙන් ද ප්‍රතිමුඛයේ ''රාජා සමුද්‍රගුප්තඃ'' යනුවෙන් ද සඳහන් වේ. අඟල් ·85 පමණ (සාමාන්‍ය) විෂ්කම්භයකින් යුක්ත වන ව්‍යාඝ්‍රපරාක්‍රම වර්ගයට අයත් කාසිවල බර ග්‍රෙන් 111 – 117 අතර වෙනස් වෙයි.

### v. වීණාවාදක වර්ගය

ඉහත කී ව්‍යාඝ්‍රපරාක්‍රම වර්ගයට අයත් කාසි මෙන්ම, වීණාවාදක වර්ගයට ඇතුළත් කළ හැකි කාසි ද ලැබී ඇත්තේ අඩු සංඛ්‍යාවලිනි. එසේ වුවද, ගුප්ත පාලකයන්ගේ කාසි අතර දෙශීය ලක්ෂණ නිසා කැපී පෙනෙන කාසි වර්ගයක් ලෙස හඳුන්වා දීමට පුළුවන. ප්‍රතිමුඛයේ දැක්වෙන දෙවතාවියගේ සුරතෙහි දක්නට ලැබෙන සමෘද්ධිශෘංගය හැරුණු විට, මෙම කාසියේ අන් කිසිදු දේශීය නොවන ලක්ෂණයක් යෙදී නැත. අලහබාද් ප්‍රශස්තියෙහි, සමුද්‍රගුප්ත රජු සංගීතය අතින් නාරද හා තිම්බරු යන දිව්‍ය ගාන්ධර්වයන් පවා අබිබවන බව සඳහන් කෙරෙයි. මෙම ප්‍රකාශය තහවුරු කෙරෙන සාධක වීණාවාදක කාසි වර්ගයෙහි අභිමුඛයේ නිරූපණය වන ලක්ෂණවලින් ලැබේ.

මේ කාසිවල අභිමුඛයෙහි රජු දේශීය වස්ත්‍රාභරණයෙන් සැරැසී පීඨයක් මත ඉන්දීය ක්‍රමයට හිඳ ඇකයේ තබාගත් වීණාවක් වයන අයුරු නිරූපණය වේ. ප්‍රතිමුඛයේ දෙවතාවිය (ලක්ෂ්මිය?) මෝර පුටුවක් (Muhra) මත හිඳ ගෙන දකුණතින් පාශයක් හා වමතින් සමෘද්ධි-ශෘංගයක් ගෙන සිටියි. දෙවතාවිය මුළුමනින්ම දේශීය වස්ත්‍රාභරණයෙන් සැරැසී සිටින ආකාර-යයි දැක්වෙන්නේ.

මේ වර්ගයද ප්‍රධාන අනුකොටස් දෙකකට බෙදා දැක්විය හැක. එක් කොටසකට අයත් කාසි ප්‍රමාණයෙන් වඩා විශාල වන අතර තුනී ය. ඒවායේ බර ද, ප්‍රමාණයෙන් කුඩා, එහෙත් වඩා ඝන වූ දෙවැනි අනුකොටසට අයත් කාසිවලට වඩා අඩු ය. පළමුවැනි අනුකොටසට අයත් කාසිවල බර සාමාන්‍යයෙන් ග්‍රෙන් 111 හා 117 අතර වෙයි. දෙවැනි අනුකොටසේ කාසිවල බර ග්‍රෙන් 119 – 121 අතර ප්‍රමාණයක් වේ. කලාත්මක අගයෙන් දෙවැනි කොටසට අයත් වන ඒවාට වඩා උසස් තත්ත්වයක් පළමුවැනි කොටසට වැටෙන වඩා තුනී කාසිවලට හිමි වෙයි. මේ තුනී කාසිවල අභිමුඛයේ රජු පා පුටුවක් මත පා තබාගෙන සිටුනා ආකාරයක් දැක්වෙන අතර, ප්‍රතිමුඛයේ දක්නට ඇති විශෙෂ ලක්ෂණයක් නම්, අන් ගුප්ත කාසිවල අනිවාර්යයෙන් වාගේ යෙදෙන සංකේතය දක්නට නොලැබීමයි. දෙවැනි අනුකොටසට අයත් වන කාසිවල අභිමුඛයේ පාපුටුව නොදැක්වෙන අතර, ප්‍රතිමුඛයේ සංකේතයක් ද යෙදී තිබේ. පා පුටුව සහිත කාසිවල ''සි'' යන අක්ෂරය ද සඳහන් වෙයි. මෙයින් සිඬ යන ආශිර්වාද පාඨය හැඟවෙතැයි අනුමාන

කෙරෙයි. මේ කාසි වර්ගයේ වට පාඨය ''මහාරාජාධිරාජ ශ්‍රී සමුද්‍රගුප්තඃ'' යනුවෙන් යෙදෙයි. ඉහත දක්වන ලද අනු කොටස් දෙකට අයත් වන මේ වර්ගයේ කාසිවල විෂ්කම්භය පිළිවෙළින් අඟල් ·75 හා ·85 වෙයි.

## vi. අශ්වමේධ වර්ගය

මෙතෙක් විස්තර කැරුණු කාසිවල නොපෙනෙන විශේෂතාවක් අශ්වමේධ වර්ගයට අයත් කාසිවල දක්නට ලැබෙයි. අනෙක් සියලුම කාසි වර්ගවල අභිමුඛයේ දක්නට ලැබෙන්නේ කිසියම් ස්වරූපයෙකින් නිරූපිත රජ රුවක් වුවද, මේ වර්ගයේ කාසිවල අභිමුඛයේ යෙදෙන්නේ අශ්වයකුගේ රූ සටහනකි. වෂ්ටන නම් ක්ෂත්‍රප පාලකයාගේ කාසියක් අභිමුඛයේ ද මෙකී සටහන දක්වා තිබීම සැලැකිය යුතු වේ. ආභරණවලින් තොර අසු වේදිකාවක් මත වූ යාග කණුවක් ඉදිරිපිට තේජාන්විත විලාසයකින් පෙනී සිටියි. ඇතැම් කාසිවල අසුගේ ගෙලෙහි පබළු වැලක් දක්වා ඇත්තේ ආගමික ග්‍රන්ථවල අශ්වමේධයට කැප කෙරෙන අසු රන් පබළුවලින් සරසනු ලැබේ යයි යන චාරිත්‍ර ක්‍රමය අනුගමනය කිරීම නිසා විය යුතුය. අශ්වයාගේ බඳ යටින් කාසියෙහි යොදා තිබෙන ''සි'' අක්ෂරය ''සිද්ධම්'' යන්න හැඟැවීමට යොදන ලද්දකැයි සලකනු ලැබේ.

මේ වර්ගයේ කාසිවල ප්‍රතිමුඛයේ යෙදෙන ස්ත්‍රී රූපය ද අන් කාසිවල යෙදෙන දේවතාවියගේ රුව නොව, ඒ වෙනුවට රජ මෙහෙසිය නිරූපණය කිරීම සඳහා යොදන ලද්දක් බව උගත්තු පිළිගනිති. අශ්වමේධ යාගය කරවන රජුගේ මෙහෙසිය ද ඒ යාගයෙහි වැදගත් කොටසක් ඉටු කරන හෙයින්, මේවායේ ප්‍රතිමුඛයේ දැක්වෙන මෙහෙසිය සමුද්‍රගුප්ත රජුගේ බිසොව වූ දත්තාදේවිය යැයි සිතිය හැක. ඇය වම් පසට මුහුණ ලා, දකුණතින් උර හිස මත රැඳවූ චාමරයක් හා වමතින් සළුවක් දරා සිටියි. ඇය සැරසී සිටින්නේ ද දේශීය ක්‍රමයට සාරියක් හැඳ ආභරණ පැළැඳීමෙනි. මේ කාසියේ අභිමුඛයේ එන වට පාඨය ''රාජාධිරාජඃ'', ''පෘථිවීවිජිත්ව දිවං ජයත්‍යාහෘත වාජිමේධඃ'' යනුවෙන් ද, ප්‍රතිමුඛ පාඨය ''අශ්වමේධ පරාක්‍රමඃ'' යනුවෙන් ද, යෙදී තිබෙනු දක්නා ලැබේ.

ඉහත දක්වන ලද පරිදි, මේ කාසි වර්ගය අනුකොටස් දෙකකට බෙදිය හැක. අභිමුඛයේ අශ්ව රූපය යෙදීමේ දී ඇතැමෙක ආභරණ රහිත ආකාරයෙන් යොදා තිබීමත්, තවත් සමහරෙක ගෙලවට හෝ ගෙලෙහි ලොම් අතර හෝ රන් පබළු වැලක් යොදා තිබීමත්, යනුවෙනි. මෙම වර්ගයට අයත් කාසිවල විෂ්කම්භය අඟල් ·8 – ·92 දක්වා වෙයි. බරින් ඒවායේ ප්‍රමාණය සාමාන්‍ය වශයෙන් ග්‍රෙන් 111 – 117 අතර වෙනස් වේ.

## ''කාච'' කාසි

''කාච'' යන නම සඳහන් මෙම කාසි වර්ගය ගුප්ත රජ පෙළපතේ කවුරුන් විසින් නිකුත් කරන ලද ද යන්න පිළිබඳව උගතුන් අතර විවිධ අදහස් පවතී. දැනට සොයා ගෙන තිබෙන ගුප්ත කාසි අතර ''කාච'' නම සඳහන් කාසි ඇත්තේ එකම වර්ගයකට එනම් දණ්ඩධර වර්ගයට වැටෙන ඒවා පමණි. මේ කාසි නිතර හමු වී ඇත්තේ පළමුවැනි චන්ද්‍රගුප්ත, සමුද්‍රගුප්ත හා දෙවැනි චන්ද්‍රගුප්ත යන රජුන්ගේ කාසි සමඟ ය. එහෙයින් මේ නාමය දරන කාසි නිකුත් කළ පාලකයා ගුප්ත පරපුරට අයත් පාලකයකු යයි සැලකිය හැකි ය. මුලදී ම මේ පිළිබඳව අදහස් දැක්වූ එඩ්වඩ් තෝමස් හා ජේම්ස් ප්‍රින්සෙප් සැලැකුවේ ''කාච'' නාමයෙන් කාසි නිකුත් කළ පාලකයා සටොත්කච ලෙස හඳුනාගත යුතු බවයි. එහෙත් මෙම පාලකයා විසින් කාසි නිකුත් නොකරන ලද බව දැන් සාමාන්‍ය පිළිගැනීම යි. ''කාච'' කාසියේ දැක්වෙන අභිමුඛයේ රූප සටහන් ද බොහෝ දුරට සමුද්‍රගුප්ත රජුගේ දණ්ඩධර වර්ගයේ අභිමුඛයේ දැක්වෙන රූප සටහන්වලට සමාන කම් දක්වයි. මේ අනුව, ස්මිත්, ප්ලීට් හා ඇලන් වැනි ශාස්ත්‍රඥයෝ මෙය සමුද්‍රගුප්ත රජුගේ ම කාසි වර්ගයක් ලෙස හඳුනා ගත යුතු බව සිතති. ඇලන් ගේ අදහස අනුව, ''කාච'' නමින් මුලදී කාසි නිකුත් කළ ගුප්ත පාලකයා සිය යුධ ජයග්‍රහණාදියෙන් අනතුරුව සමුද්‍රගුප්ත නම ගෙන එනමින් කාසි නිකුත් කළේ ය. තවත් සමහරු මේ කාසි ගැන මීට වෙනස් අදහසක් ඉදිරිපත් කරති. අලහබාද් ප්‍රශස්තියේ එන කරුණු අනුව, සමුද්‍රගුප්තගේ අධිරාජ පද

ප්‍රාප්තිය ගැන නොසතුටට පත්ව සිටි පිරිසක් ගැන සඳහන් වෙයි. පළමු දැක්වුණු මතය පිළිගන්නට නොකැමැති අය කියන්නේ මෙසේ නොසතුටට පත් සමුද්‍රගුප්තගේ සොහොයුරන් ඔහුට විරුඬව කැරලි ගසා තමන් අතර වැඩි මහලු සොහොයුරා ''කාච'' නමින් ඒ පදවියට පත් කරන ලදුව, මේ කාසි ඔහු විසින් නිකුත් කරන ලද බවයි. මේ පිළිබඳව තවත් අදහසක් පළ කරන ඩී. ආර්. භාණ්ඩර්කර් පවසන්නේ, රාමගුප්ත යනුවෙන් මූලාශ්‍රවල සඳහන් වන පාලකයාගේ නියම නම කාචගුප්ත වූ බවත්, එය වරදවා ලිවීම නිසා ගුප්ත පෙළපතෙහි රාම ගුප්ත නම් පාලකයකු ගැන අදහසක් වැරැදි ලෙස ඇති වී තිබෙන බවත් ය. මීට සමාන අදහසක් ඉදිරිපත් කරන කේ. පී. ජයස්වාල් ''රාම'' හා ''කාච'' යන නම් දෙක එකම ගුප්ත පාලකයකු සඳහා යෙදුණු බව පෙන්වා දීමට තැත් කරයි. ආර්. ඩී. බැනර්ජි ගේ මතය අනුව, මෙම කාසි සමුද්‍රගුප්ත රජු විසින් සටන්වල දී මිය ගිය සිය සෝයුරකු සිහිපත් කිරීම පිණිස නිකුත් කළ ස්මරණ පදක්කම් ලෙස හැඳින්විය හැකි වේ. ඒ අනුව කාසියෙන් අනුස්මරණය කෙරෙන්නේ අභිමුඛයේ නම සඳහන් ''කාච'' වන අතර, ප්‍රතිමුඛයේ ''සර්‍වරාජොච්ඡෙත්තා'' යන විරුද නාමයෙන් හැඳින්වෙන්නේ කාසිය නිකුත් කළ සමුද්‍රගුප්ත අධිරාජයා යි. එහෙත් මේ මතය ගැන සිය අදහස් පළ කරන අල්ටෙකාර් සමුද්‍රගුප්ත අධිරාජයා හැඳින්වීම සඳහා කිසිවිටෙක මේ විරුද නාමය භාවිත වී නැති බවත්, සමහර විට සමුද්‍රගුප්තට වඩා යුඬයෙහි දක්ෂයකු වීමට තමන් වෙත වූ අධිෂ්ඨානය නිසා ''කාච'' නම් පාලකයා මේ විරුදනාමය භාවිතා කරන්නට ඇති බවත් පවසයි. තවද, මෙබඳු ස්මරණ පදක්කම් නිකුත් කිරීමේ සිරිතක් හින්දු පාලකයන් අතර පැවැති බවට හෝ සමුද්‍රගුප්තට ''කාච'' නම් සොහොයුරකු සිටි බවට හෝ කිසිදු ස්ථිර සාක්ෂියක් සොයා ගත නොහැකි යයි පෙන්වා දෙයි.

''කාච'' පිළිබඳව මේ අයුරින් නොයෙක් අදහස් පළ කර ඇතත්, මෙම පාලකයා ගුප්ත පරපුරේ කවර තැනක් ගනී ද යන්න පිළිබඳව ස්ථිර නිගමනයකට බැසීමට ඉතිහාසඥයනට පුළුවන් වී නැත.

ඉහත සඳහන් කළ පරිදි, ''කාච'' කාසිවල අභිමුඛය බොහෝ දුරට සමුද්‍රගුප්තගේ රාජයෂ්ටි වර්ගයේ කාසිවල අභිමුඛයට සමාන ය. රජු වම් පැත්තට හැරී, දකුණතින් පූජාසනයක් මත සුවඳ ද්‍රව්‍යයක් වැනි යමක් දමන අයුරුත්, වමතින් රාජදණ්ඩක් දරා සිටින ආකාරයත් දැක්වෙයි. ''කාච'' කාසියේ දක්නට ඇති වෙනස නම් සමුද්‍රගුප්තගේ කාසියේ දක්නට ලැබෙන ගරුඬ ධ්වජය වෙනුවට චක්‍ර ධ්වජයක් යෙදී තිබීම යි. මෙහි වට පාඨය ''කාචො ගාමවිජිත්‍ය දිවං කර්‍මභිර් උත්තමෛර් ජයති'' යනුවෙන් සඳහන් වෙයි.

ප්‍රතිමුඛයේ දෙවතාවිය ආසනයක් මත හිඳිනවා වෙනුවට දකුණතින් පියුමක් ගෙන වම් පැත්තට හැරී සිටගෙන ඉන්නා ආකාරය දැක්වේ. ඇය වමතින් සමෘද්ධිශෘංගයක් ගෙන සිටින්නීය. ''සර්‍වරාජොච්ඡෙත්තා'' යන විරුද නාමය ද ප්‍රතිමුඛයෙහි සඳහන් වෙයි.

මේ වර්ගයට අයත් කාසි ද අනුකොටස් දෙකකට බෙද වෙන් කළ හැකි වෙයි. දෙවැනි අනු කොටසට අයත් කාසිවල දක්නට ලැබෙන වෙනස් ලක්ෂණ නම් අභිමුඛයේ රජු ඉදිරියේ චක්‍ර ධ්වජය වෙනුවට ගරුඬ ධ්වජයක් යොද තිබීම හා ප්‍රතිමුඛයේ දෙවතාවිය අත පියුම වෙනුවට පාශයක් වීමත් ය.

සාමාන්‍යයෙන් මේ අනුකොටස් දෙකට අයත් කාසිවල විෂ්කම්භය අඟල් ·75 – ·85 අතර වෙයි. බර ප්‍රමාණය ග්‍රෙන් 111 – 118 අතර වෙයි.

### දෙවැනි චන්ද්‍රගුප්තගේ කාසි

ගුප්ත පාලකයන් අතර විශාල සංඛ්‍යාවක් කාසි නිකුත් කරනු ලැබුයේ දෙවැනි චන්ද්‍රගුප්ත රජු විසින් බව පෙනේ. රන්කාසි හැරුණු කොට, රිදී හා තඹ කාසි නිකුත් කිරීම ආරම්භ කළ ගුප්ත පාලකයා වශයෙන් ද මොහු වැදගත්. මේ රජු විසින් රන් කාසි වර්‍ග අටක් නිකුත් කැරිණි. සිය පියා වූ සමුද්‍රගුප්ත විසින් නිකුත් කරන ලද කාසි වර්‍ග අතරින් ඔහු විසින් පවත්වා ගෙන යන ලදුයේ දණ්ඩධර හා ධනුර්ධර යන වර්‍ගද්වය පමණි. පරශු, වීණාවාදක හා අශ්වමෙධ යන වර්‍ග

දෙවන චන්ද්‍රගුප්ත රජුගේ කාසි අතර දක්නට නොලැබේ. ව්‍යාඝ්‍රපරාක්‍රම හා වීණාවාදක වර්ගයන් වෙනුවට ඒවා ආශ්‍රිතව අමුතුවෙන් සකස් කර ගන්නා ලද සිංහවික්‍රම හා සයන වර්ග නිකුත් කැරිණි. ඡත්‍ර, අශ්වාරෝහක, චක්‍රවික්‍රම, රජ හා රැජින යන වර්ග දෙවන චන්ද්‍රගුප්තගේ නව නිර්මාණයක් ලෙස හඳුන්වා දිය හැක. මෙසේ මේ රජු විසින් පහත සඳහන් වර්ගවලට අයත් රන් කාසි නිකුත් කරන ලදී.

i. දණ්ඩධර වර්ගය
ii. ධනුර්ධර වර්ගය
iii. සිංහවික්‍රම වර්ගය
iv. ඡත්‍ර වර්ගය
v. අශ්වාරෝහක වර්ගය
vi. සයන වර්ගය
vii. චක්‍රවික්‍රම වර්ගය
viii. රජ හා රැජින වර්ගය

**i. දණ්ඩධර වර්ගය**

දෙවැනි චන්ද්‍රගුප්ත රජුගේ කාසි අතර ඉතාම දුර්ලභ වර්ගය වන්නේ දණ්ඩධර වර්ගයයි. එම කාසි වර්ගය පිළිබඳව ද විවිධ මත දක්වෙයි. එය දෙවැනි චන්ද්‍රගුප්ත ගේ කාසි වර්ගයක් ලෙස පී. එල්. ගුප්ත අදහස් කළ අතර, ඒ මතයට විරුද්ධ අදහසක් පළ කරන ජබ්‍රා එය පළමුවන චන්ද්‍රගුප්ත රජු විසින් නිකුත් කරන ලද්දකැයි පවසයි. මේ පිළිබඳව මත භේදය ඇති වන විට ලැබී ඇත්තේ එකම කාසියක් පමණි. තවදුරටත් කාසි සොයාගන්නා තුරු යම් නිගමනයකට බැසීම අසීරු බව කිව යුතුය.

කාසියෙහි අභිමුඛයේ රජු වම් පැත්තට මුහුණ ලා සිට වමතින් රාජ දණ්ඩ දරන අතර දකුණතින් පූජාසනයක් මත සුවඳ ද්‍රව්‍යයක් දමන ආකාරය දක්වේ. මීට ඉහත විස්තර කරන ලද දණ්ඩධර කාසිවල මෙන්, මෙහි ද රජුගේ හිස වටා ප්‍රභාමාලාවක් වෙයි. ඇඳුම දිගු කබාය හා කලිසම ය. රජුගේ වමතට පහතින් චන්ද්‍රගුප්ත නාමය සිරස් අතට දක්වේ. වට පාඨය ''වසුධ – විජිතය – ජයත ත්‍රදව – පෘථිවීශ්වරඃ'' යනුවෙන් දක්වේ.

ප්‍රතිමුඛයෙහි දෙවතාවිය අසුනෙක හිඳ දකුණතින් පාශය ද වමතින් සමෘධිශෘංගය ද දරා සිටී. විරුද නාමය ''පරම භාගවත'' යනුවෙන් සඳහන් වෙයි. මේ විරුද නාමයෙන් දෙවැනි චන්ද්‍රගුප්ත රජු වෛෂ්ණවයකු වූ බව පෙනේ.

**ii. ධනුර්ධර වර්ගය**

දෙවැනි චන්ද්‍රගුප්ත රජුගේ කාසි අතර ඉතාම සුලභ කාසි වර්ගය මෙය වේ. මේ රජුගෙන් පසු ද ගුප්ත පාලකයන් විසින් ධනුර්ධර වර්ගයට අයත් කාසි අනුකරණය කළ බව පෙනේ. ගුප්ත අධිරාජ්‍යයේ පරිහානි සමයේ දී වටිනාකමින් අඩු ලෝහවලින් නිමවන ලද එකම කාසි වර්ගය ද මෙය වේ.

ධනුර්ධර කාසි ඒවායේ ලක්ෂණ අනුව ප්‍රධාන වශයෙන් දෙ කොටසකට බෙදිය හැක.

1. කොටස – මේ අනුකොටසට අයත් කාසිවල අභිමුඛයේ රජු කුෂාණ ඇඳුමෙන් සැරසී වම් පැත්තට හැරී වමතින් දුන්නත් දකුණතින් හීයත් දරා සිටී. ඉදිරියේ ගරුඬ ධ්වජය වෙයි. ''චන්ද්‍ර'' යන පාඨය වම් අත පහළින් සිරස් ව දක්වේ. වටපාඨය, ''දෙව ශ්‍රී මහාරාජාධිරාජ ශ්‍රී චන්ද්‍ර ගුප්ත'' යනුයි.

ප්‍රතිමුඛයේ දෙවතාවිය (ලක්ෂ්මිය?) ආසනයෙක හිඳ ගෙන ඉන්දිය වස්ත්‍රාභරණයෙන් සැරැසී වමතින් ශෘංගය හෝ පියුමක් හෝ දරා සිටින අතර, දකුණතෙහි පාශය වෙයි. අන් සමහරෙක දකුණතින් කාසි ඇද හැලෙන ආකාරයක් නිරූපණය වේ. විරුද නාමය "ශ්‍රී වික්‍රමඃ" යන්නයි.

මෙම කාසි රජුගේ "චන්ද්‍ර" යන නාමය දක්වා තිබෙන අයුරින් යළිද අනුකොටස්වලට බෙදිය හැක. රජුගේ නාමය වමත යට, දුන්න හා දුනු දිය අතර, දුනු දියට බාහිරව යනාදී වශයෙනි. ඇතැම් විට "චන්ද්‍ර" පාඨය අභිමුඛයේ යොද නැති අවස්ථාවෝද වෙති.

2. කොටස – මෙම අනුකොටසට වැටෙන කාසිවල අභිමුඛය ඉහත විස්තර කළ අනු-කොටසට අයත් කාසිවල අභිමුඛයට සමාන වේ. එහෙත් රජු දක්වා ඇත්තේ විවිධ ඉරියව් වලිනි. කුෂාණ ඇඳුම වෙනුවට රජු ඇඳ ඇත්තේ ඉන්දිය ධෝතියයි.

ප්‍රතිමුඛයේ ද යම් යම් වෙනස් කම් ඇත. මෙහි දෙවතාවිය හැමවිටම හිඳ ගෙන සිටින්නේ පියුමක් මතයි. වමතින් පියුමක් දරා සිටියි. වමත හිණ හෝ කලවා මත රඳවා ඇත. මේ අයුරින් බලත්ම, පළමුවන අනුකොටසේ කාසිවල විදේශීය ආභාසය තරමක් දුරට හුවා දක්වෙන අතර දෙවැනි අනුකොටසේ එම බලපෑම් බෙහෙවින් ඌන වී ගොස් ඇති බව පෙනේ.

දෙවැනි අනුකොටසට අයත් කාසිද යළි නොයෙක් ප්‍රභේදයන්ගෙන් යුක්ත බව පෙනේ රජු දකුණු පැත්ත බලාගෙන සිටීම, රජු කසයක් ගෙන සිටීම නැතහොත් කඩුවක් දරාසිටීම දෙවතාවිය ලලිතාසන ක්‍රමයට එක් පයක් පහත හෙළා සිටීම, ආදී වශයෙනි.

මෙම කාසිවල විෂ්කම්භය අඟල් ·75 – ·9 අතර වේ. ඒවායේ බර ග්‍රේන් 121, 124 හා 127 යන ප්‍රමාණ තුනකින් යුක්ත වේ. මින් ග්‍රේන් 121 බරින් යුත් කාසි වඩා බහුලය.

**iii. සිංහවික්‍රම වර්ගය**

මෙයද දෙවැනි චන්ද්‍රගුප්ත රජුගේ කාසි අතර තරමක් දුරට සුලභව දක්නට ලැබෙන වර්ගයකි. අභිමුඛයේ රජු දුනු හී හෝ කඩුවක් හෝ මඟින් සිංහයකුට පහර දෙන අයුරු දක්වේ. ප්‍රතිමුඛයේ දේවතාවිය සිංහයකු මත හිඳී. ඇය අතකින් පියුමක් දරා සිටින ආකාරය පෙන්නුම් කෙරෙයි. මෙ කාසි වර්ගයද සිංහයාට පහර දීම, සිංහයා පාගාගෙන සිටීම හා සිංහයා පසු බා සිටීම යන අභිමුඛයේ රූප සටහනේ විවිධත්වය අනුව අනුකොටස් තුනකට බෙදිය හැක.

1. අනුකොටස – (සිංහයාට පහර දීම)

අභිමුඛයේ රජු වමට හෝ දකුණට හැරී ආලීඪ ඉරියව්වකින් සිටගෙන දුන්නකින් සිංහයා වෙත හීයක් විදිනු දක්වෙයි. රජුගේ උඩුකය නිරුවත්ව ඇති අතර ඉහටිය හා කලවා පමණක් වැසෙන පරිදි ඉන්දිය ක්‍රමයට වස්ත්‍රයක් ඇඳ සිටී. රාජකීය ආභරණ පැළඳ ඇත. වට පාඨය "නරෙන්ද්‍ර චන්ද්‍රඃ ප්‍රථිතරණො රණො ජයත්‍යජෙයො භුවි සිංහ වික්‍රමඃ" යනුවෙනි, දක්වෙන්නේ.

ප්‍රතිමුඛයේ දෙවතාවිය පාශයක් හා පියුමක් අතැතිව සිංහයකු ආසනය කොට හිඳී. විරුද නාමය "සිංහවික්‍රමඃ" යන්නයි.

2. අනුකොටස – (සිංහයා පාගාගෙන සිටීම)

අභිමුඛයේ රජු ධෝතියක් හැඳ හෝ කාබයකින් සැරැසී හෝ, එක් පයක්න් සිංහයාගේ උදරය පාගාගෙන හීයක් විදිනු දක්වෙයි.

ප්‍රතිමුඛයේ දෙවතාවිය සිංහයකු මත හිඳ දකුණතින් පාශයක් ද වමතින් පියුමක් හෝ සමෘඞිශෘංගයක්ද දරා සිටියි. ඇතැම් විට වමතේ කිසිවක් නොදක්වෙයි.

ඉහත කී අනුකොටස් දෙකට ම අයත් කාසිවල රජුගේ ඉරියව්ව, පාඨයන් දක්වා ඇති අන්දම, දේවතාවිය දෙඅතේ දරා සිටින දේ, සිංහයා දක්වෙන අයුරු ආදී වශයෙන් ප්‍රභෙද රාශියක් කෙරෙහි නාණක විද්‍යාඥයන් ගේ අවධානය යොමු වී ඇත.

3. අනුකොටස – (සිංහයා පසු බා සිටීම)

තුන් වන අනුකොටසට අයත් කාසිවල ද පෙර සඳහන් කළ මේ වර්ගයේ කාසිවල ඇති අයුරින් ම සකස් වූ අභිමුඛයේ හා ප්‍රතිමුඛයේ සටහන් දක්නා ලැබේ. වෙනසකට ඇත්තේ අභිමුඛයේ සිංහයා රජු වෙතින් පසු බා සිටීම පමණෙකි. පාඨය ''මහාරාජාධි රාජ ශ්‍රී චන්ද්‍රගුප්තඃ'' හෝ ''දෙවශ්‍රී මහාරාජාධිරාජඃ'' හෝ වේ.

## iv. ඡත්‍ර වර්ගය

දෙවැනි චන්ද්‍රගුප්ත රජුගේ නව කාසි වර්ගයෙකි. අභිමුඛයේ රජු වම් පැත්තට හැරී සිට පූජාසනයක් මත සුවඳ ද්‍රව්‍ය දමන අයුරු දක්වෙන හෙයින්, මෙය සමුද්‍රගුප්ත රජුගේ දණ්ඩධර වර්ගයට සමාන වෙතත්, වමතින් එබඳු දණ්ඩක් දරා නොසිටී. මෙහි ඒ වෙනුවට හිණෙහි එල්බෙන කඩුවේ මුදුන මත අත තබා ගෙන සිටී. ඇඳුම ධෝතිය හෝ කලිසමයි. ඔටුන්නක් හෝ වෙන යම් හිස් වැස්මක් පැළඳ සිටියි. මේ කාසියෙහි වන විශෙෂාංගය නම් රජුගේ හිස මතින් ඡත්‍රයක් අල්ලාගෙන සිටින වාමනයකු පිටුපසින් දක්වා තිබීම යි. ඇතැම් විට මොහු කබායක් ද උස් පාවහන් ද ඇඳ පැළැඳ සිටියි. සමහර කාසිවල මෙම රූපය ස්ත්‍රී රූපයෙකි.

ප්‍රතිමුඛයෙහි ලක්ෂ්මිය යැයි හඳුනාගත හැකි දෙවතාවියගේ රූපය පියුමක් මත හිඳ දකුණතින් පාශයක් හා වමතින් පියුමක් දරා සිටින ආකාරයෙන් දක්වේ.

මේ වර්ගයට අයත් කාසි ඒවායේ දක්වෙන වට පාඨය අනුව අනුකොටස් දෙකකට බෙදිය හැක. 1. ''මහාරාජාධිරාජ ශ්‍රී චන්ද්‍රගුප්තඃ'' යන ගද්‍ය පාඨය දක්වෙන කාසි හා 2. ''ක්ෂිතිම-වජිත්‍ය සුචරිතෛර්දිවං ජයති වික්‍රමාදිත්‍යඃ'' යන පද්‍ය පාඨය සහිත කාසි යනුවෙනි.

මේවායෙහි දෙවතාවිය, ඉදිරිපස බලාගෙන නැඟිට සිටින ආකාරය, පීඨයක් මත හිඳින ආකාරය හා ගමන් කරන ආකාරය යන ආදී වශයෙන් විවිධ ඉරියව්වලින් දක්වා තිබෙනු පෙනේ.

මේ කාසිවල විෂ්කම්භය අඟල් ·75 – ·85 අතර වන අතර, ඒවායේ බර ග්‍රෙන් 121 – 124 අතර වෙයි.

## v. අශ්වාරෝහක වර්ගය

දෙවැනි චන්ද්‍රගුප්ත රජු විසින් නිකුත් කරන ලද තවත් නව කාසි වර්ගයකි. මොහු දක්ෂ අශ්වාරෝහකයකු වූ බව මේ කාසියෙන් පෙනී යයි. මීට ප්‍රථම ඉන්දියාවේ අශ්වාරෝහක රූපයක් සහිත කාසි නිකුත් කර ඇත්තේ ඉන්දු – ග්‍රීක හා සිතියානු (ශක) පාලකයන් විසිනි. ඇතැම් විට ඒ කාසිවල ආභාසය ලැබ අශ්වාරෝහයකකු වශයෙන් තමන් ලබා සිටි නිපුණත්වය දක්වීම සඳහා මේ කාසි වර්ගය නිකුත් කළා විය හැක. ගුප්ත රජුන්ගේ සමයේ දියුණු තත්ත්වයකට පත් වූ ඉන්දීය මූර්ති කලාවේ සම්භාවනීය ලක්ෂණ මේ කාසිවල දක්වා තිබෙන රූ සටහන්වලින් පැහැදිලි වෙයි.

අභිමුඛයේ හිස වටා ප්‍රභාමාලාවක් සහිතව රජු ධෝතිය හැඳ සියලු රාජ ආභරණයෙන් සැරැසී ආභරණයෙන් අලංකෘත අසකු අරා සිටිනු පෙනේ. අසු සමහර කාසියක දකුණු පැත්තට හැරී සිටින අයුරින් ද, තවත් සමහරෙක වම් පසට හැරී සිටින අයුරින් ද, දක්වා තිබේ. ඇතැම් කාසියක චන්ද්‍රවංක සටහනක් ද වේ. වට පාඨයේ ''පරමභාගවත'' යන්න සඳහන් වීමෙන් මේ පාලකයා වෛෂ්ණව භක්තිකයකු වූ බව පෙනේ.

ප්‍රතිමුඛයෙහි දෙවතාවියක ආසනයක් මත හිඳගෙන දකුණතින් පාශයක් ද වමතින් පියුමක් ද දරා සිටී. විරුද නාමය වශයෙන් යෙදී ඇත්තේ ''අජිතවික්‍රමඃ'' යන පදයයි.

මේ වර්ගයට අයත් වන කාසි ද රජු වම් පැත්තට මුහුණ ලා සිටින හා දකුණු පැත්තට මුහුණ ලා සිටින යනුවෙන් කොටස් දෙකකට බෙදිය හැකි අතර, රජු ආයුධ දරා නොසිටීම, දුන්නක් දැරීම, දුන්නක් හා කඩුවක් දැරීම ආදී වශයෙන් ප්‍රභෙද කිහිපයක් ද වෙයි.

මේ වර්ගයට අයත් කාසිවල විෂ්කම්භය අඟල් ·75 හා ·8 අතර වෙයි. බර ප්‍රමාණයෙන් ඒවා ග්‍රෙන් 121 හා 127 අතර වෙනස් වේ.

## vi. සයන වර්ගය

මේ සමුද්‍රගුප්ත රජුගේ වීණාවාදක වර්ගය අනුගමනයෙන් සකස් කර ගන්නා ලද කාසි වර්ගයක් බව පෙනේ.

මේ වර්ගයට අයත් කාසිවල අභිමුඛයෙහි යෙදෙන රජ රුව උස්, පිටි ඇන්දක් සහිත යහනක් මත හිඳගෙන ඔසවා ගත් එක් අතකින් පියුමක් දරා අනෙක් අත සෝපාවේ කෙළවරින් තබාගෙන ඉන්නා ආකාරයෙන් දක්වා තිබේ. සෝපාවට පහතින් ''රූපාකෘති'' යන විරුද නාමයක් දක්වේ. වට පාඨය ''දෙව ශ්‍රී මහාධිරාජ ශ්‍රී චන්ද්‍රගුප්තස්‍ය වික්‍රමාදිත්‍යස්‍ය'' යන්න යි.

ප්‍රතිමුඛයෙහි දෙවතාවිය අසුනක් අරා හිඳ පියුමක් මත පා තබා සිටින ආකාරයෙන් නිරූපිත ය. ඇගේ වම් අතෙහි පියුමෙකි. දකුණත හිස්ව අත්ල විහිදුවා දක්වෙයි.

අභිමුඛයෙහි ''රූපාකෘති'' යන විරුද පදය දක්නට නොලැබීම, ප්‍රතිමුඛයේ දෙවතාවියගේ දකුණු අතෙහි පාශයක් තිබීම, ''පරමභාගවත'' යන විරුද පදය ප්‍රතිමුඛයෙහි යෙදී තිබීම යන ලක්ෂණ අනුව මේ කාසි වර්ගයේ ද ප්‍රභෙද කිහිපයක් දක්නට ලැබෙයි.

මේ වර්ගයට අයත් කාසිවල විෂ්කම්භය අඟල් ·8 හා ·85 අතර වෙයි. මේ කාසි සාමාන්‍ය-යෙන් ග්‍රෙන් 121 ක් පමණ බරය.

## vii. චක්‍රවික්‍රම වර්ගය

මේ දෙවැනි චන්ද්‍රගුප්ත රජුගේ විෂ්ණු භක්තිය මැනැවින් පැහැදිලි කෙරෙන කාසි වර්ගයෙකි. මේවායේ විශෙෂ ලක්ෂණයක් ලෙස සඳහන් කළ යුත්තේ ඒ කාසි නිකුත් කළ පාලකයාගේ නම සඳහන් නොවීමයි. එසේ වුවද, නම සඳහන් කෙරෙන දෙවැනි චන්ද්‍රගුප්තගේ අනෙක් වර්ගවලට අයත් කාසිවල යෙදෙන ''සිංහවික්‍රම'', ''අජිතවික්‍රම'' වැනි විරුද නාමයන් සේ මෙහි ද, ඊට ආසන්න ස්වරූප ඇති ''වික්‍රමඃ'' යන පදය විරුදය වශයෙන් යෙදී තිබීමෙන්, මේ වර්ගයට අයත් කාසි නිකුත් කරන ලද්දේ ද එම පාලකයා විසින් ම යයි නිගමනය කළ හැකි වෙයි. දෙවැනි චන්ද්‍රගුප්ත රජු වෛෂ්ණවයකු වූ බව ද පැහැදිලි කරුණකි. (මේ පාලකයා විසින් පංජාබයේ බිස් නම් ඉන්දු නදී ශාඛාව අසබඩ විෂ්ණුපාද තීර්ථයෙහි ගරුඩධ්වජයක් පිහිටුවා ලූ බව කියැවෙයි.)

මේ වර්ගයේ කාසිවල චක්‍ර පුරුෂ වශයෙන් දක්වෙනුයේ විෂ්ණු දෙවියාගේ සුදර්ශන චක්‍රය මනුෂ්‍යත්වාරොපණයෙන් ඉදිරිපත් කිරීමෙකි. විෂ්ණු, ශිව ආදීන් ගේ ආයුධ මනුෂ්‍යත්වාරොපණ-යෙන් නිරූපණය කිරීමේ දී එම රූප ''ආයුධපුරුෂ'' යන නමින් හඳුන්වනු ලැබෙයි. චක්‍රපුරුෂ ද එබඳු ආයුධ පුරුෂ කෙනෙකි. කාසියෙහි දක්වෙන රූපයෙහි රජු චක්‍රපුරුෂගෙන් වරම් ලැබීමක් ඉදිරිපත් කෙරෙයි.

කාසියෙහි අභිමුඛයෙහි අණ්ඩාකාර චක්‍රයක් ඇතුළත සිටින චක්‍රපුරුෂ (දෙවි) දක්වේ. ධෝතියකින් සැරැසී උඩුකය නොවසා ඔටුන්නක් හා අනෙක් ආභරණ පැළඳ ගෙන දකුණතින් ගදවක් හා ඉදිරියට දික් කළ වම් අත්ල මත වටකුරු ද්‍රව්‍ය තුනක් තබාගෙනයි, රූපයේ චක්‍ර පුරුෂයා

දක්වෙන්නේ. ඔහු ඉදිරිපසින් රජු ඒ දෙස බලාගෙන චක්‍ර පුරුෂ විසින් වම් අත්ල මත තබාගෙන සිටින ප්‍රසාදයන් ලබාගනු පිණිස තම දකුණත දික් කරගෙන සිටියි. රජු කබායෙකින් හා කලිසමකින් සැරැසී සිටී. මේ චක්‍ර පුරුෂයාගේ වම් අත්ල මත තබා ඇති වටකුරු වස්තුත්‍රය ප්‍රභු ශක්ති, උත්සාහ ශක්ති හා මන්ත්‍ර ශක්ති යන තෙවැදැරුම් රාජකීය බලයන් වශයෙන් හැඳින්විය හැකැයි මතයෙකි.

ප්‍රතිමුඛයේ ලක්ෂ්මී දෙවතාවිය ඉන්දීය වස්ත්‍රාභරණයෙන් සැරැසී පියුමක් අරා හිඳියි. දකුණත යමක් වෙත දික් කෙරෙන අතර වම් අත පහළට එල්බ දිගු නටුවක් සහිත පියුමක් දරා සිටියි. පාඨය ''චක්‍රවික්‍රමඃ'' යනුවෙන් සඳහන් වේ.

### viii. රජ හා රැජින වර්ගය

මෙය දෙවැනි චන්ද්‍රගුප්තගේ කාසි අතර ඉතා විරල වූ වර්ගයයි. පළමුවැනි චන්ද්‍රගුප්තගේ යයි සැලැකෙන කාසියෙහි මෙන් නොව, මෙහි රජු හා රැජින යහනක් මත හිඳගෙන ඉන්නා අයුරු දක්වේ. එද දක්නට ලැබෙන්නේ කාසියේ ප්‍රතිමුඛයෙහි ය. අභිමුඛයේ හිස වටා ප්‍රභා මාලාව සහිත රජ දිගු කබාය හා කලිසමක් හැඳ වම් දෙසට මුහුණ ලා සිට ගෙන වම් අතින් පූජාසනායක් මත සුවඳ ද්‍රව්‍ය දමමින් හා දකුණතින් රාජදණ්ඩ දරමින් සිටියි. ගරුඩධ්වජ ස්තම්භයක් දපිටුපසින් වේ. වටපාඨය ''පරම භාගවත.........ශ්‍රී චන්ද්‍රගුප්තඃ'' යනු යි.

ප්‍රතිමුඛයේ ප්‍රභා මාලාවක් සහිත රජු හා රැජින උනුන් දෙස මුහුණ ලා සෝපාවක් මත හිඳින අයුරු දක්වෙයි. ලලිතාසන ඉරියව්වෙන් දක්වා ඇති රජුගේ වම් පයත් රැජිනගේ දකුණු පයත් පහතට එල්බී ඇත. රජු රැජිනට යමක් දෙන බවක් පෙනේ. ඇතැම් විට පළමුවන චන්ද්‍රගුප්ත ගේ කාසියේ දක්වෙන පරිදි ම මෙය සින්ධූරදනියක් වැනි දෙයක් විය හැක.

### දෙවැනි චන්ද්‍රගුප්තගේ රිදී කාසි

දෙවැනි චන්ද්‍රගුප්ත රජු විසින් තම අධිරාජ්‍යයේ සමහර ප්‍රදේශවල රිදී තඹ කාසි ද නිකුත් කළ බැව් පෙනේ. මාල්වා, ගුජරාට කඨියවාර යන නැඟෙනහිර ප්‍රදේශයන් මොහු විසින් සිය පාලනය යටතට ගැනීමෙන් පසු, බටහිර ක්ෂත්‍රප රජවරුන් විසින් එම ප්‍රදේශවල අර්ධද්‍රම්ම (Hemi-drachm) නම් රිදී කාසි භාවිතයට පත් ව තුබුණු බව පෙනී ගියෙන්, තමන්ගේ පාලනය යටතේ ද එබඳු ම රිදී කාසි නිකුත් කරන ලදි. චන්ද්‍රගුප්ත රජුගේ රිදී කාසි බටහිර ඉන්දියාවේ ප්‍රදේශවලට පමණක් සීමාවීමෙන් පෙනී යනුයේ මොහු තම අධිරාජ්‍යයට අයත් මුල් ප්‍රදේශ තුළ රන්කාසි පමණක් මිස රිදී කාසි භාවිතයට පත් කිරීමට අදහස් නොකළ බවයි. අයොධ්‍යාවෙන් හා බිහාරයේ සුල්තාන්ගංජ් පෙදෙසෙන් රිදී කාසි දෙකක් හමුවී ඇතත්, ඒවා යම් යම් අය විසින් මේ පෙදෙස්වලට රැගෙන ආ කාසි බවට සැකයෙක් නැත. දෙවැනි චන්ද්‍රගුප්ත රජු විසින් ඉහත සඳහන් ප්‍රදේශවල රිදී කාසි නිකුත් කරන ලද්දේ සිය රාජ්‍ය සමයේ අවසාන භාගයේ දී විය යුතු ය. එම බටහිර විජිතයන් ගුප්ත පාලනය යටතට පත් වූයේ මේ රජුගේ රාජ්‍ය සමයේ අවසාන කාල සීමාව ආසන්නයේ හෙයිනි. මේ රජුගේ රන්කාසි තරමටම සුලභ නොවන මේ රිදී කාසි අතර පැරැණිම කාසිය ගුප්ත වර්ෂ 90 හෙවත් ක්‍රි. ව. 409 ට පමණ වැටේ.

චන්ද්‍රගුප්ත රජුගේ රිදී කාසි බටහිර ඉන්දියාවේ ක්ෂත්‍රප කාසි අනුකරණයෙන් නිපදවා ඇති බව ඉහත සඳහන් විය. ඒවායේ විෂ්කම්භය අඟල් ·5 – ·55 අතර වේ. ග්‍රෙන් 26·5 හා 31 අතර බර ඇති මේ කාසි ක්ෂත්‍රප කාසිවලට බරින් ද බෙහෙවින් සමාන වේ.

අභිමුඛයේ දක්වෙන රජුගේ හිස ක්ෂත්‍රප කාසිවල රජ හිස අනුකරණය කෙරෙයි. දිගු නාසය, දිගුකෙස්, උඩු රැවුළ හා කර පටිය දක්වෙන්නේ ද ක්ෂත්‍රප පාලකයන් ගේ කාසිවල ඒ ඒ අංග දක්වෙන අයුරින්ම ය. දිනය යෙදීමේදී ද ඒ ක්‍රමයම අනුගමනය කෙරේ. රාජ ශීර්ෂය පිටුපසින් දිනය දක්වෙන අතර, දූෂිත ග්‍රීක පාඨයක් ද යෙදෙයි. වෙනසකට ඇත්තේ ක්ෂත්‍රප කාසිවල භාවිත වූ ශක වර්ෂය වෙනුවට ගුප්ත වර්ෂය භාවිත කිරීම පමණකි.

ප්‍රතිමුඛයේ පැරණි ක්ෂත්‍රප කාසිවල දක්නට ලැබෙන කාසියේ පහළින් යොද ඇති තරංග රේඛාව, මුදුනෙහි තිත් සමූහය හා චන්ද්‍ර වංකය යන සටහන් එලෙසින් ම යොද ගෙන තිබෙන අතර, කාසිය මැද යෙදුණු ශිඛරත්‍රයකින් සැකැසුණු පර්වත සටහන වෙනුවට ගරුඬ රූපයක් යෙදේ. තොමස්, ස්මිත් වැනි අය මේ මොණර රුවකැයි කියතත්, ඒ ගරුඬ පක්ෂියකුගේ රූපයක් බව කියන අල්ටෙකාර්ගේ මතය වඩා පිළිගත හැකිය. මේ බව දෙවැනි චන්ද්‍රගුප්ත රජුගේ තඹ කාසිවල යොද තිබෙන ගරුඬ පක්ෂි රූපයෙන් ද තහවුරු වේ. මේ පාලකයා විෂ්ණු භක්තිකයකු වූ බව ඔහු නිකුත් කළ රන් කාසිවල යෙදෙන ගරුඬධ්වජයෙන් ද, ''පරමභාගවත'' යන පාඨයෙන් ද නිශ්චිත ලෙස දත හැක. කෙසේ වුවද, මේ රිදී කාසිවල ගරුඬ රූපය ඔහුගේ තඹ කාසිවල මෙන් සත්ත්ව – මනුෂ්‍ය (පක්ෂියකුගේ කඳ හා මිනිස් හිස සහිත) රූපාකාරයෙන් නොව, හුදෙක් සත්ත්ව රූපයෙන් ම දක්වේ. ක්ෂත්‍රප කාසිවල මෙන් ගුප්ත පාලකයාගේ රිදී කාසිවලද ප්‍රති-මුඛයේ වටපාඨයක් යෙදී ඇත. එහි රජුගේ නාමය ද විරුද නාමයන් ද සමඟ පරම්පරා නාමය හෝ ලබ්ධිය හෝ දක්වෙයි.

ප්‍රතිමුඛයේ යෙදෙන වට පාඨය පිළිබඳ වෙනස් කම් නිසා දෙවැනි චන්ද්‍රගුප්ත රජු ගේ රිදී කාසි කොටස් දෙකකට බෙදන්නට පුළුවන. ඉන් පළමුවැනි කොටසට අයත් වන කාසි ලෙස ''වික්‍රමාදිත්‍ය'' යයි ඔහුගේ පරම්පරා නාමය හා ඔහුගේ ලබ්ධියඃහෝ දක්වෙන ඒවා ගිණිය හැක. දෙවැනි කොටසට අයත් කාසිවල ඔහුගේ ලබ්ධිය නො දක්වෙන නමුදු කුල නාමය දක්වෙයි. මේ දෙවැනි වර්ගයේ ඔහු සිය පරම්පරා නාමය අත්හැර ''පරමභාගවත'' යනුවෙන් සිය වෛෂ්ණව භක්තිය පමණක් දක්වා තිබේ. මේ වර්ගද්වය අතරින් කවරක් මුලින් නිකුත් කරන ලදදැයි නිගමනය කිරීම දුෂ්කර ය. දෙ කොටසම එක විට ම වාගේ භාවිතයට පත් වුණු බවයි කල්පනා කළ හැක්කේ. දෙකොටසටම අයත් කාසි සුලභ ලෙස හමු නොවන අතර, දෙවැනි කොටසට **අයත්** කාසි වඩාත් දුර්ලභ ය.

පළමුවැනි කොටසට අයත් කාසිවල අභිමුඛයේ රජුගේ උඩුකය දක්වේ. එහි දිගු කෙස් ගෙල දක්වා වැටෙන සේ නිරූපණය වෙයි. හිසට පිටුපසින් ක්ෂෙත්‍රයෙහි නිකුත් කළ වර්ෂය යෙදී තිබේ. ප්‍රතිමුඛයේ මැද කොටසේ පියාපත් විහිදුවා ගෙන සිටින ආකාරයෙන් ගරුඬ රූපය නිරූපණය වේ. උඩු කොටසෙහි දකුණු පස සලකුණක් වෙයි. වට පාඨය යෙදෙන්නේ ''පරමභාගවත මහාරාජාධිරාජ ශ්‍රී චන්ද්‍රගුප්ත වික්‍රමාදිත්‍ය'' යනුවෙනි.

දෙවැනි කොටසට අයත් කාසිවල අභිමුඛයේ රූප සටහන් ඉහත විස්තර කරන ලද පළමු-වන කොටසට අයත් කාසිවල මෙනි. ප්‍රතිමුඛයේ ද රූප සටහන් සමාන වෙතත්, වටපාඨය ''ශ්‍රී ගුප්ත කුලස්‍ය මහාරාජාධිරාජ ශ්‍රී චන්ද්‍රගුප්ත වික්‍රමාදිත්‍යස්‍ය'' යනුවෙන් වෙනස්ව යෙදෙයි.

### දෙවැනි චන්ද්‍රගුප්තගේ තඹ කාසි

ගුප්ත පරපුරේ ප්‍රථම වරට තඹ කාසි නිකුත් කළ අධිරාජයා දෙවැනි චන්ද්‍රගුප්ත යයි සැලැකිය හැක. බෙංගාලයේ බර්ඩ්වාන් දිස්ත්‍රික්කයෙන් සොයා ගනු ලැබූ තඹ කාසි දෙකක් සමුද්‍රගුප්තගේ යයි ආර්. ඩී. බැනර්ජි අදහස් කරයි. මෙහි අභිමුඛයේ ගුරුළු රුවත් ඊට ඉහළින් ''සමුද්‍ර'' යන නාමයත් සඳහන් වන බව කියැවේ. එසේ වුව ද, මෙම කාසි ප්‍රකාශයට පමුණුවා නොමැති හෙයින් ඒ පිළිබඳව නිසැක නිගමනයකට එළැඹිය නොහැකි බව අල්ටෙකාර් පෙන්වා දෙයි. දෙවැනි චන්ද්‍රගුප්තගෙන් පසු රාමගුප්ත හා පළමුවැනි කුමාරගුප්ත යන රජවරුන් විසින් ද තඹ කාසි නිකුත් කරන ලද නමුත්, ඒවා ද ලැබී ඇත්තේ ඉතා විරල වශයෙනි. හරිගුප්ත නම් රජකුගේ එකම එක තඹ කාසියක් ලැබී ඇති නමුත්, ඔහු අධිරාජ්‍ය ගුප්ත පරපුරට අයත් පාලකයකු ලෙස ගණන් ගනු නොලැබේ.

තඹ කාසි දුර්ලභ වීමට හේතුව දෛනිකව කැරෙන සුළු ගනුදෙනුවල දී මූලික වශයෙන් ඉන්දිය සමාජයේ පැවැති බඩු හුවමාරු කිරීම හෝ විනිමය මාධ්‍යයක් වශයෙන් කවඩි (හින්දි-කෞරි) භාවිතය හෝ පැවැති හෙයිනැයි සිතිය හැක. පාටලීපුත්‍ර නගරයේ වෙළෙඳ ස්ථානයන්හි තමන් විසින් දක්නා ලද්දේ කවඩි පමණෙකැයි ෆාහියන් සඳහන් කරයි.

චන්ද්‍රගුප්තයන් ගේ තඹ කාසි, මීට ඉහත විස්තර කරන ලද රිදී කාසි මෙන් නොව, බොහෝ දුරට අනුකරණයෙන් තොර වූ කාසි වර්ගයකි. කුෂාණ කාසිවල හෝ කෞශාම්බි, අයොධ්‍යා වැනි ගෝත්‍රික කාසිවල හෝ දක්නට ලැබෙන කිසිදු ලක්ෂණයක් මෙහි අනුකරණයෙන් යොදා නැත. එහෙත් චන්ද්‍රගුප්තයන්ගේ රන් කාසිවල ආභාසය මේවායේ දක්නට ලැබෙයි. ඡත්‍ර හා ධනුර්ධර වර්ගවල අභිමුඛයේ ලක්ෂණයන්ට සමාන ලක්ෂණ මේ කාසිවල අභිමුඛයේ යොද ඇත. මේ කාසිවල සාමාන්‍ය වශයෙන් දක්නට ලැබෙන ගරුඬ රුව හා ඊට යටින් වන පාඨය අනෙක් කාසි වර්ගවල දක්නට නොලැබෙන ලක්ෂණයෙකි.

### i. ඡත්‍ර වර්ගය

අභිමුඛයෙහි රජු වම් පසට මුහුණ ලා සිටින අතර වාමනයකු විසින් ඔහු සඳහා ඡත්‍රයක් උසුලා ගෙන සිටින ආකාරය දක්වෙයි. ප්‍රතිමුඛයේ පියාපත් විහිද ගෙන සිටින ආකාරයෙන් මිනිස් හිස සහිත ගරුඬ රුවක් කාසියෙහි උඩු භාගයෙහි දක්වෙන අතර, පහළ කොටසෙහි ''මහාරාජ ශ්‍රී චන්ද්‍රගුප්තඃ'' යන සරල පාඨය සඳහන් වෙයි.

මෙම කාසි වර්ගය ප්‍රතිමුඛයේ නිරූපණය වන ගරුඬ රූපයේ මිනිස් අත් සහිත හා රහිත යනුවෙන් අනුකොටස් දෙකකට බෙද දක්විය හැක. මින් පළමුවන අනුකොටසට අයත් කාසි අඟල් ·85 විෂ්කම්භයෙන් හා ග්‍රෙන් 57·5 බර ප්‍රමාණයෙන් ද, දෙවැනි අනුකොටසට අයත් කාසි විෂ්කම්භයෙන් අඟල් ·75 හා බරින් ග්‍රෙන් 64·4 ක් වෙයි.

### ii. රාජරූප වර්ගය

අභිමුඛයේ දකුණත ඔසවා සිට ගෙන වම් පස බලා සිටුනා ආකාරයෙන් මේ කාසිවල රජුගේ රූපය යෙදෙයි. ප්‍රතිමුඛයෙහි ඡත්‍ර වර්ගයේ දෙවැනි අනුකොටසට අයත් කාසිවල මෙන් මිනිස් අත් රහිත ගරුඬ රුව දක්වෙයි. මෙහි යෙදෙන පාඨය ''ශ්‍රී චන්ද්‍රගුප්තඃ'' යන්න යි.

මේ වර්ගයට අයත් කාසිවල සාමාන්‍ය ප්‍රමාණ අනුව විෂ්කම්භය අඟල් ·5 සිට අඟල් ·65 දක්වා වෙනස් වේ. බර ප්‍රමාණයන් ද දෙකකි. ඇතැම් කාසි ග්‍රෙන් 18 හා 25 අතර ද, ග්‍රෙන් 44 – 54 අතර ද වේ. මෙසේ මෙම කාසි බර ප්‍රමාණ දෙකකින් යුක්තව නිකුත් කරන ලද බව සලකන්නට පුළුවන.

### ධනුර්ධර වර්ගය

අභිමුඛයේ ප්‍රභාමාලාව සහිත රජු වම් පසට මුහුණ ලා වමතින් දුන්නත් දකුණතින් හීයකුත් ගෙන සිටී. වම් අත යටින් ''චන්ද්‍ර'' යන පාඨය දක්වේ. වට පාඨයක් ද අභිමුඛයේ වූ බවට ලකුණු ඇත. ප්‍රතිමුඛයෙහි ලක්ෂ්මී දෙවතාවිය පියුමක් මත හිඳ වමතින් පාශයක් ද දකුණතින් පියුමක් ද දරා සිටින ආකාරයෙන් දක්වා ඇත. කාසියේ දකුණු පස ''ශ්‍රී වික්‍රමඃ'' යන කෙටි පාඨය යෙදී තිබේ.

මේ වර්ගයට අයත් කාසි විෂ්කම්භයෙන් අඟල් ·8 ක් ද, බරින් ග්‍රෙන් 84·3 ක් ද වෙයි.

### ඌර්ධවකාය වර්ගය

මේ කාසි වර්ගය අනුකොටස් පහකින් යුක්තය. ඒ එකිනෙක වෙන වෙනම සලකා බැලිය යුතු වේ.

පළමුවැනි අනුකොටසට අයත් කාසි බහුල වශයෙන් ලැබී ඇත. මේවායේ අභිමුඛයේ වම් පසට මුහුණ ලා සිටින අයුරින් රජුගේ උඩුකය දක්වේ. ආභරණයෙන් සැරසී සිටින රජු ඔසවන ලද දකුණතින් මලක් දරා සිටියි. ප්‍රතිමුඛයේ ප්‍රභාමාලාව සහිත ගරුඬ රුව පියාපත් විදහා ගෙන සිටියි. ඊට පහළින් ''මහාරාජ චන්ද්‍රගුප්තඃ'' යන පාඨය සඳහන් වේ.

මෙය හුවිෂ්ක නම් කුෂාණ රජුගේ රන් කාසියක් අනුගමනය කිරීමෙන් සකසා ගන්නා ලද කාසියක් ලෙස සැලැකේ. මීට අදාළ හුවිෂ්ක රජුගේ රන් කාසියෙහි එක් අතක ධාන්‍ය කරලක් දරා සිටින විලාසයෙන් රජුගේ උඩුකය නිරූපණය වේ.

උඩුකය වර්ගයේ මෙම අනුකොටසට අයත් කාසි විෂ්කම්භයෙන් අඟල් ·9 ක් ද බරින් ග්‍රෙන් 87 ක් පමණ ද වෙයි.

දෙවැනි අනුකොටසට අයත් කාසි හමු වී ඇත්තේ අඩු ප්‍රමාණයෙනි. ඒවායේ ද අභිමුඛයේ යෙදී තිබෙන රූප සටහන් පළමුවැනි අනුකොටසට අයත් කාසිවල අභිමුඛයේ යෙදෙන ඉහත විස්තර වූ රූප සටහන්වලට සමාන ය. එහෙත් මේ කාසිවල අභිමුඛයේ දැක්වෙන රජුගේ උඩුකයෙහි රූපය කාසියේ ඉහළ කොටසට පමණක් සීමා වී ඇත. පහළ කොටසේ ''ශ්‍රී වික්‍රමාදිත්‍ය'' යන පාඨය සඳහන් වේ. ප්‍රතිමුඛයේ සටහන් ද පළමු වැනි කොටසට වැටෙන කාසිවල ප්‍රතිමුඛයේ රූප සටහන්වලට සමානය. කාසියේ පහළ කොටසේ ''ශ්‍රී චන්ද්‍ර ගුප්තඃ'' යන පාඨය සඳහන් වෙයි.

මේ අනුකොටසට අයත් කාසිවල විෂ්කම්භය අඟල් ·75 ක් ද බර ග්‍රෙන් 40·5 හා 44 අතර ද වේ. මේ කාසි හැමෙකක් ම වාගේ ලැබී ඇත්තේ අග්නිදිග පංජාබ ප්‍රදේශයේ හෙයින්, ඒ ප්‍රදේශය දෙවැනි චන්ද්‍රගුප්තයන්ගේ අධිරාජ්‍ය පාලනයට යටත්ව තිබුණු බව සැලැකිය හැකිය. එක් කාසියක රජුගේ පපු පෙදෙස ඉදිරියට නෙරා ඇති ආකාරයෙන් නිරූපිතව ඇති හෙයින්, එය කාන්තාවක දක්වන රූප සටහනක් බව වින්සන්ට් ස්මිත් අදහස් කරයි. එහෙත් එය සාවද්‍ය අදහසක් බව අල්ටෙකාර් විසින් පෙන්වා දී තිබේ.

මෙම වර්ගයෙහි තුන්වැනි අනුකොටසට අයත් කාසි එසේ බෙදනු ලබන්නේ ඒවායේ අභිමුඛයේ පාඨය දක්නට නොලැබෙන හේතුවෙනි. අභිමුඛයේ විශේෂයකට දක්නට ඇත්තේ එපමණකි. ප්‍රතිමුඛයේ ගරුඬ රූපය කිසියම් පීඨයක් මත, තුඩින් නාගයකු ඩැහැගෙන සිටින ආකාරය දක්වයි. එහි පාඨය වශයෙන් යෙදී ඇත්තේ ''චන්ද්‍රගුප්තඃ'' යන්න පමණෙකි.

මේ අනුකොටසට අයත් කාසිවල විෂ්කම්භය අඟල් ·6 ක් හා බර ග්‍රෙන් 40·5 ක් වෙයි.

සිවුවැනි අනුකොටසට අයත් කාසිවල අභිමුඛයේ හා ප්‍රතිමුඛයේ සටහන් බොහෝ දුරට ඉහත විස්තර කරන ලද තෙවැනි අනුකොටසට අයත් කාසිවල ඒ ඒ රූපසටහන්වලට සමාන වේ. වෙනසකට දක්නට ලැබෙන්නේ ප්‍රතිමුඛයේ ගරුඬ රූපය තෙවැනි වර්ගයේ මෙන් පීඨයක් මත නොව පීඨයක් රහිතව දක්වා තිබීම පමණෙකි. මේ අනුකොටසට අයත් කාසි විෂ්කම්භයෙන් අඟල් ·65 ක් ද බරින් ග්‍රෙන් 27 ක් ද වෙයි.

පස් වැනි අනුකොටසට වෙන් කර දැක්විය හැකි කාසිවල මෙතෙක් විස්තර කරන ලද කාසිවල සාමාන්‍ය ලක්ෂණයන්ට වඩා වෙනසකට දක්නට ඇත්තේ අභිමුඛයේ දැක්වෙන රජ රුවෙහි අතක මලක් නොතිබීම පමණි. චන්ද්‍රගුප්ත රජුගේ තඹ කාසි අතර ඉතා සුලභ කාසි වර්ගය මෙයයි. කුඩා ප්‍රමාණයේ කාසිවල රජුගේ උඩුකය වෙනුවට හිස පමණක් දැක්වෙයි. මේ කාසිවල විෂ්කම්භය අඟල් ·35 හා ·55 අතර වෙනස් වෙයි. බර ද ග්‍රෙන් 4·2 හා 2·8 අතර වෙනස් වෙයි. මෙම බර ප්‍රමාණය පිළිබඳ වෙනස ක්‍රමයෙන් දක්නට ලැබෙන්නක් හෙයින්, මේ කාසි අතර විවිධ බර ප්‍රමාණයන් අනුව නිකුත් කරන ලද කාසි ප්‍රභේද වේ දැයි නිගමනය කිරීම දුෂ්කරය.

**iii. චක්‍ර වර්ගය**

මේ වර්ගයට අයත් කාසිවල අභිමුඛයේ උඩුකොටසෙහි චක්‍රයක් ද, පහළ කොටසෙහි ''චන්ද්‍ර'' යන පාඨය ද දැක්වෙයි. ප්‍රතිමුඛයෙහි උඩු කොටසෙහි ගරුඬ රුවද, පහළ කොටසෙහි ''ගුප්ත'' යන පාඨයද යෙදී තිබේ. මේ ඉතා දුර්ලභ කාසි වර්ගයක් වන අතර ඊට අයත් කාසිවල විෂ්කම්භය අඟල් ·4 ක් ද, බර ග්‍රෙන් 8·4 ක් ද වෙයි.

### iv. සටස වර්ගය

මේ කාසියෙහි අභිමුඛයේ තිත් වටයක් තුළ ''චන්ද්‍ර'' යන පාඨයද, ඊ මත චන්ද්‍රවංකයක් ද දක්වෙයි. ප්‍රතිමුඛයේ තිත් වටයක් තුළ මල් සහිත පුන්කළසකි. මේ වර්ගයට අයත් කාසි ඉතා කුඩාය. ඒවායේ විෂ්කම්භය අඟල් ·4 නොඉක්මවන අතර, බොහොමයක බර ග්‍රෙන් 10 ක් පමණ වෙයි. එක් කාසියක බර ග්‍රෙන් 3·3 ක් පමණක් වන බව වාර්තාගතය.

මේ කාසි සාමාන්‍යයෙන් දෙවැනි චන්ද්‍රගුප්තගේ අනෙක් තඹ කාසිවලට වඩා වෙනස් ලක්ෂණ සහිත වන හෙයින්, දෙවැනි චන්ද්‍රගුප්ත රජුගේ නොව මෙහරෞලි ටැම් ලිපියේ සඳහන් වන චන්ද්‍ර රජුගේ කාසි යයි වින්සන්ට් ස්මිත් කල්පනා කළේ ය. මාලව ගොත්‍රිකයන් විසින් නිකුත් කරන ලද කාසිවල ආභාසය ලබා ඇති මෙම කාසි දෙවැනි චන්ද්‍රගුප්තගේ කාසි විය හැකි බව අල්ටෙකාර් පෙන්වා දෙයි. සමහර විට මාල්වා ප්‍රදේශය තම විජිතයක් බවට පත් කර ගැනීමෙන් පසුව, චන්ද්‍රගුප්ත රජු එහි මුලින් පැවැති ගොත්‍රික කාසි අනුගමනය කරමින් මෙසේ සට වර්ගයෙහි ලා අප විසින් ගණිනු ලැබෙන කාසි නිකුත් කරන ලද්දේ යයි සිතන්නට ඉඩ තිබේ. කෙසේ වුව ද, මෙම කාසි පිළිබඳ ප්‍රශ්නය ගැන නිසැක නිගමනයකට එළැඹීමට නොහැකි වී ඇත්තේ මේ වර්ගයට අයත් කාසි ලැබුණු ප්‍රදේශය හරි හැටි වාර්තා කර නැති හෙයිනි.

### රාමගුප්තගේ කාසි

ඉහත විස්තර කරන ලද ''කාච'' නම් පාලකයා මෙන්ම, රාමගුප්ත පිළිබඳ ඉතිහාසය ද අවුල් සහගතය. මේ රජු සමුද්‍රගුප්ත රජතුමාගේ වැඩිමහල් පුත්‍රයා වූ බවත්, පියාගේ ඇවෑමෙන් රජයට පත්වූවත්, පසුව කුෂාණ බලය බිඳ වඩා බලගතුවූ බාල සෝයුරු දෙවැනි චන්ද්‍රගුප්තයනට රාජ්‍යය භාර දීමට සිදුවූ බවත්, සමහර ඉතිහාසඥයෝ අනුමාන කරති. මෑතකදී රාමගුප්ත නාමය සඳහන් වන තඹ කාසි කිහිපයක් මාල්වා ප්‍රදේශයෙන් හමු වී ඇති හෙයින්, මේ පාලකයා ඒ ප්‍රදේශය පාලනය කළ අයකු ලෙස සමහරු කල්පනා කරති.

රාමගුප්ත කාසිවල අභිමුඛයේ සිංහයකු වැනි කිසියම් සත්ත්ව රූපයක් දක්නට ලැබේ. එහි උඩු කොටසෙහි චන්ද්‍රවංකයක සලකුණද, පහළ කොටසේ ''රාමගුප්ත'' යන පාඨය ද යෙදෙයි.

මේ කාසි විෂ්කම්භයෙන් අඟල් ·45 හා ·5 අතර ප්‍රමාණයෙන් ද, බරින් ග්‍රෙන් 18·7 හා 31·3 අතර ද වෙයි.

රාමගුප්ත තඹ කාසි බොහෝ දුරට මාල්වා ප්‍රදේශයේ මාලවයන් හා නාගයන් විසින් භාවිතයට පත් කරන ලද කාසිවල ඇති ලක්ෂණවලට සමාන ලක්ෂණ දරයි. ඉහත සඳහන් කරන ලද පරිදි, රාමගුප්ත මාල්වා ප්‍රදේශය පාලනය කළ ප්‍රදේශ පාලකයකු ලෙස සැලකිය හැකි නමුදු, මේ රජු පිළිබඳව ස්ථිර නිගමනයකට බැසීම දුෂ්කරය.

### පළමුවන කුමාරගුප්තගේ කාසි

දෙවැනි චන්ද්‍රගුප්ත මෙන් පළමුවන කුමාරගුප්ත ද රන්, රිදී හා තඹ යන ලෝහ වර්ගවලින් කාසි භාවිතයට පත් කළේය. එමෙන් ම ඒවා විවිධ වර්ගවලින් හා ප්‍රභේදවලින් ද යුක්තය. මීට පෙර සුලභ වශයෙන් කාසි නිකුත් කළ සමුද්‍රගුප්ත හා දෙවැනි චන්ද්‍රගුප්ත යන රජවරුන් අබිබවමින් පළමුවන කුමාරගුප්ත විවිධ කාසි වර්ග නිකුත් කර භාවිතයට පත් කළ බව පෙනී යේ.

කුමාරගුප්තගේ රන් කාසි විවිධ ය. මුලදී (ගුප්ත පෙළපතේ මුල් පාලකයන් විසින්) නිකුත් කරන ලදුව, පසුව අභාවිතයට ගිය කාසි වර්ග කිහිපයක් ම මේ පාලකයාගේ සමයේ දී නැවත වරක් නිකුත් කරන ලදි. පළමුවන චන්ද්‍රගුප්ත රජු නිකුත් කළ රජු හා රැජින වර්ගය ද, සමුද්‍රගුප්ත රජුගේ රාජ්‍ය කාලයේ දී නිකුත් වුණු ව්‍යාඝ්‍රපරාක්‍රම හා අශ්වමෙධ හා වීණාවාදක වර්ග ද මෙසේ මේ රජු විසින් යළි භාවිතයට පත් කරන ලද කාසි වර්ග වේ. දෙවැනි චන්ද්‍රගුප්ත රජු කල ඉතා බහුල වශයෙන් භාවිතයට පැමිණි ධනුර්ධර, අශ්වාරෝහක, ඡත්‍ර හා සිංහවික්‍රම යන කාසි වර්ග ද

දිගින් දිගටම භාවිත විවුණි. එසේ ව ද, කුමාරගුප්ත නිකුත් කළ මේ වර්ගවලට අයත් කාසිවල යම් යම් වෙනස් කම් ද දක්නට ලැබෙන බව අමතක නොකළ යුතු ය. මේ රජු අලුතින් ම නිකුත් කළ කාසිවලින් ඔහුගේ ස්කන්ද කුමාර භක්තිය ද, රණකාමීත්වය හා ක්‍රීඩා ලොලත්වය ද පිළිබිඹු කෙරෙයි. කුමාර හෙවත් කාර්තිකෙය වර්ගය, ඛඩ්ගධර වර්ගය, හස්ත්‍යාරෝහක වර්ගය, හස්ත්‍යාරෝහක – සිංහවික්‍රම වර්ගය, ඛඩ්ගාත්‍රාතා වර්ගය යනාදිය යි, මේ පාලකයා විසින් පළමුවැනි වරට නිකුත් කරන ලද කාසි වර්ග වන්නේ. අප්‍රතිඝ වර්ගය නමින් හැඳින්වෙන කාසි ද පළමුවැනි කුමාරගුප්ත රජුගේ යැයි අදහස් කෙරෙන නමුත් ඒ පිළිබඳ මතභෙද පවතී. මේ නයින් මෙම පාලකයාගේ රන් කාසි පිරික්සන විට මේ දක්වා ගුප්ත කාසි අධ්‍යයනයේ දී දක්නට නො ලැබුණු විවිධත්වයක් හමු වේ.

### i. ධනුර්ධර වර්ගය

දෙවැනි චන්ද්‍රගුප්ත රජුගේ කාසි අතර ඉතාම සුලභ වර්ගය වන ධනුර්ධර වර්ගයට අයත් කාසි කුමාරගුප්ත රජ විසින් ද ඉතා බහුල ලෙස ප්‍රකාශයට පමුණුවනු ලැබූ බව පෙනේ.

මේ කාසිවල අභිමුඛයේ සාමාන්‍යයෙන් දක්නට ලැබෙන්නේ රජු වම්පසට හැරී සිට ගෙන වමතින් දුන්නත් දකුණතින් හීයත් දරා සිටින ආකාරයයි. ඇතැම් කාසියක රජ රුව දක්වෙන්නේ කුෂාණ කබායෙකින් සැරැසී සිටින ආකාරයෙනි. සමහරෙක උඩුකය නොවසා රෙදි කඩෙකින් සැරැසී සිටී. රජ රුවෙහි දකුණතට පිටුපසින් පසුතලයේ ගරුඬ ධ්වජය දක්නට ලැබේ. වම් අතට පහළින් ක්ෂෙත්‍රයේ "කුමාර" යන පදය හෝ "කු" යන මුල් අකුර පමණක් හෝ යෙදී තිබේ. වට පාඨය ඒ ඒ කාසිවල ප්‍රභේද අනුව විවිධ ය.

කාසියෙහි ප්‍රතිමුඛයෙහි ලක්ෂ්මිය පියුමක් අරා හිඳ, වමතින් පියුමක් ද සුරතින් පාශයක් ද ගෙන සිටින අයුරු නිරූපණය වෙයි. ක්ෂේත්‍රයේ දකුණු පස "මහෙන්ද්‍රඃ" යන්න ලියැවී තිබේ.

සාමාන්‍ය සවරූපය අතින් කුමාරගුප්තගේ ධනුර්ධර වර්ගයට අයත් කාසි දෙවැනි චන්ද්‍රගුප්ත රජතුමාගේ එම වර්ගයට අයත් කාසි අනුගමනයෙන් සකසා ඇතත්, ඇතැම් වෙනස් කම් ද දක්නට ලැබෙයි. දෙවැනි චන්ද්‍රගුප්ත ධනුර්ධර කාසි වර්ගයේ පළමුවැනි අනුකොටසට අයත් කාසිවල ප්‍රතිමුඛයෙහි දෙවතාවියගේ රුව දක්වීමේදී, කුෂාණ කාසිවල දක්නට ලැබෙන පරිද්දෙන් ම, ඇය අසුනක් මත හිඳින ආකාරය දක්වේ. එහෙත් කුමාරගුප්ත ධනුර්ධර කාසිවල වඩාත් දේශීය ස්වරූපයක් දක්වමින් ඇය නිරූපිතව ඇත්තේ පියුමක් අරා හිඳින විලාසයෙනි. මෙය දෙවැනි චන්ද්‍රගුප්ත රජු විසින් නිකුත් කරන ලද මේ වර්ගයේ කාසිවල දෙවැනි අනු කොටසේ පමණක් සීමිතව දක්නට ලැබෙන ලක්ෂණයකි.

කුමාරගුප්ත රජුගේ ධනුර්ධර වර්ගයට අයත් කාසි ඒවායේ විවිධත්වය අනුව ප්‍රභේද කිහිපයකට වෙන් කර බෙදා දක්විය හැකි වේ.

1 අනුකොටස: මේ කාසිවල රජුගේ නාමය සිරස් අතට "කුමාර" යනුවෙන් වම් අතට පහළින් දුන්නට ඇතුළතින් යෙදී තිබේ. වට පාඨය "මහාරාජාධිරාජ ශ්‍රී කුමාරගුප්තඃ" යන පාඨයෙකි. මේ අනුකොටසට අයත් කාසියක සාමාන්‍ය බර ග්‍රෙන් 124 ක් පමණ වෙයි.

2 අනුකොටස: මේ අනුකොටසට අයත් කාසිවල රාජ නාමය හා වට පාඨය පෙර විස්තර වුණු අයුරින් ම දක්වේ. වෙනසකට ඇත්තේ "කුමාර" යන නම දක්වීමේදී දුන්නට පිටතින් එය සඳහන් කොට තිබීම පමණි.

3 අනුකොටස: මේ කොටසට අයත් කාසිවල රජුගේ නම දක්වීම සඳහා යෙදී ඇත්තේ "කු" යන එක අක්ෂරයක් පමණකි. එය රජුගේ බාහුවට පහළින් දක්වෙයි. මේවායේ වට පාඨය ද වෙනස් අයුරකින් යෙදුණකි. ඉන් "විජිතාවනිරවනිපතිඃ කුමාරගුප්තො දිවං ජයති" යන පාඨය කියැවේ. මෙම අනුකොටසට ම අයත් තවත් කාසියක වට පාඨය "ජයති මහීතලං ශ්‍රී කුමාරගුප්තඃ" යනුවෙන් යෙදී තිබේ.

4 අනුකොටස: මේ කාසිවල රජුගේ බාහුව යට රාජ නාමය හැඳින්වීමට ''කුමාර'' යන පදය හෝ ''කු'' යන අකුර හෝ දෙකින් එකකුදු නොයෙදේ. ඒවායේ වට පාඨය ''පරම-රාජාධිරාජ ශ්‍රී කුමාරගුප්තඃ'' යනුවෙන් හෝ ''ජයති මහිතලං ශ්‍රී කුමාරගුප්තඃ'' යනුවෙන් හෝ ලියැවී ඇත.

මේ වර්ගයට අයත් කාසියක විෂ්කම්භය අඟල් .8 පමණ ද සාමාන්‍ය බර ප්‍රමාණය ග්‍රෙන් 121 – 126 අතර ද වේ.

**ii. අශ්වාරෝහක වර්ගය**

කුමාරගුප්ත රජුගේ කාසි අතර වඩාත් ම ප්‍රකට වර්ගය මෙය යයි කිව හැක. මේ වර්ගයට අයත් කාසිවල අභිමුඛයේ ප්‍රභාමාලාව සහිත රජු කබායෙකින් හා කලිසමෙකින් සැරැසී ආභරණ-යෙන් සරසන ලද අසකු පිට නැඟී වම් දෙසට හෝ දකුණු දෙසට හෝ හැරී සිටින ආකාරය දක්වේ. සමහර විට රජුගේ හිණෙහි පසෙක කඩුවක් එල්බෙන අයුරු ද දක්වේ. වට පාඨය විවිධ ය. ප්‍රතිමුඛයෙහි දෙවතාවියගේ රුව මෝර පුටුවක හිඳින ආකාරයෙන් දක්වේ. ඇතැම් කාසියක ඇය මොණරකුට ආහාර දෙන ආකාරය පෙන්නුම් කෙරෙයි. මෙය මේ කාසිවල දෙවතා රුව දක්වීමේ දී අලුතෙන් ම යොද ගෙන ඇති රූප සටහනක් ලෙස හැඳින්වීමට පුළුවන.

අශ්වාරෝහක වර්ගයට අයත් කාසි ඒවායේ ප්‍රතිමුඛයේ රූප සටහන් අනුව අනුකොටස් දෙකකට බෙද දක්විය හැකි ය. පළමුවැනි අනුකොටසට දේවතාවිය 'මෝර' පුටුව මත තනිව හිඳින ආකාරය දක්වෙන කාසිත්, දෙවැන්නට දෙවතාවිය එහි හිඳ පසෙකින් සිටුනා මොණරකුට ආහාර දීම දක්වෙන කාසිත් යනුවෙනි. මේවා ද ඒ ඒ කාසිවල යෙදෙන වට පාඨයන් ගේ විවිධත්-වය අනුව යළිවරක් අනුකොටස්වලට වෙන් කොට දක්වන්නට පුළුවන.

ඒ ඒ අනුකොටස්වලට අයත් කාසිවල දක්නට ලැබෙන වට පාඨ වෙන වෙනම පහත දක්වේ.

1 කොටස. (අ) ''ජයති නෘපොරිහිජිතඃ''.
(ආ) ''ක්ෂිතිපතිරජිතො විජයී කුමාරගුප්තො දිවං ජයති.''
(ඇ) පෘථිවීතලාම්බරශශී කුමාරගුප්තො ජයත්‍යජිතඃ''.

2 කොටස. (අ) ''ගුප්තකුලව්‍යොමශශී ජයත්‍යජෙයොජිතමහෙන්ද්‍රඃ''
(ආ) ''ගුප්තකුලාමලචන්ද්‍රො මහෙන්ද්‍රකර්මා ජිතො ජයති.''
(ඇ) ''ක්ෂිතිපතිරජිතො විජයී කුමාරගුප්තො.''
(ඈ) ''පෘථිවීතලෙශ්වරෙන්ද්‍රඃ කුමාරගුප්තො ජයත්‍යජිතඃ''.

මෙම වර්ගයට අයත් කාසි සාමාන්‍යයෙන් අඟල් ·8 ක පමණ විෂ්කම්භයකින් ද, ග්‍රෙන් 125 – 127 අතර බරකින් ද යුක්ත වේ.

**iii. ඛඩ්ගධර වර්ගය:**

මේ කාසි වර්ගය ද කුමාරගුප්තයන්ගේ නව නිෂ්පාදනයෙකි. ඛඩ්ගධර වර්ගයට අයත් වන කාසි ලැබී ඇත්තේ ඉතා අල්ප සංඛ්‍යාවෙනි. සමුද්‍රගුප්ත රජු විසින් නිකුත් කරන ලද දණ්ඩධර වර්ගය ම මඳක් වෙනස් කොට සකසා ගන්නා ලද්දක් ලෙස මෙම කාසි වර්ගය හඳුන්වා දෙන්නට පුළුවන. මෙහි ද අභිමුඛයෙහි ඇති රූප සටහනෙහි රජු තමන් ඉදිරියේ ඇති පූජාසනයක් මත සුවඳ ද්‍රව්‍ය වැනි යමක් හෙළන ආකාරය නිරූපණය වෙයි. මේවායේ දක්වෙන රජු ඇඳ සිටින්නේ පැරැණි දණ්ඩධර වර්ගයේ කාසිවල දක්වෙන අයුරින් කුෂාණ ඇඳුම නොව දේශීය ඇඳුමකි. එහි වමතින් රාජ දණ්ඩ අල්වා ගෙන සිටිනු වෙනුවට, රජුගේ වමත හිණැ පැළැඳි කඩුවේ මිට

මත රඳවා ගෙන සිටින ආකාරය පෙන්නුම් කෙරෙයි. මුල් කාසිවල දක්නට ලැබුණු ගරුඬ ධ්වජය මේ කාසිවල ද දක්නට පුළුවන. කලාත්මක අගය අතින් විමැසුවහොත් මෙම වර්‍ගයට අයත් කාසි සමුද්‍රගුප්තගේ දණ්ඩධර වර්ගයට අයත් කාසිවලට වඩා බෙහෙවින් උසස් තත්ත්වයක වෙයි.

අභිමුඛයේ ගරුඬ ධ්වජය ඉහත විස්තර වුණු ඛඩ්ගධාරී රජරුව ඉදිරියෙන් දක්වෙන අතර කඩුව පැත්තකින් ක්ෂෙත්‍රයේ ''කු'' අකුර යොද ඇත. මේ වර්‍ගයේ කාසිවල යෙදෙන වට පාඨය ''ගාමාවජිත්‍ය සුචරිතෛඃ කුමාරගුප්තො දිවං ජයති'' යන්න යි.

කාසියේ ප්‍රතිමුඛයේ පියුමක් මත හිඳින ලීලාවෙන් දක්වා ඇති ලක්ෂ්මී දෙවියගේ වම් අතේ දිගු නටුවක් සහිත පියුමෙකි; දකුණතේ පාශයෙකි. ප්‍රතිමුඛයේ පාඨය ''ශ්‍රී කුමාරගුප්තඃ'' යන්න යි.

මේ වර්‍ගයට වැටෙන කාසිවල විෂ්කම්භය හා බර සාමාන්‍ය වශයෙන් ගණන් ගන්නා විට පිළිවෙළින් අඟල් .8 – .85 අතර ද, ග්‍රෙන් 125 ක් පමණ ද වෙයි.

## iv. සිංහවික්‍රම වර්‍ගය

මෙම වර්‍ගය කුමාරගුප්ත රජු විසින් ස්වකීය පියාණන් වූ දෙවැනි චන්ද්‍රගුප්තගේ කාසි වර්‍ගය තවදුරටත් පවත්වා ගැනීමක් බව පැහැදිලිය. එසේ වුවද, චන්ද්‍රගුප්තයන්ගේ මෙම වර්‍ගයට අයත් කාසිවල දක්නට ලැබෙන විවිධත්වය හා කලාත්මක අගය ඔහුගේ පුතණුවන් නිකුත් කළ සිංහවික්‍රම කාසිවල දක්නට නොලැබේ. ප්‍රතිමුඛයෙහි දේවතාවිය සඳහා යෙදෙන සිංහ වාහනය මේ කාසිවල අත්පා හකුළුවා ගත් නිශ්චල ස්වරූපයකින් දක්වෙනවා මිස කිසිවිටෙකත් ගමන් කරන ලීලාවකින් නොයෙදේ. දේවතාවිය හැම විටම ඉදිරිපස බලා ගෙන ලලිතාසනයෙන් හිඳින්නී ය. සිංහ රූපයේ හා රාජ රූපයේ පෙර දක්වුණු කලාත්මක ලීලාව මේ කාසිවල දක්නට හැකි නොවෙයි.

මේ වර්‍ගයට අයත් කාසි රජු සිංහයාට පහර දෙන ආකාරය දක්වෙන හා රජු සිංහයා පාගා-ගෙන සිටින ආකාරය දක්වෙන යනුවෙන් දෙකොටසකට බෙදා දක්විය හැක. චන්ද්‍රගුප්ත රජුගේ සිංහවික්‍රම කාසි අතර දක්නට ලැබෙන ''සිංහයා පසු බා සිටීම'' නිරූපණය වන කාසි කුමාරගුප්තගේ කාසි අතර දක්නට නොලැබෙයි.

1 අනුකොටස – (සිංහයාට පහරදීම)

අභිමුඛයෙහි රජු සර්වාභරණයෙන් සැරැසී තමන් ඉදිරිපසින් සිටුනා සිංහයාට හීයකින් විදින අයුරු මේ කාසිවල දක්වා ඇත. වට පාඨය ''ක්ෂිතිපතිරජිත මහෙන්ද්‍රඃ කුමාරගුප්තො දිවං ජයති'' යන්න යි. මෙය උපගීති වෘත්තයෙන් ගෙතුණු පද්‍ය පාඨයකි.

ප්‍රතිමුඛයෙහි රූප සටහනෙහි දෙවතාවිය අත් පා හකුළුවා නිසලව සිටින සිංහයා අරා හිඳ දකුණතින් දිගු නටුවක් සහිත පියුමක් දරා සිටී. ප්‍රතිමුඛයේ පාඨය ''ශ්‍රී මහෙන්ද්‍රසිංහඃ'' හා ''සිංහමහෙන්ද්‍රඃ'' යන දෙයාකාරයෙන් ම යෙදේ.

2 අනුකොටස – (සිංහයා පාගාගෙන සිටීම).

මේ කාසිවල අභිමුඛයෙහි රජරුව දක්වෙන්නේ නිරුවත් උඩුකය ආභරණවලින් පමණක් සරසා ගෙන සිටින අයුරිනි. රජු සිංහයා පාගාගෙන උගේ සිරුරට හීයක් විදින බවක් මෙහි දක්වේ. මේ කාසිවල එන වට පාඨය ''සාක්ෂාදිව නරසිංහො සිංහමහෙන්ද්‍රො ජයත්‍යනිශං'' යන්නයි.

වම් අතින් පියුමක් ද, දකුණතින් පාශයක් හෝ දමයක් ද ගෙන සිංහයා මත හිඳින දෙවතා-වියකගේ රූපයෙන් මේ කාසියේ ප්‍රතිමුඛය සැරැසී ඇත. සමහර උගතුන් ඇය දකුණතින් දරා සිටින්නේ හිස් කබල් එක් කොට සැදූ මාලයක්දැයි ( මුණ්ඩමාලා ) සැක පහළ කර ඇත. දෙව-තාවිය දක්වෙන පැත්තේ ක්ෂෙත්‍රයේ ''සිංහ මහෙන්ද්‍රඃ'' යන පාඨය සඳහන් වී තිබේ,

සිංහවික්‍රම වර්ගයට අයත් කාසි විෂ්කම්භයෙන් අඟල් ·75 – ·85 අතර ද, බරින් ග්‍රෙන් 125 – 127 අතර ද, වේ.

## v. ව්‍යාඝ්‍රපරාක්‍රම වර්ගය

සමුද්‍රගුප්ත රජු විසින් ඉතා සුළු වශයෙන් ව්‍යවහාරයට පත් කරන ලද මේ කාසි වර්ගය පළමුවැනි කුමාරගුප්ත විසින් නැවත විවිධ ප්‍රභෙද සහිතව නිකුත් කරන ලද්දේය. කුමාරගුප්තගේ කාසිවල අභිමුඛය ද බොහෝ දුරට ඒ කාසියේ අභිමුඛය අනුව සැකැසී ඇත. සාමාන්‍යයෙන් යෙදෙන්නේ රජු වම් පසට හැරී ව්‍යාඝ්‍රයාට හීයක් විදින ආකාරයයි. මෙම රූප දෙක අතර චන්ද්‍රවංක ශීර්ෂයක් සහිත යෂ්ටියක රූප සටහනක් යෙදෙයි. කුමාරගුප්තගේ ව්‍යාඝ්‍රපරාක්‍රම කාසිවල අභිමුඛයේ යෙදෙන පාඨය වන ''ශ්‍රීමාං ව්‍යාඝ්‍රබලපරාක්‍රමඃ'' යන්න ද සමුද්‍රගුප්තගේ කාසිවල පාඨයට බෙහෙවින් සමාන වේ. මෙහි වෙනසකට ඇත්තේ ''ශ්‍රීමාං'' යන විශේෂණ පදය එකතු කර තිබීම පමණි. එද අනිවාර්‍යයෙන් ම දක්නට ලැබෙනනේ කාසියේ වම් පස ක්ෂෙත්‍රයේ ය.

මේ කාසිවල ප්‍රතිමුඛයේ රූප සටහන් සකස් කළ ශිල්පීන් සමුද්‍රගුප්තගේ ව්‍යාඝ්‍රපරාක්‍රම වර්ගයේ කාසිවල ප්‍රතිමුඛය පමණක් නොව, කුමාරගුප්ත රජුගේම අශ්වාරෝහක වර්ගයේ කාසිවලින් ද බලපෑම් ලබා ඇති බව පෙනේ. සමුද්‍රගුප්ත කාසිවල මෙන් ම මෙහි ද දේවතාවියට වාහනය කොට යොදා ඇත්තේ මකරෙකි. කුමාරගුප්ත රජුගේ ම අශ්වාරොහක කාසිවල ප්‍රතිමුඛයේ දක්වෙන අයුරින් මෙහි දී දෙවතාවිය පසෙකින් සිටුනා මොණරකුට ආහාර දෙන විලාසයක් දක්වෙයි. මෝර පුටුවක හිඳගෙන සිටිනවා වෙනුවට, මෙහි දෙවතාවිය නැඟිට සිටින හෙයින්, මොණරා වෙත ආහාර දීමීම සඳහා ඇය නැමී සිටින අයුරු නිරූපණය කෙරෙයි. ප්‍රතිමුඛයේ ''කුමාරගුප්තොධිරාජා'' යන පාඨය යෙදී ඇත. මෙසේ පාඨය යෙදීමේදී සමුද්‍රගුප්ත කාසිවල යෙදෙන ''රාජා'' යන්න වෙනුවට ''අධිරාජ'' යනුවෙන් එය සකසා ගත් බව පෙනෙයි. කුමාරගුප්ත නිකුත් කළ මෙම කාසි වර්ගය මේ වර්ගයට අයත් සමුද්‍රගුප්තගේ කාසිවලට වඩා කලාත්මක වශයෙන් උසස් වේ. ප්‍රතිමුඛයේ රාජ රූපය දක්වීමේ දී රජුගේ කාය ශක්තිය මෙන් ම, මානසික බලවත්කමද මැනැවින් නිරූපණය වේ. ප්‍රතිමුඛයේ දෙවතාවියගේ ඉරියව්ව දක්වා ඇති ආකාරය ද බොහෝ දුරට ම යථාරූපී ය.

මෙම කාසි වර්ගය ද අනුකොටස් වශයෙන් දෙකකට වෙන් කොට දක්විය හැක. රජුගේ නාමය හැඟවීමට ''කු'' අකුරු යෙදෙන කාසි හා එය නොයෙදෙන කාසි යනුවෙනි. කාසිවල විෂ්කම්භය සාමාන්‍යයෙන් අඟල් ·8 ක් පමණ ය. සාමාන්‍ය ප්‍රමාණයක් ලෙස දක්වතොත්, මේ කාසිවල බර ග්‍රෙන් 127 ක් ලෙස සඳහන් කළ හැකි වුව ද, බරින් අඩු සමහර කාසි ග්‍රෙන් 121 – 124 අතර ප්‍රමාණයන්ට වැටෙයි.

## vi හස්ත්‍යාරෝහක වර්ගය

කුමාරගුප්ත රජුගේ අලුත් නිර්මාණයකි. මේ පාලකයා ඇතුන් පිට යාමෙහි ලොල් කළ පුද්ගලයකු ලෙස සැලැකිය හැකිය. මෙසේ රජු ඇතකු අරා ගමන් කරන ආකාරය දක්වෙන කාසියක් කුෂාණ වංශික හුවිෂ්ක රජතුමන් විසින් ද නිකුත් කර ඇත. එහෙත් පළමුවැනි කුමාරගුප්තගේ හස්ත්‍යාරෝහක කාසිය හුදෙක් හුවිෂ්ක රජුගේ කාසියේ අනුකරණයකැයි කියන්නට නුපුළුවන. කුෂාණ කාසියේ මෙන් ම, මෙහි ද රජු අතින් ගත් අංකුශයක් ඇතිව ඇතු අරා සිටින ආකාරය දක්වෙන අතර, ඊට අතිරේකව කුෂාණ කාසියේ දක්නට නොලැබෙන අයුරින් රජු පිටුපසින් ඇතු පිට හිඳින වාමනයකු විසින් රජුට ඡත්‍රයක් දරා සිටින ආකාරය මෙහි දක්වෙයි. මෙම වර්ගයට අයත් කාසිය එතරම් සුලභ ලෙස ලැබී නැත.

අභිමුඛයේ ඉහත දක්වුණු අයුරින් රජු වම් පසට ගමන් කරන ඇතු අරා සිටින්නේ නිරුවත් උඩුකයෙහි ආභරණ පැළඳගෙනය. ඇතා ද ආභරණයෙන් සරසන ලද්දෙකි. රජුගේ වමතින් අංකුශය දරා සිටිනු දක්වෙන අතර, දකුණත දක්වා ඇත්තේ ඉහටිය මත රඳවාගෙන සිටින අයුරිනි. මේ කාසියේ අභිමුඛයේ පාඨය එතරම් පැහැදිලි නොවේ. අල්ටෙකාර් ප්‍රකාශ කරන හැටියට නම් එය ''ක්ෂතරිපු කුමාරගුප්තො රාජත්‍රාතා ජයති රිපූඃ'' යන්න යි.

ලක්ෂ්මී දෙවතාවිය පියුමක් මත සිටින ආකාරය ප්‍රතිමුඛයේ දක්වා තිබේ. ඇය සාරියක් ඇඳ, ආභරණ පැළැඳ, සමඃඛිශෘංගය ගත් වමත ඉහටිය මත රඳවා ගෙන දකුණතින් දිගු දඬුවක් සහිත පද්මයක් ද ගෙන සිටින විලාසයෙනි, දක්වා තිබෙන්නේ. පහත දකුණු කෙළවරෙහි ශංඛයක රූප සටහනක් වෙයි. ප්‍රතිමුඛයේ පාඨය ''ශ්‍රී මහෙන්ද්‍රගජඃ'' යන්න යි.

### vii. හස්ත්‍යාරෝහක – සිංහවික්‍රම වර්ගය

මෙය ඉහත විස්තර වුණු හස්ත්‍යාරෝහක කාසිවර්ගය ආශ්‍රයෙන් ම සකස් වූ අලුත් කාසි වර්ගයක් බව පැහැදිලි ය. එමෙන් ම එය සුලභ ලෙස භාවිත නුවූවකි.

අභිමුඛයේ රජු හස්ත්‍යාරෝහක වර්ගයේ මෙන් ම, ඇතකු පිට නැඟී වේගයෙන් දකුණට ගමන් කෙරෙන අයුරු දක්වේ. වාමනයෙක් ඡත්‍රයක් දරා සිටියි. ඇතු ඉදිරියේ සිංහයෙකි. ඇතා ඉදිරි පසෙකින් සිංහයා පාගා දැමීමට සැරසේ. සිංහයා ද ඇතුගේ පය සපා කයි. වට පාඨය නො පැහැදිලි ය. ''ක්ෂත'' යන්න පමණක් පැහැදිලි හෙයින්, එද හස්ත්‍යාරෝහක වර්ගයේ දක්වෙන පාඨය ම වෙතැ යි අල්ටෙකාර් කල්පනා කරයි.

ප්‍රතිමුඛයේ දෙවතාවිය පියුමක් මත අබරණින් සැරැසී දකුණට හැරී සිටගෙන ඉන්නා විලාසයෙන් පිළිබිඹු වන්නී ය. ඇය වමතින් දිගු නටුවක් සහිත පියුමක් දරා සිටී. දකුණතෙහි හඳුනාගත නොහැකි කිසිවක් ද වෙයි. ඇය ඉදිරියේ මොණරකු සිටින අතර මේ වර්ගයට අයත් කාසිවල ප්‍රතිමුඛයේ ''සිංහහන්තා මහෙන්ද්‍රගජඃ'' යන පාඨය යෙදේ.

මේ වර්ගයට අයත් කාසියක් සාමාන්‍ය වශයෙන් අඟල් ·75 සිට අඟල් ·8 දක්වා විෂ්කම්භ- යෙන් ද, ග්‍රෙන් 115 හා 126 – 8 අතර බර ප්‍රමාණයෙන් ද යුක්ත වෙයි.

### iii. ඛඩ්ගාත්‍රාතා වර්ගය

සිය කෙළි ලොල් බව විදහා දැක්වීම සඳහා කුමාරගුප්ත රජුන් විසින් ඉදිරිපත් කරන ලද කාසි වර්ගයකි. මේ වර්ගයට අයත් කාසි කුමාර ගුප්තට පෙරාතුව හෝ පසුව හෝ අනෙක් ගුප්ත පාලකයකු විසින් නිකුත් කර නැති හෙයින්, මෙය විශේෂ කාසි වර්ගයක් වේ. එමෙන් ම මෙය කලාත්මක අතින් ද ගුප්ත පාලකයන්ගේ කාසි අතර උසස් තැනක් ගන්නා එකකි.

කාසිවල අභිමුඛයෙහි රජු කබායකින් හා කලිසමකින් සැරැසී, සර්වාභරණයෙන් සරසන ලද අසකු පිට නැඟී දකුණතින් ගත් කඩුවකින් කහවේණකුට පහර දෙන අයුරු දක්වේ. අශ්වයා බියට පත් ආකාරයක් දක්වමින් හිස ඔසවා සිටී. කහවේණාගේ රූපය ඉතා ස්වාභාවිකව නිරූ- පිත ය. හිස මතවූ අඟ, වමැස, කන්, වල්ගය ආදී හැම ශරීරාංගයක් ම එහි පැහැදිලිව ස්වාභාවික අයුරින් දක්වෙයි. වටපාඨය ''(භර්තෘ?) ඛඩ්ගාත්‍රාතා කුමාරගුප්තො ජයත්‍යනිශම්'' යනුවෙන් යෙදෙයි.

ප්‍රතිමුඛයෙහි තිත් පෙළකින් සැදි වටරාමුව ඇතුළත ගංගා දේවිය මකර වාහනය අරා වම් දෙසට හැරී සිටී. ඇගේ වමත එල්බෙන අතර දකුණතින් දිගු නටුවක් සහිත නෙළුමක් අල්වා ගෙන සිටියි. හිසකෙස් පිටුපසින් කැටි කර බැඳ ඇති අයුරුත්, කාන්තාභරණයෙන් සැරැසී සිටින අයුරුත්, නිරූපණය වෙයි. දේවිය පිටුපසින් ඇගේ හිසට ඉහළින් ඡත්‍රයක් ඔසවා සිටින ආකාරයෙන් පරිචාරිකාවකගේ රූපයක් වේ. ප්‍රතිමුඛ පාඨය ''ශ්‍රී මහෙන්ද්‍ර ඛඩ්ග'' යන්න යි.

මෙම කාසි වර්ගයෙහි සඳහන් පාඨයෙහි ''ඛඩ්ග'' යන වචනය අර්ථ දෙකක් ගෙන දෙන පරිදි යොදා ඇති බව පෙනේ. ''ඛඩ්ග'' යන්නෙන් කඩුව යන අදහස ද, කහවේණා යන අදහස ද දැනවේ. මේ අනුව සලකන විට ''ඛඩ්ගාත්‍රාතා'' යන්න ''කඩුවෙන් ආරක්ෂා කළ'' යන අර්ථයත්, ''කහවේණාගෙන් ආරක්ෂා කළ'' යන අර්ථයත් ගෙන දෙන අයුරු විග්‍රහ කර දැක්වීමට පුළුවන. මේ කාසි විෂ්කම්භයෙන් අඟල් ·8 පමණ ග්‍රෙන් 126·5 හා 127·6 අතරද වෙයි.

### ix. අශ්වමෙධ වර්ගය

ගුප්ත අභිලේඛනයන්හි කිසි තැනක කුමාරගුප්ත රජු අශ්වමෙධ යාගය පැවැත්වූ බවක් සඳහන් නොවේ. එහෙත් ඔහු විසින් අශ්වමෙධ යාගය පැවැත්වුණු බව කාසිවලින් පෙනී යයි. ඔහු විසින් එක් වරක් හෝ මෙම යාගය පවත්වන්නට ඇතැයි අල්ටෙකාර් කල්පනා කරන්නේ මේ කාසි වර්ගයෙන් ලැබෙන සාක්ෂි අනුවයි. මේ වර්ගයට අයත් කාසි හමුවී ඇත්තේ ඉතා දුර්ලභ වශයෙනි. කලාත්මක වටිනාකම අතින් ද මේවා සමුද්‍රගුප්තයන්ගේ අශ්වමෙධ කාසි තරම් උසස් නොවේ. ඒවායේ මෙන්, මෙහි අශ්වයාගේ රූපය තේජස්වී විලාසයෙකින් නිරූපනය නොවේ. අසුගේ රසනාවක් හෝ චෂාලයක් හෝ නොවේ. ප්‍රතිමුඛයේ දක්වා ඇති රාජිනී රූපය ද නාරිලාලිත්‍යයෙන් තොරය.

කාසියේ අභිමුඛයෙහි ආභරණයෙන් සරසන ලද අසු දකුණට හෝ වමට හෝ හැරී යූප කණුව ඉදිරිපිට සිටියි. වට පාඨය ''දෙවොජිත ශත්‍රුඃ කුමාරගුප්තාධිරාජා'' යන්නයි.

ප්‍රතිමුඛයේ රැජින වම් පසට හැරී සුරතින් චාමරය දරා සිටියි. පාඨය ''ශ්‍රී අශ්වමෙධ මහෙන්ද්‍ර'' යනුවෙන් යෙදී තිබෙනු දක්නට ලැබෙයි.

මේ වර්ගයට අයත් කාසිවල විෂ්කම්භය හා බර පිළිවෙළින් අඟල් ·8 හා ග්‍රෙන් 126·3 – 127·2 අතර ප්‍රමාණ වේ.

### x. කාර්තිකෙය වර්ගය

මෙය නියම වශයෙන් ම කුමාරගුප්ත රජුගේ නව නිර්මාණයක් වේ. මේ පාලකයා කුමාර, කාර්තිකෙය, ස්කන්ද ආදී නම්වලින් හඳුන්වනු ලබන හින්දු දෙවියන් කෙරෙහි ප්‍රසාදයක් හා භක්තියක් දැක්වූවකු බව ඔහුගේ කුමාරගුප්ත යන නාමයෙන් ම පැහැදිලි වෙයි.

අභිමුඛයෙහි ප්‍රභාමාලාව සහිත රාජ රූපය නියම හින්දු භක්තිකයකුගේ විලාසයෙන් ම ශරීරය විවෘතව හිණ වටා බැඳි කුඩා රෙදි පටියකින් හා කෙටි ධෝතියකින් සැරැසී සිටින ආකාරයෙන් දැක්වෙයි. ඔහු ඉදිරියේ මොණර රුවකි. රජු තම සුරතින් ගත් මිදි අත්තක් ඉදිරියෙහි වූ මොණරා වෙත දික් කරයි. වමත ඉඟටිය මත රඳවා ඇත. වට පාඨය ''ජයති ස්වගුණෛර් ගුණ............ මහෙන්ද්‍ර කුමාරඃ'' යනුවෙන් සඳහන් වෙයි.

කාසියේ ප්‍රතිමුඛයෙහි මයූර වාහනාරූඪ කාර්තිකෙය (ලංකාවේ කතරගම) දෙවියන් දකුණතින් හෙල්ලක් දරා ගෙන වමතින් යමක් විසුරුවන අයුරු දැක්වේ. මයූරයා පීඨයක් මත සිටින බවක් ද නිරූපණය වෙයි. පාඨය ''මහෙන්ද්‍ර කුමාරඃ'' යන්න යි. මේ කාසි විෂ්කම්භයෙන් අඟල් ·8 පමණ ද, බරින් ග්‍රෙන් 126 – 127 අතර ද, වෙයි.

### xi. ඡත්‍ර වර්ගය

මේ වර්ගයට අයත් කාසි ප්‍රථම වරට නිකුත් කරන ලද්දේ දෙවැනි චන්ද්‍රගුප්ත රජු විසිනි· එමෙන් ම ඒ පාලකයාගේ කාලයේ දී එය ඉතා සුලභ වශයෙන් නිකුත් කරන ලද වර්ගයක් ද විය· ඉතා සුළු ප්‍රමාණයක් පමණක් හමු වී ඇති කුමාරගුප්ත රජුගේ මේ වර්ගයට අයත් කාසි දෙවැනි චන්ද්‍රගුප්තයන්ගේ කාසි වර්ගය අනුකරණයෙන් නිපයන ලද බව පැහැදිලි ය.

කාසියෙහි අභිමුඛයෙහි ප්‍රභාමාලාව සහිත රජු ධොතියක් හැඳ, උඩුකය නිරුවත් ව, ආභරණ පැළැඳ දකුණතින් පූජාසනයක් මත බලියාග පුදන අයුරු දක්වා තිබේ. රජුට පිටුපසින් සිටින වාමනයකු විසින් ඡත්‍රයක් ඔසවා සිටිනු නිරූපණය වේ. වට පාඨය අසම්පූර්ණ ය. එය ''ජයත මහත'' (ජයති මහීතලං) යන්න යි.

ප්‍රතිමුඛයේ පාඨය ''ශ්‍රී මහෙන්ද්‍රාදිත්‍ය'' යන්නයි. දෙවතාවිය වමතින් පියුමක් හා සුරතින් පාශයක් රැගෙන සිටින සාරියකින් සැරැසී ආභරණ පැළැඳි විලාසයෙන් දක්වා තිබේ.

මේ කාසිවල විෂ්කම්භය අඟල් ·8 ක් පමණ වේ. ඒවායේ බර ග්‍රෙන් 127 ක් පමණ ය.

**xii. අප්‍රතිඝ වර්ගය**

කුමාරගුප්ත රජුගේ නව කාසි වර්ගයක් ලෙස ගිණිය හැකි මෙය නාණක විද්‍යාඥයන් අතර මතභේදයට ලක් වූවකි. ප්‍රථමයෙන් මෙම වර්ගය හඳුන්වන ලද්දේ "රජු හා රැජින දෙදෙන" වර්ගය යන නමිනි. ඊට හේතු වූයේ අභිමුඛයේ රජු දෙපස දක්නට ලැබෙන රූප දෙක කාන්තා රූප ලෙස හඳුනා ගැනීම යි. එහෙත් රජුගේ දකුණු පසින් නිරූපණය කොට ඇත්තේ පුරුෂ රූපයක් බව අල්ටෙකාර් විසින් පෙන්වා දී ඇත. ප්‍රතිමුඛයේ පාඨය "ශ්‍රී ප්‍රතාප" යනුවෙන් කියැවූ ඇලන් මෙම කාසි වර්ගය ඒ අනුව "ප්‍රතාප වර්ගය" යන නමින් හැඳින්වීය. එසේ වුවද, පසුව සොයාගන්නා ලද කාසි පරීක්ෂා කර බැලීමෙන් පසුව, අල්ටෙකාර් එම පාඨය "ශ්‍රී ප්‍රතාප" යන්න නොව "අප්‍රතිඝ" යන්න බව පැහැදිලි කර දී ඇත.

අභිමුඛයේ රූප සටහන් තුන අතර මැදින් දැක්වෙන්නේ රජ රුවයි. රජු ධෝතියකින් සැරැසී ඇඳිලි බැඳ, බුදුරුවක උෂ්ණීෂය මෙන් හිස්මුදුනේ ගැටගසා සකස් කළ කොණ්ඩයකින් යුතුව සිටිනු දක්නට ලැබේ. රජුගේ වම් පසින් කාන්තා රූපයකි. ඒ කාන්තාව සාරියක් හා කඤ්චුකයක් හැඳ, වමත ඉඟටිය මත තබාගෙන සුරත රජු දෙසට දික්කරගෙන සිටින විලාසයෙන් දක්වා තිබේ. රජුගේ දකුණු පසින් පුරුෂයකු වමතින් පලිහක් දරා දකුණත මැද රාජරූපය දෙසට දිගුකරගෙන සිටින ආකාරයෙන් දක්වා ඇත. පුරුෂ රූපයේ දිගු කළ දකුණතට ඉහළින් ගරුඬ ධ්වජයක් දක්නට ලැබෙන හෙයින් ඔහු දිගු කළ අතින් එය අල්ලා ගෙන සිටින්නේ දැයි සැක පහළ කරන්නට ඉඩ ඇත. මැද රූපය දකුණු පසින් හා වම් පසින් පිළිවෙළින් "කුමාර" හා "ගුප්ත" යන පද දෙක සිරස් අතට යොදා තිබේ. වට පාඨය "ප්‍රතාප පර......" යන පදයෙන් ඇරඹෙන එකකි. එය සම්පූර්ණයෙන් කියවා ගන්නට පුළුවන් තත්ත්වයක ඉතිරි වී නැත.

ප්‍රතිමුඛයේ රූපයෙන් දැක්වෙන ලක්ෂ්මිය ප්‍රභාමාලාවෙන් යුතුව සුපිපි පියුමක් මත, වම් අත ඉඟටිය මත තබා ගෙන සුරතින් පද්මයක් දරාගෙන සිටින ආකාරයෙන් යොදා ඇත. මේ වර්ගයට අයත් කාසි බොහොමයක ප්‍රතිමුඛයේ ඉහළ වම් කෙළවර චන්ද්‍රවංකයක සටහනක් දක්නට ලැබෙයි. ප්‍රතිමුඛයේ යෙදෙන පාඨය "අප්‍රතිඝ" ( දිනිය නොහැකි ) යන්නයි.

ඉහත සඳහන් වුණු පරිදි, මේ කාසිවල අභිමුඛයේ දැක්වෙන රූප හා ඒවා දක්වා ඇති ආකාරය නිශ්චිතව ද පැහැදිලිව ද දැන ගැනීම අසීරු ය. රජු වම් පසින් වූ කාන්තා රූපයෙන් රැජිනක ද, පුරුෂ රූපයෙන් ඇමැතියකු ද දැක්වෙන බව සිතීමට ඉඩ තිබේ. රජු හිසකෙස් උෂ්ණීෂයක් ලෙස බැඳ ඇඳිලි බැඳ ගෙන සිටීමෙන් රජය හැර අභිනිෂ්ක්‍රමණයට සූදානම් ව සිටින අයුරුත්, දෙපසින් සිටින රැජින හා ඇමැතියා ඔහු ඉන් වළකන්නට කරුණු කියන අන්දමත් දැක්වෙනවා විය හැකි යැයි අල්ටෙකාර් අදහසක් ඉදිරිපත් කොට ඇත. වී. වී. මිරාෂි ගේ අදහස වූයේ මේ රූපයෙන් රැජින හා කිරුළ හිමි කුමරු එවකට අධිරාජ්‍යයට මුහුණ දීමට සිදු වී තුබුණු යම් යම් අසීරුතාවන් මඟ හරවා ගැනීම සඳහා යෝගී මුනිවරයකුගෙන් ගුරුහරුකම් ගන්නා අවස්ථාවක් දැක්වෙන බවයි. මින් අල්ටෙකාර් දක්වන අදහස වඩා පිළිගත හැකිය.

විෂ්කම්භයෙන් හා බරින් මේ කාසිවල ප්‍රමාණය පිළිවෙළින් අඟල් ·72 හා ·75 අතරද, ග්‍රෙන් 120 – 123 අතර ද වෙයි.

**xiii. වීණාවාදක වර්ගය**

මෙය වූ කලී සමුද්‍රගුප්ත රජු ගේ වීණාවාදක වර්ගය යළි නිකුත් කිරීමට ගන්නා ලද ආයාසයක් ලෙස පෙනෙන්නකි. එහෙත් මේ වර්ගයට අයත් කුමාරගුප්ත රජු විසින් නිකුත් කරන ලද කාසි ඉතා දුර්ලභ ය. එමෙන් ම මේවා සමුද්‍රගුප්ත රජුගේ කාසි තරම් කලාත්මක අගයෙකින් ද යුක්ත නොවන බව කිව හැක.

අභිමුඛයේ ප්‍රභාමාලාව සහිතව රජු ආසනයක් මත දෙපා හකුළුවා හිඳියි. ඇකය මත වීණාවකි. වමත වීණාව මත තබාගෙන දකුණතේ ඇඟිලි තුඩුවලින් වීණා තත් පිරිමදින ආකාරය දක්වා තිබේ. වට පාඨය "මහාරාජාධිරාජ ශ්‍රී කුමාරගුප්තඃ" යන්න යි.

ප්‍රතිමුඛයේ දෙවතාවිය ඇඳි සහිත ආසනයක හිඳගෙන දකුණතින් පියුමක් දරා සිටින විලාසය දක්වෙන රූප සටහනකි. මෙහි දී කාන්තා රූපය සයනයක් වැනි පීඨයක් මත හිඳින ආකාරයෙන් දක්වෙන හෙයින්, සමහර විට ඉන් අදහස් කරන ලද්දේ දෙවතාවියක නොව රැජිනක පිළිබිඹු කිරීම යැයි සිතන්නට ද ඉඩ ඇත. ප්‍රතිමුඛයේ පාඨයෙහි රජුගේ නාම මාත්‍රය පමණක් "කුමාරගුප්ත" යනුවෙන් යෙදී තිබේ. සමහර විට දෙවතාවියගේ රූපය දක්වීම සඳහා ද කුෂාණ කාසිවල (අර්දොක්ෂො දෙවිතාවිය දක්වන ප්‍රතිමුඛයේ රූප සටහන්වල) මේ කාසියේ දක්නට ලැබෙන අයුරු, ඇඳි සහිත ආසනයක් යෙදී තිබේ. මෙහිදු ප්‍රතිමුඛයේ දෙවතාවිය නිරූපණය කිරීමේ දී එබඳුම සිරිතක් අනුගමනය කළ බව සිතන්නට ඉඩ ඇත.

**xiv. රජ හා රැජින වර්ගය**

මෙම කාසි වර්ගය, ඉහත විස්තර කරන ලද පළමුවැනි චන්ද්‍රගුප්ත රජු විසින් නිකුත් කරන ලද මීට අනුරූපී කාසි වර්ගයම යළි නිකුත් කිරීමකි. අභිමුඛයේ රූප සටහනෙහි රජු යෂ්ටියක් අල්වාගෙන සිටිනුවෙනුවට, අත හිණ රැඳි කඩුවේ මිට මත තබාගෙන සිටින ආකාරය දක්වෙයි. ප්‍රතිමුඛයේ දෙවතාවිය පෙර මෙන් සමෘද්ධිශෘංගයක් දරා සිටින අයුරින් නොයෙදේ. මෙබඳු සුළු වෙනස් කම් හැරුණු විට, කුමාරගුප්ත රජ නිකුත් කළ මේ වර්ගයේ කාසි චන්ද්‍රගුප්ත රජුගේ කාසි වර්ගය බොහෝ දුරට අනුකරණය කර ඇති බව පෙනේ.

අභිමුඛයෙහි ධෝතියකින් සැරසී ආභරණ පැළැඳි රජු දකුණු පසට මුහුණ ලා සිටියි. ඔහුගේ වමත කඩු මිට මත රඳවා ඇත. දකුණතින් රැජිනට මල් පොකුරක් ප්‍රදානය කෙරෙයි. රැජින දකුණත ඉහටියෙහි රඳවා, වමත ශරීර පාර්ශවයෙහි එල්බ ගෙන රජු දෙස නෙත් හෙළා සිටින්නී ය. රජුගේ හා රැජිනගේ රූප සටහන් අතර චන්ද්‍රවංක සංකේතයක සටහනක් වෙයි. කාසියේ ක්ෂෙත්‍රයේ දකුණු පසින් පාඨයක සලකුණු ඇතත් එය නොපැහැදිලි ය.

ප්‍රතිමුඛයෙහි ප්‍රභාමාලාව සහිත දෙවතාවිය ඉදිරිපසට මුහුණ ලා ගෙන සිටින්නේ අත් පා හකුළුවා ගත් සිංහයකු පීඨය කොට ගෙන ය. ඇගේ වමත කලව මත තබාගෙන සිටින අතර, දකුණු අතින් පියුමක් දරා සිටියි. පාඨය "ශ්‍රී කුමාරගුප්ත" යන්න යි.

මේ වර්ගයේ කාසි සාමාන්‍ය ප්‍රමාණ අනුව සලකන විට විෂ්කම්භයෙන් අඟල් ·75 ක් ද, බරින් ග්‍රෙන් 126·7 පමණ ද වෙයි.

**xv. ගරුඩ වර්ගය**

මෙම කාසි වර්ගය කුමාරගුප්ත රජුගේ ම කාසි වර්ගයක් දැයි ඉඳුරා දත නොහැකි ය. වී. වී. මිරාෂි මේ වර්ගයට අයත් කාසි කුමාරගුප්ත රජු වෙනුවෙන් රායිපූර්හි ප්‍රාදේශීය රාජ වංශයක් විසින් නිකුත් කරන ලද ඒවා යැයි කල්පනා කරයි. අල්ටෙකාර් ද මේවා කුමාරගුප්ත ගේ කාසි වර්ගයකට අයත් නොවෙතැයි හඟියි. කෙසේ වුවද, මෙම කාසි වර්ගය පිළිබඳ ගැටළුව නිශ්චය වශයෙන් නිරාකරණය කර ගැනීමට නාණක විද්‍යාඥයනට මේ දක්වා නොහැකි වී ඇත. මෙම වර්ගයට වැටෙන කාසි රෙපූසේ (repousae) ක්‍රමයට මුද්‍රිත හෙයින්, ප්‍රතිමුඛයේ කිසිදු රූප සටහනක් දක්නට නැත.

මේ කාසිවල අභිමුඛයෙහි උඩු කොටසේ පියාපත් විදහා ගත් ගුරුළකුගේ රුවකි. මධ්‍යයේ මුදුනෙහි චන්ද්‍රවංකය සහිත චක්‍රයක් ද, දකුණු පස සංඛයක් ද රූප සටහන්වලින් දක්වේ. පහළ කොටසේ "ශ්‍රී මහෙන්ද්‍රාදිත්‍ය" යන පාඨය යෙදේ.

ප්‍රතිමුඛයේ ක්ෂෙත්‍රය හිස්ය. මේ කාසි ප්‍රමාණයෙන් අඟල් ·8– ·9 විෂ්කම්භයෙන් ද, ග්‍රෙන් 20 ක පමණ බරින් ද යුක්ත වේ.

## පළමුවැනි කුමාරගුප්තගේ රිදී කාසි

ඉහත සඳහන් කරන ලද පරිදි, ගුප්ත අධිරාජයන් අතර ප්‍රථම වරට රිදියෙන් කාසි නිකුත් කරන ලද්දේ දෙවැනි චන්ද්‍රගුප්ත විසිනි. එහෙත් ඔහුගේ රිදී කාසි එතරම් සුලභ නොවූ බව පෙනේ. පළමුවැනි කුමාරගුප්ත විසින් විවිධ ප්‍රභේදයන්ගෙන් යුත් කාසි ඉතා විශාල සංඛ්‍යා–වලින් නිකුත් කැරිණි. චන්ද්‍රගුප්ත රජුගේ රිදී කාසි බටහිර ප්‍රදේශවලට පමණක් සීමා වුවද, කුමාරගුප්තගේ රිදී කාසි මධ්‍ය ප්‍රදේශයන්හි ද ප්‍රකාශයට පත් විණි.

## බටහිර ඉන්දීය පෙදෙස්වල රිදී කාසි

පළමුවැනි කුමාරගුප්ත විසින් බටහිර ඉන්දියානු ප්‍රදේශවල භාවිතයට පත් කළ රිදී කාසි බෙහෙවින් බටහිර ක්ෂත්‍රපයන් ගේ කාසි අනුකරණයෙන් සකස් වුණු දෙවැනි චන්ද්‍රගුප්තගේ රිදී කාසිවලට වඩා වෙනස් වනුයේ ඉතා ස්වල්ප වශයෙනි.

මෙම කාසි කථියවාර්, ගුජරාට, වලභි, ජුනාගාද්, අහමදබාද් වැනි ස්ථානවලින් රාශි වශයෙන් ගෙන තිබේ. සතාරා, බෙරාර් වැනි දිස්ත්‍රික්කවලින් ලැබී ඇති කාසි වෙළෙඳුන් විසින් හා අනෙකුත් අය විසින් ගෙන යනු ලැබූ බව පෙනේ.

මේ කාසි කොටස්වලට බෙදීමේ දී නාණකවිද්‍යාඥයන් නොයෙක් ක්‍රම අනුගමනය කර ඇත. වින්සන්ට් ස්මිත් එම කාසිවල එන වට පාඨයෙහි ''මහාරාජාධිරාජ'' යනුවෙන් සඳහන් කාසි එක් ගණයකටත්, ''රාජාධිරාජ'' යනුවෙන් දැක්වෙන කාසි තවත් ගණයකටත් වෙන් කර දක්වයි. කුමාරගුප්ත සිය පියාණන්ගේ රාජ්‍ය සමයෙහි තමා කථියවාර් ප්‍රදේශයෙහි යුවරාජ තනතුර දැරූ හෙයින්, මෙම වකවානුවේ දී ඔහු ''රාජාධිරාජ'' යන වට පාඨය සහිත දෙවැනි කොටසට අයත් කාසි නිකුත් කරන්නට ඇතැයි ස්මිත් අදහස් කළේ ය. කෙසේ වුවද, මෙම අදහස පිළිගැනීමට තරම් සාක්ෂි නොමැත. අනෙක් අතට දෙවැනි චන්ද්‍රගුප්ත අධිරාජයකු වශයෙන් පාලනය කළ සමයෙහි ඔහු විසින් ද ''රාජාධිරාජ'' නාමය යොදන ලද බව ගුප්ත වර්ෂ 62 ට අයත් වන මථුරා සෙල්ලිපියේ සඳහන් කරුණුවලින් පෙනේ.

ඇලන් මේ කාසි බෙද දක්වනුයේ ඒවායේ ප්‍රමාණයන් හා නිර්මාණ තත්ත්වය අනුවය. මෙසේ ඔහු විශාල කාසිවලින් කුඩා කාසි වෙන් කරන අතර, නිර්මාණයෙන් උසස් කාසි එක් කොටසකට ද, එතරම් උසස් නිර්මාණ තත්ත්වයක් පිළිබිඹු නොකරන කාසි තවත් කොටසකට ද, වෙන් කර දක්වා ඇත.

මෙයින් ඇලන්ගේ වර්ගීකරණය ස්මිත්ගේ ක්‍රමයට වඩා ශාස්ත්‍රීය බව පිළිගැනෙයි.

## පළමුවැනි කොටස

අභිමුඛයේ දකුණට මුහුණ ලූ රජුගේ උඩුකය දැක්වෙන පිළිරුව ක්ෂත්‍රප පාලකයන්ගේ කාසිවල දැක්වෙන රූ සටහනේ ලක්ෂණවලට සමාන ය. චක්‍ර ගිය අයුරින් දැක්වෙන රජුගේ හිසකෙස්වලට ඉහළින් ක්ෂේත්‍රයේ ''වර්ෂ'' යන පදය යෙදී තිබේ. ඇතැම් විට දූෂිත ග්‍රීක අක්ෂර කීපයක් ද දැක්වේ.

ප්‍රතිමුඛයේ උඩු භාගයෙහි පියාපත් විදහාගත් අයුරින් දැක්වෙන ගරුඩ රුවකි. පහළ කොටසෙහි ''පරමභාගවත මහ – රජධිරජ ශ්‍රී කුමාරගුප්ත මහෙන්ද්‍රාදිත්‍ය'' යන පාඨය වෙයි.

මෙම කාසි දෙවැනි චන්ද්‍රගුප්ත ගේ රිදී කාසිවලට බෙහෙවින් ම සමාන ය. එහෙයින් චන්ද්‍රගුප්තගේ කාසි ළඟට ව්‍යවහාරයට පත්වූ කාසි වර්ගය ලෙස ගිණිය හැක. අභිමුඛයේ ''වර්ෂ'' යන පදය දැක්වෙතත්, එකී වර්ෂය දැක්වෙන්නේ කලාතුරෙකිනි.

මේ වර්ගයට අයත් කාසිවල සාමාන්‍ය විෂ්කම්භය අඟල් ·55 හා ·6 අතර වේ. ඒවායේ බර ප්‍රමාණය ග්‍රෙන් 30 ක් පමණ වේ.

**දෙවැනි කොටස:**

අභිමුඛයේ රජුගේ උඩුකය දැක්වෙන පිළිරුවකි. මේ කොටසට වැටෙන කාසිවල ග්‍රීක අක්ෂර යෙදී නොමැත. ප්‍රතිමුඛයේ පාඨය ''පරමභාගවත රාජාධිරාජ'' යන්න යි.

මෙම කාසි පළමුවැනි කොටසට අයත් කාසිවලට වඩා කලාත්මක අගයෙන් අඩුය. ක්ෂත්‍රප කාසිවල ආභාසය දක්නට ඇත්තේ ද මඳ වශයෙනි. ග්‍රීක අක්ෂර නොයෙදීමෙන් පෙනී යනුයේ අනවශ්‍ය විදේශීය ලක්ෂණ දුරු කිරීමට උත්සාහයක් දරා ඇති බවයි. මේවායේ ප්‍රමාණය විෂ්කම්භයෙන් අඟල් ·5 – ·6 අතර ද, බරින් ග්‍රෙන් 28 – 30 අතර ද වේ.

**තුන්වැනි කොටස:**

මේ ගණයට වැටෙන කාසි අභිමුඛය හා ප්‍රතිමුඛය අතින් පළමුවැනි කොටසට අයත් කාසිවලට සමානය. මෙහිදු ග්‍රීක අක්ෂර දක්නට ලැබේ. වෙනසකට ඇත්තේ ප්‍රමාණයෙන් කුඩා වීම පමණි. මේවා බොහෝ දුරට දකුණු ගුජරාටයෙහි ත්‍රෛකූටක පාලකයන් නිකුත් කළ කාසිවලට සමානතා දක්වන හෙයින්, ගුප්ත රජුන් විසින් මේ ප්‍රදේශය යටත් කර ගැන්මෙන් පසු, මේවා භාවිතයට පත් කළා විය හැකි යැයි ජෝන් ඇලන් අදහස් කරයි. එහෙත් ඉහත කී රාජවංශය යටත් කළ බවක් ගුප්ත අභිලේඛනයන්ගෙන් ලැබෙන සාක්ෂිවලින් නොපෙනේ.

මේවායේ සාමාන්‍ය විෂ්කම්භය අඟල් ·5 ක්ද බර ග්‍රෙන් 31 පමණ වේ. කාසිවල හැඩය ද සමරූපිතාවෙන් තොරය. ඇතැම් කාසි වටකුරු ස්වරූපයක් ගන්නා අතර අනික් ඒවා පස්කොන් හැඩයක් ගනියි.

**හතරවැනි කොටස:**

අභිමුඛයෙහි රාජ ශීර්ෂය දැක්වෙන රූ සටහනෙකි. ග්‍රීක අක්ෂරවල සලකුණු මාත්‍රයක් දක්නට තිබෙයි. මේවායේ ප්‍රතිමුඛය අතින් ඉහත විස්තර කරන ලද කාසිවල ප්‍රතිමුඛයට වඩා වෙනසි. එහි දැක්වෙනුයේ වජ්‍රයක රූ සටහනෙකි.

මේ කොටසට අයත් කාසි ලැබී ඇත්තේ එකක් පමණි. මේ නිසා මෙම වර්ගයේ කාසි කුමාරගුප්තයන් විසින් නිකුත් කරන ලද්දේ දැයි ඇලන් වැනි නාණක විද්‍යාඥයෝ සැක කෙරෙති. එසේ වුවද, කුමාරගුප්ත නාමය මෙහි පැහැදිලි ලෙස දක්වා ඇති බව අල්ටෙකාර් පෙන්වා දෙයි.

මේ වර්ගයේ කාසිවල විෂ්කම්භය අඟල් ·6 ක් පමණ වේ.

**මධ්‍ය දේශයේ රිදී කාසි**

මධ්‍ය ප්‍රදේශයේ ගංගා නදිය අසබඩ ද පළමුවැනි කුමාරගුප්ත විසින් රිදී කාසි භාවිතයට පත් කර තිබුණු බවට සාක්ෂි ඇත. මෙම කාසි ප්‍රමාණයෙන් හා බරින්ද, අභිමුඛයේ රජුගේ උඩුකය හා ප්‍රතිමුඛයේ ගුරුළුරුව දක්වන රූප සටහන් යොද තිබීමෙන්ද, ඉහත විස්තර කරන ලද බටහිර ඉන්දිය ප්‍රදේශවල රිදී කාසිවලට සමාන ය. එහෙත් මේ දෙවර්ගය අතර විශේෂතා ද දක්නට ලැබේ.

(අ) මේවායේ රාජ ශීර්ෂය දක්වා ඇත්තේ ක්ෂත්‍රප කාසිවල අභිමුඛයේ යෙදෙන රූප සටහන් අනුකරණයෙන් නොවේ. මේවායේ එන රජ රුවෙහි දිගු උඩුරැවුළ හා දිගු නාසය දක්නට නොලැබේ. එහෙත් හිස පිටුපසින් වැටෙන අක් බමරු හිස කෙස් දක්වා ඇත්තේ ක්ෂත්‍රප කාසිවල මෙනි. බොහෝ දුරට කුමාරගුප්ත රජුගේ පිළිරුව මෙම රූ සටහන්වලින් දක්වන්නට ආයාස ගෙන ඇති බව පෙනේ.

(ආ) කිසිදු අර්ථයක් ගෙන නොදෙන එමෙන් ම වැඩකට නැති ග්‍රීක අක්ෂර හා පාඨ යෙදීම මේ කාසි නිපැදවීමේ දී සහමුලින් ම අත හැර දමා තිබෙනු දක්නට ලැබේ.

(ඈ) බටහිර ඉන්දීය ප්‍රදේශවල කාසිවල දනම යෙදීමේ දී රජුගේ හිසට පිටුපසින් කාසියේ ක්ෂෙත්‍රයේ එය යෙදුණු අතර, මේ ප්‍රදේශයේ භාවිත වූ කාසිවල එය හිසට ඉදිරිපසින් යොද තිබේ.

(ඇ) ප්‍රතිමුඛයේ ගරුඩ පක්ෂියා වෙනුවට මධ්‍ය දේශයේ තිබී සොයා ගන්නා ලද ඇතැම් කාසිවල මොණර රුවක් දක්වෙයි. (කුමාරගුප්ත කාර්තිකෙය දෙවියන් කෙරෙහි වැඩි ප්‍රසාදයක් දක්වූ හෙයින් එම දෙවියාගේ වාහනය වූ මයූර පක්ෂියා යොදන ලද බව පෙනේ.)

(ඉ) බටහිර ඉන්දීය කාසිවල යෙදෙනුයේ ගද්‍ය පාඨයක් වුවද, මධ්‍ය දේශයේ නිකුත්කළ කාසිවල ගී වෘත්තයෙන් බැඳි පාඨයක් යෙදෙයි. එය කුමාරගුප්ත රජුගේ රන්කාසි අතුරින් ධනුර්ධර වර්ගයේ දක්වෙන පාඨයම බව පෙනේ. ''විජිතාවනිරවනිපතිඃ කුමාරගුප්තො දිවං ජයති'' යන මෙම පාඨය මධ්‍ය දේශයේ ශතක දෙකක් පමණ ගතවන තුරු, ස්කන්දගුප්ත බුධගුප්ත, තොරමාන, මෞඛරී රජවරුන් හා හර්ෂවර්ධන රජු විසින් ද භාවිතා කරන ලද බව පැහැදිලිය. ලේඛන අක්ෂරවල වෙනසක් නුවූව ද, මධ්‍යකාලීන යුගයට අයත් ස්වර සඳහා යෙදෙන යම් යම් සලකුණු බටහිර ඉන්දීය කාසිවල කිසි විටෙකත් දක්නට නොලැබේ.

මෙම මධ්‍යදේශීය කාසිවල බර හා ප්‍රමාණය සාමාන්‍ය වශයෙන් පිළිවෙළින් අඟල් ·55 – ·6 අතර ද, ග්‍රෙන් 29 – 31 අතර ද වේ. අභිමුඛයේ රූප සටහනෙහි රජුගේ උඩුකය දක්වීමේ දී පැතැලි නාසයක් හා උඩු රැවුලෙන් තොර මුහුණක් යෙදී තිබෙන අතර, ග්‍රීක අකුරින් ලියැවුණු පාඨයන් ද දක්නට ලැබේ. ප්‍රතිමුඛයෙහි වම් දෙසට මුහුණ ලා පියාපත් විදගෙන සිටින අයුරින් දක්වෙන මොණරෙක් දක්වේ. ඉහත දක්වුණු අයුරු, වට පාඨයක් ද, මොණර රුව අසල පියුමක රූප සටහනක් ද වේ.

ප්‍රතිමුඛයේ පියුමක් යෙදීම, ඒ වෙනුවට තිත් තුනක් පමණක් දක්වා ලීම, කිසිවකින් තොරව හිස්ව තිබීම් යනාදි වශයෙන් ප්‍රතිමුඛයේ රූප සටහන්වල විශෙෂතා අනුව මෙම කාසි ප්‍රභෙද කිහිපයකට ද වෙන් කොට දක්විය හැක. මෙසේ දක්නට ලැබෙන එක් අතුරු කොටසකට අයත් කාසිවල පෙන්වා දිය හැකි විශෙෂ වැදගත්කම වන්නේ කාසියේ කෙළවර දක්නට ඇති තිත් වටයත් වට පාඨයත් අතර සැහෙන ප්‍රමාණ පරතරයක් වීම පමණි.

## රිදී ආලේප කරන ලද තඹ කාසි

කුමාරගුප්ත රජුගේ රාජ්‍ය සමයෙහි රිදී කාසි මෙන් ම, මධ්‍යදේශයෙහි හා බටහිර ඉන්දීය ප්‍රදේශවල භාවිතයට පත් රිදී ආලෙප කරන ලද තඹ කාසි ද හමු වී තිබේ. කුමාරගුප්ත රජුගේ රාජ්‍ය සමයෙහි අවසාන කාලයේ අධිරාජ්‍යය ආර්ථික වශයෙන් පරිහානි යුගයකට මුහුණ දීම මෙබඳු කාසි විශෙෂයක් නිකුත් කිරීමට හේතුව වී යැයි සලකනු ලැබේ. මේ කාසි නිර්මාණය සඳහා යොද ගන්නා ලද ද්‍රව්‍යයන්ගේ වෙනසක් මෙසේ දක්නට ලැබුණද අභිමුඛයේ හා ප්‍රතිමුඛයේ දක්වෙන රූප සටහන් ඈ ලක්ෂණවලින් වෙන් වෙන් වශයෙන් බටහිර ඉන්දීය ප්‍රදේශවල හා මධ්‍ය දේශයේ නිකුත් කැරුණු රිදී කාසි අනුගමනය කර ඇති බව පෙනේ.

## කුමාරගුප්තගේ තඹ කාසි

ඉහත සඳහන් රිදී ආලේප කරන ලද තඹ කාසි හැරුණු විට, එසේ රිදී ආලේප නොකළ තඹ කාසිද කුමාරගුප්ත රජු විසින් නිකුත් කර ඇත. එහෙත් ඒ ඉතා අල්ප වශයෙනි. මෙම තඹ කාසි ඒ රජුගේ රන්කාසි මෙන් ම වර්ග කිහිපයකට අයත් වේ.

### i. ඡත්‍ර වර්ගය

අභිමුඛයේ රූප සටහනෙන් ප්‍රභාමාලාව සහිතව රජු මඳක් වමට හැරී සිටින ආකාරය නිරූපණය වෙයි. ඔහු පිටුපසින් ඡත්‍රධාරියකුගේ පිළිරුව දක්වේ. කාසියේ ප්‍රතිමුඛයෙහි උඩ භාගයෙහි පියාපත් විදහාගෙන සිටින අයුරු දක්වෙන ගරුඩ රූපයක් ද ඊට යටින් පේළි දෙකක් සහිත පාඨයක් මඟින් ''මහාරාජ ශ්‍රී කුමාරගුප්තඃ'' යන වචන කිහිපය ද යොද ඇත. මේ වර්ගය

දෙවැනි චන්ද්‍රගුප්ත රජුගේ තඹ කාසි ඒ වූ පරිද්දෙන් ම අනුකරණය කිරීමෙන් නිමවා ගන්නා ලද බවට සැක නැත. මෙම වර්ගයට අයත් වන කාසියක සාමාන්‍ය ප්‍රමාණය විෂ්කම්භයෙන් අඟල් 1 ක් පමණ වේ. බරින් ග්‍රෙන් 84 ක් පමණ වේ.

### ii. ධනුර්ධර වර්ගය

මේ වර්ගයට වැටෙන කාසිවල අභිමුඛයේ රජු වම්පසට හැරී දකුණතින් හීයක් හා වමතින් දුන්න දරා සිටින ආකාරය නිරූපණය වෙයි. කාසියේ ප්‍රතිමුඛයෙහි රූප සටහන ඡත්‍ර වර්ගයට අයත් තඹ කාසිවල ප්‍රතිමුඛයට අතිශයෙන් සමාන ගරුඩ රුවකි. මේවායේ පාඨය මඳක් වෙනසි. එය ''ශ්‍රී කුමාරගුප්තඃ'' යනුවෙන් පමණක් කිසිදු විරුද නාමාදියෙකින් තොරව යෙදෙයි. මේ වර්ගයේ කාසියක් සාමාන්‍යයෙන් විෂ්කම්භයෙන් අඟල් ·6 ක් පමණ වේ. ග්‍රෙන් 58 ක් පමණ බරය.

### iii. රාජරූප වර්ගය

මේ වර්ගයට අයත් කොට ගිණිය හැකි කාසිවල අභිමුඛයේ රජු සිටගෙන වම් අත ඉඟටිය මත තබාගෙන දකුණතින් පූදසුනක් මත කිසියම් පූජා ද්‍රව්‍යයක් දමන ආකාරය දැක්වෙන රූප සටහනක් වේ. ප්‍රතිමුඛයේ රූප සටහන ඉහත දැක්වූ වර්ගවල මෙනි. මේ කාසියක සාමාන්‍ය විෂ්කම්භය අඟල් ·7 ක් පමණ වේ.

### iv. පූජාසන වර්ගය

අභිමුඛයේ පූජාසනයක් බඳු රූප සටහනක් දැක්වෙන හෙයින් මේ කාසි වර්ගය පූජාසන වර්ගය නමින් හඳුන්වනු ලැබේ. එහෙත් එම රූප සටහනෙන් නිරූපණය වන්නේ නියම වශයෙන් ම පූදසුනක් ද යන්න අවිනිශ්චිත ය. ඇතැම් විටෙක ඉන් දැක්වෙන්නේ ගුරුළු රුවක්දැයි සැක කරන්නට ද අවකාශ ඇත. ඒ අතර ම මෙසේ වර්ග කරනු ලැබෙන කාසි නිකුත් කළේ සතළොස් වසරක් අතර තුර කාලයේ රජ කළ කුමාරගුප්ත නාමය දරූ පාලකයන් දෙදෙනාගෙන් කවරකුගේ ද යන්නත් නිශ්චය වශයෙන් කියන්නට නුපුළුවන. පළමුවැනි කුමාරගුප්ත රජුගේ රන් කාසිවල යෙදෙන පරිද්දෙන් මෙහි ද කුමාරගුප්ත යන සම්පූර්ණ නාමය වෙනුවට ''කු'' අක්ෂරය පමණක් යෙදෙන හෙයින්, මේ කාසිද පළමුවැනි කුමාරගුප්ත රජු විසින් ම නිකුත් කරන ලදැයි අල්ටේකාර් පෙන්වා දෙයි.

අභිමුඛයේ කාසියේ ක්ෂේත්‍රය වටා වැටුණු තිත් රෙඛාවක් මැද උඩු කොටසෙහි පූජාසනයක් ද, ඊට යටින් පහළින් ''ශ්‍රී කු'' යන අක්ෂර ද දක්නට ලැබේ. ප්‍රතිමුඛයේ දෙවතාවියක හඳුනාගත නොහැකි ආසනයක් මත හිඳින ආකාරය දැක්වෙන රූප සටහනකි. එය සිංහ වාහනය ආසනය කොටගත් දෙවතාවියකගේ රුවකැයි ඇලන් සිතිය. ස්මිත්ගේ අදහස වූයේ එය කුඩා පීඨයක් බවයි. එහෙත් ඒ පිළිබඳ නිශ්චයකට පැමිණීම දුෂ්කර ය.

මේ කාසි සාමාන්‍ය වශයෙන් විෂ්කම්භයෙන් අඟල් ·65 ක් පමණ වෙයි.

ඉහත විස්තර වූ තඹ කාසි වර්ග ලැබී ඇත්තේ එක් වර්ගයකින් එකක් දෙකක් හෝ තුනක් බැගින් පමණි. පළමුවැනි කුමාරගුප්ත රජුගේ රාජ්‍ය කාලයේ අවසාන සමය ගුප්ත අධිරාජ්‍ය යේ පරිහානි ලක්ෂණ පෙන්නුම් කරන කාල පරිච්ඡේදයක් වූ බව මේ කාසිවලින් පෙනී යයි.

### ස්කන්දගුප්තගේ කාසි

මේ දක්වා විස්තර කරන ලද ගුප්ත කාසි ගැන අවධානය යොමු කරන විට, සමුද්‍රගුප්ත, දෙවැනි චන්ද්‍රගුප්ත හා පළමුවැනි කුමාරගුප්ත යන රජවරුන් විසින් විවිධත්වයෙන් හා කලාත්මක අගයෙන් යුත් කාසි වර්ග නිකුත් කළ බව පැහැදිලි ය. ස්කන්දගුප්ත රජුගේ කාසි පිළිබඳව එසේ කිව නොහැක. මේ රජු විසින් රන් කාසි වර්ග තුන හතරක් නිකුත් කරන ලද නමුත් ඒවා අතර එකක් හෝ නව නිර්මාණයකැයි හැඳින්විය නොහැක. මීට හේතුව වූයේ මෙකල පැවැති ආර්ථික හා දේශපාලන අර්බුද තත්ත්වය යයි සැල කිය හැක.

### i. ධනුර්ධර වර්ගය

ස්කන්දගුප්තගේ කාසි අතර සුලභ තම වර්ගය මෙයයි. මේ දෙවැනි චන්ද්‍රගුප්ත රජු සමයේ ද සුලභ වූ කාසි වර්ගයකි.

මේ කාසිවල අභිමුඛයේ කබායකින් හා කලිසමකින් සැරැසී, උස් පාවහන් ලාගෙන වමතින් දුන්න හා දකුණතින් ඊතලයක් ගෙන සිටින රජු වම් පැත්තට හැරී ඉන්නා අයුරින් දක්වා ඇත. ගරුඩධ්වජය සුරත පිටුපසින් දක්නා ලැබේ. වම් බාහුව යටින් ''ස්කන්ද'' යන පදය සටහන් කොට තිබේ. වට පාඨය ''ජයති මහීතලං (ස්කන්දගුප්තඃ) සුධන්වී'' යන්න යි.

කාසියෙහි ප්‍රතිමුඛයේ ලක්ෂ්මී දෙවතාවිය ප්‍රභා මාලාවෙන් යුතුව, පියුමක් මත හිඳ දකුණ-තින් පාශයක් හා වමතින් පියුමක් ද දරා සිටී. පාඨය ''ශ්‍රී ස්කන්දගුප්ත'' යන්නයි. ඇතැම් කාසියක මෙම පාඨය වෙනුවට ''ක්‍රමාදිත්‍ය'' යන්න යෙදී තිබෙනු දක්නට ලැබෙයි.

මේ කාසිවල බර සාමාන්‍ය වශයෙන් විෂ්කම්භය අඟල් ·75 හා ·9 අතර ද, බර ග්‍රෙන් 130·2 – 142·8 අතර ද වෙයි.

### ii. රජ හා ලක්ෂ්මී (රැජින ?) වර්ගය

මේ කාසි වර්ගය පිළිබඳ මත භේද පවතී. කාසියේ අභිමුඛයේ පාඨය හොඳින් ආරක්ෂා වී නො තිබීමත්, එහි කාන්තාව අතින් දරා සිටින වස්තුව කුමක් දැයි නිශ්චය ලෙස හඳුනා ගත නොහැකි තත්ත්වයක තිබීමත්, යන කරුණු මෙම මතභෙදවලට හේතු වී ඇත. වින්සන්ට් ස්මිත් පළමුවන චන්ද්‍රගුප්ත රජුගේ කාසි අනුව සලකමින් මෙය ද රජ හා රැජින වර්ගය යන නමින් හැඳින් වූ අතර ඇලන් මෙය රජ හා ලක්ෂ්මී වර්ගය යනුවෙන් හඳුන්වයි. අලටෙකාර් ද නැඹුරු වන්නේ ඇලන්ගේ නම් කිරීමට යි. ඔහුගේ අදහස අනුව මෙය රජ හා රැජින වර්ගය යනුවෙන් හැඳින්වුව හොත්, පළමුවැනි චන්ද්‍රගුප්ත ගේ කාසියෙහි මෙන් මෙහිදු ඒ දෙදෙනාගේ නම් සඳහන් නොකිරීම ගැන දැක්විය හැකි කරුණක් නැත. කාන්තාවගේ හිසට ආසන්නයේ යෙදෙන අක්ෂරවලින් වින්සන්ට් ස්මිත් දක්වන පරිදි, ''ප්‍රියා'' යන්න නොව, පාඨයේ ''සුධන්වී'' යන පදයේ ''න්වී'' යන්න යි ලියැවී ඇත්තේ. චන්ද්‍රගුප්තගේ කාසිවල රාජකීය යුවළ දැක්වීමේ දී රජු හැම විටම දකුණු පැත්තේ ම යෙදෙතත්, මේ වර්ගයට අයත් කාසිවල රජුගේ රුව වම් පැත්තේ ඇති එකයි. එහෙත් මේ කාසියේ අභිමුඛයේ සටහන හුදෙක් රාජකීය යුවළ දැක්-වීමක් නොව, රැජින රජුට යමක් දෙන ආකාරය දක්වන්නකැ යි සමහරු අදහසක් ඉදිරිපත් කරති. චන්ද්‍රගුප්ත රජුගේ රජ හා රැජින වර්ගයේ කාසිවල රජු රැජිනට යමක් දෙන අයුරු නිරූපණය වේ. රූ සටහන මැද වන ගරුඬ ධ්වජයත් රජු දරා සිටින දුන්න හා හීයත් නිසා මෙය යුද බිමෙහි අවස්ථා-වක් නිරූපණය කිරීමක් යයි සැක සිතිය හැක. සමහර විට මේ කාසියෙහි රූප සටහන මගින් ජය ලක්ෂ්මිය යුද බිමෙහි සටන් වැදී සිටි රජුට පට්ටබන්ධන වැනි ජය එළවන යම් ප්‍රසාදයක් ප්‍රදානය කිරීම දක්වන්නට අදහස් කළා විය හැක.

කාසියෙහි අභිමුඛයෙහි වම් පසින් රජු දකුණු පැත්තට මුහුණ ලා ගෙන වමතින් දුන්නක් ගෙන ඉහටිය මත රැඳැවූ දකුණතින් ඊයක් දරා සිටින ආකාරය දැක්වේ. දකුණු පසින් ලක්ෂ්මිය රජු දෙසට මුහුණ ලා වමතින් දරූ පියුමක් සහිතව දකුණු අත ඔසවා රජුට යමක් දෙන අයුරු පෙන්නුම් කෙරේ. මෙම රූප දෙක අතරින් ගරුඬ ධ්වජය දිස් වේ. වට පාඨය අවිනිශ්චිත ය. අල්ටෙ-කාර්ගේ අදහස නම් මෙහි දැක්වෙන වට පාඨය ද ඉහත සඳහන් කැරුණු ධනුර්ධර වර්ගයේ කාසිවල යෙදී තිබෙන වට පාඨය ද අතර වෙනසක් නැති බවයි.

කාසියේ ප්‍රතිමුඛයෙහි ලක්ෂ්මිය ප්‍රභාමාලාව සහිතව පියුමක් මත හිඳ වමතින් පියුමක් හා සුරතින් පාශයක් ගෙන සිටින අයුර දැක්වේ. ප්‍රතිමුඛයේ යෙදෙන පාඨය ''ශ්‍රී ස්කන්දගුප්තඃ'' යන්න යි.

මේ කාසි වර්ගයට අයත් කාසි විෂ්කම්භයෙන් අඟල් ·75 ක්ද බරින් ග්‍රෙන් 128·8 ක් ද වන සාමාන්‍ය ප්‍රමාණයන්ගෙන් යුක්ත ය.

### iii. ඡත්‍ර වර්ගය

මේ ස්කන්දගුප්ත රජතුමන් විසින් නිකුත් කරන ලද කාසි වර්ගයක් යයි නියත වශයෙන් ම කීමට තරම් පැහැදිලි සාක්ෂි නැත. මේ වර්ගයේ කාසිවල අභිමුඛයේ රජුගේ නම නොදක්වෙයි. එහෙත් ප්‍රතිමුඛයේ පාඨයෙහි යෙදෙන ''ක්‍රමාදිත්‍ය'' යන විරුද නාමය නිසා මෙය මෙම පාලකයා විසින් නිකුත් කරන ලද්දකැයි අදහස් කරනු ලැබේ.

කාසියෙහි අභිමුඛයෙහි ප්‍රභාමාලාව සහිතව රජ රුව දක්වෙයි. ඒ වම්පැත්තට හැරී නැඟිට සිටිමින් දකුණතින් යම් (පූජා) ද්‍රව්‍යයක් දමන අයුරිනි. එහෙත් රූප සටහනෙහි පූජාසනයක් නොදක්වේ. වාමනයෙක් රජු පිටුපසින් සිට ගෙන රජුට ඡත්‍රයක් අල්වයි.

මේ වර්ගයේ කාසිවල ප්‍රතිමුඛයේ යොද ඇත්තේ සුරතින් පාශයක් හා වමතින් පියුමක් ගෙන නැඟිට සිටින ඉරියව්වෙන් නිරූපිත දේවතාවියකගේ පිළිරුවකි. ප්‍රතිමුඛයේ ''ක්‍රමාදිත්‍ය'' යනුවෙන් විරුද නාමයක් සඳහන් වෙයි. මෙවා විෂ්කම්භයෙන් අඟල් ·8 ක් පමණ ද බරින් ග්‍රෙන් 130 ක් පමණ ද වේ.

### v. අශ්වාරෝහක වර්ගය

මේ කාසි වර්ගය සම්බන්ධයෙන් ද නාණක විශෙෂඥයන් අතර මත භෙද පවතී. අල්ටෙකාර් මෙය ස්කන්දගුප්ත රජුගේ කාසියක් යයි සලකන අතර, ඊට පෙර වින්සන්ට් ස්මිත් දෙවැනි චන්ද්‍රගුප්ත රජු විසින් නිකුත් කරන ලද්දක් සේ සැලැකී ය. අල්ටෙකාර් තම හඳුනාගැනීමට පදනම වශයෙන් දක්වන්නේ ඉහත විස්තර කළ ඡත්‍ර වර්ගයේ කාසියේ මෙන් ම මෙහි ද ප්‍රතිමුඛයේ ''ක්‍රමාදිත්‍ය'' යන විරුද නාමය යෙදී තිබෙනු දක්නට ලැබීමයි.

මෙම කාසියෙහි අභිමුඛයේ රජු අශ්වාරෝහකව සිටිනු දක්වෙන රූප සටහනක් යෙදෙන හෙයිනි, මේ වර්ගයට මෙම නාමය ලැබෙන්නේ. රජතුමා අත කිසිදු අවියක් නොවේ. අභිමුඛයේ වට පාඨය නො පැහැදිලි ය.

ප්‍රතිමුඛයේ දක්වෙන දෙවතාවිය මෝර පුටුවක් මත හිඳියි. ඇගේ සුරතේ පාශයක් ද වමතේ පියුමක් ද වේ. ''ක්‍රමාදිත්‍ය'' යන විරුද නාමය ද සඳහන් වෙයි. මෙම වර්ගයට වැටෙන කාසිවල විෂ්කම්භය අඟල් ·8 ක් පමණ ද බර ග්‍රෙන් 140·5 පමණ ද වෙයි.

### ස්කන්දගුප්තගේ රිදී කාසි

අධිරාජ්‍ය ගුප්ත රජවරුන් අතරින් අවසාන වරට බටහිර ඉන්දිය ප්‍රදේශවල හා මධ්‍ය ප්‍රදේශවල රිදී කාසි නිකුත් කරන ලද්දේ ස්කන්දගුප්ත රජු විසිනි. මේ පාලකයා විසින් දෙවැනි චන්ද්‍රගුප්ත හා පළමුවැනි කුමාරගුප්ත යන රජුන් නිකුත් කළ රිදී කාසි ම තව දුරටත් නිකුත් කළ බැව් පෙනේ. මෙවායේ විශෙෂ ලක්ෂණයක් නම් ග්‍රීක අක්ෂර සහිත වීමයි. මේ රජතුමා වෘෂභ වර්ගය හා පූජාසන වර්ගය යනුවෙන් නාණක විශේෂඥයන් විසින් හඳුන්වනු ලැබෙන කාසි වර්ග ද්වයක් අලුතෙන් නිකුත් කළේ ය.

ස්කන්දගුප්ත රජුගේ රිදී කාසි අතරින් මධ්‍ය දේශයෙහි නිකුත් කරන ලද ඒවා සිය පියා විසින් නිකුත් කැරුණු කාසිවලට හැම අතින් ම සමාන ය. අභිමුඛයේ ක්ෂත්‍රප බලපෑම්වලින් තොර ව රජුගේ උඩුකය දක්වා ඇති අන්දමත්, ප්‍රතිමුඛයේ ගුරුළු රුව වෙනුවට මොණර රුව යොද තිබීමත් මේ කාසි විභාග කිරීමේ දී දක්නට ලැබේ. අභිමුඛයේ ඒ ඒ කාසිය නිකුත් කළ වර්ෂය ගුප්ත වර්ෂයෙන් සටහන් කොට ඇත.

## බටහිර ඉන්දීය ප්‍රදේශවල රිදී කාසි

මේවායේ අභිමුඛයෙහි රජුගේ රුව යෙදෙන්නේ කුමාරගුප්ත රජුගේ කාසිවල මෙනි ග්‍රීක අක්ෂර ද එහි දක්නට ලැබේ.

ප්‍රතිමුඛයෙහි උඩ කොටසෙහි ගරුඩ පක්ෂියා දක්නට ලැබේ. මෙහි පක්ෂි රූපය දක්වා ඇත්තේ තරංග රේඛාවක් මත වසා සිටින ආකාරයෙනි. වට පාඨය ''පරම භාගවත මහාරාජාධිරාජ ශ්‍රී ස්කන්දගුප්ත ක්‍රමාදිත්‍ය'' යනුවෙන් යෙදී ඇත. මේ කාසි විෂ්කම්භයෙන් අඟල් ·5 හා ·55 අතරද, බරින් ග්‍රෙන් 22 – 33 අතර ද වෙයි.

### i. වෘෂභ වර්ගය

මේ වර්ගයට අයත් කාසිවල ද අභිමුඛයේ පෙර දක්වන ලද කාසිවල මෙන් ම, රජුගේ හිස දක්වෙන රූ සටහන හා ග්‍රීක අක්ෂර පාඨයත් වෙයි.

ප්‍රතිමුඛයේ දැක්වෙන නිදා සිටින වෘෂභ රුවක් නිසා ය, මේ කාසි වර්ගය වෘෂභ වර්ගය නමින් හැඳින්වෙන්නේ. මේ වෘෂභ රූපයෙන් ශිව දෙවියන්ගේ වාහනය වන නන්දි නිරූපණය වෙතැයි සැලැකේ. මෙහි යෙදුන වට පාඨය ඉහත සඳහන් කරන ලද එකම ය. මේ කාසි අතර ද විෂ්කම්භයෙන් අඟල් ·5 – ·6 අතර ද බරින් ග්‍රෙන් 20 – 29 ද වේ.

මෙම කාසි පිළිබඳව සිය අදහස් ප්‍රකාශ කරන ඇලන් වලභි පාලකයන්ගේ සංකේතය වෘෂභ රූපය (නන්දි) වූ හෙයින්, මේ කාසි කැම්බේ ප්‍රදේශය අවට භාවිත වන්නට ඇතැයි කියයි. එහෙත් අල්ටෙකාර් වෘෂභ රූපය පද්මාවතියෙහි නාග පාලකයන්ගේ ද, මාල්වා ප්‍රදේශය පාලනය කළ කෘෂ්ණ රාජ නම් කලචුරි රජුගේද කාසිවලත් දක්නට ලැබෙන බව පෙන්වා දෙයි.

### ii. පූජාසන වර්ගය

මෙම කාසිවලටද වර්ග කිරීමෙන් ඉහත දැක්වූ නම යෙදිය හැක්කේ ප්‍රතිමුඛයේ රූප සටහනෙහි යෙදෙන පූජාසනයක සටහන නිසාය. කාසිය මැද ගිනිදැල් තුනක් සහිත පූජාසනයක් දක්වා තිබෙනු දක්නට ලැබේ. ප්‍රතිමුඛයේ වට පාඨය දෙයාකාරයකට යෙදෙයි. ''පරමභාගවත ශ්‍රී වික්‍රමාදිත්‍ය ස්කන්දගුප්තඃ'' යනුවෙන් හෝ ''පරමභාගවත ශ්‍රී ස්කන්දගුප්තඃ ක්‍රමාදිත්‍යඃ'' යනුවෙනි. මේවායේ අභිමුඛයේ රජුගේ උඩුකයෙහි පිළිරුවද, ග්‍රීක අක්ෂරවල සලකුණු ද, ඉහත විස්තර කරන ලද කාසි වර්ගවල දැක්වෙන ආකාරයෙන්ම යෙදී ඇත.

මේ වර්ගයට අයත් කාසිවල නිමාව ඉතා දළය. කාසිවල ආකෘතිය හා හැඩයද, සමරූපී බවෙන් තොරය. විෂ්කම්භය අඟල් ·5 – ·55 අතර වෙනස් වේ. සාමාන්‍ය බර ග්‍රෙන් 28 ක් පමණ වේ. ගුප්ත කාසිවල පරිහානි ලක්ෂණ බොහෝ දුරට මෙම කාසිවලින් පිළිබිඹු වේ.

## මධ්‍යදේශයේ රිදී කාසි

ඉහත සඳහන් කළ පරිදි, මේ ප්‍රදේශයේ ස්කන්දගුප්ත රජු විසින් නිකුත් කරන ලද රිදී කාසි බොහෝ දුරට කුමාරගුප්ත රජු විසින් ප්‍රකාශයට පත් කරන ලද කාසිවලට සමාන වේ. ඒවායේ අභිමුඛයෙහි රජුගේ උඩුකයද ගුප්ත රාජ වර්ෂයද, දැක්වේ. ප්‍රතිමුඛයෙහි සාමාන්‍යයෙන් යෙදෙන්නේ මයූර රූපයකි. වට පාඨය ''විජිතාවනිරවනපත (ජයති දිවං) ස්කන්ද ගුප්තොයං'' යනුවෙන් යෙදෙයි.

මේවා විෂ්කම්භයෙන් අඟල් ·55 – ·6 අතරත්, බරින් ග්‍රෙන් 30 – 32 අතරත් වෙයි.

### ස්කන්දගුප්ත – අනන්තරාගමිකයන්ගේ කාසි

ස්කන්දගුප්ත රජුගෙන් අනතුරුව අධිරාජ්‍ය ගුප්ත පරපුර පිළිබඳ තතු බෙහෙවින් අවුල් සහගත තත්ත්වයක පවතී. මේ කාලයට අයත් වන පාලකයන් අතර පුරුගුප්ත, ඝටොත්කචගුප්ත, නරසිංහගුප්ත, දෙවැනි කුමාරගුප්ත, බුධගුප්ත, විෂ්ණුගුප්ත, වෛන්‍යගුප්ත හා ප්‍රකාශාදිත්‍ය යන පාලකයන් ගේ යයි සලකනු ලැබෙන කාසි සොයා ගෙන තිබේ.

### පුරුගුප්තගේ කාසි

1. ධනුර්ධර වර්ගයට අයත් කොට ගිණිය හැකි රන් කාසියක අභිමුඛයෙහි වූ අක්ෂරද්වයන් ජේ. ඇලන් විසින් ''පුර'' යනු වෙන් හඳුනා කියැවීම නිසා ඒ කාසිය පුරුගුප්ත නම් පාලකයා විසින් නිකුත් කරන ලද්ද කැයි කලක් තිස්සේම සලකන ලදී. එහෙත් එම අක්ෂරවලින් කියැවෙන්නේ ''පුර'' යන්න නොව ''බුධ'' යන්න බව ඇස්. කේ. සරස්වතී විසින් පසුව පෙන්වා දෙන ලදී. ඉන් අනතුරුව සොයා ගන්නා ලද මේ ගණයට වැටෙන තවත් කාසි දෙකක් ද පරීක්ෂා කළ උගතුනට සරස්වතී ඉදිරිපත් කළ කියැවීම වඩා නිවැරැදි බව පෙනී ගොස් ඇත. මෙම කාසි වල ප්‍රතිමුඛයේ ''ශ්‍රී වික්‍රම'' යන විරුද නාමය සඳහන් වේ. මේ කාසිය බුධ ගුප්ත නම් පාලකයා විසින් නිකුත් කරන ලද එකක් ලෙස සලකන්නට පුළුවන.

### ඝටොත්කචගුප්ත ගේ කාසි

ඝටොත්කච තෙමේ මාල්වා ප්‍රදේශ පාලනය කළ පාලකයෙක් විය. ධනුර්ධර වර්ගයට අයත් වන ''ඝටො'' යන නාමය සඳහන් එකම කාසියක් මෙම පාලකයා විසින් නිකුත් කරන ලද්දක් ලෙස සලකනු ලැබේ. මීට පෙර විස්තර කරදෙන ලද ධනුර්ධර වර්ගයට අයත් කාසිවල මෙන්ම, මෙහිද අභිමුඛයේ රජු දැතින් දුනු හී දරා සිටුනා අයුරු පිළිබිඹු කෙරෙයි. රජ රුවට පිටුපසින් ගරුඬධ්වජය දක්නට ලැබේ. කාසියේ අභිමුඛයේ වට පාඨය නො පැහැදිලි හෙයින් කියවා ගත නොහැකි වන නමුත් රජ රුවෙහි වම් බාහුව යට ''ඝටො'' යන පදය හඳුනා ගතහැකි තරම් පැහැදිලිව යෙදී තිබේ.

ප්‍රතිමුඛයේ දක්වෙන පාඨය ''ක්‍රමාදිත්‍යඃ'' යන විරුදයයි. මෙහි පාශයක් හා පද්මයක් දෙඅතින් දරාගෙන ලක්ෂ්මී දෙවතාවිය ප්‍රභාමාලාව සහිතව ඉදිරියට මුහුණ ලා වැඩ සිටුනා ආකාරය නිරූපිතය.

මේ කාසිය පිළිබඳවද උගතුන් අතර මතභේද පවතියි. මෙය පළමුවැනි චන්ද්‍රගුප්ත රජුගේ පියාණන්වූ ඝටොත්කච ගේ කාසියකියි බ්ලොක් අදහස් කළ නමුත්, ඒ අදහස පිළිගන්නට අනෙක් උගත්තු අකමැති වූහ. සමුද්‍රගුප්ත රජුගේ කාලය වනතුරු ගුප්ත පාලකයන් විසින් ධනුර්ධර කාසි නිකුත් කිරීමෙක් නොවූ බව අල්ටෙකාර් පෙන්වා දෙයි. මේ කාසිය නිකුත් කළ පාලකයා වූ කලී තුමෙන් සෙල්ලිපියේ එනමින් සඳහන් පාලකයා හෝ වෛශාලි මුද්‍රාවක සඳහන් කෙරෙන පාලකයා හෝ විය යුතුය යන්න යි, අල්ටෙකාර් දක්වන අදහස් වන්නේ.

### නරසිංහගුප්තගේ කාසි

පුරුගුත්තගේ පුතකු ලෙස සැලැකෙන නරසිංහගුප්ත රජතුමන් විසින්ද ධනුර්ධර වර්ගයට අයත් කාසි නිකුත් කරන ලද බව පෙනේ. රජුගේ රූපයෙහි දෙපා අතර එක් අකුරක් යෙදී මෙන් කාසිය නිකුත් කළ පාලකයා හඳුන්වා තිබීම මේ කාසි වර්ගයේ විශෙෂ ලක්ෂණයක් වේ. උගතුන් විසින් මෙම අක්ෂරය ''ගු'' හෙවත් ''ගෞ'' යන්න ලෙස හඳුනා ගෙන තිබේ. මීට පෙරාතුව කුෂාණ පාලකයන්ගේ කාසිවල මෙබඳු අක්ෂර යොද තුබුණු නමුදු, අධිරාජ්‍ය ගුප්ත රජවරුන් විසින් තමන්ගේ කාසි නිකුත් කිරීමෙදී මේ සිරිත අත් හැර දමන ලද බව පෙනේ. නරසිංහ ගුප්ත රජු විසින් මෙම ක්‍රමය යළි අරඹන ලද්දේ කවර හෙයින්ද, යනු සිතිය නොහැකිය. නියම වශයෙන් ඒ අකුර සඳහා යෙදුණක්ද යන්නත් සැක සහිතය.

මේ වර්ගයට අයත් වන කාසි අභිමුඛයේ වට පාඨය සහිතව හා රහිතව සකසා තිබෙනු දක්නට ලැබෙයි. මේ කාසිවල ප්‍රමාණයන් සාමාන්‍ය වශයෙන් විෂ්කම්භයෙන් අඟල් ·9 පමණද, බරින් ග්‍රෙන් 144·5 පමණද, වෙයි.

**දෙවැනි කුමාරගුප්තගේ කාසි**

නරසිංහගුප්තගෙන් අනතුරුව රජ වූ ඔහු ගේ පුත්‍ර දෙවැනි කුමාරගුප්ත විසින් නිකුත් කරන ලද්දේ ධනුර්ධර වර්ගයට පමණක් සීමාවූ රන් කාසිය. මෙහිදූ ඇතැම් කාසිවල රජුගේ දෙපා අතර ''ජෝ'', ''ගා'', හෝ ''ගෝ'' යන අක්ෂර දක්නට ලැබේ. අනෙක් කාසිවල එ බඳු අක්ෂර යෙදීමෙක් නැත. අභිමුඛයෙහි ''මහාරාජාධිරාජ ශ්‍රී කුමාරගුප්ත ක්‍රමාදිත්‍යඃ'' යන වට පාඨය හා ප්‍රතිමුඛයෙහි ''ශ්‍රී වික්‍රමාදිත්‍ය'' යන විරුදය දක්වේ. මේ රජුගේ කාසි වැඩි හරියක් බෙංගාලයේ කාලිඝාට් වැනි ස්ථානවලින් ලැබී ඇති හෙයින්, ඔහු මේ ප්‍රදේශය පාලනය කළ අයකු ලෙස සැළැකේ. එහෙත් මුලින්ම ඔහු ගුප්ත රාජ්‍යය පාලනය කළේය. පසුව ඔහුගේ මලණුවන් බුධගුප්ත රජ වීමෙන් අනතුරුව නරසිංහගුප්ත බෙංගාල ප්‍රදේශය පමණක් පාලනය කළේ යැයි සිතන්නට පුළුවන.

**බුධගුප්තගේ කාසි**

ගුප්ත අධිරාජ්‍යයේ පරිහානි සමයේදී රජ පැමිණි මොහු බලවත් පාලකයකු වූ හෙයින් නැතිවී ගිය ගෞරවය යළිත් තම පාලනය සඳහා දිනා ගන්නට සමර්ථ විය. මොහු විසින් රන් හා රිදී යන ලෝහ වර්ග දෙකින්ම නිකුත් කරන ලද කාසි හමුවී තිබේ. එහෙත් ඒවා පූර්ව පාලකයන්ගේ කාලවලදී නිකුත් කරන ලද කාසි මෙන් සුලභ ලෙස භාවිතයට පත් වූ බවක් නොපෙනේ. මොහුගේ රන් කාසිද ධනුර්ධර වර්ගයට පමණක් සීමා විය. අභිමුඛයේ ''බුධ'' යනුවෙන් ස්වකීය නාමය සහිතව හා රහිතව වද, ප්‍රතිමුඛයෙහි 'ශ්‍රී වික්‍රම' යන විරුද නාමය ඇතිවද, කාසි නිකුත් කර තිබේ.

පුරුගුප්ත, නරසිංහගුප්ත හා දෙවැනි කුමාර ගුප්ත යන රජුන්ගේ කාලවල අභාවයට පත් වී තුබුණු රිදී කාසි බුධ ගුප්ත විසින් යළි භාවිතයට පත් කරන ලදි. එසේ මොහු විසින් නිකුත් කරන ලද්දේ මධ්‍ය දේශයේ කාසි වර්ගය පමණි. මේ කාලය (පස්වන සිය වසේ අවසාන භාගය) වන විට බටහිර ප්‍රදේශ ගුප්ත අධිරාජ්‍යයෙන් ගිලිහී යන්නට ඇතැයි කල්පනා කරනු ලැබේ.

බුධගුප්තගේ මධ්‍ය දේශීය රිදී කාසි වර්ගය පළමුවැනි කුමාරගුප්තගේ හා ස්කන්දගුප්තගේ කාසිවලට සමානය. රජුගේ මුහුණෙහි පමණක් කිසියම් වෙනස් කමක් දක්නට ඇත. ප්‍රතිමුඛයේ වට පාඨය 'විජිතාවනිරවනිපතිඃ ශ්‍රී බුධගුප්තො දිවං ජයති' යන්නයි. මේ කාසි ප්‍රමාණයෙන් දිහල් ·55 විෂ්කම්භයෙන්ද, ග්‍රෙන් 33·8 – 38.3 අතර බරින්ද යුක්ත වේ.

**විෂ්ණුගුප්තගේ කාසි**

දෙවැනි කුමාරගුප්ත රජුගේ පුතකු වූ මේ පාලකයා විසින්ද ධනුර්ධර වර්ගයට අයත් රන් කාසි නිකුත් කර ඇත. ප්‍රතිමුඛයෙහි රජුගේ විරුද නාමය වශයෙන් මේ කාසිවල යෙදී ඇත්තේ ''ශ්‍රීචන්ද්‍රාදිත්‍ය'' යන්නයි.

**වෛන්‍යගුප්තගේ කාසි**

මොහුද බෙංගාල ප්‍රදේශ පාලනය කළ අයකු ලෙස සැලැකේ. මේ රජුගේ කාසිද ධනුර්ධර වර්ගයට අයත් රන් කාසිවලට සීමා වේ. ඒවායේ ප්‍රතිමුඛයෙහි දක්වෙන විරුදය 'ද්වාදශාදිත්‍යඃ' යන්නයි.

**ප්‍රකාශාදිත්‍යගේ කාසි**

මේ නමින් යුත් ගුප්ත පාලකයකු ගැන දැන ගත හැක්කේ කාසිවලින් පමණි. මොහුද පස්වන ශතවර්ෂයේ අවසාන භාගයෙහි පාලන කාර්යයෙහි නිරත වූවකු ලෙස සැලැකිය හැකි වේ. එසේ වූවද, ඔහු විසින් ප්‍රකාශයට පමුණුවා ඇති නව කාසි වර්ගය නිසා මේ රජු ඉහත විස්තර කැරුණු ධනුර්ධර වර්ගයට පමණක් සීමා කොට කාසි නිපදවූවන්ට පළමුව පාලනය කළ අයකු දැයි සැක කරන්නට ඉඩ තිබේ. මොහු පුරුගුප්ත රජුම විය හැකි යයි අල්ටෙකාර් අදහස් කරයි.

විමර්ශන අංශය

ප්‍රකාශාදිත්‍ය රජුගේ කාසි 'අශ්වාරෝහක සිංහවික්‍රම' වර්ගය යනුවෙන් හඳුන්වන්නට පුළුවන. ඒවායේ අභිමුඛයේ රජු අශ්වයකු පිට නැඟී සිංහයකුට කඩුවකින් පහර දෙන ආකාරය නිරූපණය වෙයි. දකුණු උරහිසෙහි රැඳවූ දුනුදියෙන් යුත් දුන්නක් රජු පිටු පසින් වෙයි. අසුගේ හිසට ඉහළින් ගරුඬධ්වජයකි. වටපාඨය''.........(විජිත්‍ය) වසුධාං දිවං ජයති'' යනුවෙන් යෙදෙයි.

ප්‍රතිමුඛයෙහි ලක්ෂ්මිය පියුමක් මත හිඳියි. දකුණතින් පාශයක් හා වම් අතින් පියුමක්ද දරා ගෙනයි, ඇය වැඩ සිටින්නේ. විරුද නාමය ''ශ්‍රී ප්‍රකාශාදිත්‍යඃ'' යන්නයි.

### ගුප්ත කාසිවල යොද ඇති සංකේත

ගුප්ත රජවරුන්ගේ රන් කාසිවල ප්‍රතිමුඛයේ දක්වෙන රූප සටහන් අතර සංකේත වශයෙන් හඳුන්වා දිය හැකි ජ්‍යාමිතික සටහන් විශෙෂයක් දක්නට ලැබේ. එහෙත් ඔවුන්ගේ රිදී හා තඹ කාසිවල මේ සංකේත නොයෙදේ. මේවා සාමාන්‍යයෙන් තිත් කිහිපයකට යටින් යෙදූ කුඩා හරස් රේඛා එකක් හෝ දෙකක්ද, ඒ රේඛාවනට සම්බන්ධ කොට ඊට යටින් යොද ඇති කුඩා සමාන්තරාශ්‍රයකින් හෝ වෘත්තයකින්ද, යුක්ත සංකීණ ජ්‍යාමිතික සටහන් වේ. (චිත්‍රය II, 57– 77). කාසියක මේ සංකේතය යෙදීමේදී ඊට නියම තැන හැටියට කාසි නිපැදවූ ශිල්පීන් තෝරා ගෙන ඇත්තේ කාසියේ ප්‍රතිමුඛයේ ක්ෂෙත්‍රයෙහි ඉහළ වම් කෙළවරයි. සමහර අවස්ථාවක ප්‍රතිමුඛයේ යෙදෙන ප්‍රධාන රූප සටහන නිසා මේ නියමිත ස්ථානයෙහි එය යෙදීමට අවකාශ නොලැබුණු විටෙක ඊට මදක් පහළින් කාසියෙහි මැද එය යොද තිබෙනු දක්නට ලැබේ. ''කාච'' කාසි හා පළමුවැනි කුමාරගුප්ත රජුගේ ''අප්‍රතිඝ'' කාසි මීට හොඳ උදහරණ වේ. සමහර විට, ප්‍රතිමුඛයේ රූප සටහනින් සංකේතය සඳහා නියමිත ස්ථානය වැසී ගිය විට සංකේතය යෙදීම සම්පූර්ණයෙන්ම අත් හැර තිබෙනු ද දක්නට ලැබෙයි. සමුද්‍රගුප්ත රජුගේ ''අශ්වමෙධ'' හා ''ව්‍යාඝ්‍රපරාක්‍රම'' වර්ගවලට අයත් කාසිවල සංකේතයක් යොද නොමැත.

සාමාන්‍ය සිරිත වූයේ එක් කාසියක එක සංකේතයක් පමණක් යෙදීම වුවද, මුල්ම ගුප්ත පාලකයන් නිකුත් කළ කාසි අතර සමහරෙක දෙවැනි වඩා සරල සංකේතයක්ද ප්‍රතිමුඛයේ ඉහළ දකුණු කෙළවරෙහි යොදා තිබෙනු දක්නට ලැබේ. පළමුවැනි චන්ද්‍රගුප්ත, සමුද්‍රගුප්ත වැනි රජවරුන්ගේ කාසි අතර ඇතැමෙක දක්නට ලැබෙන මෙම අතිරේක සංකේතය අවසන් වරට යෙදී ඇත්තේ දෙවැනි චන්ද්‍රගුප්ත රජුගේ ධනුර්ධර වර්ගයට අයත් කාසිවලය.

මුලින්ම ඉන්දීය පාලකයන්ගේ කාසි ගැන අධ්‍යයනය කළ උගත්තු මේ සංකේත සටහන් අක්ෂරසංයුක්තයන් ( monogrammes ) යයි නම් කළ හ. ගුප්තයනට පෙර ඉන්දියාවේදී කාසි නිකුත් කළ ඉන්දු – ග්‍රීක හා ශක පාලකයෝ තමන්ගේ කාසිවල ග්‍රීක හෝ බරොෂ්ඨී අක්ෂර එක්කොට සකසා ගන්නා ලද අක්ෂරසංයුක්තයන් යෙදූහ. එහෙත් ගුප්ත කාසිවල යෙදෙන සංකේත අතර එකකුදු ගුප්ත අක්ෂරවලින් සකස් කරගත් සංයුක්තයක් ලෙස හඳුනා ගන්නට නුපුළුවන.

මේ සංකේත හා ඒවා යෙදීම පිළිබඳ උගතුන් විසින් පළ කර ඇති අදහස් කිහිපයකි. ඉන්දු–ග්‍රීක හා කුෂාණ රජවරුන්ගේ කාසි පිරික්සන විට, ඒ පාලකයන් තමන්ට විශේෂවූ සංකෙතයක් තමන් නිකුත් කළ කාසි හැමෙකකම යෙදූ බව පෙනී යයි. ගුප්ත රජවරුන්ගේ කාසි හා ඒවායේ සංකේත යෙදීම ගැන මෙබන්දක් කිව නොහැක. මුල් ගුප්ත පාලකයන් සිය කාසිවල සංකෙත කිහිපයක්ම යොද ගත් අතර ඒවායින් සමහරෙක් ඔවුනට අනතුරුව පැමිණි ඇතැම් රජවරුන්ගේ කාසිවල ද දක්නට ලැබෙයි. ඒ ඒ කාසි වර්ග නිපැදවූ නාණක ශිල්පීන් තමන් විසින් ඒ කාසි නිපදවන ලද බව දක්වන්නට මේ සංකේත යොද ගන්නට ඇතැයි ඇතැම් උගතුන් මතයක් ඉදිරිපත් කර ඇතත්, එකම සංකේතය පාලකයන් කිහිප දෙනකු විසින් දීර්ඝ කාලයක් තිස්සේ නිකුත් කළ කාසිවල යෙදී තිබෙනු දක්නට ලැබෙන හෙයින්, ඒ අදහසද පිළිගත හැකි නොවේ. මේ සංකේතවලින් දක්වෙන්නේ ඒ කාසි කවර නගරයක නිපදවන ලද්දේද යන වගයයි සමහරු පවසති. එහෙත් ඇතැම් කාසිවල සංකේත දෙකක් තිබීම මේ අදහසද නිවැරැදි නොවන බවට සාක්ෂියකි. ඒ හැරුණු විට, කිසියම් නගරයක් හා මේ සංකේතයන් සම්බන්ධ කර දක්වීමට උපයෝගී කර ගත හැකි බාහිර සාක්ෂිද කිසිත් නොවේ.

ගුප්ත කාසිවල දක්නට ලැබෙන සංකෙත කිසියම් ආගමික වැදගත් කමකින් යුතුව යොදා ඇති බව ස්මිත් කලකට පෙර පැවැසීය. කාසිවල ප්‍රතිමුඛයේ යොද ඇති රූප සටහන් බොහෝමයක් ආගමික වැදගත් කමක් නිසා යොදන ලද දේවරූප ආදිය ලෙස නිසැකව හඳුනා ගත හැකි වුවද, මේ සංකේත තනිව හෝ දේව රූප හා එක්ව හෝ ගත් කල ඒවායේ ආගමික වැදගත් කමක්, ආගමික සම්බන්ධයක් වෙතැයි කීමට සාක්ෂි නැත. මෙම සංකේත මංගල සලකුණු ලෙස හඳුනා ගැනීමද කළ හැකි නොවේ. ඒ ඒ වගීයෙන් එක් වරට නිකුත් කරන ලද කාසි සංඛ්‍යාව දක්වීම සඳහා මේ සංකේත යොද ගන්නා ලදැයි ද, කාසි නිකුත් කරන ලද දිනය දක්වීම සඳහා මේ සටහන් යොදන ලදැයිද, තවත් අදහස් දෙකක් පළ වී තිබේ. ගුප්ත පාලකයෝ සිය රිදී කාසි වල ඒවා නිකුත් කළ කාලය දක්වීම සඳහා ගුප්ත ඉලක්කම් යොද ගත්හ. මේ අනුව රන් කාසිවලද එබඳු සටහනක් කිරීම අවශ්‍ය වී නම්, ඒ සඳහා සංකේතයක් යොද ගන්නට ඇතැයි සිතිය නොහැක.

මුල් ගුප්ත පාලකයෝ වගී කිහිපයකට අයත් කාසි නිකුත් කළෝය. එක් එක් වගීයට අයත් කාසි අතර දක්නට ලැබෙන වෙනස්කම් සලකා, ඒ ඒ වගී යළි අනුකොටස් හා ප්‍රභේදවලටද බෙද දක්විය හැක. මේවා සඳහා එකිනෙකට විශෙෂවූ සංකේත යෙදීමක් කර නැති බව මේවා පිරික්සීමේදී පෙනී යයි.

ඒ. ඇස්. අල්ටෙකාර් ගුප්ත කාසි තොග කීපයක සංකේත ගැන කළ අධ්‍යයනයකින් පසු බැසගත් නිගමනය නම්, මේවා කිසියම් විශෙෂ වැදගත් කමකින් තොරව යොදන ලද සටහන් විශෙෂයක් බවයි. ඉන්දු – ග්‍රීක හා කුෂාණ කාසිවල යෙදුණු අක්ෂරසංයුක්තය අග්‍රයෙන් සිය කාසිවල සැරසිලි මෝස්තරයක් වශයෙන් ඊට අනුරූප සංකෙත විවිධ ස්වරූපයන්ගෙන් යොදන්නට ඇතැයි සිතිය හැක. ඉතා සුළු කාලයක් තුළ පමණක් කාසි නිකුත් කළ පළමුවැනි චන්ද්‍රගුප්තගේ කාසිවල එකිනෙකට විවිධ ස්වරූප අටකින් පමණද, සමුද්‍රගුප්ත රජුගේ කාසිවල මෙබඳු ස්වරූප විසිපහෙකින් පමණද, දෙවන චන්ද්‍රගුප්ත රජුගේ කාසිවල ස්වරූප හතළිහකින් පමණද, මේ සංකේත යෙදී තිබේ. මෙසේ හුදු සැරසිලි මෝස්තරයක් ලෙස විවිධාකාර සංකෙත යෙදීම පසුකාලීනව කාසි නිපැදවූ ශිල්පීනට රුචි නොවූ හෙයින් දෝ, පළමුවැනි කුමාරගුප්තගෙන් පසු ගුප්ත කාසිවල යෙදෙන වෙනස් සංකේත සංඛ්‍යාව බෙහෙවින් අඩුවී යනු පෙනේ. ඔහු විශාල සංඛ්‍යාවලින් නිකුත් කළ ධර්නුධර කාසිවල දක්නට ඇත්තේ එකිනෙකට වෙනස් සංකේත හයක් පමණි.

## ගුප්ත ආභාසය ලත් කාසි

පසු කාලීන හින්දු රජවරුන් විසින් නිකුත් කරන ලද කාසි කෙරෙහි අධිරාජ්‍ය ගුප්ත පාලකයන්ගේ කාසිවලින් ඉමහත් බලපෑමක් ලැබී ඇති බව පෙනේ. හින්දු රජවරුන් කිහිප දෙනකු විසින් නිකුත් කරන ලද කාසි ගුප්ත කාසිවල අනුකරණයන් ලෙස හැඳින්විය හැකි තරම් ඒවාට ආසන්නය. හූණ පාලකයන්ගේ රිදී හා තඹ කාසි අතර සමහරක්ද ගුප්ත කාසි වගීවල ආසන්න අනුකරණවේ. වර්ධන හා මෞඛරී රජවරු ගුප්ත රිදී කාසි කිට්ටු ලෙස ආශ්‍රය කරමින් කාසි නිකුත් කළහ. මේ අනුකරණ කාසිවල පාඨයන් පවා ගුප්ත කාසිවල දක්වෙන පාඨයන් ගෙන් වෙනස් වන්නේ රාජ නාම මාත්‍රයෙන් පමණකි. බටහිර වෙඩිඩි පෙළපතේ පාලකයන්ගේ රන් කාසිවල ප්‍රතිමුඛයේ එන ලක්ෂ්මී දෙවතාවිය හිඳ ගෙන සිටින ආකාරය දක්වෙන ප්‍රතිරූපය ගුප්ත කාසි අතර බහුල ලෙස දක්නට ලැබෙන රූප සටහනෙහිම පිටපතකැයි කිව හැකි තරම් වේ. මේ රූප සටහනම නැගෙනහිර වෙඩිඩි, චාන්දෙල්ල, තෝමාර හා ගහඩවාරි පාලකයන්ගේ රන් කාසි වල ප්‍රතිමුඛයේද සුලභව දක්නට ලැබේ. සමහර මුස්ලිම් ආක්‍රමණිකයන්ගේ රන් කාසි වලද මේ ප්‍රතිමුඛ රූප සටහනේ අනුකරණ යෙදී තිබේ.

ක්‍රි. ව. 525 හා 675 අතර සමයට වැටෙතැයි නිගමනය කළ හැකි මෙතෙක් හඳුනා නොගත් හින්දු රාජ වංශවලට අයත් පාලකයන් කීප දෙනකු විසින් නිකුත් කරන ලද රන්, රිදී හා තඹ කාසි කිහිපයක් ගුප්ත කාසි වල අනුකරණයන් ලෙස මෙහිදී විස්තර කළ යුතුය. අධිරාජ්‍ය ගුප්ත පෙළපතට අයත් නුවූවද, මේ පාලකයන් නිකුත් කළ කාසි ගුප්ත පාලකයන්ගේ කාසිවලට බෙහෙවින් අනුරූපී වන හෙයින්, ඒවා ද ගුප්ත කාසි සමඟම විස්තර කිරීම වඩා උචිතය.

### භීමරාජගේ කාසි

අයොධ්‍යාවෙන් සොයා ගන්නා ලදුව, කනිංහැම් විසින් ප්‍රථම වරට ප්‍රකාශයට පමුණුවන ලද එකම රිදී කාසියකින් පමණි, භීමරාජ නම් පාලකයකු ගැන කරුණු දත හැක්කේ. අභිමුඛයේ රජුගේ උඩුකය දක්වෙන ප්‍රතිරූපයක් ද, ප්‍රතිමුඛයේ විදහා ගත් පිල් සහිත මොණරකු ගේ රූප සටහනක් ද, සහිත මෙම කාසිය බුධගුප්ත රජුගේ මේ වර්ගයේ කාසි අනුකරණයෙන් නිපදවන ලද බව පැහැදිලි ය. බුධගුප්තගේ කාසියෙහි අභිමුඛයේ රාජ රූපය දකුණට හැරී සිටින ආකාරයෙන් යෙදී ඇති අතර, මෙහි එය වමට හැරී සිටින අයුරින් දක්වෙයි. ප්‍රතිමුඛයේ ඇති එකම වෙනස පාඨයේ බුධගුප්ත රාජ නාමය වෙනුවට ''භිමරාජො'' යන්න යෙදී තිබීම පමණි. නාණක විද්‍යා සාධක අනුව භීමරාජ නම් මෙම පාලකයාගේ රාජ්‍ය සමය ක්‍රි. ව. 500 සිට 550 අතර කාලයට ඇතුළත් විය හැකි බව අනුමාන කරනු හැරෙන්නට ඔහු හඳුනා ගැනීමට අන් කිසිදු සාක්ෂියක් නැත.

### හරිගුප්තගේ කාසි

හරිගුප්ත නම් පාලකයකු විසින් නිකුත් කරන ලද තඹ කාසි කිහිපයක් හමු වී තිබේ. මොහු ගැනද අනෙක් මූලාශ්‍ර හෝ සාක්ෂි කිසිත් නොවේ. නාණක විද්‍යා සාධක අනුව, ඔහු ක්‍රි. ව. 550 ට පෙර උත්තර පඤ්චාල රාජධානිය පාලනය කළ, වඩා බලවත් නොවූ ප්‍රාදේශික පාලකයකු බව අනුමාන වශයෙන් කිව හැක. මේ පාලකයා නිකුත් කළ ''ඡත්‍ර'' හා ''සට'' වර්ගවලට අයත් තඹ කාසි හමු වී තිබේ. දෙවැනි චන්ද්‍රගුප්ත රජුගේ ඡත්‍ර වර්ගයට අයත් තඹ කාසි ආශ්‍රයෙන් නිකුත් කළ හරිගුප්ත රජුගේ කාසියේ දක්නට ලැබෙන වෙනස්කම් දෙකකි. එකක් නම් හරිගුප්ත ගේ කාසිය ප්‍රමාණයෙන් වඩා විශාල වීම යි. දෙවැනි වෙනස නම් දෙවැනි චන්ද්‍ර-ගුප්තගේ කාසියෙහි ''චන්ද්‍ර'' යනුවෙන් පමණක් යෙදී ඇති කෙටි පාඨය වෙනුවට මෙහි (කාසිය වඩා විශාල නිසා දෝ) ''මහාරාජ ශ්‍රී හරිගුපත'' යන සම්පූර්ණ නාමය ම යෙදී තිබීම යි.

### හරිකාන්තගේ කාසි

නොපැහැදිලි එහෙත් අනුමාන වශයෙන් ''හරිකාන්ත'' යැයි හඳුනාගෙන ඇති පාඨයක් සහිත එකම රිදී කාසියක් පමණි, මේ පාලකයා ගැන තතු දැනගන්නට ඇති මූලාශ්‍රය. කාසියේ අභිමුඛයේ දකුණට හැරී ඇති ආකාරයෙන් දක්වා ඇති රාජශීර්ෂය ඉදිරියෙන් අඩක් මැකී ගිය ඉලක්කම්වලින් දිනයක් යොද ඇත. ස්මිත් එය ''166'' ලෙස කියවයි. මේ කියවීම නිවැරැදි නම් හරිකාන්ත නම් පාලකයා බුධගුප්ත ගේ සමකාලීනයකු විය යුතුය. ඒ කෙසේ වුවද, කාසිය පිළිබඳ අන් ලක්ෂණවලින් ඔහු ක්‍රි. ව. 500 ට පෙර විසූවකු බව නිගමනය කිරීමට නාණක ශාස්ත්‍රඥයෝ දිරි දරා ඇත. භීමරාජ රජු ගේ කාසියේ මෙන් ම මෙහි ද ප්‍රතිමුඛයේ පිල් විදහා ගත් මොණරකු ගේ රුවක් හා වට පාඨයක් යෙදී තිබේ.

### ජයගුප්තගේ කාසි

මේ පාලකයා ගැන ද හමු වී ඇති එකම මූලාශ්‍රය ඔහු විසින් දෙවැනි චන්ද්‍රගුප්ත රජුගේ තඹ කාසි අනුකරණයෙන් නිකුත් කරන ලද අභිමුඛයේ බෙහෙවින් ගෙවී ගිය රජකුගේ උඩුකය දක්වෙන රූප සටහනකින් හා ප්‍රතිමුඛයේ ගරුඩ රූපයකින් හා රාජ නාමය දක්වන පාඨයකින් යුක්ත එකම තඹ කාසියක් පමණකි. ජයගුප්ත ද ඉහත සඳහන් කරන ලද හරිගුප්ත නම් පාලකයා-ගේ සමකාලීනයකු ලෙස කුඩා ප්‍රදේශයක් පාලනය කළ පාලකයකු වන්නට ඇතැයි පිළිගත හැකි වේ.

### වීරසේනගේ කාසි

මේ පාලකයා විසින් නිකුත් කරන ලද රන්කාසි කිහිපයක් හමු වී ඇත. මේ කාසිවලින් සමහරක් හමු වූ ස්ථානයන් ද ඒවායේ ඇතැම් රූප සටහන් ද සාක්ෂි කරගෙන ඔහු බරණැස අසල ප්‍රදේශයේ රාජ්‍යය කරන්නට ඇතැයි අනුමාන කරනු ලැබේ. ඔහුගේ රන්කාසි ගුප්ත රන් කාසිවලට වෙනස් බර මිනුම් ක්‍රමයකට (රති 60 ක් බර ශතමාන මිම්ම අනුව) නිකුත් කරන ලද බව පෙනේ. කාසිවල ප්‍රතිමුඛයේ ලක්ෂ්මී දේවිය අතින් ගත් පියුමක් ඇතිව පියුමක් මත හිඳගෙන සිටින ආකාරය දක්වේ. ස්කන්දගුප්ත, දෙවැනි කුමාරගුප්ත ආදී ගුප්ත පාලකයන්ගේ කාසිවල යෙදෙන ''ක්‍රමාදිත්‍ය'' විරුද නාමය මේ රජුගේ කාසියේ ද ප්‍රතිමුඛයේ යෙදී තිබෙයි.

### සමාචරදේවගේ කාසි

මේ නම සඳහන් රජකු විසින් නිකුත් කරන ලද රන් කාසි දෙකක් හමු වී තිබේ. මේ පාලකයා පිළිබඳව හමු වී ඇති මූලාශ්‍ර ඉතා අල්ප වුවද, ඔහු හඳුනා ගැනීම සම්බන්ධයෙන් මත භේද කීපයක් වෙයි. නාලන්දවේ තිබී සමාචරදේව රජුගේ මුද්‍රාවක් ද, නැගෙනහිර බෙංගාලයෙන් ඒ රජු විසින් නිකුත් කරන ලද හයවැනි ශතකයේ අකුරුවලින් ලියැවී ඇති තඹ සන්නසක් ද, ලැබී ඇත. මේ පාලකයා නැගෙනහිර බෙංගාලයේ ශශාංක රජුට පෙර ඔහුට ඉතා ආසන්නව (550 සිට 575 පමණ) රජ කළ බව පිළිගත හැක. ඔහුගේ රන් කාසි දෙකකින් එක් වර්ගයක් ගුප්ත කාසි අතර සුලභව හමු වී ඇති ධනුර්ධර වර්ගයට අයත් ය. එහි ප්‍රතිමුඛයේ ඉදිරියට මුහුණ ලා පියුමක් මත හිඳින ලක්ෂ්මී දෙවතාවියගේ ප්‍රතිරූපය හා ''ශ්‍රී නරේන්ද්‍ර විනීත'' යන විරුද පාඨය ද වෙයි. අනෙක් කාසියේ අභිමුඛයේ රජු ශයනයක් මත රාජ ලීලාවෙන් හිඳගෙන සිටින ආකාරයත්, ප්‍රතිමුඛයේ පියුමක් මත ත්‍රිභංග ඉරියව්වෙන් සිටින සරස්වතී දේවියගේ රූප සටහනකුත් නිරූපණය වී ඇත.

### ශශාංකගේ කාසි

හත්වැනි ශත වර්ෂයේ මුල් කොටසේ නැගෙනහිර බෙංගාලයේ ගෞඩ ප්‍රදේශය පාලනය කළ මේ පාලකයා හර්ෂවර්ධන රජුගේ ප්‍රතිමල්ලයකු විය. ශශාංක රජුගේ රන් කාසි පමණි, හමු වී ඇත්තේ. එහෙත් සමහර කාසි තඹයෙන් තනා රන් ආලේප කරන ලද ඒවාය. අර්ධ ශත මාන (ග්‍රෙන් 85 ක් පමණ) හා සුවර්ණ (ග්‍රෙන් 144) යන බර මිම් දෙකට අනුව ප්‍රමාණ දෙකක රන් කාසි ඔහු විසින් නිකුත් කර ඇති බව පෙනේ. බෞද්ධ විරෝධී ශෛව භක්තිකයකු වූ මේ රජු නිකුත් කළ කාසිවල අභිමුඛයේ දක්නට ලැබෙන්නේ නන්දි වෘෂභ වාහනය අරා සිටින ශිව දෙවියා ගේ ප්‍රතිරූපයයි. මේ කාසිවල ප්‍රතිමුඛයේ ගුප්ත කාසිවල මෙන් ම පියුමක් මත හිඳින ලක්ෂ්මියගේ රූපය යෙදී ඇත. ප්‍රතිමුඛයේ එන පාඨයේ ගුප්ත කාසිවල මෙන් විරුද නාමයන් නොව යළි වරක් ''ශ්‍රී ශශාංක'' යනුවෙන් රාජ නාමයම දක්නට ලැබේ.

### ජයනාග ප්‍රකාණ්ඩයශස්ගේ කාසි

මංජුශ්‍රීමූලකල්පයේ එන වාර්තාවක් අනුව, ශශාංක රජුගේ ඇවෑමෙන් ඔහුගේ පුත් කුමරකුගේ මාස කිහිපයක කෙටි රාජ්‍ය සමයක් අවසානයේ, නාග නම් පාලකයෙක් රජ විය. ඒ නාග නමැති පාලකයා බෙංගාලයේ තිබී හමුවී ඇති රන් හා රන් ආලේප කළ කාසි කීපයක නම සඳහන් වන ජයනාග ප්‍රකාණ්ඩයශස් නම් පාලකයා විය හැක. ශශාංක රජුගේ කාසි සමඟ සසඳා මේ පාලකයාගේ කාසි විභාග කරන විට, නාණක විද්‍යා සාධක අනුවද, මේ නිගමනය නිවැරැදි විය හැකි බව පෙනී යයි. මේ රජුගේ කාසිවලින් පෙනී යන්නේ ඔහු වෛෂ්ණව භක්තිකයකු වූ බවයි. මේ නිසා ඔහු විසින් ශශාංක රජු නිකුත් කළ කාසිවල අභිමුඛයේ දක්නට ලැබුණු නන්දි වෘෂභ වාහනය අරා සිටින ශිව රූපය වෙනුවට, ගුප්ත කාසි අතර සුලභ ව භාවිතා වුණු ධනුර්ධර රාජ රූපය යළි යෙදීය. මේවායේ ප්‍රතිමුඛයේ එන රූප සටහන් ශශාංක රජුගේ කාසිවල ප්‍රතිමුඛයේ යෙදී ඇති රූප සටහන් බෙහෙවින් අනුකරණය කෙරෙයි.

නිකුත් කළ පාලකයෝ කවුරු දැයි මෙතරම් දුරට වත් අනුමාන කරන්නට පවා සාක්ෂි නැති, ගුප්ත කාසි අනුකරණයෙන් නිපැද වූ තවත් කාසි කිහිපයක් නැගෙනහිර බෙංගාලයේ ඇතැම් ස්ථානවලින් ලැබී තිබේ. ඒවා ගුප්ත කාසිවල අනුකරණයන් වුවද, නිමැවුම අතින් ඉතා දළය. මේ අතර සමහර කාසි ඇතැමුන් විසින් මගධ දෙශය පාලනය කළ පශ්චාත් – ගුප්තයන් විසින් නිකුත් කරන ලද ඒවායයි නිගමනය කිරීමට තැත් කරතත්, ඒ කාසි හමු වී ඇත්තේ මගධ දේශයට දුරින් පිහිටි නැගෙනහිර බෙංගාලයේ වීම ඊට පටහැනි වන සාධකයෙකි. මේ කාසි එකිනෙක වෙන් වෙන් ව විස්තර කිරීම අනවශ්‍ය ය. තවත් මේ ගැන සාක්ෂි සොයා ගනු ලැබෙන තුරු සාමාන්‍යයෙන් පිළිගත හැකි අදහස නම්, මෙම කාසි ශශාංක පරපුරට පසුව නැගෙනහිර බෙංගාලයේ බලයට පත් කිසියම් ප්‍රාදේශීය පාලක පෙළපතකට අයත් වූවන් විසින් නිකුත් කරන ලද බවයි. ඒවා නිකුත් කළවුන් කවුරුන් වුවද, මෙම කාසි අධිරාජ්‍ය ගුප්ත පාලකයන් විසින් සකසා ගන්නා ලද කාසි ක්‍රමය ශත වර්ෂ කිහිපයක් තිස්සේ හින්දු පාලකයන් ගේ කාසි ක්‍රමය කෙරෙහි සැලැකිය යුතු බලපෑමක් ඇති කළ බව පෙන්වා දෙන සාක්ෂි වේ.

වැලිගම
මහජන පුස්තකාලය.

## ගැටපද විවරණය

අක්ෂරසංයුක්ත — අක්ෂර කීපයක් එක අකුරක් මෙන් එක් කොට දක්වාලීම. ඉන්දු–ග්‍රීක පාලකයන්ගේ කාසිවල මෙබඳු ග්‍රීක අක්ෂරසංයුක්තයන් වන රූප සටහන් නිතර යොද තිබේ.

අර්දෝක්ෂො — සෞභාග්‍යය පිළිබඳ රෝම දේවතාවිය යි. ඉන්දියානු ලක්ෂ්මී දේවතාවිය බඳු ය. සංකේතය වශයෙන් එක් අතක සමෘඬිශෘංගය දරා සිටී.

ඇපෝලෝ — ග්‍රීකයන්ගේ සූර්‍ය දේවතාවා, කාව්‍ය ශාස්ත්‍රය, සංගීතය, වෛද්‍ය විද්‍යාව, ධනු ශිල්පය ආදියට අධිපති දේවතාවා ලෙස සැලැකේ.

ඉන්ගොට් — කාසි භාවිතය ආරම්භයේ දී අච්චුවක වත්කොට තනාගන්නා ලද ලෝහ කාසි විශෙෂයෙකි. මෙවා සාද ගැනීම සඳහා යොද ගත් ලොහය රිදී බැවින් ඒවා "silver ingot" යන නමින් හැඳින්වේ. ඉන්දියාවේ පැරැණිතම කාසි ගණයට වැටෙන මෙවායේ කුඩා වටකුරු තිත් තුනක් සලකුණු වශයෙන් යොද ඇත.

ඖරියස් — රෝම අධිරාජ්‍යයේ රන් කාසි වර්ගයකි.

උජ්ජයිනි සංකේතය — කතිරයක් හා එහි රේඛා කෙළවරවල යෙදූ කව සතරකින් යුත් සංකෙතයකි. මෙය අවන්ති රාජධානියේ කාසිවල සුලභ ලෙස දක්නට ලැබෙන හෙයින් ඇලෙක්සැන්ඩර් කනිංහැම් විසින් "උජ්ජයිනි සංකේතය" යන නමින් හඳුන්වාදී ඇත.

කාෂාපණ — කාෂා ඇටයක බරැති කාසියකි. මෙ පදය "කාසි" යන්නට පර්‍යාය නාමයක් වශයෙන් රන් රිදී හා තඹ කාසි හැඳින්වීමට භාවිත විය. තඹ කාෂාපණ කාසියක බර ග්‍රෙන් 146·4 ක් පමණ වෙයි.

කැඩූසියස් — හර්මීස් නම දෙවතාවාගේ යෂ්ටිය.

කෘෂ්ණල — ගුඤ්ජා පැළෑටියෙන් ලැබෙන ඇට වර්ගයක නමයි. මෙ නම කෘෂ්ණල (රාක්තික) ඇටයක බර ප්‍රමාණය හැඳින්වීමට යොද ගනු ලැබිණි. එහි බර කාෂාපණයකින් $\frac{1}{16}$ ක් එනම් ග්‍රෙන් 1·75 ක් පමණ වෙයි.

චෂාල — යාග කණුවක (යූප) මුදුනේ සවිකොට තුඹු ලීයෙන් කළ වළල්ලකි.

තලෙන්ත — පැරැණි ග්‍රීක බර මිම්මකි. රාත්තල් 84 ක් පමණ වේ. ඇටික් (attic) තලෙන්තයක් රාත්තල් 57·75 ක් පමණ බර විය.

තක්ෂශිලා සංකේතය — මැද කවයක් හා ඒ වටා යොදන ලද චන්ද්‍රවංකවලින් සකස් වුණු සෞර සංකෙතයකි.

දිනාර — රන් කාසි විශෙෂයකි. "ඖරියස්" යන නමින් ද හැඳින්වේ. (රූපක) $\frac{1}{10}$ සුවණ් 28 = දිනාර 1 = ග්‍රෙන් 124).

ධරණ — "පුරාණ" යන නාමයෙන් ද හැඳින්වෙන හස් යෙදූ කාසි සඳහා භාවිත වූ නාමයෙකි.
රති 2 = මාෂ 1
මාෂ 16 = ධරණ (පුරාණ) 1.

නිෂ්ක — රත්රනින් කරන ලද ග්‍රීවාභරණ විශෙෂයකි. පසු කලෙක මුදල් ඒකකයක් වශයෙන් ද භාවිත කරන ලදි. මෙහි සාමාන්‍ය බර රති 320 ක් (එනම් ග්‍රෙන් 560) පමණ විය.

නිකේ — ජයග්‍රහණයට අධිපති ග්‍රීක දෙවතාවිය.

ටෝරින් — වෘෂභ සංකේතය. සෞර ග්‍රහ මණ්ඩලයේ සංකේත අතර දෙවැන්නයි.

ඩියොස්කුරි — සියුස් දේවතාවාගේ පුතුන් දෙදෙනා ලෙස සලකන ලද කැස්ටර් හා පොලුක්ස්.

පද්මටංක — දකුණු ඉන්දියාවේ පැරණිතම රන් කාසි වර්ගයකි. මේවායේ සාමාන්‍ය බර ග්‍රේන් 52 ක් පමණ විය. පද්මයක් කේන්ද්‍රය වශයෙන් ගෙන ඒ වටා හස් යෙදූ කාසිවල යෙදෙන සලකුණු කිහිපයක් යෙදීමෙන් මේ කාසිවල රූප සටහන සකසා ගෙන ඇත.

පලස් — ඥානයට හා කර්මාන්තවලට අධිපති ඇතිනි නම් ග්‍රීක දේවතාවිය.

පුරාණ — හස් යෙදූ කාසිවලට ම ව්‍යවහාර වූ කාසි විශෙෂයකි. ''ධරණ'' නමින් හඳුන්වන ලද්දේ ද මේ කාසිමය.

පොටින් — තඹ, සින්ක්, ඊයම් හා ටින් මිශ්‍ර කර ගැනීමෙන් සාද ගන්නා ලද ලොහ වර්ගයකි. ඇතැම් පැරණි පාලකයන් විසින් තමන්ගේ කාසි නිපැදවීම සඳහා මෙ ලෝහ වර්ගය උපයෝගි කර ගන්නා ලදි.

පොසිඩොන් — සමුද්‍රයට අධිපති ග්‍රීක දේවතාවා. රෝමයන් විසින් මේම දේවතාවාම නැප්ට්‍යුන් වශයෙන් හඳුන්වා දී ඇත.

බිලන් — රිදී, තඹ හා ටින් යන ලෝහ වර්ගවල මිශ්‍රණයකි. පැරණි කාසි නිපැදවීම සඳහා මේ මිශ්‍ර ලෝහය භාවිත කැරිණි.

මාෂක — මාෂ ඇටයක බර ප්‍රමාණයෙන් යුත් තඹ කාසියක් වූ මෙය කාර්ෂාපණයකින් $\frac{1}{16}$ ක් වී යැයි සලකනු ලැබේ.
රති 5 = මාෂ 1
මාෂ 16 = කාර්ෂාපණ 1 (රති 80).

බෙන්ට් -- බාර් — රිදී හස් යෙදූ කාසි අතර පැරණිතම ගණයට වැටෙන කාසි වර්ගයකි. දිගටි හුරු මෙම රිදී කාසිය අඟල් 1·5 ක් පමණ දිගය. දෙකෙළවර මඳක් එක් අතකට වක් ව තිබේ. වක් වූ ඇතුළු පාර්ශවයෙහි යම් සලකුණක් ඔබවා ඇත. මේවා ''ඉන්ගොට්'' කාසි සමඟ එකට භාවිත වූ බව පෙනේ. ''ශතමාන'' යන නාමයෙන් හඳුන්වන ලදුයේ ද ''බෙන්ට් – බාර්'' කාසි යැයි අදහසක් වෙයි. (කනිංහැම්). මෙය පර්සියානු''සිග්ලොස්'' කාසි දෙකක අගයෙන් යුත් කාසියක් යැයි තවත් මතයක් ද වෙයි. (ඇලන්).

රති — රාක්තීක (කෘෂ්ණල) ඇටයක බර ප්‍රමාණයයි. ඉන්දිය කාසිවල බර මිමි අතර අඩුම බර ප්‍රමාණය මෙය විය. රති (කෘෂ්ණල) 1 = ග්‍රෙන් 1·75 හෝ 1·83 පමණ වේ.

රූපදර්ශක — කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රයෙහි දක්වෙන අයුරු කාසිවල ව්‍යවහාරික බව (වලංගු බව) රාජ්‍ය භාණ්ඩාගාරය විසින් පිළිගනු ලැබෙන බව (කොෂප්‍රවේශ්‍ය) සහතික කරන ලද්දේ මෙම නිලධාරියා විසිනි.

රෙපූසේ — (කාසියක) පිටුපසින් හෝ (භාජනයක) ඇතුළතින් තැළීමෙන් උඩට නෙරා සිටි ලෙස රූකම් මතුකොට දක්වෙන ක්‍රමය.

ලක්ෂණාධ්‍යක්ෂක — කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රයට අනුව කාසි නිෂ්පාදනය භාරව සිටි නිලධාරීයා.

**ලක්ෂ්මී** — සෞභාග්‍යයට අධිපති ඉන්දියානු දෙවතාවිය; විෂ්ණු දෙවියන්ගේ භාර්යාවයි. මේ දෙවතාවිය හැම විටම පියුමක් මත හිඳින හෝ සිටින හෝ විලාශයෙන් රූ කම්වල දක්වෙයි. සමහර විටක ඇය දෙපසින් සිට ඇගේ හිස මතට ඔසවා ගත් සොඬින් ජලය වත්කරන ඇතුන් දෙදෙනකු සමඟ ද ලක්ෂ්මී දෙවතාවිය දක්වෙයි. එය "ගජ –ලක්ෂ්මී" හෝ "අභිෂෙක – ලක්ෂ්මී" හෝ යනුවෙන් හැඳින්වේ.

**ලක්ෂ්මී තහඩු** — ලංකාවේ පුරාණ කාසි වර්ගයකි. මේවායේ අභිමුඛයේ අභිෂෙක – ලක්ෂ්මී රූපය දක්වෙන හෙයින් මෙම නම භාවිත වේ.

**ශතමාන** — බ්‍රාහ්මණ ග්‍රන්ථවල සඳහන්වන කාසි වර්ගයක නමකි. මේ නමින් හැඳින්වෙන්නේ "බෙන්ට්බාර්" රිදී කාසි දැයි අනුමාන කෙරේ. ශතපථ බ්‍රාහ්මණයෙහි රන් ශතමාන ගැනද සඳහන් වේ.

**සමෘද්ධශෘංගය** — සෞභාග්‍යයේ සංකේතයකි. ග්‍රීක දේව කථා අනුව ජුපිටර් (ද්‍යඋස්පිතර්) ග්‍රහයාට කිරි පෙවූ එළුවාගේ අඟයි. අර්දෝක්ෂෝ නම් දෙවතාවිය මෙය අතින් දරා සිටින අයුරු දක්වෙයි.

**සිග්ලොස්** — පර්සියානු රිදී කාසියකි. මෙහි බර ග්‍රෙන් (ට්‍රොයි) 86·45 කි.

**සියුස් (ද්‍යඋස්)** — ග්‍රීක ඔලිම්පියානු දේවතා ගණයේ නායකයා සියුස්ය. දීප්තිමත් අහසට අධිපති දෙවියා ය. රෝමන් වරුන් විසින් ගුරු ග්‍රහයා ලෙස හඳුන්වනු ලැබිණි.

**සිස කහාපණ** — ඊයම්වලින් නිම වූ කහාපණ විශෙෂයකි.

**සුවර්ණ** — භාණ්ඩයක වටනාකමට සමාන වූ රත්රන් ප්‍රමාණයකි. සුවර්ණ කැටි (හිරණ්‍ය – පිණ්ඩ) වශයෙන් ද භාවිතා විය. "සුවර්ණ" යනු රන් ධූලි සඳහා ද භාවිත වී යැයි අනුමාන කෙරේ (කනිංහැම්).

**හර්මීස්** — ග්‍රීක දේවතාවන්ගේ දූතයා. කලාශිල්ප, ව්‍යක්ත භාවය යනාදියට අධිපතියා විය. රෝමන්වරු බුධ ග්‍රහයා ලෙසද හැඳින්වූහ.

**හස් යෙදූ කාසි** — "පුරාණ" "ධරණ" යන නම්වලින් ද හඳුන්වනු ලැබෙන මේ කාසි ඉන්දියාවේ පැරණිතම කාසි වේ. රිදියෙන් හා තඹයෙන්, නිමවා ඇති මේ කාසිවල නොයෙක් සංකෙත සලකුණු ඔබවා ඇති හෙයින් මේ නම භාවිත කෙරේ.

**හෙරක්ලීස්** — (ලතින් හර්ක්‍යුලිස්) ග්‍රීක වීරයන් අතර ප්‍රමුඛයා. බොහෝ විට දෙවියකු වශයෙන් ද සලකනු ලැබිණි.

**හිරණ්‍ය – පිණ්ඩ** — රිදියෙන් සැදි පිණ්ඩ (කැටි) හෙවත් "ඉන්ගොට්" වලට සමාන රනින් කළ "පිණ්ඩ" විශෙෂයකි. යම් නියමිත බරක් අනුව සකස් කර ගෙන කාසි වශයෙන් භාවිත කරන ලදි.

# චිත්‍ර නාමාවලිය

| | | |
|---|---|---|
| i | 1 – 3 | ''බෙන්ට් – බාර්'' කාසිවල යොද ඇති සලකුණු. |
| | 4 – 63 | ''පුරාණ'' කාසිවල යොද ඇති සලකුණු. |
| | 64 – 70 | ගොත්‍රික කාසිවල මුද්‍රිත සලකුණු. |
| | 71 – 77 | ආන්ධ්‍ර කාසිවල මුද්‍රිත සලකුණු. |
| ii | 1 – 35 | ඉන්දු – ග්‍රීක කාසිවල මුද්‍රිත අක්ෂරසංයුක්ත. |
| | 36 – 56 | කුෂාණ කාසිවල මුද්‍රිත සංකෙත. |
| | 57 – 77 | ගුප්ත කාසිවල මුද්‍රිත සංකෙත. |
| ii | 1 – 2 | ''බෙන්ට් – බාර්'' රිදී කාසි. |
| | 3 – 9 | ''පුරාණ'' රිදී කාසි. |
| | 10 | මථුරාවෙන් සොයාගන්නා ලද ''පුරාණ'' කාසි මුද්‍රිත මැටි අච්චුවක්. |

iv 1 ශක වංශික මොආස් රජුගේ තඹ කාසියක්.

**අභිමුඛය:** දකුණට හැරුණු හොඬ ඔසවා ගත් ඇත් හිස. බෙල්ලෙහි සීනුවක් එල්ලෙයි.

**ප්‍රතිමුඛය:** කැඩූසිස්. වම්පස අක්ෂර සංයුක්තය: දෙපස වූ ග්‍රීක සිරස් පාඨය: ''බැසිලෙඋස් මයොළි''.

2 ශක වංශික අයිස් 1 රජුගේ තඹ කාසියක්.

**අභිමුඛය:** දකුණු දෙසට ගමන් කරන අසු පිට නැගුණු රජ. වමතින් හෙල්ලක් දරයි. ග්‍රීක වට පාඨය: ''බැසිලෙඋස් (බැසිලිඔන්) අසොලි''

**ප්‍රතිමුඛය:** සියුස් දේවතාවා වම්දෙසට මුහුණ ලා වමතින් සෙංකෝලය දරා සිටී. ඉදිරිපස අක්ෂර සංයුක්තයකි. ඛරොෂ්ඨී වට පාඨය. ''මහරජස.........''

3 කුෂාණ වංශික විම කැඩ්පිසිස් රජුගේ රන් කාසියක්.

**අභිමුඛය:** රජ දකුණු දෙසට මුහුණ ලා එරමිණිය ගොතාගෙන හිඳියි.
දකුණතින් ගදයුධය දරයි. ග්‍රීක වට පාඨය:
''බැසිලෙඋස් ඔඊමො කඩ්පිසිස්.''

**ප්‍රතිමුඛය:** ශිව දෙවි දකුණතින් ත්‍රිශූලය ගෙන පිටුපසින් සිටි වෘෂභයාගේ පිට මත වමත තබා ගෙන සිටියි. නන්දිපද සංකෙතය වම්පස වෙයි. ඛරොෂ්ඨී වට පාඨය: ''මහරජස රජතිරජස සර්වලොග ඉශ්වරස මහිශ්වරස විම කඨ්පිසසස ත්‍රදර''.

4. කුෂාණ වංශික කණිෂ්ක රජුගේ රන් කාසියක්.

**අභිමුඛය:** රජ දිගු කබාය (ෂර්වානිය) හැඳ උස් සපත්තු ලා තොප්පියක් හිසලා වම් දෙසට මුහුණ ලා සිටියි. වමතින් යෂ්ටිය දරා ඇති අතර දකුණතින් පූජාසනයක් මත ෂූජා ද්‍රව්‍යයක් හෙළයි. ඉරානිය වට පාඨය: ''ෂාඔනානොෂාඔ කණෙෂ්කි කොෂාණො.''

**ප්‍රතිමුඛය:** ඉදිරියට මුහුණ ලා සිටි බුද්ධ රූපය. සිවුර දෙවුර වසා ඇත. දකුණතින් අභය මුද්‍රාව දක්වියි. සිරස වටා ප්‍රභාමාලාවක් ද සිරුර වටා තවත් ප්‍රභාමාලාවක් ද වෙයි. වම් පස සංකෙතයකි. දකුණු පස ග්‍රීක පාඨය: ''බොඩ්ඩෝ''.

5. කුෂාණ වංශික වාසුදෙව රජුගේ රන් කාසියක්.

**අභිමුඛය:** ප්‍රභාමාලාව සහිත රජ දිගු කබායෙන් හා යුද ඇඳුමෙන් සැරැසී වම් දෙසට මුහුණ ලා සිටියි. බඳ පටියෙහි කඩුවක් එල්බෙයි. වමතින් දිගු මිට සහිත ත්‍රිශූලයක් දරයි. දකුණතින් පූජා ද්‍රව්‍යයක් පුදන අයුරු දක්වයි. පූජාසනය පිටුපස ත්‍රිශූලයකි. ඉරානිය වට පාඨය: ''ෂාඕනානොෂාඕ අසොදෙඕ කොෂාණො.''

**ප්‍රතිමුඛය:** ශිව දෙවි ධොතියකින් සැරැසී වමතින් ත්‍රිශූලය දරා සිටියි. පිටුපස වෘෂභ වාහනය වේ. ඉදිරියට දිගු කළ දකුණතට ඉහළින් සංකෙතයකි. වම්පස පාඨය: ''ඔඑෂො''.

6. කුෂාණ වංශික කණිෂ්ක iii රජුගේ රන් කාසියක්.

*අභිමුඛය: ප්‍රභාමාලාව සහිත රජරුව 5 කාසියෙහි මෙනි. වමතින් ත්‍රිශූලය දරයි.* දකුණතින් පූජා ද්‍රව්‍යයක් දමයි. වට පාඨය: ''ෂාඕනානොෂාඕ කණෙෂ්කි කොෂාණෙ.''

**ප්‍රතිමුඛය:** අර්දොක්ෂො දේවතාවිය ඉදිරිදෙසට මුහුණ ලා ආසනයක් මත ප්‍රලම්බපාදව හිඳී. වමතෙහි තල්පතක් හා දකුණතින් මල් බඳුනක් දරයි. වම්පස සංකේතයකි. දකුණු පස සිරස් පාඨය ''අර්දොක්ෂො'' යනුයි.

v 1. මථුරා ක්ෂත්‍රප රාජුවුලගේ රිදී කාසියක්.

**අභිමුඛය:** හිස්වැස්මක් පැළඳි රජුගේ උඩුකය. දකුණට හැරී ඇත. ග්‍රීක වට පාඨය නොපැහැදිලි ය. ''බැසිලෙඋස් බැසිලිඔන්......''

**ප්‍රතිමුඛය:** වජ්‍රායුධයක් දකුණතින් දරා සිටි පලස් ඇතිනි දෙවඳුව.
බ්‍රාහ්මී වට පාඨය: ''අප්‍රතිහත චක්‍රස ඡත්‍රපස රජුවුලස.''

2. බටහිර ක්ෂත්‍රප රුද්‍රදමගේ රිදී කාසියක්.

**අභිමුඛය:** හිස් වැස්මක් පැළැඳි රජුගේ උඩුකය. දකුණට මුහුණලා ඇත. ග්‍රීක වට පාඨය නොපැහැදිලිය.

**ප්‍රතිමුඛය:** ගර්භ තුනකින් සැදි චෛත්‍යය. ඊමත චන්ද්‍රවංකය වේ. දකුණු පස තරුවක් හා වම්පස තවත් චන්ද්‍රවංකයක් ද වේ. බ්‍රාහ්මී වට පාඨය: ''රාඥෙ ක්ෂත්‍රපස ජය (දමස) රාඥෙ මහාක්ෂත්‍රපස රුද්‍රදමස.''

3. උජ්ජයිනි ගොත්‍රික තඹ කාසියක්.

**අභිමුඛය:** එරමිණිය ගොතා හිඳි මිනිස් රුව.

**ප්‍රතිමුඛය:** උජ්ජයිනි සංකෙතය.

4. කුණින්ද ගොත්‍රික අමොඝභූතිගේ රිදී කාසියක්.

**අභිමුඛය:** දකුණු දෙසට හැරී සිටි මුවා ඉදිරිපස දකුණතින් පියුමක් දරන ස්ත්‍රී (ලක්ෂ්මී) රුව. මුවාගේ හිස මත ශ්‍රිවත්ස බඳු සංකේතයකි පිටුපස තවත් සලකුණකි. වට පාඨය: ''රාඥඃ කුණින්දස්‍ය අමොඝභූතිස්‍ය මහාරාජස්‍ය.''

**ප්‍රතිමුඛය:** ගර්භ සයකින් සැදි චෛත්‍යය. ඊමත නන්දි පද සංකෙතය. වම් පස ස්වස්තිකය හා තවත් සංකෙතයක්. වම් පස වේදිකාවෙන් වට වූ ගසකි. සියල්ලට පහළින් තරංග රේඛාවකි. වට පාඨය: ''රඥ කුණිදස අමොඝභූතිස මහරජස.''

5. ඖදුම්බර ගොත්‍රික රුද්‍රදසගේ තඹ කාසියක්.

**අභිමුඛය:** වේදිකාවෙන් වටවූ වෘක්ෂය. වම්පස ෂාඨය. ''......ස රඥ රුද්‍රදසස''.

**ප්‍රතිමුඛය:** කණු මත පිහිටි දෙමහල් පියස්සකින් යුත් චෛත්‍යගෘහය. පාඨය අසම්පූර්ණය. ''බරස.''

6. යෞධෙය ගොත්‍රික රිදී කාසියක්.

**අභිමුඛය:** ෂන්මුඛ කාර්තිකෙය ඉදිරියට මුහුණ ලා වමත ඉහටිය මත තබා දකුණතින් හෙල්ල දරා ගෙන සිටියි. වට පාඨය: ''භාගවත ස්වාමිනො බ්‍රාහ්මණ්‍ය යෞධෙය.''

**ප්‍රතිමුඛය:** ලක්ෂ්මිය පද්මයක් මත සිටියි. වම් පසින් මුදුනේ නන්දිපදය සහිත චෛත්‍යයකි. දකුණු පස වෙදිකාවෙන් වටවූ ගසකි. පහළින් තරංග රේඛාවකි.

7. ආන්ධ්‍ර වංශික විලිවායකුර රජුගේ තඹ කාසියක්.

**අභිමුඛය:** ගර්භ පේළි සතරකින් සැදි චෛත්‍යය හා ඊමත වූ ස්වස්තිකය. දකුණු පස කැටයම් සහිත වෙදිකාවකින් වට වූ වෘක්ෂය.

**ප්‍රතිමුඛය:** සිරස් අතට සවි කළ දුනු දිය සහිත දුන්න. බ්‍රාහ්මී වට පාඨය: ''රඤෙ ගොතමීපුතස විලිවයකුරස.''

8. ආන්ධ්‍ර වංශික ධූටුකලානන්ද රජුගේ තඹ කාසියක්.

**අභිමුඛය:** කුඩා ගර්භ පේළි දෙකක් මත වූ ගර්භයකින් සැදි චෛත්‍යය. වට පාඨය: ''රඤෙ ධූටුකලානන්දස.''

**ප්‍රතිමුඛය:** වෙදිකාවකින් වටවූ වෘක්ෂය. දකුණු පස නන්දිපද සංකෙතය.

vi 1. සමුද්‍රගුප්ත රජුගේ දණ්ඩධර වර්ගයට අයත් රන් කාසියක්.

**අභිමුඛය:** ප්‍රභාමාලාව සහිත රජ දිගු කබාය හා කලිසම හැඳ වම්පස බලා සිටියි. වමතින් රාජ දණ්ඩ දරා ඇති අතර දකුණතින් පූජාසනයක් මත පූජා ද්‍රව්‍යයක් හෙළන අයුරු දක්වේ පූජාසනයෙන් ගිනිදැල් නික්මෙන ආකාරයක් ද පෙනේ. දකුණතට පිටුපසින් ගරුඩධ්වජය වේ. වම් බාහුව යට ''සමුද්‍ර'' යනුවෙන් සඳහන් වේ. වට පාඨය: ''සමරශත විතත...... රිපුරජිතො දිවං ජ (යති).''

**ප්‍රතිමුඛය:** දේවතාවියක් උස් වූ පිටි ඇන්දකින් යුත් ආසනයක් මත ප්‍රලම්බපාද ව හිඳියි. දකුණතෙහි පාශය හා වමතෙහි සමෘධිශෘංගය වේ. වම්පස සලකුණකි. දකුණු පස සිරස් පාඨය ''පරාක්‍රමඃ'' යනුයි.

2. සමුද්‍රගුප්ත රජුගේ ව්‍යාඝ්‍රපරාක්‍රම වර්ගයට අයත් රන් කාසියක්.

**අභිමුඛය:** ප්‍රභාමාලාව සහිත රජ සකච්ඡ ධෝතියක් හැඳ මැණික් බැඳි හිස්වැස්මකින් හ අනෙකුත් අබරණ පැළඳ වම්පස බලා ප්‍රත්‍යාලීඪ ඉරියව්වෙන් සිටී. දකුණතෙහි දුන්නය. වමතින් ඇදි දුනුදිය කණ දක්වා ඇදී ඇත. වේදනාවෙන් හා කෝපයෙන් මුව අයා ගත් ව්‍යාඝ්‍රයා දකුණු පයින් පාගා ගෙන සිටියි. ව්‍යාඝ්‍රයා පිටුපස චන්ද්‍රධ්වජය වේ.

**ප්‍රතිමුඛය:** ගංගා දේවිය වම්පස බලා කඤ්චුකයකින් හා සාරියකින් සැරසී අබරණ පැළඳ මකරකු පිට සිටියි. වමතින් දිගු නටුව සහිත පද්මය දරා ඇත. වම්පස චන්ද්‍රධ්වජය වේ. වම්පස සිරස් පාඨය ''ව්‍යාඝ්‍රපරාක්‍රමඃ'' යනුයි.

3. සමුද්‍රගුප්ත රජුගේ වීණාවාදක වර්ගයට අයත් රන් කාසියක්.

**අභිමුඛය:** ප්‍රභාමාලාව සහිත රජු උස් ඇන්දකින් යුත් යහනක් මත හිඳ වීණාව ගායනා කරන අයුරු දක්වෙයි. සෝපාව යට තබා ඇති පා පුටුවෙහි ''සි'' බ්‍රාහ්මී අක්ෂරය සටහන් වී ඇත. වට පාඨය: ''මහාරාජාධිරාජශ්‍රී සමුද්‍රගුප්තඃ''.

**ප්‍රතිමුඛය:** දේවතා විය මෝර පුටුව මත වම දෙසට මුහුණ ලා හිඳ දකුණතින් පාශය හා වමතින් සමෘද්ධිශෘංගය දරයි. දකුණු පස වූ සිරස් පාඨය ''සමුද්‍රගුප්තඃ'' යනුයි.

4. සමුද්‍රගුප්ත රජුගේ අවශ්මෙධ වර්ගයට අයත් රන් කාසියක්.

**අභිමුඛය:** පළඳනාවලින් තොර අශ්වයා පීඨයක් මත සවිකරන ලද යූපය ඉදිරිපස සිටියි. යූපයේ අග විශාලයකින් යුක්තය. ඊ මත වූ ධජය අසුගේ හිසට ඉහළින් සුළඟේ වැනෙයි. එය කෙළවර චන්ද්‍රවංකය වේ. අසුගේ පා අතර ''සි'' අක්ෂරය සටහන් වී ඇත.

වට පාඨය: ''රාජාධිරාජ: පෘථ…… ව …… මවිත්වා දිවංජයත්‍යාහෘතවාජිමෙධඃ''

**ප්‍රතිමුඛය:** ප්‍රභාමාලාව සහිත රැජින වම්පසට මුහුණ ලා පලසක් මත සිටියි. උරහිස මත වූ චාමරය දකුණතින් දරයි. ඉදිරිපස සූචිය වෙයි. දකුණු පස වූ සිරස් පාඨය ''අශ්වමෙධපරාක්‍රමඃ'' යනුවෙන් සඳහන් වෙයි.

5. කාච රන් කාසියක්.

**අභිමුඛය:** ප්‍රභාමාලාව සහිත රජ දිගු කබායක් හැඳ අබරණ පැළැඳ සිටියි. වම් අතින් රාජදණ්ඩ දරයි. දකුණතින් පූජාසනය මත පූජා ද්‍රව්‍යයක් හෙළන අයුරු දක්වේ. දකුණත පිටුපස ගරුඩධ්වජය වෙයි. වම් බාහුවට පහළින් ''කාච'' යනුවෙන් සඳහන් වේ. වට පාඨය නොපැහැදිලිය. ''භ'' (රු.) ……හමෛර් ජය (ති)

**ප්‍රතිමුඛය:** දේවතාවිය ගමන් කරන අයුරින් වම්පස බලාගෙන සිටියි. කඤ්චුකයකින් හා සාරියකින් සැරසී දකුණතින් පාශය හා වමතින් සමෘධිශෘංගය දරා සිටියි. දකුණතට ඉහළින් සලකුණකි. එම පස ''සර්‍වරාජොච්ඡේත්තා'' යනුවෙන් සඳහන් වේ.

6. චන්ද්‍රගුප්ත ii රජුගේ ධනුර්ධර වර්ගයට අයත් රන් කාසියක්.

**අභිමුඛය:** ප්‍රභාමාලාව සහිත රජ දිගු කබාය හා කලිසම හැඳ අබරණ හා හිස්වැස්මක් පැළඳ වම්පස බලාගෙන සිටියි. වමතින් දුන්න දරයි. දකුණත ඉදිරියට දිගු කැරෙයි. පසු පස ගරුඩධ්වජයකි. වට පාඨය අසම්පූර්ණය. ''දවශ්‍රමහර……'' (දෙවශ්‍රී මහාරාජා…)

**ප්‍රතිමුඛය:** දේවතාවිය ඉදිරිපස බලාගෙන පද්මාසනාරූඪ ව හිඳියි. දකුණතෙහි පාශය හා වමතෙහි දිගු නටුවකින් යුත් පියුමකි. දකුණතට ඉහළින් සළකුණකි.

7. චන්ද්‍රගුප්ත ii රජුගේ සිංහවික්‍රම වර්ගයට අයත් රන් කාසියක්.

**අභිමුඛය:** ප්‍රභාමාලාව සහිත රජ ප්‍රත්‍යාලීඪ ඉරියව්වෙන් වම්පස බලා ගෙන දකුණතින් දුන්න දරා වමතින් දුනුදිය අදින අයුරු දක්වයි. දකුණු පයින් සිංහයා පාගා මැඩ සිටියි. වට පාඨය: ''නරෙන්ද්‍ර චන්ද්‍රඃ පෘථ (වි) තරණෙ රණෙ.''

**ප්‍රතිමුඛය:** දේවතාවිය වම්පස බලාහිඳිනා සිංහයා මත ලලිතාසනයෙන් හිඳියි. දකුණතින් පාශය හා වමතින් පියුම දරයි. දකුණතට පහළින් සලකුණකි. දකුණු පස සිරස් පාඨය ''සිංහවික්‍රමඃ'' යනුයි.

8. චන්ද්‍රගුප්ත ii රජුගේ ඡත්‍ර වර්ගයට අයත් රන් කාසියක්.

**අභිමුඛය:** හිස් වැස්මක් පැළඳ ගත් රජ වමත ඉණටිය මත තබා දකුණත පූදසුනකට පූජා ද්‍රව්‍යයක් දමන අයුරු පෙන්වයි. රජු පටුපසින් වාමනයෙක් රජුට ඡත්‍රයක් උසුලා සිටියි. වට පාඨය: නොපැහැදිලිය. ''ක්ෂිතමව……''

**ප්‍රතිමුඛය:** දේවතාවිය පීඨයක් මත සිට දකුණතින් පාශය හා වමතින් දිගු නටුව සහිත පියුමක් දරයි. වම් පස සලකුණකි. දකුණු පස ''වික්‍රමාදිත්‍යඃ'' යනුවෙන් සඳහන් වේ.

9. චන්ද්‍රගුප්ත ii රජුගේ සයන වර්ගයට අයත් රන් කාසියක්.

**අභිමුඛය:** ධෝතියක් පමණක් හැඳි රජ උස් පිටි ඇන්ද සහිත සෝපාවක් මත රාජලීලාවෙන් හිඳියි. ඇන්ද මත රජුගේ වම් වැලමිට තබා ඇත. දකුණතින් පියුම් කැකුලක් දරයි. වට පාඨය: ''පරමභාගවත මහාරාජාධිරාජ ශ්‍රී චන්ද්‍රගුප්තඃ''

**ප්‍රතිමුඛය:** ලක්ෂ්මී දේවිය වම්දෙසට මුහුණ ලා ඇන්දක් නොමැති සෝපාව මත ලලිතාසනයෙන් හිඳියි. වමත සෝපාව මත තබා ඇති අතර දකුණතින් දිගු නටුව සහිත පියුමක් දරයි. සෝපාව යට පා පුටුවකි. පාඨය ''වික්‍රමාදිත්‍යඃ'' යනුයි.

10. චන්ද්‍රගුප්ත ii රජුගේ චක්‍රවික්‍රම වර්ගයට අයත් රන් කාසියක්.

**අභිමුඛය:** වම්පසින් සිටින දෙවිරුව දකුණු දෙසට හැරී සිටියි. ප්‍රභාමාලා යුග්මයක් සිරුර හාත්පස දිවෙයි. ධෝතියක් හැඳ අබරණ පැළඳ ඇත. පහතට එල්බෙන වමතෙහි ගදුව දරයි. දකුණතින් ප්‍රසාදයක් දෙන අයුරු පෙන්වයි. දෙවියා ඉදිරිපිට ප්‍රභාමාලාව සහිත රජ දිගු කබාය හා කලිසම හැඳ අබරණ පැළැඳ සිටියි. දෙවිඳුන් විසින් දෙනු ලබන ප්‍රසාදය ලබාගනු පිණිස ඔහු දකුණත ඉදිරියට දිගු කරයි. වම්පස හිණෙහි එල්බෙන කඩුවේ මිට මත වමත රැඳී ඇත. පාඨයක් නොමැත.

**ප්‍රතිමුඛය:** ප්‍රභාමාලාව රහිත ලක්ෂ්මී දේවිය අඩක් වමට හැරී පියුමක් මත සිටියි. සාරියකින් සැරැසී ආභරණ පැළඳ ඇත. යමක් දෙස දකුණතෙහි දබරැඟිල්ල දිගු කරන බවක් පෙනෙයි. වමතින් දිගු නටුවකින් යුත් පියුමක් දරා සිටී. ඒ පසෙකින් සලකුණකි. පාඨය ''චක්‍රවික්‍රමඃ'' යනුයි.

11. කුමාරගුප්ත i රජුගේ අශ්වාරෝහක වර්ගයට අයත් රන් කාසියක්.

**අභිමුඛය:** අබරණින් සරසන ලද අසකු පිට නැගී ගත් රජ දකුණු දෙසට මුහුණ ලා සිටිනු පෙනෙයි. රජුගේ වමතෙහි දුන්නකි. දකුණු පසින් කඩුවක් එල්බෙයි. වට පාඨය: පැහැදිලි නැත. ''පෘථවතලශ්චන්ද්‍ර කුමාර......''

**ප්‍රතිමුඛය:** මෝර පුටුව මත හිඳගත් දේවතාවිය දකුණතින් ඉදිරියෙන් සිටි මොණරකුට ආහාර දෙන අයුරු දක්වයි. වම්පස වූ පාඨය ''අජිතමහෙන්ද්‍රඃ'' යනුයි.

12. කුමාරගුප්ත i රජුගේ මයුර වර්ගයට අයත් රන් කාසියක්.

**අභිමුඛය:** ප්‍රභාමාලාව සහිත රජ වම් පස බලාගෙන සිට ඉදිරියෙන් වූ මොණරාට මිදි කෑමට දෙන අයුරු දක්වයි. පාඨය නොපැහැදිලිය.

**ප්‍රතිමුඛය:** කාර්තිකෙය දෙවි මයුර වාහනය මත හිඳ වමතින් හෙල්ල දරන අතර දකුණ තින් සුවඳ පූජා ද්‍රව්‍ය පුදසුන මත හෙළයි. වම්පස පාඨය ''මහෙන්ද්‍රකුමාරඃ'' යනුයි.